# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report

# 2021



## විදේශ අමාත්‍යාංශය

## வெளிநாட்டு அமைச்சு

## Foreign Ministry

# විදේශ අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2021

**2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**
**විදේශ අමාත්‍යාංශය**
**වැය ශීර්ෂ අංක 112**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **01** වැනි **පරිච්ඡේදය** | **හැඳින්වීම/ ආයතනික පැතිකඩ** | 5 |
| | විදේශ අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර | 7 |
| | විදේශ අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් | 8 |
| | විදේශ අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 9 |
| | විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාල ජාලය | 10 |
| | විදේශ අමාත්‍යාංශය යටතේ පවතින අංශ | 11 |
| **02** වැනි **පරිච්ඡේදය** | **ප්‍රගතිය හා අනාගත දැක්ම** | 12 |
| | කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: ජනතා කේන්ද්‍රීය රාජ්‍යතාන්ත්‍රිකභාවය | 21 |
| | කොන්සියුලර් සේවා | 22 |
| | ගෝලීය සබඳතා - ඉහළ මට්ටමේ සංචාර | 25 |
| | කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: හරස් කැපුම් අංශ | 27 |
| | එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | 27 |
| | ආර්ථික කටයුතු අංශය | 35 |
| | සාගර කටයුතු, පරිසරය සහ කාලගුණික විපර්යාස අංශය | 38 |
| | ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 43 |
| | මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය | 45 |
| | ජාත්‍යන්තර ආරක්ෂාව සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය | 47 |
| | කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: දේශභූමික අංශ | 50 |
| | අප්‍රිකා අංශය | 50 |
| | ඇමරිකා අංශය | 51 |
| | නැගෙනහිර ආසියා අංශය | 56 |
| | යුරෝපය හා මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩල අංශය | 60 |
| | මැද පෙරදිග අංශය | 65 |
| | දකුණු ආසියා සහ සාර්ක් අංශය | 70 |
| | අග්නිදිග ආසියා අංශය | 75 |
| | කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: මෙහෙයුම් අංශ | 81 |
| | මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය | 81 |
| | නීති අංශය | 84 |
| | විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය | 87 |
| | සන්ධාන අංශය | 89 |
| | සාමාන්‍ය පරිපාලන අංශය | 89 |
| | අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය | 91 |

| | | |
|---|---|---|
| | 2021 දී සිදු වූ සුවිශේෂී සිදුවීම් | 92 |
| **03 වැනි පරිච්ඡේදය** | **වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | 95 |
| | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 95 |
| | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 96 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 97 |
| | මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන | 98 |
| | ආදායම් රැස් කිරීම පිළිබඳ කාර්ය සාධනය | 99 |
| | ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම පිළිබඳ කාර්ය සාධනය | 100 |
| | 208 වැනි මූල්‍ය වාර්තාව ප්‍රකාරව අමාත්‍යාංශයේ වියදම් සඳහා වූ ප්‍රතිපාදන ප්‍රදානය කිරීම | 100 |
| | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම පිළිබඳ කාර්ය සාධනය | 101 |
| | 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 102 |
| | 2021 ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය | 102 |
| | විගණකාධිපති වාර්තාව | 103 |
| **04 වැනි පරිච්ඡේදය** | **කාර්ය සාධන දර්ශක** | 120 |
| | අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 120 |
| | ප්‍රධාන කාර්ය සාධන දර්ශක ළඟා කර ගැනීම ප්‍රතිශතයක් ලෙස | 122 |
| **05 වැනි පරිච්ඡේදය** | **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම පිළිබඳ කාර්ය සාධනය** | 137 |
| | හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක | 137 |
| | තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ ජයග්‍රහණ සහ අභියෝග | 137 |
| **06 වැනි පරිච්ඡේදය** | **මානව සම්පත් පැතිකඩ** | 139 |
| | සේවක සංඛ්‍යා කළමනාකරණය | 139 |
| | මානව සම්පත් හිඟය හෝ අතිරික්තය අමාත්‍යාංශයේ කාර්ය සාධනයට බලපා ඇති ආකාරය | 139 |
| | මානව සම්පත් සංවර්ධනය | 141 |
| **07 වැනි පරිච්ඡේදය** | **අනුකූලතා වාර්තාව** | 149 |

# 01 වැනි පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ

### 1.1 විදේශ අමාත්‍යාංශය සහ දූත මණ්ඩල ජාලය

ශ්‍රී ලංකාව විදේශ අමාත්‍යාංශයේ ඍජු පරිපාලනය යටතේ පවතින පහත සඳහන් විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හා දූත කාර්යාල පවත්වාගෙන යයි.

| | | |
|---|---|---|
| තානාපති කාර්යාල/මහ කොමසාරිස් කාර්යාල | - | 49 |
| එක්සත් ජාතීන් සඳහා නිත්‍ය දූත මණ්ඩල | - | 02 |
| නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල | - | 01 |
| කොන්සල් ජනරාල් කාර්යාල | - | 13 |
| නියෝජිත කාර්යාල | - | 01 |
| එකතුව | - | 66 |

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් බහු පාර්ශ්වීය හා කලාපීය සබඳතා පෝෂණය කිරීම, ද්විපාර්ශ්වික දේශපාලන හා ආර්ථික සබඳතා, ආරක්ෂක හා උපාය මාර්ගික සහයෝගිතාව, විද්‍යාව හා තාක්ෂණික සහයෝගිතාව, සංවර්ධන සහය, සංස්කෘතික හා පුද්ගලාන්තර සබඳතා වැඩිදියුණු කිරීම තුළින් විදේශ රටවල දී ශ්‍රී ලංකාවේ ජාතික අභිලාෂය සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මූලික වගකීම දරනු ලැබේ. තවද, විදේශ රටවල වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවට අවශ්‍ය කොන්සියුලර් සහය ලබාදීම සහ කම්කරු සුබසාධනය තහවුරු කිරීම ද විදේශ රටවල පිහිටි මෙම ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාලවල වගකීමකි. තවද, මෙම ස්පෂ්‍ය අරමුණුවලට අමතරව, ලොව විවිධාකාර වූ භූ දේශපාලනික පිහිටීම්වල පවතින සෑම විදේශීය දූත මණ්ඩලයක්ම ස්ථාපනය කිරීම පිළිබඳව පුළුල් පරාසයක අස්පෂ්‍ය, උපායමාර්ගික හා දිගු කාලීන අරමුණු පවතී.

**දැක්ම**

ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලි සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම

**මෙහෙවර**

ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම

## 1.3 - විදේශ අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍ය

පළමුවැනි කොටස: අංශය (1) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක: 2194/74 – 2020.09.25

විදේශ අමාත්‍ය

**1. විෂය පථය**

මිත්‍රශිලී හා නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක් මත ශ්‍රී ලාංකිය අනන්‍යතාවය තහවුරු කරමින් සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතිකමය වපසරියන් තුළ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සබඳතාවන් ඔස්සේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ඔසවා තැබීම.

**2. කාර්යයන් හා කර්තව්‍යයන්**

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මිත්‍රශීලී හා නොබැඳි විදේශ ප්‍රතිපත්තිය ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණ පණත්වලට අනුකූලව විදේශ විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන් හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසු විපරම් කිරීම.


**3. සුවිශේෂී ප්‍රමුඛතා**

1. රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් අන් රටවල් හා සම මිතුරු සබඳතා පවත්වා ගැනීම.
2. මෙතෙක් ඇතිකරගෙන ඇති ද්වීපාර්ශ්වීය ගිවිසුම් නැවත සමාලෝචනයට ලක්කොට රටට අහිතකර කොන්දේසි සම්බන්ධයෙන් නැවත සලකා බැලීම හා ගිවිසුම්වලට එළැඹීමේ දී දේශීය ආර්ථිකයට හානිකර නොවන පසුබිමක් සකස් කිරීම.
3. විදේශ දූත මණ්ඩල තෝරා ගැනීමේ දී රටේ විදේශීය ප්‍රතිපත්තියට අනුකූලව ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යය ඉටු කිරීමට දායක වන නිර්ණායකයන් අනුව කටයුතු කිරීම හා දූත මණ්ඩල මඟින් අපේක්ෂිත අරමුණු ඉටුවීම පිළිබඳ අඛණ්ඩ ඇගයීමට ලක් කිරීම.

**4. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් |
|---|---|
| 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල<br>2. ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා කාර්යාලය<br>3. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය | • 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍යය පිළිබඳ පනත<br>• 1996 අංක 9 දරන රාජ්‍ය දූත වරප්‍රසාද පනත<br>• 1980 අංක 31 දරන 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත |

විදේශ අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාල ජාලය



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

**හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ**

එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

ආර්ථික කටයුතු අංශය

සාගර කටයුතු, පරිසරය හා දේශගුණික විපර්යාස අංශය

ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය

ජාත්‍යන්තර ආරක්ෂාව සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය

**දේශභූමික අංශ**

අප්‍රිකා අංශය

ඇමරිකා අංශය

නැගෙනහිර ආසියා අංශය

යුරෝපය හා මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩල අංශය

මැද පෙරදිග අංශය

දකුණු ආසියා හා සාර්ක් අංශය

අග්නිදිග ආසියා අංශය

**මෙහෙයුම් අංශ**

කොන්සියුලර් කටයුතු අංශය

මානව සම්පත් සහ දූතමණ්ඩල කළමනාකරණ අංශය

නීති අංශය

විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය

සන්ධාන අංශය

ගිණුම් හා මූල්‍ය අංශය

සාමාන්‍ය පරිපාලන අංශය

අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය

## 02 වැනි පරිච්ඡේදය

**ප්‍රගතිය සහ අනාගත දැක්ම**

2020 සහ 2021 වසරවල ඇතිවූ කොවිඩ්-19 වසංගතය මගින් ජාත්‍යන්තර සන්ධර්භය තුළ පෙර නොවූ විරූ අභියෝග මෙන්ම ගවේෂණය නොකළ අවස්ථා ද ගෙන ආවේය. මෙම අභියෝගවලින් සමහරක් ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමින් නොදුටු පරිමාණයේ විය. වසංගතය මධ්‍යයේ ලොව පුරා ආර්ථිකයන්හි සහ දේශීය වශයෙන් සිදුවූ ප්‍රධාන හැකිලීම් ශ්‍රී ලංකාව වැනි සාපේක්ෂ වශයෙන් කුඩා ආර්ථිකයක් හිමි රටක් සඳහා වූ විශාලතම අභියෝගය විය. අපනයන ආදායම, සංචාරක ආදායම සහ විදේශ ප්‍රේෂණ අඩුවීම හේතුවෙන් විදේශ විනිමය කෙරෙහි ඇති වූ බලපෑම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේය. මෙම බාහිර සාධක මගින් තුඩු දුන් බලපෑම සහ තත්ත්වයන් හේතුවෙන් විදේශ අමාත්‍යාංශයට සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල 66 කින් සමන්විත ජාලයට එහි රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය කෙරෙහි නැවත අවධානය යොමු කිරීම සහ නැවත සකස් කිරීම සඳහා නව උපාය මාර්ග පිළිබඳව සොයා බැලීම සහ යොදා ගැනීම අවශ්‍ය විය.

මේ අනුව, නව වගකීම් තුළ පැහැදිලිව අර්ථ දක්වනු ලැබ ඇති විදේශ අමාත්‍යාංශයේ කාර්යභාරය තුළ, ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම ප්‍රමුඛස්ථානයට පැමිණ ඇති අතර, පවතින ද්විපාර්ශ්වික සබඳතා තහවුරු කර ගැනීම, ජාතික වත්කම් ආරක්ෂා කිරීම, ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දරනු ලැබේ.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ දැක්ම" සහ එහි ආංශික ප්‍රතිපත්ති පිළිබිඹු කරමින්, විදේශ අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය එක්ව "කරුණු 20 කින් සමන්විත 2020 සහ ඉන් ඔබ්බට ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ" යන මැයෙන් ප්‍රතිපත්ති ලේඛනයක් 2020 අග භාගයේ දී සකස් කරන ලද අතර, 2021 මුල් භාගයේදී එය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. රජයේ විදේශ ප්‍රතිපත්ති දැක්ම ඇතුළත් මෙම ලේඛනය මගින්, මෙම පරිපාලනයේ ප්‍රධාන ස්ථම්භ ත්‍රිත්වය වන ජාතික ආරක්ෂාව, ආර්ථික සංවර්ධනය සහ විදේශ ප්‍රතිපත්ති පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම හා එකඟ කිරීම අපේක්ෂා කරයි.

**ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික සබඳතා**

2021 වසර තුළදී, කොවිඩ්-19 වසංගතය පැවතියද ශ්‍රී ලංකාව අනෙකුත් රටවල් සමඟ පවතින අන්‍යෝන්‍ය සහයෝගීතාවය අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. ශ්‍රී ලංකාව සිය ගෝලීය සහයෝගීතාව ඉහළ මට්ටමකට ගෙන යමින් සහ කලාපීය සහ ජාත්‍යන්තර වේදිකාවල ශක්තිමත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීමක් අනුගමනය කරමින් හවුල්කාරිත්වයන් ගැඹුරු කර පුළුල් කළේය. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ අමාත්‍යතුමා බොහෝ දුරට ලොව පුරා සිටින ඔවුන්ගේ සම තනතුරු දරන්නන් සහ මැදිහත්කරුවන් සමඟ අතථ්‍ය වේදිකාවල දී කටයුතු කරන ලදී. මෙම හමුවල දී, ද්විපාර්ශ්වික සබඳතා සහ කලාපීය සහයෝගීතාවයට අදාළ වැදගත් කරුණු සාකච්ඡාවට බඳුන් විය.

2021 දී සිදු කරන ලද ප්‍රධාන ඉහළ මට්ටමේ බාහිර සංචාර අතර, සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) ඉහළ පෙළේ සැසිවාරයට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ විදේශ අමාත්‍ය ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා නිව්යෝර්ක් හි නිරත වූ සංචාරය, නොවැම්බර් මාසයේ දී ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ හි සහ එක්සත් රාජධානියේ පැවති UNFCCC CoP-26 ලෝක නායක සමුළුවට සහභාගී වීමට අතිගරු ජනාධිපතිතුමා සහ ගරු විදේශ අමාත්‍යතුමා නිරත වූ සංචාරය සහ දෙසැම්බර් මාසයේ දී 5 වැනි ඉන්දියානු සාගර සමුළුවට සහ EXPO 2020 ට සහභාගී වීම සඳහා ඔවුන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (UAE) නිරත වූ සංචාරය, අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ගරු විදේශ අමාත්‍යවරයා සැප්තැම්බර් මාසයේ දී ඉතාලියේ නිරත වූ සංචාරය, ගරු අග්‍රාමාත්‍යතුමාගේ මාර්තු මස බංග්ලාදේශ සංචාරය, ගරු විදේශ අමාත්‍යවරයාගේ

ඔක්තෝබර් මස බ්‍රිතාන්‍ය සංචාරය සහ නොවැම්බර් මාසයේ දී ඉන්දියන් සාගර වටද්දර රටවල සංගමයේ (IORA) උප සභාපතිත්වය භාර ගැනීම සඳහා එතුමා නිරත වූ බංග්ලාදේශ සංචාරය, ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා දෙසැම්බර් මස නිරත වූ ඉන්දීය සංචාරය, කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය (SMRC) ගරු තාරක බාලසූරිය මැතිතුමා සැප්තැම්බර් මස රුසියාවේ සහ යුක්රේනයේ සහ දෙසැම්බර් මාසයේ දී ඕමානයේ නිරත වූ සංචාර, එතුමා සමඟ ගරු විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපල විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ප්‍රියංකර ජයරත්නමැතිතුමා ඔක්තෝබර් මස කටාර් රාජ්‍යයේ නිරත වූ සංචාරය සහ ගරු සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා සමඟ ඔක්තෝබර් මාසයේදී පැරිසියේ පැවැත්වෙන ජාත්‍යන්තර ප්‍රංශ සංචාරක වෙළඳ ප්‍රදර්ශනයට (IFTM TOP RESA 2021) සහභාගී වීම සඳහා නිරත වූ සංචාරය, ගරු මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා අප්‍රේල් මාසයේ දී කටාර්, ඔක්තෝබර් මාසයේ දී ඩුබායි, නොවැම්බර් මාසයේ දී ඕමානය සහ දෙසැම්බර් මාසයේ දී රියාද් සහ අබුඩාබි යන රටවල නිරත වූ සංචාර සහ එතුමා සමඟ ගරු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමා ජූනි මස රුසියාවේ නිරත වූ සංචාරය, ගරු ප්‍රවාහන අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය සහ ගරු විසිතුරු මත්ස්‍ය, මිරිදිය මත්ස්‍ය සහ ඉස්සන් ගොවිතැන, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු සහ මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය කාංචන විජේසේකර මහතා සැප්තැම්බර් මාසයේ දී රුසියාවේ නිරත වූ සංචාරය, ගරු යෞවන හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ සහ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා ජූලි මාසයේ දී ටෝකියෝ හි, දෙසැම්බර් මස කටාර් හි, ඔක්තෝබර් මාසයේ දී ඉන්දියාවේ සහ ගරු ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක මැතිතුමා සමඟ මාර්තු මාසයේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නිරත වූ සංචාරය, ගරු බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමා සැප්තැම්බර් මාසයේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ හා ඉරානයේ සහ නොවැම්බර් මාසයේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නිරත වූ සංචාරය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මර්ජන් ෆලීල් මැතිතුමා අගෝස්තු මස දී ඉරානයේ නිරත වූ සංචාරය, සඳහන් කළ යුතු සංචාර සමහරක් වේ.

මෙම කාල සීමාව තුළ සිදු වූ සැලකිය යුතු ඉහළ මට්ටමේ මෙහි පැමිණි සංචාර අතරට; පාකිස්ථාන අග්‍රාමාත්‍ය ගරු ඉම්රාන් ඛාන් මැතිතුමා පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය, ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා ජනවාරි මාසයේ දී නිරත වූ සංචාරය, ඕස්ට්‍රේලියාවේ ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු කැරන් ඇන්ඩෘස් මැතිනිය දෙසැම්බර් මාසයේ දී නිරත වූ සංචාරය, චීන ආරක්ෂක අමාත්‍ය ජෙනරාල් වෙයි ෆෙංගේ මැතිතුමා අප්‍රේල් මාසයේ දී නිරත වූ සංචාරය, රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ලේකම් නිකොලොයි පැටෘෂෙව් මහතා නොවැම්බර් මාසයේ දී නිරත වූ සංචාරය, ඉන්දීය විදේශ ලේකම්වරයා ඔක්තෝබර් මාසයේ දී නිරත වූ සංචාරය, එක්සත් ජාතීන්ගේ දේශපාලන, සාමය ගොඩනැගීම සහ සාමය ගොඩනැගීමේ දෙපාර්තමේන්තුවේ සහකාර මහලේකම් ඛාලිඩ් ඛිආරි මහතා නොවැම්බර් මාසයේ දී නිරත වූ සංචාරය, ඉන්දීය යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී ඔක්තෝබර් මාසයේ දී නිරත වූ සංචාරය, එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ටොමෝයා ඔබෝකාටා මහතා නොවැම්බර් මාසයේ දී නිරත වූ සංචාරය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සඳහා එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම්, ආසියා සහ පැසිෆික් කලාපය සඳහා UNDP කලාපීය කාර්යාංශයේ සහකාර පරිපාලක සහ අධ්‍යක්ෂ කන්නි වින්නරාජා මහත්මිය දෙසැම්බර් මාසයේ දී නිරත වූ සංචාරය අයත් විය.

මෙම වසර තුළදී, අපගේ සහයෝගීතාව වඩාත් සමීප මට්ටමකට ගෙන ඒම සඳහා නිරන්තර මැදිහත්වීම් තුළින් කොළඹ සිටින දූත මණ්ඩල ප්‍රධානීන් සමඟ අන්තර්ක්‍රියා ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ප්‍රයත්න දැරීය. මේ සඳහා ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් විදේශ අමාත්‍යතුමා විසින් ඉස්ලාමීය රාජ්‍ය දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා කොළඹ දී අන්‍යෝන්‍ය අන්තර්ක්‍රියා අංගයක් පැවැත් වූ අතර, ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස එක් වූ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ද එම අවස්ථාව සඳහා සහභාගී විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවණතා පිළිබඳව නේවාසික රාජ්‍යතාන්ත්‍රික බළකාය දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මෙම කාලය තුළ දී රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා කිහිපයක් ද පවත්වන ලදී.

අනාගතයේ දී ස්පාඤ්ඤයේ, රුමේනියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කොල්කටා (ඉන්දියාව) සහ චෙංඩු (චීනය) හි කොන්සල් ජනරාල් කාර්යාල විවෘත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීම ද

පසුගිය වසරේ දී සිදු විය. පවතින ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් පුළුල් කිරීමේ අදහසින් යුතුව, 2021 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව ලිච්ටෙන්ස්ටයින් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කළේය.

කරුණු සලකා බැලීමෙන් අනතුරුව, විදේශ අමාත්‍යාංශය එහි විදේශයන්හි පිහිටි දූත මණ්ඩල/දූත කාර්යාල තුනක්, එනම් නයිජීරියාවේ අබුජා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සහ සයිප්‍රසයේ නිකොසියා හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය 2021 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි තාවකාලිකව වසා දැමීමට තීරණයක් ගෙන ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති මෙම තීරණය විදේශ අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල හා දූත කාර්යාල ජාලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක කොටසකි. ගෝලීය වසංගතය හේතුවෙන් එල්ල වී ඇති බරපතල ආර්ථික අභියෝග හමුවේ, ද්විපාර්ශ්වික සබඳතා ඵලදායී ලෙස පවත්වාගෙන යාම සහතික කරන අතරම, විදේශයන්හි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල / දූත කාර්යාල ද නඩත්තු කිරීම හා සම්බන්ධ වියදම් අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය විදේශ සංචිත සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරේ. තවද, අමාත්‍යාංශය විසින් දූත මණ්ඩලවල සහ අමාත්‍යාංශයේ සිය කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව තාර්කිකකරණය කිරීමේ අභ්‍යාසයක් ආරම්භ කොට ඇති අතර, එය දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

වසංගතය පැවතියද, ද්විපාර්ශ්වික/දේශපාලන උපදේශන කිහිපයක කොටස්කරුවෙකු වීමට සහ සලකා බලන කාල සීමාව තුළ පැවති ප්‍රධාන රැස්වීම් කිහිපයකට සහභාගී වීමට ශ්‍රී ලංකාව සමත් විය. ජනවාරි මාසයේදී පැවති යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 23 වැනි සැසිවාරය, පෙබරවාරි මාසයේදී පැවති ජපාන-ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සංවාදයේ 2 වැනි සැසිවාරය, පෙබරවාරි මාසයේදී පැවති පාකිස්ථාන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 12 වැනි සැසිවාරය, අප්‍රේල් මාසයේදී පැවති ශ්‍රී ලංකා-නවසීලන්ත නිල උපදේශන, ජුනි මාසයේදී පැවති ඉතියෝපියාවේ විදේශ අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික උපදේශන1 වැනි සැසිවාරය, ජුනි මාසයේදී පැවති තුර්කිය සමඟ ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ 2 වැනි ඒකාබද්ධ කොමිසම, ජුනි මාසයේදී පැවති ශ්‍රී ලංකාව සහ රුසියාව අතර වෙළඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය කොමිෂන් සභාව, ජුනි මාසයේදී පැවති බංගලාදේශ - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම 1 සහ 2 වටවල 1 වැනි වටය, ජූලි මාසයේදී පැවති ජර්මනිය සමඟ විදේශ කාර්යාල උපදේශන (FOC) පළමු වටය, සැප්තැම්බර් මාසයේදී චීනය සමඟ පැවති ඒකාබද්ධ ආර්ථික වෙළඳ කොමිසමේ 7 වැනි සැසිවාරය, ඔක්තෝබර් මාසයේදී පැවති සංවර්ධන සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම, ඔක්තෝබර් මාසයේදී පැවති රුසියාව සමඟ විදේශ කාර්යාල උපදේශන, ඔක්තෝබර් මාසයේ දී පැවති ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම, ජූලි මාසයේදී පැවති ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ (VNR) 2 වැනි සම්පාදනය ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව සූදානම් කිරීම සඳහා වන ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්, නොවැම්බර් මාසයේ දී පැවති එහි 2 වැනි වටය, ඔක්තෝබර් මාසයේදී බහරේනය සමඟ පැවති දේශපාලන උපදේශනවල පළමු වටය යනාදිය සඳහන් කළ යුතුය.

**බහුපාර්ශ්වීකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවේශය**

සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය සහ ආර්ථික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් යුතුව, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහා මෙම කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව සහභාගී විය. නොබැඳි ව්‍යාපාරයේ (NAM) ආරම්භක සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව නොබැඳි ව්‍යාපාරයේ ක්‍රියාකාරී සහභාගීත්වය අඛණ්ඩව පවත්වාගෙන යමින්, ජාත්‍යන්තර ප්‍රජාවේ වගකිවයුතු සාමාජිකයෙකු ලෙස එහි ජාත්‍යන්තර කැපවීම් තහවුරු කර ඇති අතර, පොදුරාජ්‍ය මණ්ඩලයීය සාමාජිකයෙකු ලෙස රාජ්‍යයන් සමඟ, කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංගමය (SAARC), බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය (BIMSTEC), ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IORA), ආසියානු සංවර්ධන බැංකුව (ADB), ෂැංහයි සහයෝගිතා සංවිධානය (සංවාදයක් ලෙස හවුල්කරු) සහ කොළඹ ක්‍රමය සහ තවත් ජාත්‍යන්තර සංවිධාන කිහිපයක් සමඟ අඛණ්ඩව කටයුතු කරයි.

සමාලෝචිත කාල සීමාව තුළ දී ශ්‍රී ලංකාව ව්‍යවස්ථාපිත විධි නියෝග සහ නීති පද්ධතියට අනුකූලව මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අඛණ්ඩව සිදු කළ අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර ප්‍රජාව හරහා ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සමඟ අඛණ්ඩව සහ ස්ථාවර ලෙස සම්බන්ධ වීම වැඩි දියුණු කළේය. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන රැස්වීම්වලට සහභාගී වීමට අමතරව, විදේශ අමාත්‍යාංශය, අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණයෙන් විශ්ව කාලාන්තර සමාලෝචනයට (UPR) ප්‍රතිචාර දැක්වීමට ක්‍රියා කරන අතර, මූලික එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ගිවිසුම් 9 ක් යටතේ අඛණ්ඩව වාර්තා කිරීමේ වගකීම්, මානව හිමිකම් පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම, සහ විද්‍යා හා තාක්ෂණ, සමාජ-ආර්ථික ක්ෂේත්‍ර යනාදී ක්ෂේත්‍රවල බහුපාර්ශ්වික නියැලීමේ වේග පවත්වා ගෙන ගියේය.

මානව හිමිකම් කවුන්සිලයේ දී, ශ්‍රී ලංකාව මීට පෙර භාරගත් කැපවීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව මානව හිමිකම් කවුන්සිලය වෙත දන්වා සිටියේය. අමාත්‍යාංශය විසින් 2021 සැප්තැම්බර් මාසයේ දී ජිනීවා හි පැවති 48 වැනි මානව හිමිකම් කවුන්සිල සැසියේ දී ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිබඳව සම්බන්ධීකරණය කරන ලදී. ගරු විදේශ අමාත්‍යවරයා විසින් පටිගත කරන ලද වාචික ප්‍රකාශයක් ද සිදු කරන ලදී. මෙම ප්‍රයත්නවල දී ශ්‍රී ලංකාව විසින් මුහුණ දෙන ලද විශාලතම අභියෝගයක් වූයේ අසත්‍ය තොරතුරු ප්‍රචාරය වීමට එරෙහිව කටයුතු කිරීම, වාර්තාව නිවැරදි කිරීම සහ සිදුවීම් පිළිබඳ නිරවද්‍ය, විෂය මූලික සහ සත්‍ය විස්තරයක් ප්‍රක්ෂේපනය කිරීමයි.

සංහිඳියාව සහ මානව අයිතිවාසිකම් බැඳීම් සහතික කිරීම සඳහා මෙම අමාත්‍යාංශය අධිකරණ අමාත්‍යාංශය සහ අනෙකුත් දේශීය රේඛීය නියෝජිතායතන සහ අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP), වන්දි ගෙවීමේ කාර්යාලය (OR), ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය (ONUR) වැනි අදාළ බලධාරීන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගිවිසුම් බැඳීම් සපුරාලීම සඳහා, විදේශ අමාත්‍යාංශය විසින් 2021 අප්‍රේල් මාසයේදී රේඛීය අමාත්‍යාංශ/නියෝජිත ආයතන 20 ක් සමඟ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් කැඳවන ලදී. මූලික මානව හිමිකම් ගිවිසුම් 09 සහ විකල්ප ප්‍රොටෝකෝල 02 සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම සඳහා කේන්ද්‍රස්ථානයක් නම් කරන ලෙස සෑම ආයතනයකින්ම ඉල්ලා සිටින ලදී.

ජාත්‍යන්තර මානව හිමිකම් වාර්තා කිරීමේ වගකීම්වල දී සිවිල් සමාජය සමඟ සක්‍රීය අන්තර්ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීම සඳහා වූ අතිගරු ජනාධිපතිතුමාගේ කැපවීමට අනුකූලව, මෙම අමාත්‍යාංශය ගරු විදේශ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සිවිල් සමාජ සංවිධාන සමඟ උපදේශන කිහිපයක් පැවැත්විය. සිවිල් සමාජයට අදාළ සියලු අංශ සහ රාජ්‍ය සංවිධාන සමඟ එහි කටයුතු සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා 2021 නොවැම්බර් මාසයේදී රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය විදේශ අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගෙන එන ලදී. මෙය සමාජ සංවර්ධනයට අදාළව සිවිල් සමාජය ගැටළු විසඳීමට මෙන්ම මානව හිමිකම් සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් ඔවුන් සම්බන්ධ කර ගැනීම සඳහා රජය ගෙන ඇති තිරසාර පියවර පිළිබඳ ප්‍රකාශනයකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අදාළ පාර්ශ්වකරුවන් සමඟ නැවත සමාලෝචනය කිරීම සහ එම සමාලෝචන ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවෙකු වී ඇති ජාත්‍යන්තර ප්‍රොටෝකෝලයන්ට අනුකූල බව සහතික කිරීම සම්බන්ධයෙන් සිදු කෙරෙන සාකච්ඡා සඳහා ද අමාත්‍යාංශය ක්‍රියාකාරී සහභාගීත්වය ලබා දුන්නේය.

සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික දෘෂ්ටිකෝණයකින්, ශ්‍රී ලංකාව 2021 දෙසැම්බර් මාසයේදී පැරිසියේ පැවති 'අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටු රැස්වීමේ' 16 වැනි සැසිවාරයේ මුලසුන දැරූ අතර, එහිදී 'දුම්බර රට කලාල' නිපදවීමේ ශිල්පය ලොව අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයක් ලෙස සටහන් කරන ලදී. මෙය ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික අත්කම් සහ කලා ශිල්ප පිළිබඳ ප්‍රධාන සන්ධිස්ථානයකි.

සලකා බලනු ලබන කාල සීමාව තුළදී බහුපාර්ශ්වික ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලාංකිකයන්ගේ අභිවෘද්ධිය සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) කෙරෙහි අවධානය යොමු කිරීම තීව්‍ර කරන ලදී. තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමට රජය විසින් සචේතනික තීරණයක් ගෙන ඇත. මෙම සන්දර්භය තුළ, ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුව යටතේ පිහිටුවන ලද මෙහෙයුම් කමිටුව තුළ විදේශ අමාත්‍යාංශය

සිය කාර්යභාරය ඉටු කළේය. 2021 තිරසාර සංවර්ධන වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව, 2021 දී එහි තිරසාර සංවර්ධන ඉලක්ක දර්ශක ශ්‍රේණිගත කිරීම ස්ථාන 7 කින් ඉහළ නංවා ඇති අතර, ලෝකයේ රටවල් 165 ක තිරසාර සංවර්ධන ඉලක්ක දර්ශක ශ්‍රේණිගත කිරීම් අතුරින් 87 වැනි ස්ථානයේ තබා ඇති බව ද සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පරිවර්තනීය මාර්ග සොයා ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකාවේ නොසැලෙන කැපවීම නැවත තහවුරු කිරීම සඳහා, "2030 න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම ඉදිරියට ගෙන යන අතරතුර දී කොවිඩ්-19 වෙතින් වඩා හොඳින් ගොඩ නැගීම" යන තේමාව යටතේ තිරසාර සංවර්ධන ඉලක්ක කවුන්සිලය සමඟ විදේශ අමාත්‍යාංශය 2021 නොවැම්බර් මාසයේ දී UNESCAP සංවිධානය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වැනි දකුණු ආසියානු සංසදය පැවැත්වීය. කොවිඩ්-19 වසංගතයේ සමාජ-ආර්ථික අභියෝග සංඛ්‍යාව මධ්‍යයේ 2021 වසර සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ මෙම ධනාත්මක ජයග්‍රහණ මඟින් 2030 න්‍යාය පත්‍රයේ ඉලක්ක ක්‍රමානුකූලව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය දක්වන කැපවීමේ මට්ටම පෙන්නුම් කරයි.

නිරායුධකරණ දෘෂ්ටිකෝණයෙන් බලන කල, මේ වසරේ දී න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ගිවිසුමට අත්සන් තැබීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මෙම අමාත්‍යාංශයට ලැබුණු අතර, 1996 දී අත්සන් තබන ලද විස්තීර්ණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම පිළිබඳ නිරීක්ෂණ අපරානුමත කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට අහිතකර තොරතුරු පිළිබඳව ප්‍රතිවිරෝධතා දැක්වීම**

2009 දී අවසන් වූ සන්නද්ධ ගැටුම සම්බන්ධයෙන් සාවද්‍ය නිවේදන සහ පදනම් විරහිත ප්‍රකාශයන්ට එරෙහිව සටන් කිරීමේ අභියෝගයට ශ්‍රී ලංකාව අඛණ්ඩව මුහුණ දෙමින් පවතී. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) ශේෂයන් සහ ඩයස්පෝරාවේ එල්ටීටීඊ හිතවාදී කොටස්, එල්ටීටීඊ මතවාදයට සහය දැක්වීම සඳහා විරෝධතා සහ ව්‍යාපාර දියත් කළ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට කැළලක් ඇති කරමින් වැරදි තොරතුරු පතුරුවා හැරියේය. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතාවලට පටහැනි, මෙම ගැටළු සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය ක්‍රියාකාරීව, එහෙත් රාජ්‍යතාන්ත්‍රික ලෙස කටයුතු කළ අතර, විවිධ කාරණා සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ගෙන් එල්ල වූ බලපෑම් රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාමාර්ග හරහා ඵලදායී ලෙස හසුරුවන ලදී.

මෙම කාලසීමාව තුළ දී විදේශ භූමියේ සිදුවන මෙවැනි ක්‍රියාවන්ට එරෙහිව අමාත්‍යාංශය සිය දැඩි විරෝධය පළ කළේය. 2021 මැයි 18 වැනි දින ඇමරිකා එක්සත් ජනපදයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන ලද 413 වැනි එල්ටීටීඊ හිතවාදී දෙමළ ඩයස්පෝරාව විසින් දියත් කරන ලද යෝජනාවට එරෙහි සාමූහික ප්‍රතිචාරය මෙම අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. කැනඩාවේ දෙමළ ජන සංහාර අධ්‍යාපන සතිය පිළිබඳ ඔන්ටාරියෝ පළාත් පනත් කෙටුම්පත-104 සඳහා අමාත්‍යාංශය දැඩි ලෙස විරුද්ධ වෙමින් කැනේඩියානු රජයට කරුණු ඉදිරිපත් කළ අතර, ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් සංහිඳියාව සහ වගවීම යන ක්ෂේත්‍රවල වර්තමාන ධනාත්මක වර්ධනයන් පිළිබඳව මෙම රටවල ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම සඳහා කටයුතු කළේය.

එල්ටීටීඊ තහනම ඉවත් කිරීම සඳහා එල්ටීටීඊයේ ඉතිරි වූ කොටස් සහ එහි ආධාරකරුවන් විසින් වරින් වර කරන ලද ආයාචනාවලට එරෙහිව ශ්‍රී ලංකාව අඛණ්ඩව ඵලදායී ලෙස කටයුතු කොට ඇති අතර, යුරෝපා සංගමයේ සහ එක්සත් රාජධානියේ එල්ටීටීඊය අප-ලැයිස්තුගත කිරීම තහවුරු කිරීමට සමත් විය.

2021 ජූනි මාසයේ ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳ යුරෝපීය පාර්ලිමේන්තුවේ යෝජනාවට ප්‍රතිචාර වශයෙන් සහ සාමාන්‍යකරණය කරන ලද මනාප ක්‍රමය යටතේ අදාළ වන ජාත්‍යන්තර සම්මුතීන් 27 ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා සංගමයේ (EU) ජීඑස්පී+ නිරීක්ෂණ කණ්ඩායමේ නිරීක්ෂණවලට ප්‍රතිචාර වශයෙන්, මෙම වසරේ සැප්තැම්බර් මාසයේදී ජීඑස්පී+ හි විදේශ අමාත්‍යාංශය සිය දූත මණ්ඩල ජාලයේ සහ දේශීය පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව යුරෝපා සංගමයේ ජීඑස්පී+ ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ ක්‍රියාවලිය

පිළිබඳ සිය නිරීක්ෂණ ඉදිරිපත් කළේ ය. ප්‍රතිසන්ධානයේ ප්‍රගතිය, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සමාලෝචනය, සිවිල් සමාජය සමඟ සම්බන්ධ වීම, තිරසාර සංවර්ධන ඉලක්ක 16 මුලපිරීම සහ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාවේ සහයෝගීතාවය පිළිබඳ ප්‍රගතිය පිළිබඳව යුරෝපා සංගමය දැනුවත් කිරීම සඳහා ද ශ්‍රී ලංකාව මෙය අවස්ථාවක් කර ගත්තේය.

ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ආරක්ෂක ජාල ගොඩනැගීමේ අරමුණින් යුතුව, මෙම අමාත්‍යාංශය රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ද්විපාර්ශ්වික, කලාපීය හා ජාත්‍යන්තර ජාල සංවර්ධනය කළේය: යුරෝ ජස්ට් සමඟ කේන්ද්‍රීය ස්ථාන පිහිටුවීම සඳහා පහසුකම් සැලසීම, යුරෝපෝල් සමඟ විධිමත් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම, ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ ගෝලීය සන්ධානයේ අයිඑස් සංවිධානයට අරමුදල් සැපයීමට එරෙහි (සීඅයිඑෆ්පී) ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමට ශ්‍රී ලංකාව නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වීම, අන්තර්ජාලය හරහා ත්‍රස්තවාදී අන්තර්ගතයට සහ රැඩිකල්කරණයට එරෙහිව සටන් කිරීමට ක්‍රියා කිරීමට කැඳවීම පිළිබඳ ක්‍රයිස්ට්චර්ච් හි පැවති 2 වැනි සමුළුවට සහභාගී වීම, ත්‍රස්තවාදය සම්බන්ධ සහයෝගීතාව පිළිබඳ බංග්ලාදේශය, පිලිපීනය සහ ජර්මනිය සමඟ ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුම්වලට එළඹීම, දේශීය ආයතනවල ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් කිහිපයක් ආරම්භ කිරීම, ත්‍රස්තවාදී අන්තර්ගතයන්ට එරෙහිව සටන් කිරීමේ උපාය මාර්ගයක් සම්බන්ධීකරණය කිරීම යනාදිය වැනි සමහර ක්‍රියාමාර්ග සඳහන් කළ යුතුය. තව දුරටත්, විදේශ අමාත්‍යාංශය විසින් 2021 මාර්තු මාසයේදී නිව්යෝර්ක් හි පැවති ජාත්‍යන්තර ආරක්ෂාව (OEWG) සන්දර්භය තුළ තොරතුරු සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්ධනයන් පිළිබඳ විවෘත-අවසන් ක්‍රියාකාරී කණ්ඩායම පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය හා නියැලීම සම්බන්ධීකරණය කරන ලදී. උපාය මාර්ගික සන්නිවේදන ඒකකයක සහය ඇතිව ත්‍රස්ත මර්දන සහ ජාත්‍යන්තර ආරක්ෂක අංශය සහ මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය ශක්තිමත් කිරීම තුළින්, විදේශීය භූමියේ සිදුවන ශ්‍රී ලංකාවේ අඛණ්ඩතාවයට එරෙහි ඕනෑම ක්‍රියාමාර්ගයක් සඳහා විසඳුම් සෙවීම පිණිස අමාත්‍යාංශය සිය ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීමට ද උත්සාහ දරා ඇත.

**තිරසාර සාගර සහ පරිසරය**

2000-2019 ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව 23 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කොට ඇති දූපත් ජාතියක් ලෙස, ක්‍රියාකාරී දේශගුණික ධනාත්මක විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකාව ස්ථාවරයක් ගෙන ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ දැක්මට අනුකූලව, දේශගුණික විපර්යාස සඳහා හරිත හා තිරසාර විසඳුම් සඳහා උත්සාහ කරන රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රක්ෂේපණය කිරීමට ද අමාත්‍යාංශය සිය ක්‍රියාමාර්ගය යළි සකස් කළේය. නොවැම්බර් මස පැවති UNFCCC CoP-26 සමුළුවට සහභාගී වීම සඳහා ගරු විදේශ අමාත්‍යවරයා සමඟ ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ හි එතුමා නිරත වූ සංචාරයේදී, ලෝක නායකයින් විසින් හදිසි ගෝලීය දේශගුණික ක්‍රියාමාර්ග සඳහා කැපවීමේ වැදගත්කම එතුමා අවධාරණය කළේය. 2050 වන විට ශ්‍රී ලංකාව නව ගල් අඟුරු බලශක්ති ධාරිතා ගොඩනැගීම අත්හිටුවන බවත්, කාබන් මධ්‍යස්ථතාව ළඟා කර ගැනීම ඉලක්ක කර ගන්නා බවටත් කළ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශය ජාත්‍යන්තර ප්‍රජාවගේ ප්‍රසාදයට ලක් විය. තවද, දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට අත්සන් තබා ඇති ශ්‍රී ලංකාව, 2030 වන විට බලශක්ති සැපයුමෙන් 70% ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් උත්පාදනය කිරීම සඳහා කැපවී සිටී.

දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රයත්නයන්ට මෙම අමාත්‍යාංශය සහභාගී වී ඇති අතර, යටිතල පහසුකම්, ජීවනෝපාය සංවර්ධනය, පාලනය, අධ්‍යාපනය, කර්මාන්ත, බලශක්ති, කෘෂිකර්මය, මානව සම්පත් සංවර්ධනය, රාජ්‍ය පරිපාලනය ඇතුළු පරිසරය ආශ්‍රිත ක්ෂේත්‍රවල ව්‍යාපෘති සඳහා සංවර්ධන ආධාර ලබා ගැනීමේ මුල පිරීම් කිහිපයක් සම්බන්ධීකරණය කොට ඇත. පුත්තලම පුබුදුගම කඩොලාන භාරකාර වැඩසටහන, ජාතික සබ්මැරීන් කේබල් ප්‍රත්‍යස්ථතාව සහ ආරක්ෂණ රාමුවක් සැකසීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති නායකත්ව කාර්යභාරය - කැළි කසළ සම්බන්ධ පොදුරාජ්‍ය මණ්ඩලීය වැඩසටහන (CLiP) පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම වැනි වැදගත් ජයග්‍රහණ සඳහන් කළ යුතුය. මෙම කාල පරිච්ඡේදය තුළ, ජාත්‍යන්තර මුහුදු පතුලේ අධිකාරිය (ISA) ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වීම සඳහා ජාතික කේන්ද්‍රස්ථානයක් නම් කිරීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගනිමින් ISA සමඟ සමීපව කටයුතු කිරීමට කටයුතු කරන ලදී.

මිනිසා විසින් සිදු කරන ලද ව්‍යසන හේතුවෙන් සිදුවන පරිසර දූෂණයට මුහුණ දීමේ සමකාලීන අභියෝගවලට මුහුණ දීම සඳහා විදේශ අමාත්‍යාංශය පියවර ගණනාවක් ගෙන ඇති අතර, 2021 දී සිදු වූ එම්වී එක්ස්ප්‍රස් පර්ල් නෞකා ව්‍යසනයට අදාළ කරුණු සඳහා විදේශ රටවලින් සහ සංවිධානවල සහාය ලබා ගැනීමට සහය විය. මෙවැනි අර්බුදකාරී අවස්ථාවන්හිදී ජාත්‍යන්තර සහයෝගය සම්බන්ධීකරණය කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් වැදගත් වේ.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ වැඩි දියුණු කළ කලාපීය මැදිහත්වීම**

සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, කාලීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ සියලු අවධානය ඒකාබද්ධ කරමින්, විදේශ අමාත්‍යාංශයේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන (EDP) ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ සමමුහුර්ත වන පරිදි නැවත හැඩගස්වා ඇත. ආර්ථික හවුල්කාරිත්වය සහ කලාපීය ආර්ථික සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා කැප වූ කලාපීය සහයෝගීතා රාජ්‍ය අමාත්‍යාංශය, ආර්ථික සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ආසියානු සහ අප්‍රිකානු රටවල් සමඟ නව අපේක්ෂාවන් සොයමින් වෙළඳාම, ආයෝජන, ශ්‍රම වෙළඳපොලවල්වල පවතින අවස්ථා පුළුල් කිරීම සඳහා ස්ථිර ක්‍රියාමාර්ගයක් ගන්නා ලදී. මෙම අමාත්‍යාංශ දෙකම එක්ව, රේඛීය ආයතන සහ දූත මණ්ඩල ජාලය සමඟ සාකච්ඡා කොට, අපනයන ගොන්න විවිධාංගීකරණය කිරීම සහ සංක්‍රමණික ශ්‍රම/විදේශ රැකියා පුළුල් කිරීම හා ඉහළ නැංවීම සඳහා මුලපිරීම් මාලාවක් 2021 දී ආරම්භ කරන ලදී.

විදේශයන්හි ඵලදායි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ගෝලීය වසංගතය විසින් නිර්මාණය කරන ලද අහිතකර තත්ත්වයන් පැවතිය ද, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ප්‍රධාන වශයෙන් අතථ්‍ය වේදිකාවල වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසූ අතර, යථාර්ථවාදී ජයග්‍රහණ කරා ළඟා වීම පිණිස දූත මණ්ඩල සඳහා සංචාරක, වෙළඳ (අපනයන), විදේශ රැකියා සහ ආයෝජන පිළිබඳ ඉලක්ක තැබීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශය දිගටම පවත්වාගෙන ගියේය. වරාය නගරයේ පර්යේෂණ සහ සංවර්ධන අවධානය යොමු වී ඇති ක්ෂේත්‍ර සඳහා ආයෝජන දිරිමත් කිරීමට දූත මණ්ඩලවලට උපදෙස් දී ඇත. දැනටමත් ස්ථාපිත වෙළඳපල ඒකාබද්ධ කරමින් ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්ට විදේශ වෙළඳපොලවල් වෙත පිවිසීමට ඵලදායී ලෙස සහාය දැක්වීමට සහ පහසුකම් සැලසීමට අපගේ දූත මණ්ඩල නැවත සකස් කර ඇත.

දේශීය පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් දූත මණ්ඩල විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයක් මඟින් මෙම දුෂ්කර කාලවලදී නව අවස්ථා සොයා ගැනීමට උපකාර වූ අතර, එමඟින් කාර්මික සැපයුම් දාම ස්ථායීව සහ විවෘතව පවත්වාගෙන යාමට උපකාරී විය. මෙම පියවර මඟින් දේශීය ආර්ථික ප්‍රකෘතිය සහ සමාජ සංවර්ධනය සිදුකෙරෙන මෙම කාලසීමාවේ දී ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම සඳහා උපකාරී වී ඇත.

බහුපාර්ශ්වික ආර්ථික රාජ්‍යතාන්ත්‍රික දෘෂ්ටිකෝණයකින්, ශ්‍රී ලංකාව මෙම කාලපරිච්ඡේදය තුළ දී කලාපීය සංවිධාන සහ මුලපිරීම් කිහිපයක නායකත්ව භූමිකාවන් ද සිදුකළේය. බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (BIMSTEC) මුලසුන දරන රට ලෙස, ශ්‍රී ලංකාව 2021 අප්‍රේල් 1 වන දින ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ විශේෂ සැසිවාරයට පෙර 17 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීම පැවැත්වීය. මෙම අමාත්‍යාංශය විසින් අනෙකුත් ප්‍රධාන රැස්වීම් 4 ක් ද පවත්වන ලදී. මෙම රැස්වීම්වලදී, බිම්ස්ටෙක් ප්‍රඥප්තිය, අංශ තාර්කිකකරණය සහ බිම්ස්ටෙක්හි උප අංශ වැනි ප්‍රධාන කරුණු පිළිබඳ කටයුතු අවසන් කරන ලදී. 2022 වසර මුල් භාගයේ දී 5 වැනි බිම්ස්ටෙක් සමුළුව ශ්‍රී ලංකාව විසින් පැවැත්වීමට නියමිත අතර, එහි සභාපතිත්වය තායිලන්තයට ලබාදෙනු ඇත.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ දී, ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (IORA) ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය ලෙස විදේශ අමාත්‍යාංශය, 2021 නොවැම්බර් මස 21 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී 2021/2023 කාලසීමාව සඳහා IORA හි උප සභාපති තනතුර භාර ගන්නා ලදී. එය සමුද්‍ර නැව් මාර්ග සහ සාගර අවකාශය දූෂණය ආශ්‍රිත ව්‍යසනවලින් ආරක්ෂා කර ගැනීම සඳහා සාමූහික ක්‍රියාමාර්ගයක් ඉල්ලා සිටියේය. තවද, 2021 දෙසැම්බර් මාසයේදී අබුඩාබි හි පැවති 5 වන ඉන්දීය සාගර සමුළුව - IOC 2021 දී ගරු විදේශ අමාත්‍යවරයා ඉන්දියන් සාගරයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට ශ්‍රී

ලංකාවේ උනන්දුව ප්‍රකාශ කිරීමෙහිලා වැදගත් විය. ශ්‍රී ලංකාව ඒ සඳහා ප්‍රමුඛ රට ලෙස සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂාව යන ක්ෂේත්‍රයෙහි ප්‍රධාන භූමිකාවක් අඛණ්ඩව ඉටු කළ අතර, 2021 මාර්තු 18 - 19 දිනවල දී සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ IORA ක්‍රියාකාරී කණ්ඩායමේ (WGMSS) 02 වැනි රැස්වීම සඳහා සත්කාරකත්වය සපයන ලදී.

2021 අගෝස්තු මාසයේ දී කොළඹ ක්‍රමයේ 47 වැනි උපදේශක කමිටු රැස්වීම (CCM) සඳහා ශ්‍රී ලංකාව අතථ්‍ය ලෙස සත්කාරකත්වය ලබා දුන් අතර, පරිසරය සහ දේශගුණික විපර්යාස වැඩසටහන යටතේ 'තිරසාර හරිත නගර ගොඩනැගීම සහ හරිත අවකාශය වැඩි කිරීම' යන විෂය ක්ෂේත්‍රයට නායකත්වය දීම සඳහා ශ්‍රී ලංකාව ප්‍රතිඥා දුන්නේය. පිළිවෙලින් 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී පැවති කොළඹ සැලසුම් ස්ථාවර කමිටු රැස්වීමට සහ 304 වැනි කොළඹ ක්‍රමය සභාවට ද ශ්‍රී ලංකාව සහභාගි විය.

වගකිවයුතු ලෙස ශ්‍රමිකයන්ට ප්‍රභවය සලසන රටක් ලෙස ශ්‍රී ලංකාවේ කාර්යභාරය පිළිගනිමින්, අබුඩාබි සංවාදයේ මීළඟ සභාපතිවරයා පත් කිරීමට සම්මුතිය ගොඩනැගීම සඳහා සාකච්ඡා මෙහෙයවීමට ශ්‍රී ලංකාවට නියම වූ අතර, ශ්‍රමය සපයන රටවල් සමඟ පැවති සාකච්ඡා වට කිහිපයක් සම්මුති අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵලයක් ලබා දුන්නේය.

විදේශ අමාත්‍යාංශය සෘජුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිය දූත මණ්ඩල හරහා සත්කාරක රට සමඟ අන්තර් ක්‍රියා කිරීම, ශක්‍යතා සහිත සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම, වෙළඳ හවුල්කරුවන්, ආයෝජකයින් සහ අනෙකුත් සහභාගිවන්නන් සම්බන්ධ කර ගැනීම හා සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය තුළින් එහි සුන්දරත්වය සහ පොහොසත් උරුමය ප්‍රදර්ශනය කිරීම පිණිස ඩුබායි හි පැවැත්වෙන ලොව විශාලතම ජාත්‍යන්තර වේදිකාව වන Expo 2020 හි ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා පහසුකම් සලසා ඇත.

**මහජන කේන්ද්‍රීය සේවා සැපයීම සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කොවිඩ්-19 ගැටළු සඳහා කඩිනමින් ප්‍රතිචාර ලබා දීම**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රට වසා දමා තිබියදී ද අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය 2021 වසර තුළ දී බොහෝ දුරට මහජනතාව සඳහා විවෘතව පැවතුණි. මහනුවර, (2021.02.26) සහ ත්‍රිකුණාමලයේ (2021.03.13) සහ කුරුණෑගල (2021.07.27) ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල විවෘත කිරීමෙන් සේවා සැපයීම විමධ්‍යගත කිරීමට කටයුතු කරන ලදී. මෙය කොළඹ ප්‍රධාන කාර්යාලය, යාපනය සහ මාතර කාර්යාලවල දැනට පවතින සේවා මධ්‍යස්ථානවලට අමතරවය. සලකා බලනු ලබන කාල සීමාව තුළ දී ලිපි ලේඛන 121,050 ක් සත්‍යාපනය කිරීමෙන් කොන්සියුලර් අංශයට රුපියල් 92,288,900 ක සම්පූර්ණ ආදායමක් ලැබී ඇති අතර, පුද්ගලයන් 67,474 දෙනෙකුට කොන්සියුලර් සේවා සපයන ලදී. 2021 වසරේ දී පවුලේ සාමාජිකයන් / වින්දිතයින් 95 දෙනෙකු අතර බෙදා හැරීම සඳහා වන්දි වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 178.5 ක් පමණ අය කර ගෙන ඇත.

මෙම අංශය යටතේ ඇති එතෙර ශ්‍රී ලාංකික ඒකකය 2021 පෙබරවාරි මස සිට නැවත ක්‍රියාත්මක කොට ඇති අතර, වසංගත කාලපරිච්ඡේදය තුළ දී විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විමසීම්/ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම සඳහා දියත් කරන ලද "ශ්‍රී ලංකාව අමතන්න" මාර්ගගත ද්වාරය හැසිරවීමේ වගකීම ඊට පැවරී ඇත. මෙම අංශය දැන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක ස්වාධීන අංශයක් ලෙස ප්‍රතිස්ථාපනය කර ඇත.

කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා සහය වශයෙන්, වසංගතය අතරතුර දී ලෝකයේ විවිධ ප්‍රදේශවල අතරමං වූ ශ්‍රී ලාංකිකයින්ට අන්තර්කාලීන සහන සැලසීම සඳහා විදේශ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 6.4 ක මුදලක් ලබා දෙන ලදී. වියළි සලාක, අභ්‍යන්තර ප්‍රවාහනය, තාවකාලික නවාතැන්, ඖෂධ සහ සමහර අවස්ථාවල දී ගුවන් ටිකට්පත් සඳහා එම මුදල් වියදම් කොට ඇත.

මීට අමතරව, රැකියා අහිමි වූවන් සඳහා විකල්ප රැකියා අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම; සමාව ලබා දීම, වීසා විධිමත් කිරීම සහ දඩුවම් සහ දඩ මුදල් නිදහස් කිරීම වැනි සහන ක්‍රියාමාර්ග සැපයීම සඳහා අදාළ රජයන් සමඟ සාකච්ඡා කිරීම; විදේශ රාජ්‍යතාන්ත්‍රිකයින්ට නැවත පැමිණීමට/රැඳී සිටීමට පහසුකම්

සැලසීම සහ සංචාරක සීමාවන් හේතුවෙන් අතරමං වූ විදේශිකයන්ට උපකාර කිරීම; දූත මණ්ඩල ජාලය හරහා ලොව පුරා ඖෂධ, වෛද්‍ය උපකරණ, ආරක්ෂිත ආම්පන්න, එන්නත් විශාල ප්‍රමාණයක් සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රචාරණය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය සහාය විය. වෙනත් රටවල 'එන්නත් මූලික කර ගත් රාජ්‍යතාන්ත්‍රික' මුල පිරීම් සහ කොවැක්ස් පහසුකම හරහා ශ්‍රී ලංකාවට කිසිදු වියදමක් නොමැතිව එන්නත් ලබා ගැනීම වෙනත් රේඛීය නියෝජිතායතන සහ දූත මණ්ඩල ප්‍රධානීන් කිහිප දෙනෙකු සමඟ සහයෝගයෙන් යුතුව විදේශ අමාත්‍යාංශය විසින් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරන ලදී.

**අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය**

සලකා බලන කාල සීමාව තුළ දී, විදේශ අමාත්‍යාංශය තුළ පිරිවැය ඵලදායී, වගවීම සහ සේවක හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පරිපාලන හා මූල්‍ය ක්‍රියාවලීන් කිහිපයක් විධිමත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවලින් සමහරක් අතරට, ස්ථාන මාරු මාර්ගෝපදේශ සංශෝධනය කිරීම, ස්ථාන මාරු ක්‍රියාවලිය ද්වි-වාර්ෂිකව සිදු කිරීමට ඉඩ සලසන ස්ථාන මාරුවීම් විධිමත් කිරීම ඇතුළත් විය. අනෙකුත් කොන්දේසි අතර 'ප්‍රාදේශීය දුෂ්කරතා වර්ගීකරණය' මත පදනම් වූ තේරීම් ක්‍රියාවලියක් හඳුන්වා දීම, නිලධාරීන් අතර සාධාරණ ලෙස ස්ථානගත කිරීම් සිදුකිරීම හඳුන්වා දෙන ලදී. මෙම කාල සීමාව තුළ දී සියලුම සියරට පේරුවේ කාර්ය මණ්ඩල සඳහා දූත මණ්ඩල අතර හරස් පත්වීම් ලබා දීම හෝ වසර තුනකින් සේවා දිගු ලබා දීම නවතා දැමීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ස්ථිර ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

විදේශ දූත මණ්ඩලවල සියරට පේරුවේ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන අධ්‍යාපන දීමනා විධිමත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශය කටයුතු කළ අතර, වගකීම් බෙදාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ සහ වැඩි වගවීමක් හඳුන්වාදීමේ අරමුණින් යුතුව, එම නිලධාරියා විසින් දරුවන් දෙදෙනෙකු සඳහා 25% ක මුදලක් ගෙවීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. අමාත්‍යාංශ උපදෙස් මාලාවේ චක්‍රලේඛයක් හරහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත ස්ථානගත කර ඇති ස්වදේශීය නිලධාරීන් විසින් ආපසු පැමිණීමේ අවශ්‍යතාවය විධිමත් කිරීම සඳහා ද කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, අනෙකුත් විධායක සේවාවන්ට සමගාමීව ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු 16 ක් ඇති කිරීමේ ක්‍රියාවලිය දැන් සිදු කෙරේ. සේවයේ නියුතු වෘත්තීය වෘත්තීය රාජ්‍යතාන්ත්‍රිකයින් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා අවසන් වරට 2018 වසරේ ශ්‍රී ලංකා විදේශ සේවා නිළධාරීන් බඳවා ගැනීමෙන් පසුව, විවෘත තරඟ විභාගයක් මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නිළධාරීන් බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කොට ඇත. විදේශ දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා කළමනාකරණ සේවා නිලධාරීන් (MSO) සහ පුද්ගලික සහකාර නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ විභාග පැවැත්වීම සඳහා වන ගැසට් පත්‍රය පිලිබඳ කටයුතු අවසන් වෙමින් පවතී.

සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, දූත මණ්ඩල ප්‍රධානීන් තිස් එක් (31) දෙනෙකුගේ පත්වීම් සැකසීම සහ පහසුකම් සැපයීම සිදු කරන ලදී. දූත මණ්ඩල ප්‍රධානී තනතුරු සඳහා නාමයෝජනා අටක් (08) ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකා රජය සතුව දූත මණ්ඩල 26 ක දේපල 46 ක් පවතින අතර නයිරෝබි හි, ස්ටොක්හෝම් හි සහ කැන්බරා හි රජය සතු දේපල සංවර්ධනය/ ප්‍රතිසංස්කරණය කඩිනම් කිරීමට ක්‍රියා කරයි. රෝමයේ, මිලානෝ සහ සිංගප්පූරුවේ දූත මණ්ඩල සඳහා දේපල අත්පත් කර ගැනීම දැනට සිදු වෙමින් පවතී.

ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි නිශ්චිත විෂය ක්ෂේත්‍රයන්හි දූත මණ්ඩලවල මානව සම්පත්වල පවතින අඩුපාඩුකම්වලට පිළියම් යෙදීම සඳහා සහ විදේශ අමාත්‍යාංශයට සහාය දක්වන විශේෂඥ සංචිතය ශක්තිමත් කිරීම සඳහා, අමාත්‍යාංශ යාන්ත්‍රණයට නව සහයෝගීතාවයක් ගෙන ඒම පිණිස අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ බාහිර විශේෂඥතාව මුසු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතා

ඒකකයක් සහ උපාය මාර්ගික සන්නිවේදන ඒකකයක් පිහිටුවීම සඳහා අමාත්‍යාංශය පරිපාලන ක්‍රියා පටිපාටි විධිමත් කළේය.

සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් තුළ ක්‍රියාත්මක වීමට අවශ්‍ය කාර්යාල අවකාශය ඇතැම් අංශවලට ලැබෙන පරිදි කඩිනමින් අමාත්‍යාංශය එක් ගොඩනැගිලි පරිශ්‍රයක ස්ථාපනය කිරීම සඳහා ද කටයුතු කරමින් පවතී. මෙමගින් කොන්සියුලර් කටයුතු, ආර්ථික කටයුතු, පරිපාලනය සහ ගිණුම් හා විගණන අංශ පවත්වා ගැනීම පිණිස පුද්ගලික දේපලක දැනට භාවිත කෙරෙන ඉඩකඩ සඳහා වන කුලී පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇත. මෙම වසර තුළ දී අභ්‍යන්තර චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් සීමිත සම්පත් අරපිරිමැස්මෙන් සහ දූරදර්ශීව භාවිතා කිරීම තුළින් ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල වියදම් සීමා කිරීම සඳහා අමාත්‍යාංශය පියවර කිහිපයක් ගෙන ඇත. හැකි අවස්ථාවල දී රජය සතු දේපළ උපරිම ප්‍රයෝජනයට ගැනීම තුළින් සහ උකස් මගින් දේපළ අත්පත් කර ගැනීම හෝ/සහ සම්පූර්ණයෙන්ම මිලදී ගැනීම යනාදිය වැනි නව විකල්ප ගවේෂණය කිරීම තුළින් සියරට පේරුවේ නිලධාරීන්ගේ නිල නිවාස, චාන්සරි ගොඩනැගිලි සහ මහල් නිවාස සඳහා ගෙවන කුලී ගාස්තු අඩු කිරීමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. විදේශ විනිමය හිඟය හේතුවෙන් පුනරාවර්තන වියදම් අවම කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා ලබා දුන් නියෝජන දීමනාව තාවකාලිකව අත්හිටුවන ලදී.

තොරතුරු තාක්‍ෂණය ඵලදායි ලෙස යෙදවීම, මාර්ගගත ගිණුම්කරණ පැකේජ, ඉන්වෙන්ට්‍රි කළමනාකරණ මෘදුකාංග වැනි දූත මණ්ඩල/දූත කාර්යාලවල ඇතැම් ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම තුළින් එහි පුනරාවර්තන වියදම් තවදුරටත් අඩු කර ගැනීමේ හැකියාව පිළිබඳව අමාත්‍යාංශය සොයා බලයි. කෙසේ වෙතත් ඇතැම් තාක්ෂණික ගැටළු හේතුවෙන් ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වී ඇත. එසේ වුවද, පවතින ක්‍රියාවලීන් සරල කිරීම සඳහා නව විකල්ප සෙවීම සහ එහි අනාගත ක්‍රියාකාරකම් සඳහා ඩිජිටල් ක්‍රියාවලි භාවිත කිරීම තුළින් වියදම් අඩු කිරීමට හා මානව සම්පත් ධාරිතාව ඉහළ නැංවීමට මෙම අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කරනු ඇත. පවතින සම්පත් තුළ, අමාත්‍යාංශය සහ එහි දූත මණ්ඩල ජාලය උපරිම කැපවීමෙන් යුතුව රටේ විදේශ ප්‍රතිපත්තිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇත.

සමාප්තියක් ලෙස, කොවිඩ්-19 ගෝලීය වසංගතය සහ ලොව පුරා ආර්ථිකයන්හි හැකිලීම් හේතුවෙන් ඇති වන අභියෝග පැවතිය ද, 2021 වසරේ දී රටේ ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සහ එතෙර සිටින ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම මගින් රජයේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රමුඛතා තහවුරු කිරීමට විදේශ අමාත්‍යාංශය සමත් විය.

## කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේශනය - ජනතා කේන්ද්‍රීය රාජ්‍යතාන්ත්‍රිකභාවය

### කොවිඩ් 19 වසංගතය සඳහා විදේශ අමාත්‍යාංශයේ ප්‍රතිචාරය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ සුබසාධන කටයුතු සැලසීම, මිල දී ගත් හෝ පරිත්‍යාග කරන ලද වෛද්‍ය උපකරණ සහ එන්නත් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය, ඒවා බෙදා හැරීම සහ එන්නත් සහතික පිළිගැනීම ඇතුළු විදේශ රටවලට අදාළ කරුණු සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සඳහා 2020 මාර්තු මාසයේ දී විදේශ අමාත්‍යාංශය විසින් කොවිඩ්-19 ඒකකයක් ස්ථාපිත කරන ලදී.

විදේශ සංචාර අවශ්‍යතා සහ අනෙකුත් අදාළ විමසීම් පිළිබඳ තොරතුරු ශ්‍රී ලාංකිකයන්ට සැපයීම සඳහා මෙම කොවිඩ්-19 ඒකකය මගින් විශේෂ දුරකථන සබඳතා ක්‍රියාත්මක කෙරේ.

2021 වර්ෂයේ දී කොවිඩ් වසංගතය හමුවේ අතරමං වූ ශ්‍රී ලාංකිකයන්ට අතුරු සහන සැලසීම සඳහා, විදේශ අමාත්‍යාංශය විසින් කොවිඩ් සඳහා වෙන් කළ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 6.4 ක් ලබා දෙන ලදී. වියළි සලාක, අභ්‍යන්තර ප්‍රවාහනය, තාවකාලික නවාතැන්, ඖෂධ මෙන්ම ඇතැම් අවස්ථාවල ගුවන් ටිකට්පත් සඳහා ද මෙම අරමුදල වියදම් කොට ඇත.

ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන්නන් ලියාපදිංචි කිරීම සහ ඔවුන් සඳහා විශේෂ ගුවන් ගමන් සම්බන්ධීකරණය කිරීම තුළින් සියරට පැමිණවීමේ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් විදේශ අමාත්‍යාංශය විසින් විදේශයන් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා සපයන ලදී. 2021 වසරේ දී ශ්‍රී ලාංකිකයන් 116,000 කට අධික පිරිසක් ආපසු ගෙන්වා ගන්නා ලදී.

මෙම අමාත්‍යාංශය විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා කොවිඩ්-19 එන්නත් පරිත්‍යාග සහ එන්නත් ප්‍රසම්පාදන සඳහා පහසුකම් සැලසීය. චීනය සහ ඉන්දියාව (සහ කොවැක්ස් පහසුකම හරහා ඇමරිකා එක්සත් ජනපදය, ජපානය හා යුරෝපා සංගමය) විසින් සම්පූර්ණ වශයෙන් එන්නත් මිලියන 7.9 ක් ලබා දෙන ලදී. පරිත්‍යාග කරන ලද සහ මිලදී ගන්නා ලද වෛද්‍ය උපකරණ හා ඖෂධ සැපයීම සඳහා ද එමඟින් පහසුකම් සලසන ලදී. අද වන විට මෙම අමාත්‍යාංශය මගින් විදේශවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන්, විදේශීය රජයන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් සහ හිතවතුන්ගෙන් ලැබුණු වෛද්‍ය උපකරණ සහ අත්‍යාවශ්‍ය ඖෂධ තොග 130 කට වැඩි ප්‍රමාණයක් රජයේ රෝහල්වල කොවිඩ්-19 වාට්ටු සහ දැඩි සත්කාර ඒකක වෙත ලබා දී ඇත.

මෙරටට ප්‍රවේශ වීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට අදාළ වන කරුණු, සංචරණ සීමා ඉවත් කිරීම සහ එන්නත් සහතික අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විදේශවල රජයන් සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කොට ඇත. ශ්‍රී ලංකාව විසින් මෙතෙක් රටවල් 77 ක කොවිඩ්-19 එන්නත් සහතික පිළිගෙන ඇත.

විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් හිතවතුන් හරහා රැස් කරන ලද මුදල් පරිත්‍යාග සඳහා මෙම අමාත්‍යාංශය පහසුකම් සැලසූ අතර, ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථාපිත "ඉටුකම" කොවිඩ් අරමුදලට එම මුදල් බැර කරන ලදී. ඒ සඳහා 2021 වර්ෂයේ දී ලැබූ සමස්ත දායකත්වය ශ්‍රී.ලං.රු. මිලියන 15 කි.

මෙම අමාත්‍යාංශය විසින් විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහාය ඇතිව ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ සංචාර සඳහා අවශ්‍ය කොවිඩ්-19 එන්නත් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අඩංගු මාර්ගෝපදේශයක් සකස් කළ අතර, අදාළ සියලුම රේඛීය අමාත්‍යාංශ වෙත නිරන්තර යාවත්කාලීන කිරීම් ද සපයනු ලැබේ. මෙය 2021 ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී.

මෙම අමාත්‍යාංශය මගින් රාජ්‍යතාන්ත්‍රික බළකායේ සාමාජිකයන්ට සහ කොළඹ පිහිටි ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයන්ට කොවිඩ්-19 එන්නත ලබා දීම සඳහා මෙම කාලසීමාව තුළ දී පහසුකම් සලසා ඇත.

එන්නත් නැවත පිරවීමේ කම්හලක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වර්තමානයේ දී බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරයි.

**අමාත්‍යාංශයේ කොන්සියුලර් සේවා**

1981 අංක 04 දරණ කොන්සියුලර් කාර්ය පනතට අනුව සහ ඉන්පසු 2006 අංක 18 දරණ පනතේ සංශෝධනයට අනුව කොන්සියුලර් අංශය ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල පිහිටි එහි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල හරහා රට තුළ සහ විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ට සහාය වේ. ලිපි ලේඛන සත්‍යාපනය, නැවත මෙරටට ගෙන්වා ගැනීම, වන්දි ගෙවීම, විදේශයන්හි සිදුවන මරණ සහ අනෙකුත් යන අංශ පහ හරහා කොන්සියුලර් අංශය සිය කොන්සියුලර් සේවා සපයයි.

මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල, අදාළ ප්‍රදේශවල සහ ඊට තදාසන්න ප්‍රදේශවල පුරවැසියන්ට කොන්සියුලර් සේවා සැපයීම සඳහා පිළිවෙලින් 2021.02.26, 2021.03.13 සහ 2021.07.27 යන දිනවල දී විවෘත කරන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළ දී ලිපි ලේඛන 226,033 ක් සත්‍යාපනය කිරීමෙන් සහ පුද්ගලයන් 122,468 දෙනෙකු සඳහා සේවා සැපයීමෙන් කොන්සියුලර් අංශයට ලැබුණු මුළු ආදායම ශ්‍රී ලංකා රුපියල් 176,667,700/-කි.

උප්පැන්න, විවාහ, මරණ සහතික, අ.පො.ස. (සා./පෙ.) සහ අ.පො.ස. (උ./පෙ.) විභාග සහතික කාර්යක්ෂමව සහතික කිරීම පහසු කිරීම පිණිස විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e-DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීම සඳහා මෙම අංශය විසින් සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. මීට අමතරව, විදේශවල රැකියා සොයා යන අය සඳහා කාර්යක්ෂම සේවාවන් සැපයීම සඳහා අන්තර්ජාලය හරහා පොලිස් නිෂ්කාශන සහ පොලිස් වාර්තා සත්‍යාපනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීම පිණිස ශ්‍රී ලංකා පොලීසිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.


මෙම කාලසීමාව තුළ දී විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහාය ඇතිව පවුලේ සාමාජිකයන්/වින්දිතයන් 138 දෙනෙකු අතර වන්දි/මරණ වන්දි මුදල් සහ අනෙකුත් හිඟ මුදල් ලෙස බෙදා හැරීම සඳහා ආසන්න වශයෙන් ශ්‍රී.ලං.රු. මිලියන 276.4 ක මුදලක් අයකරගෙන ඇත.

මරණ 702 ක් (කොවිඩ් මරණ 149 ක් සහ කොවිඩ් නොවන මරණ 571 ක් ඇතුළුව) පිළිබඳව මරණ අංශය වෙත වාර්තා කරන ලද අතර, සමීපතම ඥාතීන්ගේ අනුමැතිය ඇතිව මෘත දේහ නැවත මෙරටට ගෙන්වා ගැනීමට/ භූමදාන කිරීමට හෝ ආදාහනය කිරීමට පහසුකම් සලසා ඇත. මියගිය විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ මරණ සහ පුද්ගලික දේපළ සම්බන්ධයෙන් දේශීය මරණ සහතික සහ වෙනත් අදාළ ලියකියවිලි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ලබා ගැනීමට මරණ අංශය සහාය වී ඇත.

නැවත ගෙන්වා ගැනීමේ අංශය විදේශයන්හි සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ පළාත් පාලන ආයතන සමඟ සෘජුව කටයුතු කරනු ලබන අතර, ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ ඉල්ලීම පරිදි විදේශයන්හි අතරමං වූ/ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකිකයන් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කරයි. එම කාලය තුළ දී බන්ධනාගාර ගත කරන ලද අවස්ථා 85 ක් ඇතුළුව නැවත මෙරටට ගෙන්වා ගැනීමේ සිද්ධීන් 878 ක් විය. ඉහත කාල සීමාව තුළ විදේශයක දී හෝ ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවෙන් පිටත දී අත්අඩංගුවට ගත් ශ්‍රී ලාංකික ධීවරයින් සහ ධීවර යාත්‍රා පිළිබඳ සිද්ධීන් කිහිපයක් පිළිබඳව කටයුතු කොට, ධීවරයින් සහ යාත්‍රා නිදහස් කර ගැනීමට සහය වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) ලියාපදිංචියකින් තොරව රැකියා සඳහා ශ්‍රී ලංකාව හැර ගිය අතරමං වූ/ අනාථ වූ ශ්‍රී ලාංකිකයන් සහ විදේශ අත්අඩංගුවේ පසුවන ශ්‍රී ලාංකිකයන් නැවත ගෙන්වා ගැනීමේ ඉල්ලීම් සඳහා ද මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.


සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ දී, අසාර්ථක වූ රැකවරණය පතන්නන් සඳහා නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට පහසුකම් සලසමින්, නැවත පිළිගැනීමේ සිද්ධි කළමනාකරණ පද්ධතිය (RCMS) යටතේ අයදුම්පත් 150ක් සැකසීමට මෙම අංශය විසින් පහසුකම් සලසා ඇත.


මෙම අංශයේ විවිධ අංශය මඟින්, පොලිස් නිෂ්කාශන සහතික නිකුත් කිරීම, විදේශ ගමන් බලපත්‍ර කටයුතු, විදේශ උපාධි සහතික සත්‍යාපනය, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට සහය වීම, විදේශවල දී ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය ලබා ගැනීමට සහය වීම, ධීවර යාත්‍රා නිදහස් කිරීම සඳහා සහය වීම, අතරමං වූ ධීවරයන් ආපසු ගෙන්වා ගැනීම, උප්පැන්න සහතික බෙදා හැරීම, පුරවැසි සහතික සම්බන්ධයෙන් සහය ලබා දීම, මරණ දණ්ඩන සම්බන්ධයෙන් කටයුතු කිරීම ආදිය ඇතුළු විවිධ කොන්සියුලර් කටයුතු හසුරුවන ලදී.




## 2021.01.01 සිට 2021.12.31 දක්වා කොන්සියුලර් ලිපිලේඛන සත්‍යාපන කටයුතු

| කොන්සියුලර් කාර්යාලය | හසුරවන ලද ලිපිලේඛන සංඛ්‍යාව | සේවය සපයන ලද පුද්ගලයින් සංඛ්‍යාව | උපදවන ලද ආදායම (රු.) |
|---|---|---|---|
| කොළඹ (මූ/කා) | 191,139 | 99,308 | 145,493,300.00 |
| යාපනය (ප්‍රා/කා) | 15,135 | 7,886 | 14,363,500.00 |
| මාතර (ප්‍රා/කා) | 4,418 | 3,428 | 3,489,100.00 |
| මහනුවර (ප්‍රා/කා) | 5,511 | 4,835 | 5,263,100.00 |
| ත්‍රිකුණාමලය (ප්‍රා/කා) | 3,352 | 2,651 | 2,867,600.00 |
| කුරුණෑගල (ප්‍රා/කා) | 6,478 | 4,360 | 5,191,100.00 |
| එකතුව | 226,033 | 122,468 | 176,667,700.00 |



**එතෙර ශ්‍රී ලාංකික අංශය**

එතෙර ශ්‍රී ලාංකික අංශය 2021 පෙබරවාරි මස සිට පිහිටුවා ඇති අතර, විශේෂයෙන් වසංගත තත්ත්වය තුළ සියරට පැමිණීම සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විමසීම්/ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම සඳහා දියත් කරන ලද "ශ්‍රී ලංකාව අමතන්න" (Contact Sri Lanka) මාර්ගගත ද්වාරය හැසිරවීමේ වගකීම ඊට පැවරී ඇත. 2021 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ "ශ්‍රී ලංකාව අමතන්න" මාර්ගගත ද්වාරය වෙත ලැබුණු විමසීම්/ ඉල්ලීම් 1800 කට අධික සංඛ්‍යාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට මෙම අංශය සමත් විය. මීට අමතරව, මෙම අංශය සහ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල වෙත සෘජුවම ලැබෙන විමසීම්/ ඉල්ලීම් සඳහා පහසුකම් සලසා ඇත. මෙම කාල සීමාව තුළ දී එවැනි විමසීම්/ ඉල්ලීම් 850 කට අධික ප්‍රමාණයකට පිළිතුරු සපයා ඇත.

මෙම අංශය මගින් සිරගෙවල්වල/ රැඳවුම් කඳවුරුවල සිටින ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලාංකික ප්‍රජාව/ ව්‍යාපාරික සංගම්, විදේශීය ශ්‍රී ලාංකිකයන් ප්‍රමුඛ ආගමික හා සංස්කෘතික සංවිධාන සම්බන්ධයෙන් දත්ත සමුදායක් පිහිටුවීම සඳහා තොරතුරු රැස්කර ඇත. මෙහි ඇතැම් තොරතුරුවලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ සහයෝගී අන්තර්ක්‍රියා ප්‍රවර්ධනය කිරීමට අදහස් කෙරේ.

මෙම අංශය විසින් ගරු විදේශ අමාත්‍යතුමා සහ විදේශ ලේකම්තුමා සමඟ අතථ්‍ය සාකච්ඡා පැවැත්වීම සඳහා ප්‍රධාන විදේශ දූත මණ්ඩල හඳුනාගෙන ඇත. මෙම සාකච්ඡා මාලාවේ පළමු රැස්වීම ගරු විදේශ අමාත්‍යවරයාට සිංගප්පූරුවේ සහ බෲනායි දරුස්සලාම් හි ආගමික, ව්‍යාපාරික සහ ප්‍රජා නායකයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීම සඳහා 2021 ජූලි 01 දින අතථ්‍ය ලෙස පවත්වන ලදී.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි සංක්‍රමණික සේවකයින්ට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සහාය ලබා දීම සඳහා හැකි සහාය ලබා දීමට මෙම අංශය කොළඹ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සමග සම්බන්ධීකරණය කොට ඇත. මේ සම්බන්ධයෙන් මධ්‍යගත දත්ත පදනමක් සංවර්ධනය කිරීම සඳහා වන කෙටුම්පත් සංකල්ප සටහනක් අමාත්‍යාංශයේ අදාළ අනෙකුත් අංශ හා පාර්ශ්වකරුවන් අතර බෙදා හැර ඇති අතර, එය 2022 ජුනි 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**ගෝලීය සබඳතා - ඉහළ මට්ටමේ සංචාර**

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මෙහි පැමිණි විදේශීය සම්භාවනීය අමුත්තන්

**රාජ්‍ය නායකයින්/ අග්‍රාමාත්‍යවරුන්**

| | |
|---|---|
| 01 | පාකිස්ථාන ඉස්ලාමීය ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන් මැතිතුමා 2021 පෙබරවාරි 23-24 දිනවල දී ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය |
| 02 | මාලදිවයින් ජනරජයේ අතිගරු ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මැතිතුමා 2021 ජූලි 23-24 දිනවල දී ශ්‍රී ලංකාවේ නිරත වූ පෞද්ගලික සංචාරය |
| 03 | මාලදිවයින් ජනරජයේ අතිගරු ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මැතිතුමා 2021 නොවැම්බර් 8-9 දිනවල දී ශ්‍රී ලංකාවේ නිරත වූ පෞද්ගලික සංචාරය |
| 04 | 2021 නොවැම්බර් 02 දින ඩාවූඩි බෝරා ප්‍රජාවගේ ලොවපුරා ආධ්‍යාත්මික නායක සියෙඩිනා මුෆාඩ්ඩාල් සයිෆුඩ්ඩින් සහෙබ් උතුමාණන්ගේ පැමිණීම |
| 05 | 2021 දෙසැම්බර් 30 දින සිට 2022 ජනවාරි 02 දිනවල දී මාලදිවයින් ජනරජයේ අතිගරු ජනාධිපති ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මැතිතුමා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය |

**විදේශ අමාත්‍යවරු සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරු**

| | |
|---|---|
| 01 | ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා 2021 ජනවාරි 05-07 දිනවල දී නිරත වූ සංචාරය. |
| 02 | පාකිස්ථානයේ විදේශ අමාත්‍ය ගරු මොහමඩ් කුරේෂි මැතිතුමා 2021 පෙබරවාරි 24 වැනි දින නිරත වූ සංචාරය. |

වෙනත් අමාත්‍යවරු

| | |
|---|---|
| 01 | මහජන චීන ජනරජයේ රාජ්‍ය මන්ත්‍රණ සභික හා ආරක්ෂක අමාත්‍ය ජනරාල් වෙයි ෆෙංහෙ මැතිතුමා 2021 අප්‍රේල් 27-29 දිනවල දී නිරත වූ සංචාරය |
| 02 | එක්සත් රාජධානියේ දකුණු ආසියාව හා පොදුරාජ්‍ය මණ්ඩලය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විම්බල්ඩන් හි අහ්මඩ් සාමිවරයා 2021 මැයි 24-26 දිනවල දී නිරත වූ සංචාරය |
| 03 | ඕස්ට්‍රේලියාවේ ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු කැරන් ඇන්ඩෲස් මැතිනිය 2021 දෙසැම්බර් 18-21 දිනවල දී නිරත වූ සංචාරය |

**අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමා 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී බැහැරට සිදුකළ සංචාර**

අතිගරු ජනාධිපතිතුමා

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| 1 | ඇමරිකා එක්සත් ජනපදය | 2021 සැප්තැම්බර් 18-26 | එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 76 වැනි සැසි වාරයට සහභාගී වීම සඳහා නිල සංචාරය |
| 2 | එක්සත් රාජධානිය, ස්කොට්ලන්තය | 2021 ඔක්තෝබර් 30 - නොවැම්බර් 03 | එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට (COP 26) සහභාගී වීම සඳහා නිල සංචාරය |
| 3 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 2021 දෙසැම්බර් 03-06 | 5 වැනි ඉන්දියන් සාගර සමුළුවට (IOC) සහභාගී වීම සඳහා නිල සංචාරය |

ගරු අග්‍රාමාත්‍යතුමා

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| 1 | බංග්ලාදේශය | 2021 මාර්තු 19-20 | රාජ්‍ය සංචාරය |
| 2 | ඉතාලිය | 2021 සැප්තැම්බර් 10-16 | බොලොඤ්ඤෝ හි පැවති G20 අන්තර් ආගමික සංසදයට සහභාගී වීම |

ගරු විදේශ අමාත්‍යතුමා

| අංකය | රට | කාලසීමාව | අරමුණ |
|---|---|---|---|
| 1 | ඉතාලිය | 2021 සැප්තැම්බර් 10-16 | බොලොඤ්ඤෝ හි පැවති G20 අන්තර් ආගමික සංසදයට සහභාගී වීම |
| 2 | ඇමරිකා එක්සත් ජනපදය | 2021 සැප්තැම්බර් 18-26 | එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 76 වැනි සැසි වාරයට සහභාගී වීම සඳහා නිල සංචාරය |
| 3 | එක්සත් රාජධානිය හා ස්කොට්ලන්තය | ඔක්තෝබර් 30 - නොවැම්බර් 03 | එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට (COP 26) සහභාගී වීම සඳහා නිල සංචාරය |
| 4 | බංග්ලාදේශය | 2021 නොවැම්බර් 15-17 | 21 වැනි අයෝරා අමාත්‍ය කවුන්සිලයේ රැස්වීම |
| 5 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 2021 දෙසැම්බර් 03-06 | 5 වැනි ඉන්දියන් සාගර සමුළුවට (IOC) සහභාගී වීම සඳහා නිල සංචාරය |

## කාර්යය සාධන දළ විශ්ලේෂණය: හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ

## එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

**ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික සබඳතා** පිළිබඳ සන්දර්භය හමුවේ, නිව්යෝර්ක් හා ජිනීවා හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය දූත මණ්ඩල සහ වියානා, පැරිස්, රෝමය, නයිරෝබි, බැංකොක් සහ හේග් හි එක්සත් ජාතීන්ගේ අනුබද්ධ නියෝජිතායතන සඳහා අක්තගන්වන ලද තානාපති කාර්යාල/ ස්ථිර නියෝජිත කණ්ඩායම් මෙම අංශයේ විෂය පථයට අයත් වේ.

**එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 76 වැනි සැසිවාරය (UNGA) - 2021 සැප්තැම්බර් මස නිව්යෝර්ක් හි දී**

2021 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 76 වැනි සැසිවාරයේ ඉහළ පෙළේ සාකච්ඡා වටයේ දී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිසගේ සහභාගීත්වය සඳහා අමාත්‍යාංශය විසින් අවශ්‍ය පරිදි සහ සැපයුම් සේවා කටයුතු සිදු කරන ලදී. අතිගරු ජනාධිපතිවරයා 2021 සැප්තැම්බර් 22 වැනි දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ඉහළ පෙළේ කොටස ඇමතූ අතර, 76 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවට සමගාමීව 2021 සැප්තැම්බර් 23 සහ 24 යන දිනවල දී පැවති එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුවට සහ බලශක්ති පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ සංවාදයට ද සහභාගී විය. එතුමා එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් මැතිතුමා, කුවේට් අග්‍රාමාත්‍ය ෂෙයික් සාබා බාලෙඩ් අල් හමා අල් සාබා මැතිතුමා, ලැට්වියා ජනරජයේ ජනාධිපති අතිගරු එගිල්ස් ලෙවිට්ස් මැතිතුමා සහ මාලදිවයිනේ ජනාධිපති අතිගරු ඊබ්‍රාහිම් මොහොමඩ් සෝලි මැතිතුමා සමඟ ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීය.

අතිගරු ජනාධිපතිතුමා සමඟ 76 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙහි ඉහළ පෙළේ සාකච්ඡා වට සඳහා සහභාගී වූ ගරු විදේශ අමාත්‍යතුමා, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, කසකස්ථානය, නිකරගුවාව, තායිලන්තය, දකුණු අප්‍රිකාව හා ඉන්දුනීසියාවේ විදේශ අමාත්‍යවරුන් සමඟ මෙන්ම එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කර්මාන්ත සහ උසස් තාක්ෂණ අමාත්‍යවරයා සහ එක්සත් රාජධානියේ දකුණු ආසියාව හා පොදුරාජ්‍ය මණ්ඩලය සඳහා රාජ්‍ය අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීය. එතුමා පොදුරාජ්‍ය මණ්ඩලයීය මහලේකම්වරයා, OIC හි මහලේකම්වරයා, CICA හි විධායක අධ්‍යක්ෂ සහ එක්සත් ජාතීන් සඳහා ශුද්ධාසනයේ නිත්‍ය නිරීක්ෂකවරයා සමඟ ද ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීය.

**ප්‍රතිසන්ධානය සහ මානව හිමිකම්:**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ජිනීවා (46, 47 සහ 48 වැනි සැසිවාර)

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී (UNHRC) ශ්‍රී ලංකාවේ ස්ථාවරය සඳහා සහාය ලබා ගැනීමට නිලධාරීන්, අමාත්‍යවරුන් සහ රාජ්‍ය ප්‍රධානියා මට්ටමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සියලුම සාමාජිකයින් සහ සියලුම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ සම්බන්ධ වීම මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

ජිනීවා හි පැවැති මානව හිමිකම් කවුන්සිලයේ (HRC) 2021 මාර්තු (46 වැනි සැසිවාරය), ජූනි (47 වැනි සැසිවාරය) සහ සැප්තැම්බර් (48 වැනි සැසිවාරය) යන නිත්‍ය සැසිවාරවල දී ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිබඳ සම්බන්ධීකරණය ද මෙම අංශය විසින් සිදු කරන ලදී.

පිළිවෙලින් මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරය සහ 48 වැනි සැසිවාරය අතරතුර දී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ වාර්තාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ ඇයගේ වාචික යාවත්කාලීනය මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අවස්ථාවේ දී ගරු විදේශ අමාත්‍යවරයා අදාළ රට ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රකාශය ඉදිරිපත් කළේය.

මානව හිමිකම් කවුන්සිලයේ මාර්තු, ජූනි සහ සැප්තැම්බර් සැසිවාරවල දී ශ්‍රී ලංකාව මැදිහත්වීම් ගණනාවක් සිදු කළ අතර, ඒකාබද්ධ ප්‍රකාශ 46 ක් සහ යෝජනා සම්මුති 13 ක් සඳහා සම අනුග්‍රහය දැක්වීය.

මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරයෙන් පසුව, ගරු විදේශ අමාත්‍යතුමා සහ ගරු අධිකරණ අමාත්‍යතුමාගේ සම සභාපතිත්වයෙන් යුතුව මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ සම්බන්ධීකරණ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය, වන්දි ගෙවීමේ කාර්යාලය, ජාතික ඒකාබද්ධතාව සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ තිරසාර සංවර්ධන ඉලක්ක කවුන්සිලය ඇතුළු දේශීය ආයතනවල සහභාගීත්වයෙන් යුතුව විදේශ අමාත්‍යාංශයේ පැවති ඒකාබද්ධ රැස්වීම් 3 ක් මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. *(මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් රජය විසින් ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සටහන අමුණා ඇත- සටහන I)*

**ගිවිසුම් ආයතන සහ එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි විධාන දරන්නන්:**

එක්සත් ජාතීන්ගේ මූලික මානව හිමිකම් ගිවිසුම් 9 යටතේ ශ්‍රී ලංකාව එහි පවතින වාර්තා කිරීමේ වගකීම් අඛණ්ඩව ඉටු කරනු ඇත.

- 2021 අප්‍රේල් මාසයේ දී, මූලික මානව හිමිකම් ගිවිසුම් 9 ක් සහ අනෙකුත් බහුපාර්ශ්වික නිරායුධකරණ ගිවිසුම් යටතේ වාර්තා කිරීමේ වගකීම් සම්බන්ධීකරණය කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ උපදේශන කැඳවන ලදී.
- තාවකාලිකව 2022 මාර්තු මාසයේ දී පැවැත්වීමට නියමිත ICCPR යටතේ ශ්‍රී ලංකාවේ 6 වැනි වාර වාර්තාව සමාලෝචනය කිරීම සහ CEDAW යටතේ ශ්‍රී ලංකාවේ 9 වැනි වාර්තාව ඉදිරිපත් කිරීම ඇතුළුව මෙම ගිවිසුම්වල වාර්තා/ සමාලෝචන ගණනාවක් ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වෙමින් පවතී.

2020 දී, අධ්‍යාපන අයිතිය පිළිබඳ විශේෂ වාර්තාකරු සහ වහල්භාවයේ සමකාලීන ස්වරූපය, එහි හේතූන් සහ ප්‍රතිවිපාක පිළිබඳ විශේෂ වාර්තාකරු යන විශේෂ ක්‍රියාපටිපාටි විධාන දරන්නන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟතාව පළ කොට ඇත.

වහල්භාවයේ සමකාලීන ස්වරූපය, එහි හේතූන් සහ ප්‍රතිවිපාක පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ටොමෝයා ඔබොකාටා මහතා 2021 නොවැම්බර් 26 වැනි දින සිට 2021 දෙසැම්බර් 3 වැනි දින දක්වා ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරය මෙම අංශය විසින් සංවිධානය කරන ලදී.

**මානව හිමිකම් පිළිබඳ යුරෝපා සංගම් – ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම**

2021 සැප්තැම්බර් 29 දින පැවති පාලනය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපා සංගම් – ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමේ 5 වැනි රැස්වීමට මෙම අංශය සහභාගී විය.

මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය, මානව හිමිකම් කවුන්සිලය සමඟ සහයෝගීතාව, ගිවිසුම් ආයතන, විශේෂ ක්‍රියා පටිපාටි විධාන දරන්නන් ඇතුළු දේශීය ආයතන විසින් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව මෙම අංශය යුරෝපා සංගම් නියෝජිත පිරිස යාවත්කාලීන කළේය.

**තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)**

තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු සහ තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා විදේශ අමාත්‍යාංශයේ සහභාගීත්වය මෙම අංශය සම්බන්ධීකරණය කරයි.

"2030 න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම ඉදිරියට ගෙන යන අතරම කොවිඩ්-19 වසංගතයෙන් වඩා හොඳින් ගොඩ නැගීම" යන තේමාව යටතේ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ

කොමිසමේ (UNESCAP) දකුණු සහ නිරිතදිග ආසියානු කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, 2021 නොවැම්බර් 15 සිට 17 දක්වා කොළඹ දී පැවති තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වැනි දකුණු ආසියානු සංසදය සංවිධානය කිරීමේ දී මෙම අංශය තිරසාර සංවර්ධන සභාවට සහාය විය.

2021 ජූලි මාසයේදී තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඉහළ පෙළේ දේශපාලන සංසදයට ඉදිරිපත් කෙරෙන ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ (VNR) 2 වැනි සම්පාදනය ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව සූදානම් වීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්වල දී පැවති මූලික සාකච්ඡා සඳහා විදේශ අමාත්‍යාංශය නියෝජනය කරමින් මෙම අංශය දායක විය

**නිරායුධකරණය**

බහුපාර්ශ්වික නිරායුධකරණ ප්‍රයත්න සඳහා ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීන කැපවීම සමඟ, නිරායුධකරණය පිළිබඳ සමුළුව, පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ සම්මුතියේ අන්තර් සැසි රැස්වීම, ජීව විද්‍යාත්මක අවි සම්මුතියේ විශේෂඥයන්ගේ රැස්වීම, පොකුරු බෝම්බ පිළිබඳ සම්මුතිය සඳහා රාජ්‍ය පාර්ශවකරුවන්ගේ රැස්වීම, මාරාන්තික ස්වයංක්‍රීය අවි පද්ධති (LAWS) පිළිබඳ රජයේ විශේෂඥයින් කණ්ඩායම ඇතුළුව, 2021 වර්ෂයේ දී ප්‍රධාන වශයෙන් ජිනීවා හි දී පවත්වන ලද නිරායුධකරණ රැස්වීම් සඳහා මෙන්ම, නිව්යෝර්ක් හි දී පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පළමු කමිටුවේ විචාරණයන් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සහ රජයේ ස්ථාවරය සම්බන්ධයෙන් මෙම අංශය අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ අඛණ්ඩව සම්බන්ධ විය.

මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පවතින ගැටළු සමාලෝචනය කිරීම සඳහා පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් 2021 අප්‍රේල් 29 වැනි දින මෙම අමාත්‍යාංශයේදී පැවැත්විණි. ආරක්ෂක අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුද හමුදාව, ජාතික බිම්බෝම්බ ක්‍රියාකාරී මධ්‍යස්ථානය, අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ආබාධිත වූවන් පිළිබඳ ලේකම් කාර්යාලය යන ආයතනවල නියෝජිතයන් මෙම රැස්වීමට සහභාගි වූහ. මෙම රැස්වීමට අනුව, පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත පියවර ගන්නා ලදී:

i. 2021 ජුනි 18 වැනි දින විනිවිදභාවය පිළිබඳ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.

ii. පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය යටතේ ලබා දී තිබූ 4 වැනි කාල සීමාව ඉකුත් වීමට වසරකට ආසන්න කාලයකට පෙර 2021 අගෝස්තු 24 වැනි දින ශ්‍රී ලංකාව අවසන් ඉතිරි බිම් බෝම්බ 11,840 ක් විනාශ කළ අතර, මෙම ජයග්‍රහණය පිළිබඳව ජිනීවා සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ සහායක ඒකකය (ISU) සමඟ ඒකාබද්ධ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී.

iii. 2021 සැප්තැම්බර් 6 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීමේ පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීමටත්, පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

iv. සියලුම පුද්ගල නාශක බිම්බෝම්බ විනාශ කිරීම සනිටුහන් කිරීම සඳහා, ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව උත්සවයක් සංවිධානය කිරීමට සහ මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ජයග්‍රහණ පිළිබඳව නිසි ප්‍රචාරයක් ලබා දීම සඳහා පියවර ගනිමින් පවතී.

76 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පළමු කමිටුවේ (නිරායුධකරණය සහ ජාත්‍යන්තර ආරක්ෂාව) ඉදිරිපත් කරන ලද යෝජනා/ තීරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරයන් සැකසීමේ දී මෙම අංශය නායකත්වය ලබා දුන්නේය.

න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ගිවිසුමට අත්සන් තැබීම සඳහා ශ්‍රී ලංකාව සඳහා ගරු විදේශ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව 2021 දෙසැම්බර් 20 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

1996 දී අත්සන් තබන ලද විස්තීරණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම් කිරීමේ ගිවිසුම (CTBT) ශ්‍රී ලංකාව විසින් අනුමත කිරීම සඳහා නිරීක්ෂණ කැඳවන ලදී.

ශ්‍රී ලංකාව මෙතෙක් පාර්ශ්වකරුවෙකු වී නොමැති නිරායුධකරණ ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිබඳ සමාලෝචනයක් ද අංශය විසින් ආරම්භ කොට ඇත. විවිධ න්‍යාය පත්‍ර අයිතමයන් පිළිබඳ රජයේ ස්ථාවරයන් ගෙනහැර දැක්වීමට අමතරව, 2021 දී පැවති සැසිවාරයේදී නිරායුධකරණය පිළිබඳ සමුළුවේදී යෞවනයින් හා නිරායුධකරණය සහ කාන්තාවන් හා නිරායුධකරණය පිළිබඳ ප්‍රකාශයන් කිරීම සඳහා මෙම අංශය ශ්‍රී ලංකාව වෙනුවෙන් අවශ්‍ය සැකසීම් සිදු කළේය.

**විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ බහුපාර්ශ්වික නියැලීම**

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) සමඟ ශ්‍රී ලංකාවේ නියැලීම මෙම අංශය මඟින් සම්බන්ධීකරණය කෙරේ. 2021 ජූනි 7 සිට 11 දක්වා පැවති IAEA පාලක මණ්ඩල රැස්වීමට සහ 2021 සැප්තැම්බර් 20-24 දක්වා පැවති IAEA මහා සම්මේලනයේ 65 වැනි සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගී විය.

අගෝස්තු 25-26 දිනවල පැවති ශ්‍රී ලංකාව සඳහා ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචන මෙහෙයුම (INIR) - 1 අදියර පිළිබඳ IAEA විශේෂඥයන් සමඟ පාර්ශ්වකරුවන්ගේ අතථ්‍ය උපදේශන සම්බන්ධ කටයුතු ද අංශය සම්බන්ධීකරණය කරන ලදී. INIR හි අරමුණ වන්නේ ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික බලශක්තිය භාවිතා කිරීමේ ශක්‍යතා තක්සේරු කිරීමයි.

2021 මාර්තු මාසයේ දී සහ 2021 දෙසැම්බර් 13-17 දිනවල දී නිව්යෝර්ක් හි පැවති ජාත්‍යන්තර ආරක්ෂාව (OEWG) සන්දර්භය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවණතා පිළිබඳ විවෘත ක්‍රියාකාරී කණ්ඩායමට අදාළ ශ්‍රී ලංකාවේ ස්ථාවරය සහ නියැලීම ද මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

**සමාජ-ආර්ථික ක්ෂේත්‍රයේ බහුපාර්ශ්වික නියැලීම**

සමාජ-ආර්ථික ක්ෂේත්‍රවල ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කරන බහුපාර්ශ්වික සංසදවල ශ්‍රී ලංකාවේ නියැලීම මෙම අංශය අඛණ්ඩව සම්බන්ධීකරණය කරයි.

මෙම සංසද සමඟ නිතිපතා සම්බන්ධ වීමට අමතරව, අංශය විසින් ශ්‍රී ලංකාවේ පහත සඳහන් ඉහළ මට්ටමේ නියෝජන සම්බන්ධීකරණය කරන ලදී;

i. ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය (FAO): 2021 ජූනි 03 වැනි දින රෝමයේ ආහාර සහ කෘෂිකාර්මික සංවිධානයේ දී අතථ්‍ය ලෙස පවත්වන ලද ලෝක ආහාර සුරක්ෂිතතාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවේ කෘෂි විද්‍යා උත්සවයේ 48 වැනි සැසිවාරය (CFS 48) සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වය.

ii. එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුව - 2021 ජූලි 26 සිට 28 දක්වා රෝමයේ දී අතථ්‍ය ලෙස පැවති එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති සමුළුවේ පූර්ව සමුළුවේ දී සහ 2021 සැප්තැම්බර් 23 වන දින පැවති 76 වැනි එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සමගාමීව පැවති ප්‍රධාන සමුළුව සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වය.

iii. නොබැඳි ව්‍යාපාරය - 2021 ජූලි 13-14 දිනවල නිව්යෝර්ක් හි පැවති නොබැඳි ව්‍යාපාරයේ (NAM) මධ්‍ය කාලීන අමාත්‍ය සමුළුවේ (මාර්ගගත) ප්‍රධාන විවාදය සඳහා ශ්‍රී ලංකාවේ ගරු විදේශ අමාත්‍යතුමාගේ සහභාගිත්වය.

iv. ලෝක සෞඛ්‍ය සංවිධානය - 2021 මැයි මාසයේදී පැවති 74 වැනි ලෝක සෞඛ්‍ය සමුළුව සඳහා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමියගේ සහභාගීත්වය සහ කොවිඩ්-19 ආශ්‍රිත සාකච්ඡා ඇතුළුව අනෙකුත් ලෝක සෞඛ්‍ය සංවිධාන රැස්වීම්වල දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

v. ආර්ථික හා සමාජ කවුන්සිලය (ECOSOC) - ECOSOC 2021 සැසිවාරයේ ඉහළ මට්ටමේ අංශය සඳහා ගරු විදේශ අමාත්‍යතුමාගේ සහභාගීත්වය සහ 2021 ජූලි 13 සිට 16 දක්වා නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ අතථ්‍ය ලෙස පැවති ECOSOC 2021 සැසියේ ප්‍රධාන විවාදය සඳහා විදේශ ලේකම්වරයාගේ සහභාගීත්වය.

vi. ලෝක තරුණ නිපුණතා දින සැමරුම: 2021 ජූලි 15 වන දින බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පැවති තරුණ නිපුණතා දිනයේ දී ගරු කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගීත්වය.

ශ්‍රී ලංකාව සඳහා 2023-2027 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව (UNSDCF) සංවර්ධනය කිරීම සම්බන්ධ මූලික සාකච්ඡා සඳහා ද මෙම අංශය දායක විය. 2021 ජූලි 02 වැනි දින පැවති 1 වැනි ඒකාබද්ධ ජාතික ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටු රැස්වීමේදී සහ ඉන් පසුව පැවැත්වෙන ක්‍රියාකාරී මට්ටමේ රැස්වීම්වල දී මෙම අංශය විදේශ අමාත්‍යාංශය නියෝජනය කළේය.

මත්ද්‍රව්‍ය ජාවාරම්, අපරාධ වැළැක්වීම, දූෂණය, ජාවාරම් මෙන්ම සයිබර් අපරාධ සම්බන්ධයෙන් ද කටයුතු කිරීම යන ක්ෂේත්‍රවල රැස්වීම්වල දී මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකාවේ සහභාගීත්වය තුළින් 2021 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNODC) සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම අඛණ්ඩව සිදු කරන ලදී.

පුරාණ සීගිරි නගරයේ සීගිරි පර්වතයේ සීගිරියේ බිතු සිතුවම් දක්වා ඇති හිණිපෙත, නරඹන්නන්ගේ වේදිකාව, සුළං කොරිඩෝවේ ලෝහ පාලම සහ සීගිරියේ සිංහ පඩිපෙළේ කැඩීගිය පාෂාණ පුවරු අලුත්වැඩියා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ආධාර ලෙස 2021 අගෝස්තු මාසයේ දී යුනෙස්කෝ ලෝක උරුම අරමුදලෙන් ශ්‍රී ලංකාවට ඇ. ඩොලර් 91,212 ක් ලැබුණි.

2021 දෙසැම්බර් මස කොළඹ දී අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටු රැස්වීම් සැසිවාරයේ 16 වැනි සැසිවාරය පැවැත්වීමේ අවස්ථාව යුනෙස්කෝ විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාව 2021 සැප්තැම්බර් මාසයේ සිට වසර 3 ක කාලයක් සඳහා නොබැඳි ව්‍යාපාරයේ (NAM) විද්‍යා හා තාක්ෂණ පාලක මණ්ඩලයේ සභාපතිත්වය සඳහා තේරී පත් විය.

2021 නොවැම්බර් 30 වැනි දින නිව්යෝර්ක් හි දී (අථත්‍ය ලෙස) පැවති 77 කණ්ඩායමේ විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 45 වැනි රැස්වීමේදී ශ්‍රී ලංකාවේ (ගරු විදේශ අමාත්‍යතුමා) සහභාගීත්වය මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

2021 දෙසැම්බර් මාසයේ දී පැරිසියේ පැවති අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටු රැස්වීම් සැසියේ 16 වැනි සැසිවාරයේ ශ්‍රී ලංකාව මූලසුන දැරීම සම්බන්ධ කරුණු මෙම අංශය සම්බන්ධීකරණය කළේය. මෙම සැසියේදී ශ්‍රී ලංකාවේ 'දුම්බර රටා කළාල' නිෂ්පාදන කලා ශිල්පය ලෝකයේ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයක් ලෙස සටහන් විය.

**1. අපේක්ෂකත්ව:**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල විවිධ තනතුරු සඳහා වෙනත් රාජ්‍යයන් විසින් යෝජනා කරන ලද අපේක්ෂකත්වයන්ට සහාය දීමෙන් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්න මෙම අංශය අඛණ්ඩව සම්බන්ධීකරණය කළේය. ඒ අනුව, 2021 වසර තුළ දී UPU, ISO, IUCN, ජාත්‍යන්තර

පරමාණුකබලශක්ති නියෝජිතායතනය (IAEA), වාර්ගික වෙනස්කම් ඉවත් කිරීම පිළිබඳ සම්මුතිය (CERD), සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CMW), ආර්ථික හා සමාජ සභාව

(EcoSoC), එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය , ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), CED, OPCW, CTBTO, ASOSAI, වධහිංසාවට එරෙහි සම්මුතිය (CAT), IOPCF, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO), IMO, AALCO ආදියෙහි දී පැවති බහුපාර්ශ්වික මැතිවරණ 45කදී ප්‍රකාශිත ඡන්ද 325කට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා වූ ශ්‍රී ලංකාවේ සහයෝගය මෙම අංශය විසින් සකස් කරන ලදී. ජාත්‍යන්තර කම්කරු කොමිෂන් සභාව (ILC), ආර්ථික හා සමාජ සභාව (ECOSOC) සහ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම (UNCITRAL) වෙත ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා අන්‍යෝන්‍ය සහය විධිවිධානවලට ද මෙම අංශය සම්බන්ධ විය.

**2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන්ගේ සංචාර**

2021 වසරේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් නිරත වූ එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ පහත සඳහන් සංචාර සම්බන්ධීකරණය කරන ලදී.

2021 නොවැම්බර් 23 සිට 25 දක්වා දේශපාලන, සාමය ගොඩනැගීම සහ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම් ඛාලිඩ් ඛිආරි මහතාගේ සංචාරය; හා

2021 දෙසැම්බර් 13 සිට 17 දක්වා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) කලාපීය කාර්යාංශයේ ආසියා සහ පැසිෆික් කලාපීය කාර්යාංශයේ සහකාර පරිපාලක සහ අධ්‍යක්ෂ, UNDP එක්සත් ජාතීන්ගේ සහකාර ලේකම් කන්නි විග්නරාජා මහත්මියගේ සංචාරය.

**සටහන I:**

**මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීම**

<u>අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය</u>

1. **අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය** (OMP) එහි ව්‍යවස්ථාපිත කාර්යයන් සඳහා වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇති ඔවුන්ගේ විශේෂඥභාවය සහ පළපුරුද්ද මත පදනම්ව කොමසාරිස්වරුන් පත් කර ඇත. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය දැනට වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් යුතුව අතුරුදහන් වූවන්ගේ ලැයිස්තුව සකසා අවසන් කරමින් සිටී.

2. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් ප්‍රධාන සාධක තුනක් කෙරෙහි අවධානය යොමු කරමින් පළමු අදියර ලෙස අයදුම්පත්/ගොනු 6,025 ක (2000-2001 අතර නඩු) වාර්තා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට තීරණය කර ඇත;
   (i) මෑතක දී සිදු වූ අතුරුදහන් වූවන් පිළිබඳ සිදුවීම්;
   (ii) දැනටමත් සැලකිය යුතු සාක්ෂි ඇති සිදුවීම්; හෝ
   (iii)අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ මතයට අනුව, පොදු වැදගත්කමක් සහිත එවැනි සිදුවීම්.

3. පැමිණිලි 2500ක් පරිවර්තනය කර ඇති අතර, අතුරු වාර්තා විමර්ශන ක්‍රියාවලිය සඳහා තක්සේරු කිරීම දැනටමත් ආරම්භ කොට ඇත. අතුරු වාර්තා සමඟ නිකුත් කළ පැමිණිලි 68ක් ඊට ඇතුළත් වේ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්ට ඉහත පැමිණිලි සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය පොලිස් ස්ථානය හමුවී විමසන ලෙසට උපදෙස් ලබා දී ඇති අතර, පහත සඳහන් කරුණු පිළිබඳව යාවත්කාලීන කරන ලෙස ඔවුන්ට උපදෙස් දෙන ලදී.

   - අයදුම්කරු විසින් අතීතයේදී කරන ලද පැමිණිලි කිසිවක් ඉදිරිපත් කර තිබේද;
   - නිලධාරීන් හෝ බලධාරීන් කිසියම් විමර්ශනයක් හෝ විමර්ශනයක් සිදු කර තිබේද; එසේ නම් එම විස්තරය; හා

- එම පිටපත් ලබා ගැනීම සඳහා නිලධාරීන් විසින් කිසියම් ද්‍රව්‍යමය සාක්ෂි එකතු කර හෝ රැස් කර තිබේද යන්න.

<u>වන්දි ගෙවීමේ කාර්යාලය (OR)</u>

4. **වන්දි ගෙවීමේ කාර්යාලය (OR)** විසින් 2021 දෙසැම්බර් 31 වැනි දිනට 2021වසරේ හිමිකම් 5964 ක් සකස් කර ඇත. 2021 වසර තුළදී, වන්දි ගෙවීම සඳහා වන්දි ගෙවීමේ කාර්යාලය වෙත මුළු රුපියල් මිලියන 399.8 ක මුදලක් ලැබී ඇති අතර, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම වන්දි ගෙවීම සඳහා යොදවා ඇත.

5. 2018 අංක 34 දරන වන්දි ගෙවීමේ කාර්යාල පනත යටතේ වන්දි ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ. 2021 අගෝස්තු 17 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙමඟින් ව්‍යවස්ථාපිත ක්‍රියාවලිය සම්පූර්ණ කරන අතර, වන්දි ගෙවීමේ කාර්යාල පනතේ මූලික මූලධර්ම මත පදනම්ව වන්දි ගෙවීමේ කාර්යාලයේ කාර්ය වැඩසටහන සඳහා පදනම සපයයි. වන්දි ගෙවීමේ ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත.

<u>ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා කාර්යාලය (ONUR)</u>

6. ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR) ජාතික සමගිය සහ සංහිඳියාව ගොඩනැගීමේ අරමුණින් යුතුව තේමාත්මක ක්ෂේත්‍ර 8ක් යටතේ සිය ජනවරම අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

7. ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය විසින් 2021 ඔක්තෝබර් 30 සිට 31 දක්වා 'නූතන සමාජය තුළ තිරසාර සාමය, ආරක්ෂාව සහ සංහිඳියාව අවබෝධ කර ගැනීම තුළින් වෙනස්කම විසඳීම' යන තේමාව යටතේ සිය පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ නූතන බහු සංස්කෘතික සමාජය තුළ ආරක්ෂාව, සාමය ගොඩනැගීම, තිරසාර සාමය, අයිතිවාසිකම් සහ පුරවැසියන්ගේ වගකීම්, අයිතිවාසිකම් සහ වගකීම් යන ගැටලුවලට අදාළව ප්‍රමුඛ පෙළේ විද්වතුන්, පර්යේෂකයන් සහ පර්යේෂණ විද්වතුන්, වෘත්තිකයන් ඔවුන්ගේ අත්දැකීම්, අදහස්, තොරතුරු සහ පර්යේෂණ ප්‍රතිඵල හුවමාරු කර ගැනීම සහ බෙදාහදා ගැනීමයි. එමඟින් පර්යේෂකයන්, වෘත්තිකයන් සහ අධ්‍යාපනඥයින් සඳහා නවතම නවෝත්පාදන, ප්‍රවණතා සහ උත්සුකයන් මෙන්ම මුහුණ දුන් ප්‍රායෝගික අභියෝග සහ විසඳුම් ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීම සඳහා ප්‍රමුඛ අන්තර් විනය වේදිකාවක් සපයා ඇත.

<u>තිරසාර සංවර්ධන ඉලක්ක 16</u>

8. 2021 තිරසාර සංවර්ධන වාර්තාවට අනුව, තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී ශ්‍රී ලංකාව ස්ථාවර ප්‍රගතියක් පෙන්නුම් කරයි. තිරසාර සංවර්ධන ඉලක්ක ජයග්‍රහණ පිළිබඳ ශ්‍රී ලංකාවේ ගෝලීය ශ්‍රේණිගත කිරීම ස්ථාන 7 කින් ඉහළ ගොස් ඇති අතර, 2021 දී රටවල් 165 කින් 87 වැනි ස්ථානයට පත්ව ඇත.

9. අධිකරණ අමාත්‍යාංශය සහ තිරසාර සංවර්ධන කවුන්සිලය විසින් සම කැඳවීම් කරනු ලදුව, 2021 දෙසැම්බර් 13 වැනි දින පැවති තිරසාර සංවර්ධන ඉලක්ක-16 රැස්වීමේදී රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජයේ උපදේශනයක් සිදු කරන ලදී. අමාත්‍යාංශය විසින් ප්‍රමුඛතා ක්ෂේත්‍ර හතක් යටතේ මූලාරම්භ කරන ලද ජයග්‍රහණ, අභියෝග සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව මෙම උපදේශනය තුළින් පිළිබිඹු විය. එහිදී ගනු ලැබූ ප්‍රධාන තීරණ අතර, තිරසාර සංවර්ධන ඉලක්ක 16 අනු කමිටු සඳහා සිවිල් සමාජ නියෝජිතයන් නම් කිරීම, විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය පිළිබඳ පසු විපරම් කිරීම, වැඩසටහන් සැලසුම් කිරීම සඳහා ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය සහ ඒකාබද්ධතා අංශය සමඟ වෙනම රැස්වීමක් පැවැත්වීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති අංක C190 - ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීමේ සම්මුතිය අපරානුමත කිරීම සඳහා කටයුතු කිරීම.

ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව

10. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විමසන විනිසුරුවරයෙකු වන විනිසුරු නවාස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා වෙත කඩිනමින් භාරදීම සඳහා සිය දෙවැනි අතුරු වාර්තාව අවසන් කිරීමේ කටයුතුවල නිරතව සිටී.

11. මෙම කොමිෂන් සභාව බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී මාධ්‍යවේදීන් ඉදිරියේ මහජන රැස්වීම් පවත්වා ඇති අතර, එහි කටයුතු ආරම්භයේ සිට දීර්ඝ කාලයක් මහජනතාව සඳහා විවෘතව පවතී. මේ වන විට කොමිෂන් සභාවේ මහජන රැස්වීම් කොළඹ, යාපනය සහ කිලිනොච්චිය යන ප්‍රදේශවල පැවැත්වේ. මෙම මහජන රැස්වීම්වලදී සාක්ෂිකරුවන් 100කට අධික සංඛ්‍යාවක් කොමිසම හමුවේ සාක්ෂි ලබා දී ඇත.

සිවිල් සමාජය සමඟ සම්බන්ධ වීම

12. දශක ගණනාවක් තිස්සේ, සමාජීය හා මානව සංවර්ධනයට මෙන්ම මානව හිමිකම් ප්‍රශ්නවලට අදාළ කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සඳහා සිවිල් සමාජය වැදගත් හවුල්කරුවෙකු වී තිබේ. අපගේ ජාත්‍යන්තර මානව හිමිකම් වාර්තා කිරීමේ වගකීම්වල දී රජය සිවිල් සමාජය සමඟ සක්‍රීය අන්තර්ක්‍රියාකාරිත්වයක් පවත්වා ඇත. විදේශ අමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් අඛණ්ඩ ක්‍රියාවලියක නිරතව සිටී. පසුගියදා පැවති රැස්වීමක දී, ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය සහ තිරසාර සංවර්ධන ඉලක්ක 16 පිළිබඳ මෙහෙයුම් කමිටුව සමඟ සම්බන්ධ වීමෙන් SDG 16 හි ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා සිවිල් සමාජයේ විශේෂඥතාව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

13. 2254/30 දරන සහ 2021 නොවැම්බර් 17 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ විධිවිධානවලට අනුව, ජාතික රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ කාර්යයන්, බලතල සහ පරිපාලනය විදේශ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතනයක් ලෙස පත් කොට ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නැවත සලකා බැලීම

14. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ජාත්‍යන්තර සම්මතයන් සහ විශිෂ්ට පරිචයන්ට අනුකූලව ගෙන ඒම සඳහා එහි ප්‍රධාන විධිවිධාන සඳහා සංශෝධන යෝජනා කිරීම පිණිස රජය 2022 ජනවාරි 10 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. යෝජිත සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව අවසන් අනුමැතිය සඳහා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් 2022 ජනවාරි 25 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. මෙම ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙය වසර 42කට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මක කිරීමෙන් පසු එහි සිදුකෙරෙන පළමු ප්‍රධාන සංශෝධනය වේ.

15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති නඩු කඩිනමින් විසඳාගැනීම ද සිදුකෙරෙමින් පවතී. තව දුරටත්, ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වැනි වගන්තිය ප්‍රකාරව තම බලතල ක්‍රියාත්මක කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදකරුවන් වී සිරදඬුවම් විඳිමින් සිටින එල්ටීටීඊ සාමාජිකයින් දහසය (16) දෙනෙකුට සමාව ලබා දී ඇත.

## ආර්ථික කටයුතු අංශය

### ද්විපාර්ශ්වික සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික, තාක්ෂණික සහයෝගිතා අංශය

ආර්ථික කටයුතු අංශයට ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහ තාක්ෂණික සහයෝගීතාවයට අදාළ ක්‍රියාකාරකම් පැවරී ඇත. අනෙකුත් රටවල් සහ සංවිධාන සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබා දීම තහවුරු කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන සමඟ වෙළෙඳාම, ආයෝජන, තාක්ෂණික සහයෝගීතාව, සංචාරක ව්‍යාපාරය, තේ ප්‍රවර්ධනය සහ සංවර්ධන ආධාර යන ක්ෂේත්‍ර සමීපව සම්බන්ධීකරණය කරන ලදී. අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකක් වන ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ වසර තුළ සාක්ෂාත් කර ගත යුතු ආර්ථික ඉලක්ක දූත මණ්ඩලවලට පවරනු ලැබේ.

ඵලදායී ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමේ දී ගෝලීය වසංගතය හේතුවෙන් එල්ල වූ අහිතකර සහ අවාසිදායක තත්ත්වයන් මධ්‍යයේ වුවද, සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළදී පහත සඳහන් ප්‍රධාන අංග ඇතුළුව බොහෝ වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.

2021 වර්ෂයට අදාළව දූත මණ්ඩල වෙත ලබා දී ඇති අපනයන ඉලක්ක;

2021 සඳහා මුළු අපනයන ඉලක්කය ඇ.ඩොලර් බිලියන 15.72ක් වන අතර එය වෙළඳ භාණ්ඩ අපනයනය ඇ.ඩොලර් බිලියන 12.14ක් සහ සේවා ඇ.ඩොලර් බිලියන 3.5ක් නියෝජනය කරයි. 2021 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළදී, වසංගත තත්ත්වය සහ සැපයුම් දාමයට බාධාවීම හේතුවෙන් සීමාවන් පැවතිය ද, ශ්‍රී ලංකාව ඇ.ඩොලර් බිලියන 11.11 ක් වටිනා වෙළඳ භාණ්ඩ අපනයනය කර ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව ලංකා තේ ප්‍රවර්ධනය සඳහා තෝරාගත් දූත මණ්ඩල සඳහා 2021 - 2025 කාලසීමාව සඳහා අපනයන ඉලක්ක සැකසීම සහ ලබා දී ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාළ දූත මණ්ඩලවල ප්‍රයත්න පහසු කිරීම සඳහා වෙළඳපොළ සන්නිවේදන සැලසුම් ලබා දීම. 2022 සඳහා වන අපනයන ඉලක්ක දැනටමත් දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත බෙදා හැර ඇත.

මෙම අමාත්‍යාංශය විසින් 2021 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) සමඟ එක්ව අතථ්‍ය රැස්වීම් මාලාවක් දියත් කෙරිණි. එමඟින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රදර්ශනය කිරීමට/ ප්‍රවර්ධනය කිරීමට සහ ආයෝජකයින්ගේ වර්ග සහ ආයෝජකයින් වෙත ළඟා විය හැකි ක්‍රම හඳුනා ගැනීම සඳහා ගත යුතු ප්‍රවේශය තීරණය කිරීමට SEC වෙත සහාය වීම සඳහා දූත මණ්ඩලවලට අවස්ථාව ලැබේ. රැස්වීම් 13 ක් පැවැත්විණි.

2021 සැප්තැම්බර් 14-15 දිනවල ලක්සම්බර්ග් හි පැවති ICT Spring Europe ප්‍රදර්ශනය සහ 2021 නොවැම්බර් 05-10 දිනවල චීනයේ පැවති 3 වැනි චීන ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ ප්‍රදර්ශනය (CIIE) සඳහා සහභාගී වීමට පහසුකම් සැලසූ අතර ආර්ථික රාජ්‍යතාන්ත්‍රික අයවැය යටතේ අවශ්‍ය අරමුදල් සපයන ලදී.

ඔසාකා හි පැවති එක්ස්පෝ 2025 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව සහ වෙළඳ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.

වෙළෙඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධන පිළිබඳ අථත්‍ය රැස්වීම්/ වෙබිනාර් විශාල සංඛ්‍යාවක් සඳහා සත්කාරකත්වය ලබා දුන් මෙම අංශය, ඊට සහභාගී විය. අතථ්‍ය රැස්වීම් 34ක් පවත්වන ලදී.

2021 සැප්තැම්බර් 24 වැනි දින අතථ්‍ය ලෙස ශ්‍රී ලංකාව සහ චීනය අතර පැවති වෙළෙඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ 07 වැනි සැසිවාරය සම්බන්ධීකරණය කොට, ක්‍රියාකාරීව සහභාගි විය.

අදාළ රේඛීය ආයතන විසින් සංවිධානය කරන ලද ආර්ථික, වෙළඳ, සංචාරක සහ විදේශ රැකියා ප්‍රවර්ධන පිළිබඳ විවිධ රැස්වීම් සඳහා මෙම අංශය ක්‍රියාකාරීව සහභාගී විය. මීට අමතරව, මෙම අංශය බොහෝ වෙළඳ/ ආර්ථික සහයෝගීතා අවබෝධතා ගිවිසුම්, රේඛීය ආයතන, විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කොළඹ පිහිටි විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට සම්බන්ධ ගිවිසුම් සඳහා පහසුකම් සැලසූ අතර, ද්විපාර්ශ්වික සංචාර සහ ද්විපාර්ශ්වික දේශපාලන/ ආර්ථික සහයෝගීතා සැසි සඳහා සහභාගී වී ආර්ථිකය හා සම්බන්ධ යෙදවුම් සැපයී ය.

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය, ආරක්ෂක අමාත්‍යාංශය, මහජන බැංකුව, ලංකා විදුලිබල මණ්ඩලය වැනි විවිධ රාජ්‍ය ආයතනවල ලොව පුරා ටෙන්ඩර්/ ප්‍රසම්පාදන 30ක් අවශ්‍ය ප්‍රචාරය සඳහා විදේශ රටවල දූත මණ්ඩල වෙත යොමු කර ඇත.

වෙළෙඳාම සම්බන්ධ ආරවුල් 15ක් සහ ජාත්‍යන්තර මූල්‍ය/ සංවර්ධන නියෝජිතායතනවල කොළඹ පිහිටි කාර්යාලවල කාර්ය මණ්ඩලයේ ඇතුළුවීමේ වීසා 55ක් සහ නේවාසික වීසා බලපත්‍ර සම්බන්ධ කරුණු 2ක් විසඳීම සඳහා ද සමාලෝචන කාල සීමාව තුළ දී අංශය විසින් පහසුකම් සපයන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ (SLTPB) උපදේශක මණ්ඩලවල දී අමාත්‍යාංශය නියෝජනය කරන ලදී.

ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුම (PTA) පිළිබඳ සාකච්ඡා සහ ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සැකසීම පිළිබඳ සාකච්ඡා සඳහා මෙම අංශය ක්‍රියාකාරීව සහභාගී වී ඇත.

තුර්කි ජනරජයේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය අතර රේගු කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය පරිපාලන සහය පිළිබඳ ගිවිසුමට 2021 නොවැම්බර් 26 දින අත්සන් තබන ලදී.

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ පොල් සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් යුතුව, බ්‍රසීලයට තැඹිලි වතුර අපනයනය පුළුල් කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර බෝට්ටු තැනීම, නැව්ගත කිරීම, අමතර කොටස් සැපයීම සහ විනෝදාත්මක බෝට්ටු පැදීමේ කර්මාන්තය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම කර්මාන්තය ආදී ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා මාලදිවයිනේ ජාතික බෝට්ටු සංගමය (NBAM) සහ ශ්‍රී ලංකා බෝට්ටු සහ නැව් තැනීමේ කර්මාන්තයේ නියෝජිතයන් අතර අතථ්‍ය හමුවක් 2021 ඔක්තෝබර් 11 වැනි දින මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගීතාවයෙන් පවත්වන ලදී.

ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර ව්‍යාපාරික අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා 2021 නොවැම්බර් 23 වැනි දින කොළඹ ෂැංග්‍රි-ලා හෝටලයේ පැවති 33 වැනි RCCI ජාත්‍යන්තර ජයග්‍රහණ සම්මාන සහ ව්‍යාපාරික අවස්ථා සමුළුව සඳහා කොළඹ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයට පහසුකම් සැලසී ය.

2021 නොවැම්බර් 22 සිට 25 වැනි දින දක්වා මෙරට සංචාරයක නිරත වූ දකුණු ඉන්දීය බලවේග ජේෂකර්ම සම්මේලනයේ වෙළඳ හා ආයෝජන නියෝජිත පිරිස සම්බන්ධීකරණය කිරීම සහ ඊට සක්‍රීයව සහභාගී වීම. ගරු විදේශ ලේකම්වරයා, ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්, තනතුරු දරන්නන් සහ ලංකා වාණිජ මණ්ඩලයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වී ය.

2021 දෙසැම්බර් 01 වැනි දින ගරු විදේශ අමාත්‍යවරයා සහ ගරු සංචාරක අමාත්‍යවරයා අතර සංචාරක ප්‍රවර්ධනය පිළිබඳ අතථ්‍ය හමුවක් පැවැත්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අපේක්ෂිත සංචාරකයින්ට නවතම තොරතුරු සැපයීමේ අරමුණින් යුතුව දූත මණ්ඩල වෙබ් අඩවි යාවත්කාලීන කොට, ඒවා Sri Lanka Tourism හා Hello Again වෙබ් අඩවි සමඟ සම්බන්ධ කරන ලදී.

**තාක්ෂණික සහයෝගීතාව**

**ප්‍රසම්පාදනය:** ශ්‍රී ලංකන් ගුවන් සේවය, ආරක්ෂක අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ජාතික රක්ෂණ භාර අරමුදල, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි ආයතනවල ප්‍රසම්පාදන දැන්වීම් 30 ක් සඳහා ජාත්‍යන්තර වශයෙන් පහසුකම් සලසා ඇත.

**වීසා ප්‍රවර්ගය** : ජයිකා, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන සඳහා ප්‍රවේශ වීමේ වීසා 33ක් සහ නේවාසික වීසා බලපත්‍ර 12ක් නිර්දේශ කෙරිණි.

**ආර්ථික කටයුතු (බහුපාර්ශ්වික)**

ආර්ථික කටයුතු අංශයේ බහුපාර්ශ්වික අංශය බහුපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් රජය විසින් සිදු කරන ලද කැපවීම් පිළිබඳව පසු විපරම් කිරීමෙ සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කොට මෙම සංසදවලදී ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ස්ථාවරයන් සැකසීම පිණිස ජාත්‍යන්තර, අන්තර් රාජ්‍ය සහ කලාපීය සංවිධාන සමඟ සම්බන්ධ වේ.

මෙම අංශය ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (අයෝරා) ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. ඒ හා සම්බන්ධ රැස්වීම් 42ක් සඳහා අංශය සහභාගී වීම/පහසුකම් සැලසීම සිදුකළේය. විදේශ අමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් 2021 නොවැම්බර් 15-17 යන දිනවල ඩකා හි පැවති 21 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමේ (COM) දී IORA හි උප සභාපති ධුරය ශ්‍රී ලංකාව විසින් භාර ගන්නා ලදී. විදේශ අමාත්‍යාංශයේ නිලධාරීන් ද අමාත්‍ය මණ්ඩල කමිටුව (COM) සමග පැවති ජ්‍යෙෂ්ඨ නිල රැස්වීමේ (CSO) 23 වැනි කමිටුව සඳහා සහභාගි වූහ. මෙම සැසියේ දී, 2022-2026 සඳහා වන දෙවන IORA ක්‍රියාකාරී සැලැස්මේ ආයතනික විධිවිධාන සහ පුළුල් කිරීමේ කටයුතු (IABE) සඳහා සම්බන්ධීකරණ රට ලෙස ශ්‍රී ලංකාව අනුමත කරන ලදී. 2021 ජූනි 8, 14, 23, 24 සහ 28 යන දිනවල අයෝරා හි නව මහලේකම්වරයා තෝරා ගැනීමේ සුදුසුකම් සහ නිර්ණායක සම්බන්ධ තාවකාලික ක්‍රියාකාරී කණ්ඩායම (AHWG) සඳහා ශ්‍රී ලංකා රජය සත්කාරකත්වය සැපයූ අතර, 2021 ජූනි 30 දින අයෝරා හි ලේකම් වෙත සිය අවසන් වාර්තාව ඉදිරිපත් කළේය.

අයෝරා හි දී ශ්‍රී ලංකාව, ආපදා අවදානම් කළමනාකරණය (DMR), සංචාරක හා සංස්කෘතික හුවමාරු (TEC), නීල ආර්ථිකය (BE) සහ ධීවර කළමනාකරණ (FM) කණ්ඩායම් සඳහා සක්‍රියව සහභාගී වන අතරම සමුද්‍රීය ආරක්ෂාව සහ ආරක්ෂක පොකුරු සමූහය සම්බන්ධීකරණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

ආසියා සහ පැසිෆික් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිෂන් සභාවේ (UNESCAP) වාර්ෂික කොමිෂන් සභා සැසි ඇතුළුව රැස්වීම්/ ක්‍රියාකාරී කණ්ඩායම්/ ධාරිතා වර්ධන වැඩසටහන් 27ක දී නිලධාරීන්ගේ සහභාගීත්වය සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී. 2021 නොවැම්බර් 15-16 යන දිනවල තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වැනි දකුණු ආසියාවේ සංසදය (පශ්චාත් කොවිඩ් වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ පැවැත්වූ පළමු ජාත්‍යන්තර සමුළුව) පැවැත්වීම සහ ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන කවුන්සිලයේ සහයෝගයෙන් දකුණු ආසියාවේ තිරසාර සංවර්ධනය සඳහා වූ කලාපීය සහයෝගීතාව පිළිබඳ ප්‍රතිපත්ති සංවාදය 2021 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය ලබා දෙන ලදී.

බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (බිම්ස්ටෙක්) සභාපතිත්වය දරන රට ලෙස ශ්‍රී ලංකාව ප්‍රධාන රැස්වීම් කීපයකට සත්කාරකත්වය ලබා දුන් අතර, එහිදී බිම්ස්ටෙක් ප්‍රඥප්තිය, බිම්ස්ටෙක් හි අංශ සහ උප අංශ තාර්කීකරණය, බිම්ස්ටෙක් සාමාජික රටවල රාජ්‍යතාන්ත්‍රික ඇකඩමි/පුහුණු ආයතන අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ බිම්ස්ටෙක් මධ්‍යස්ථාන/ ආයතන පිහිටුවීම පිළිබඳ සහයෝගීතා ගිවිසුමේ (MoA) සැකිල්ල අවසන් කරන ලදී. ශ්‍රී ලංකාව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ විශේෂ සැසිවාරයට පෙර 2021 අප්‍රේල් 1

වැනි දින 17 වැනි බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීම සඳහා සත්කාරකත්වය ලබා දුන්නේය. බිම්ස්ටෙක් රැස්වීම් 8 කට නිලධාරීන්ගේ සහභාගීත්වය සැලසීම සඳහා මෙම අංශය පහසුකම් සලසා ඇත. මත් ද්‍රව්‍ය, මනෝවිද්‍යාත්මක ද්‍රව්‍ය සහ පූර්වගාමී රසායන ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම පිළිබඳ බිම්ස්ටෙක් උප කණ්ඩායමේ හයවැනි රැස්වීමට ඔක්තෝබර් 28-29 යන දිනවල ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය ලබා දෙන ලදී.

බිම්ස්ටෙක් හි මහලේකම්වරයා 2021 දෙසැම්බර් 05 සිට 10 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර, එහිදී අතිගරු ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු විදේශ අමාත්‍යවරයා, ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා, ගරු දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා සහ ගරු නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යවරයා හමුවිය. 5 වැනි බිම්ස්ටෙක් සමුළුව 2022 මාර්තු 30 වැනි දින දෙමුහුන් ආකෘතියක් යටතේ කොළඹ දී පැවැත්වීමට යෝජිත ය. අනෙකුත් සාමාජික රටවල් සත්කාරකත්වය සැපයූ අංශ පදනම් රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව ද සහභාගී විය.

2021 අගෝස්තු 10-12 යන දිනවල ශ්‍රී ලංකාව කොළඹ ක්‍රමයේ 47 වැනි උපදේශක කමිටු රැස්වීම (CCM) අතථ්‍ය අයුරින් පැවැත්වී ය. CCM වෙත යොමු කළ, ශ්‍රී ලංකාවේ රාජ්‍ය තේමා පත්‍රිකාවේ ඇතුළත් නිර්දේශයන්ට අනුකූලව, සාමාජික රටවල් අතර වඩාත් හොඳ භාවිතයන් සහ විශේෂඥතාව හුවමාරු කරගැනීමේ අරමුණින් කොළඹ ක්‍රමයේ පාරිසරික හා දේශගුණික විපර්යාස වැඩසටහන යටතේ තිරසාර හරිත නගර ගොඩනැගීම සහ හරිත අවකාශය වැඩි කිරීම යන විෂය ක්ෂේත්‍රයට නායකත්වය දීමට ශ්‍රී ලංකාව ප්‍රතිඥා දුන්නේ ය. 2022 දී පුරප්පාඩු වන කොළඹ ක්‍රමයේ මහලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකයා ලෙස ශ්‍රී ලංකා රජය විසින් තානාපති ග්‍රේස් ආශිර්වාදම් මැතිනිය නම් කරන ලදී.

2021 කොළඹ ක්‍රමය ස්ථාවර කමිටු රැස්වීම 2021 නොවැම්බර් 30 වැනි දින පැවැත්වූ අතර, කොළඹ ක්‍රමය සභාවේ 304 වැනි සැසිවාරය 2021 දෙසැම්බර් 10 වැනි දින පැවැත්විණි.

අබුඩාබි සංවාදයේ මීළඟ සභාපතිවරයා පත් කිරීම සඳහා අවශ්‍ය වන සම්මුතිය ගොඩනැගීමේ සාකච්ඡා මෙහෙයවීමට ශ්‍රී ලංකාවට නියම විය. එහිදී ශ්‍රමිකයන් යවන රටවල් සම්මුති අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීමත් සමඟම, සාකච්ඡා වට කිහිපයකින් සාර්ථක ප්‍රතිඵලයක් ලැබිණි.

2022 මැයි මාසයේ දී නිව්යෝර්ක් නුවර පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර සංක්‍රමණ සමාලෝචන සංසදයේ (IMRF) නිර්දේශවල කොන්දේසි (ToR) පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ඒ පිළිබඳ අදහස් ලබා ගැනීමට 2021 දෙසැම්බර් 17 වැනි දින විදේශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රේඛීය අමාත්‍යාංශ සමඟ රැස්වීමක් සංවිධානය කරන ලදී.

මෙම අංශය අප්‍රිකානු-ආසියානු ග්‍රාම සංවර්ධන සංවිධානය (AARDO), ආසියා සහයෝගීතා සංවාදය (ACD) G77, UNCTAD, WTO, OECD, WEF, IOM, කොළඹ ක්‍රියාවලිය සහ GFMD පිළිබඳ රේඛීය අමාත්‍යාංශ සමඟ ද සම්බන්ධ විය.

## සාගර කටයුතු, පරිසරය හා දේශගුණික විපර්යාස අංශය

### බහු පාර්ශ්වික සබඳතා

**2021 ජනවාරි 29 වැනි දින විදේශ ලේකම්වරයා විසින් මෙහෙයවන ලද සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ/ නිලධාරීන්ගේ ජාලකරණ රැස්වීම** - සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ දේශීය ප්‍රවීණයන් සමඟ විධිමත් ජාලයක් නිර්මාණය කිරීමේ අරමුණින් යුතුව මෙම අංශය ඉහත කටයුත්ත සංවිධානය කළේය. මෙය අයෝරා සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වැඩ සැලැස්මේ අරමුණකට අනුකූලව වේ. නීති විශාරදයින්, කීර්තිමත් විද්‍යාඥයින්, ත්‍රිවිධ හමුදාවේ විශේෂඥයින් සහ රාජ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත වූ මෙම අවස්ථාව සඳහා නිලධාරීන් 30

දෙනෙකු සහභාගී විය. ජර්මානු බුද්ධි මණ්ඩලයක් වන මැක්ස් ප්ලාන්ක් පදනමේ සහාය ඇතිව මෙම අංශය සංවිධානය කරන ලදී.

**ජාත්‍යන්තර මුහුදු පත්ල අධිකාරිය (ISA) සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම -** ISA ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වීම සඳහා ජාතික කේන්ද්‍රස්ථානයක් නම් කිරීම - 2021 ජනවාරි 22 වැනි දින - ජාත්‍යන්තර මුහුදු පත්ල අධිකාරිය සඳහා ජාතික කේන්ද්‍රස්ථානයක් නම් කිරීමට මෙන්ම එම අධිකාරිය සමඟ ඵලදායී ලෙස සම්බන්ධ වීමේ ක්‍රමවේද සාකච්ඡා කිරීමේ අරමුණින් යුතුව, අංශය විසින් අදාළ රජයේ නියෝජිතායතන සමඟ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් සංවිධානය කරන ලදී. විදේශ අමාත්‍යාංශය (සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය) ජාතික කේන්ද්‍රස්ථානය විය යුතු බව සහභාගිවන්නන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් තීරණය කරන ලදී. මෙම අංශය විසින් කාරක සභාව සඳහා යොමුකිරීමේ අනුදේශ කෙටුම්පත සකස් කර ඇති අතර සහභාගිවන්නන්ගේ අදහස්/ආදාන එකතු කර එය අවසන් කිරීම සඳහා කටයුතු කරමින් සිටී.

**කඩොලාන භාරකාර වැඩසටහන- පුබුදුගම, පුත්තලම, 2021 ජනවාරි 20 වැනි දින -** මෙම අංශය පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව 2018 වසරේ සිට පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තියේ කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය ක්‍රියාකාරී කණ්ඩායම (MELAG) සඳහා ප්‍රමුඛතාව ලබා සිටී. කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2021 ජනවාරි 20 වැනි දින කඩොලාන භාරකාර වැඩසටහන (MCP) දියත් කරන ලදී.

**ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමය (IORA) සම්බන්ධ රැස්වීම්**

i) **සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ අයෝරා ක්‍රියාකාරී කණ්ඩායමේ (WGMSS) 02 වැනි රැස්වීම:** 2021 මාර්තු 18-19 යන දිනවල - IORA WGMSS හි ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස මෙම අංශය විසින් ක්‍රියාකාරී කණ්ඩායමේ 2 වැනි රැස්වීම සඳහා සත්කාරකත්වය සපයන ලදී. මෙහිදී 2022-2026 වර්ෂ සඳහා IORA WGMSS වෙනුවෙන් නව වැඩ සැලැස්මක් සම්මත කරන ලදී. සීමිත ආරාධිතයන් සංඛ්‍යාවක් (ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අයෝරා සාමාජික රටවල කොළඹ පදිංචි දූත මණ්ඩල ප්‍රධානීන් මෙන්ම සංවාද හවුල්කාර රටවල ප්‍රධානීන් සහ එක්සත් ජාතීන්ගේ නිලධාරීන් ඇතුළුව) සඳහා පැවැත්වූ සමාරම්භක උත්සවයක් මගින් මෙම රැස්වීම දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලදී. අයෝරා ලේකම් කාර්යාලයේ සාමාජික රටවල් සහ සහභාගිවන්නන් ඊට අතථ්‍ය ලෙස සම්බන්ධ විය.

ii) **සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ දෙවැනි අයෝරා ක්‍රියාකාරී කණ්ඩායමේ පර්ෂද කණ්ඩායම් රැස්වීම, 2021 සැප්තැම්බර් 09 -** 2 වන IORA WGMSS වැඩ සැලැස්මේ ක්‍රියාකාරකම් 2 වන අයෝරා ක්‍රියාකාරී සැලැස්මට අනුව නැවත සකස් කිරීම පිණිස සාමාජික රටවල යෝජනා සාකච්ඡා කිරීම සඳහා අංශය විසින් මෙම රැස්වීම පවත්වන ලදී.

මෙම අංශය පොකුරු කණ්ඩායම් උපදේශන වට කිහිපයක මුලසුන හොබවමින් IORA හි MSS පිළිබඳ සමූහය [ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, කෙන්යාව, මැඩගස්කරය, මොරිෂස්, දකුණු අප්‍රිකාව, ටැන්සානියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය] 2 වැනි IORA ක්‍රියාකාරී සැලැස්මේ MSS සංරචකය අවසන් කිරීම සඳහා මෙහෙයවී ය .තවද, නොවැම්බර් මස 15 සහ 16 යන දිනවල බංග්ලාදේශයේ ඩකා හි පැවති ජ්‍යෙෂ්ඨ නිල රැස්වීමේ [CSO] 23 වැනි සැසිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර, MSS සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් යෙදවුම්/මැදිහත්වීම් ලබා දුන්නේ ය.

iii) **ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ එකොළොස්වැනි අයෝරා ද්වි-වාර්ෂික රැස්වීමේ අතථ්‍ය රැස්වීම, 2021 ජුනි 15-16 යන දිනවල -** සාගර කටයුතු, පරිසරය හා දේශගුණික විපර්යාස අංශයේ IORA WGMSS වැඩ සැලැස්ම (2022-2026) සහ එම වැඩ සැලැස්ම යටතේ අවසන් කරන ලද අනෙකුත් අදාළ අනුබද්ධ කටයුතු පිළිබඳ යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරන ලදී.

iv)**වරාය තත්ත්ව පාලනය (PSC) සහ ඉන්දියන් සාගර කලාපයේ සමුද්‍රීය සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ වෙබිනාර් සාකච්ඡාව, 2021 මැයි 04 වැනි දින -** IORA WGMSS හි ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස, මැක්ස් ප්ලාන්ක් පදනම සමඟ එක්ව මෙම අංශය විසින් මෙම වෙබිනාර් සාකච්ඡාව සංවිධානය කරන ලදී. බොහෝ දුරට අයෝරා සාමාජික රටවල්වලට අයත් රටවල් දහතුනකින් (13) සහභාගී වන්නන් තිස් නව දෙනෙක් (39), ජාත්‍යන්තර ධීවර පාලනය සහ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය

(IMO) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර නීති සහ ප්‍රමිතීන් සමඟ වෙළඳ නැව්ගත කිරීම පිළිපැදීම යන දෙකෙහිම සන්දර්භය තුළ වරාය තත්ව බල ප්‍රදේශය පාලනය කරන වත්මන් ජාත්‍යන්තර නියාමන රාමුව පිළිබඳව සහභාගිවන්නන්ට අවබෝධයක් ලබා දුන් මෙම මාර්ගගත රැස්වීම සඳහා ලියාපදිංචි වූහ. මේ සඳහා ජාත්‍යන්තර සහ දේශීය කථිකයන් යන දෙපිරිසම සහභාගි වූහ.

**ජාතික සබ්මැරීන් කේබල්වල ඔරොත්තු දීමේ හැකියාව සහ ආරක්ෂණ රාමුවක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියට නායකත්වය දීම -** සබ්මැරීන් කේබල් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ආසන්නව පවතින/ ගමන් කරන බැවින්, යෝජිත රාමුව මඟින් එම සබ්මැරීන් කේබල්වල සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතික කිරීමට උපකාරී වේ. මෙම කේබල් ශ්‍රී ලංකාව සහ තවත් බොහෝ ඉන්දියානු සාගර රාජ්‍යයන් සඳහා ජීව මාර්ගයන් වන අතර, ශ්‍රී ලංකා අධිකරණ බලය යටතේ මුහුදු පත්ලේ පිහිටි ස්ථාන වේ. ජාතික සබ්මැරීන් කේබල් ආරක්ෂණ සහ ඔරොත්තු දීම පිළිබඳ රාමුව ශ්‍රී ලංකාවේ සබ්මැරීන් කේබල් ජාලය ආරක්ෂිත සහ ඔරොත්තු දෙන බව සහතික කරන පියවර පිළිබඳව විස්තර කරයි. මෙම රාමුව පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශන සහිතව සකස් කරන ලද අතර, එය 2021 ජූලි 15 වැනි දින අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. ජාතික අයවැය සම්පාදන ක්‍රියාවලිය 2021 නොවැම්බර් මාසයේ සිට ආරම්භ වන බැවින්, අදාළ සංශෝධන මාස තුනක් (03) ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සිදුවන බැවින් ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය කඩිනම් කළ යුතු බව ජනාධිපති ලේකම්වරයා නීතිපති දෙපාර්තමේන්තුවට උපදෙස් දුන්නේ ය.

**පොදුරාජ්‍ය මණ්ඩලයීය කසළ වැඩසටහනට (CLiP) අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම -** ශ්‍රී ලංකාව සඳහා මෙම ව්‍යාපෘතිය ජයග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය මෙම අංශය මඟින් ආරම්භ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස MEPA, ITI, CEA සහ NARA ආයතන සඳහා ප්ලාස්ටික්, විශේෂයෙන්ම ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳව පර්යේෂණ කිරීම සඳහා විද්‍යාගාර පහසුකම්, උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි වූ අතර, ගංගා සඳහා කසළ රඳවා ගැනීමේ දැල්, ශ්‍රී ලංකාවේ විද්වතුන් සහ එක්සත් රාජධානියේ පර්යේෂණ ආයතන/ විශ්වවිද්‍යාල අතර පර්යේෂණ සහයෝගිතා, වරාය අපද්‍රව්‍ය සහ අත්හැර දමන ලද ධීවර ආම්පන්න තක්සේරු කිරීම, මාධ්‍ය ප්‍රචාරණ, රූපවාහිනිය සහ සමාජ මාධ්‍ය හරහා ප්ලාස්ටික් කසළවල අහිතකර බලපෑම් පිළිබඳව දැනුවත් කිරීම, ආධාර ප්ලාස්ටික් දූෂණය පිළිබඳ ගැටළු පිළිබඳව දැනුවත් කිරීම සඳහා විෂයමාලා සංවර්ධනය සඳහා ද ආධාර වෙන් කොට ඇත. 2021 අගෝස්තු 20 වැනි දින දක්වා සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වූ පිරිවැය මහා බ්‍රිතාන්‍ය පවුම් 843,185 කි.

**UNFCCC කොප් 26, ග්ලාස්ගෝ, එක්සත් රාජධානිය, 2021 ඔක්තෝබර් 31 සිට නොවැම්බර් 12 වැනි දින දක්වා -** ශ්‍රී ලංකාව මින් ඉදිරියට ගල් අඟුරු බලාගාර ඉදි නොකරන බවට පොරොන්දු වෙමින් ජනාධිපතිවරයා සිදු කළ ප්‍රකාශය සඳහා මෙම අංශය දායක විය. මෙම කටයුත්තට ජාත්‍යන්තර මාධ්‍ය තුළ ශ්‍රී ලංකාවට පුළුල් හා සාධනීය ප්‍රචාරණයක් ලැබිණි. වනාන්තර සහ ඉඩම් පරිහරණය, අධ්‍යාපනය සහ පරිසරය, පුනර්ජනනීය බලශක්ති සංක්‍රාන්තිය, සමුද්‍ර ආරක්ෂිත ප්‍රදේශ ආදිය සම්බන්ධ ප්‍රතිඥා සහ ප්‍රකාශ 09කට සම්බන්ධ වීමට ශ්‍රී ලංකාව සඳහා රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කර ඇත. ශ්‍රී ලංකා දූත පිරිසේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා තාක්ෂණය සහ විදේශ ඍජු ආයෝජන (FDI) හුවමාරු කිරීම සඳහා විශේෂයෙන් නියෝජිතායතන සහ ප්‍රභූවරුන් සමඟ ජාලකරණ අවස්ථා සංවිධානය කිරීම.; "නයිට්‍රජන් නැවත සොයාගැනීම: දේශගුණික විපර්යාස, සෞඛ්‍ය, ජෛව විවිධත්වය සහ චක්‍රලේඛ ආර්ථිකය සඳහා විසඳුම් සහ සහයෝගීතා" මැයෙන් අතුරු උත්සවයක් ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) විධායක අධ්‍යක්ෂ ඇතුළු ඉහළ මට්ටමේ කථිකයන් සමඟ සංවිධානය කරන ලදී. මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නොවැම්බර්

08 වැනි දින "නීල කාබන් ප්‍රතිස්ථාපනය ක්‍රියාවට නැංවීම; පොදු රාජ්‍ය මණ්ඩලයෙන් උදාහරණ", නොවැම්බර් 09 වැනි දින පැවති "ඇය දේශගුණය වෙනස් කරයි" නමැති ජෛව විවිධත්ව සහෝදරියන්ගේ මණ්ඩලය, නොවැම්බර් 10 වැනි දින පැවති "ඉතා වැදගත් පාඩම් හුවමාරු කරගැනීම- කඩොලාන, පොදුරාජ්‍ය මණ්ඩලය සහ රොටරි සංවිධානය" වැඩසටහන යන වැඩසටහන තුළ දේශකයකු වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළේ ය. තවද, පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්වරයා, දකුණු ආසියා සහයෝගීතා පරිසර වැඩසටහනේ (SACEP) අධ්‍යක්ෂ ජනරාල්වරයා, ෆීජි හි අග්‍රාමාත්‍යවරයා, එක්සත් රාජධානියේ පරිසර, ආහාර සහ ග්‍රාමීය කටයුතු දෙපාර්තමේන්තුවේ (Defra) රාජ්‍ය ලේකම්, බෙලීස් හි නීල ආර්ථික අමාත්‍යාංශය, කෘෂිකර්ම, දේශගුණික විපර්යාස සහ පරිසර අමාත්‍යවරයා, PEW පුණ්‍ය භාරකරත්වය, ජාත්‍යන්තර රොටරි සංවිධානයේ සභාපති, ඉන්දියාවේ පරිසර, වනාන්තර සහ දේශගුණික විපර්යාස අමාත්‍යාංශයේ ලේකම්වරයා යනාදීන් සමඟ ජාලකරණ අවස්ථා කිහිපයක් පැවැත්වී ය.

**ස්වභාව ධර්මය සඳහා වූ ස්වෛරී ණය හුවමාරුව**

මේ සම්බන්ධයෙන් සීෂෙල්ස් සංරක්ෂණ සහ දේශගුණ අනුවර්තන භාරයේ (SEYCCAT) ප්‍රධාන විධායක නිලධාරියා සහ පෘථිවිය සහ නිල් හරිත අනාගතය නැවත සමතුලිත කිරීමේ වැඩසටහනේ සහකාර අධ්‍යක්ෂ/ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම-අරමුදල්කරු සමඟ සාකච්ඡා පැවැත්විණි.

**අසම්පූර්ණ/ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාකාරකම්: අමාත්‍ය මට්ටමේ ඉන්දියන් සාගර සමුළුවක් -** මෙය 2021 වසරේ 3 වැනි හෝ 4 වැනි කාර්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත්, විවිධ හේතූන් නිසා එය කල් දමන ලදී. මෙම අංශයේ අදහස වන්නේ 2019 දී ට්‍රැක් 1.5 අංගයක් පැවැත්වීමෙන් පසුව, ඊළඟට පැවැත්විය යුත්තේ අමාත්‍ය අංගයක් වන බවයි. පසුව, 2022 දී භෞතික සහභාගීත්වයෙන් තවත් ට්‍රැක් 1.5 අංගයක් සංවිධානය කිරීම පිළිබඳව සලකා බලන ලෙස විදේශ ලේකම්වරයා උපදෙස් දුන්නේය. මෙම අංශය දැනට මැක්ස් ප්ලාන්ක් පදනම (ජර්මනිය) සමඟ සම්බන්ධ වී සිටින අතර, සංකල්ප පත්‍රිකාව/ සටහන, නිකුත් කිරීමේ පත්‍රිකා සහ සිදුවීම සඳහා වියහැකි ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ සහ නියාමකවරුන්ගේ ලැයිස්තුව පිළිබඳ සාකච්ඡා/ සංවර්ධනය කිරීම සඳහා රැස්වීම් කිහිපයක් පවත්වා ඇත.

**පොදුරාජ්‍ය මණ්ඩලයීය නීල ප්‍රඥප්තිය, කඩොලාන පරිසර පද්ධති සහ ජීවනෝපාය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ [MELAG] 3 වැනි රැස්වීම -** 2022 වසර අග දී පැවැත්වීමට සැලසුම් කොට ඇත.

**සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ මාර්ගෝපදේශ සහ රෙගුලාසි සම්මත කිරීම -** ශ්‍රී ලංකා මුහුදේ සමුද්‍රීය පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ (MSR) නිෂ්කාශන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සඳහා, අංශය පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශනය හරහා සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ රෙගුලාසි සහ මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළේය. මාර්ගෝපදේශ සහ රෙගුලාසි, අමාත්‍ය මණ්ඩල සංදේශය සහ කැබිනට් මණ්ඩලය සඳහා පසුබිම් සටහනක් මේ වන විට අවසන් කොට ඇත. අදාළ ලේඛන සඳහා නීති අංශයෙන් අවසන් නිෂ්කාශනය අපේක්ෂාවෙන් පවතී.

**නව මුලපිරීම්**

**එම්වී එක්ස්ප්‍රස් පර්ල් නෞකා ව්‍යසනයට ප්‍රතිචාර වශයෙන් සිදු කරන ලද කටයුතු -** එම ව්‍යසනය සිදු වූ වහාම හානිය පිළිබඳ පාරිසරික තක්සේරුවක් සිදු කිරීම සඳහා විශේෂඥ කණ්ඩායමක් UNEP හරහා ශ්‍රී ලංකාවට එවා ඇති බව සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සමඟ මෙම අංශය සම්බන්ධීකරණය කරන ලදී. එසේම සියලුම විදේශ ආධාර (මූල්‍ය, උපකරණ සහ තෛතික ආධාර) සම්බන්ධීකරණය කරන ලද අතර, කොළඹ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල අදාළ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කර ඇත. ප්‍රතිසාධන මෙහෙයුම් සඳහා නාරා ආයතනයට සහාය වීම පිණිස දින 04ක් ඇතුළත ඉන්දියානු යාත්‍රාවක් පැමිණීම සහතික කිරීමට මෙම අංශයට හැකි විය. තවද, සාගර සත්ත්ව සාම්පල සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් සාම්පල පිළිබඳ නීතිමය කටයුතු සඳහා භාවිතා කිරීම සඳහා පිළිගත් විදේශීය රසායනාගාර සහ රසායනාගාර (Cefas, NOAA සහ CEDRE, ALS, ආදිය) වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය නියෝජිතායතන (MEPA, DWC සහ NARA) අතර සම්බන්ධීකරණය කරන ලදී. අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි 'සමුද්‍රීය ආපදා

සූදානම් යාන්ත්‍රණයක්' සඳහා සංකල්ප සටහනක් සකස් කර අන්තර්වාර යාන්ත්‍රණයක් සමඟ එක්ව හැකියාවන් සහ සම්පත් අනුකෘතියක් සකස් කරන ලදී. සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හරහා ඇ.ඩො. 180,000ක් වටිනා වෙරළ පිරිසිදු කරන යන්ත්‍ර 08ක් MEPA වෙත ලබා ගැනීම ද මෙම අංශය විසින් සම්බන්ධීකරණය කර ඇත.

කැස්බෑවන්ගේ මළ සිරුරු විශ්ලේෂණය කිරීම සඳහා ඉතාලි විශේෂඥයින් 03 දෙනෙකු ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම මෙන්ම විදේශීය රසායනාගාරවල විශ්ලේෂණය සඳහා පස්, ක්ෂුද්‍ර ප්ලාස්ටික් කැබලි සහ බයෝටා සාම්පල යැවීමට MEPA වෙත සහය විය.

**සමුද්‍රීය ආපදා සඳහා සූදානම -** මෙම අංශය විසින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආපදා සූදානමට අදාළ සම්පත් සහ හැකියාවන් පිළිබඳ අනුකෘතියක් සකස් කෙරුණු අතර එය කොළඹ පිහිටි තෝරාගත් රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල වෙත බෙදා හරින ලදී. ඕස්ට්‍රේලියාව, යුරෝපා සංගමය සහ සිංගප්පූරුව යන රටවල සමුද්‍රීය ආපදා අධිකාරිය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවට සහාය වීම සඳහා විශේෂඥයින් හඳුනා ගැනීමට මෙම අංශය කටයුතු කළේ ය.

**ගංගා ආශ්‍රිත ප්ලාස්ටික් පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතියට ආධාර ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම -** Cefas අංශය (එක්සත් රාජධානියේ Defra හි විෂය පථය යටතේ වන) සමඟ සමීපව සහයෝගීතාවයෙන් කටයුතු කිරීම, ගංගා ආශ්‍රිත ප්ලාස්ටික් සඳහා තවත් අරමුදලක් කරා ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාවට හැකි විය. ප්‍රතිලාභී ශ්‍රී ලාංකික නියෝජිතායතන - NARA, ITI, MEPA සහ CEA.

**තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශය -** ප්‍රථම වරට දේශගුණික විපර්යාස පිළිබඳ කතිකාවට නයිට්‍රජන් ගෙන ඒම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරිසර අමාත්‍යාංශය, කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර නයිට්‍රජන් කළමනාකරණ පද්ධති සමඟ සම්බන්ධීකරණය කිරීම. 2021.04.27 – 29 "දේශගුණය සහ හරිත ප්‍රතිසාධනය සඳහා නයිට්‍රජන්" පිළිබඳ පූර්ව COP26 අතථ්‍ය අංගයක දී මෙම අංශය ද (අධ්‍යක්ෂ ජනරාල්වරයා නියාමකයෙක් විය) දායක විය.

ජාත්‍යන්තර තලය තුළ රට සඳහා ධනාත්මක ආවරණයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන කැපවීම් (එනම් 2030 වන විට 70% පුනර්ජනනීය බලශක්තිය, 2050 වන විට කාබන් උදාසීනතාවය සහ තවදුරත් අලුතින් ගල් අඟුරු භාවිත නොකිරීම) පිළිබඳව UNFCCC වෙත කාලෝචිත ලෙස NDC ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා අංශය විසින් ලබා දුන් දායකත්වය (2021 ජූලි 30 වන විට).

මීට අමතරව, දෙසැම්බර් 08 වැනි දින 'ද ඉකොනොමිස්ට්' සඟරාව විසින් "දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා සොබාදහම පදනම් කරගත් සාගර විසඳුම්" නමින් සංවිධානය කරන ලද ලෝක සාගර සමුළුවේ (අථත්‍ය) DERANA 24 Nature 24 වැඩසටහන ඇතුළුව සාගර, පරිසරය සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත සම්මන්ත්‍රණ/ වැඩමුළු/ වෙබිනාර් සාකච්ඡා කිහිපයකට සම්පත් දායකයෙකු/ කථිකයෙකු ලෙස මෙම අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය.

නීතිය බලාත්මක කිරීම, නායකත්වය සහ සන්නිවේදන කුසලතා පිළිබඳ වනජීවී, වන හා ධීවර නිලධාරීන් පුහුණු කිරීම සඳහා UNODC සමඟ සම්බන්ධීකරණය කිරීම.

සමුද්‍ර ජෛව විවිධත්වය, සමුද්‍ර දූෂණය, තිරසාර මුහුදු ආහාර කර්මාන්තය සහ දේශගුණික විපර්යාස සඳහා සහය වන එක්සත් රාජධානියේ Blue Planet Fund - Ocean Country Partnership Program සහාය සඳහා ප්‍රවේශ වීම සඳහා ශ්‍රී ලංකාව (රටවල් 15ක් අතර) ප්‍රමුඛතා රටක් බව සහතික කිරීමට හැකි විය.

සමුද්‍ර අවකාශීය සැලසුම් කිරීම ආරම්භ කිරීම සඳහා අවිධිමත් සාකච්ඡා ආරම්භ කිරීම සහ ඒ සඳහා තාක්ෂණික සහ මූල්‍ය ආධාර ලබා ගත හැකි මූලාශ්‍ර හඳුනා ගැනීම.

## ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය, රජයේ විදේශ ප්‍රතිපත්තිය මත පදනම්ව ප්‍රතිපත්ති අරමුණු හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ අමාත්‍යාංශයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවා (SLFS) නිලධාරීන්ගේ සහ දූත මණ්ඩල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට අදාළ සියලු කටයුතු සම්බන්ධීකරණය කරයි.

සමාලෝචිත කාල සීමාව තුළදී අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, මූල්‍ය වර්ෂය අවසානයේ දී අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධනය තක්සේරු කිරීමේ අරමුණින් යුතුව වාර්ෂික ඉලක්ක සැකසීම සඳහා අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සහ විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරන ලදී. ඒ අනුව, මෙම අංශය විසින් 2020 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. තවද, රජයේ ව්‍යවස්ථාදායක අවශ්‍යතාවයට අනුව 2021 ප්‍රගති වාර්තාව සම්පාදනය කොට 2021 ඔක්තෝබර් මාසයේ දී වාර්ෂික අයවැය කාරක සභා රැස්වීමට ඉදිරිපත් කර ඇත.

නියාමන අවශ්‍යතා සහ අයවැය අරමුණු අනුව මෙම අංශය විසින් 2022 සඳහා ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කර ඇත. 2020 වසරේ 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුව සහ අතිගරු ජනාධිපතිතුමාගේ දැක්මට අනුව සකස් කරන ලද "2020 සහ ඉන් ඔබ්බට කරුණු 20 ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ" පිළිබඳ ලේඛන ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සහ රජයේ විදේශ ප්‍රතිපත්ති ප්‍රමුඛතා ප්‍රකාශයට පත් කිරීම සඳහා කොළඹ පදනම් කොටගත් ශ්‍රී ලංකාව සඳහා අක්ත ගන්වා ඇති රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ මෙම අංශය බෙදාහදා ගෙන ඇත.

ආයතන ගොඩනැගීම සහ අමාත්‍යාංශයේ මානව සම්පත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, විභාග දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට, මෙම අංශය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.

- 2020/2021 දී ශ්‍රී ලංකා විදේශ සේවයට III ශ්‍රේණියේ නිලධාරීන් 40 දෙනෙක් බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම. දීප ව්‍යාප්ත සේවාවන්ට අනුකූලව ශ්‍රී ලංකා විදේශ සේවයේ නිළධාරීන් බඳවා ගැනීමේ විභාගය අදියර දෙකකින් පවත්වනු ලබන අතර, මෙය එවැනි විභාගවල පළමු විභාගය වනු ඇත.

- ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා 1 වැනි සහ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරීන් සහ පුද්ගලික සහකාර පුරප්පාඩු පිරවීම සඳහා වන තරඟ විභාගය -2020 (2021) පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මෙම අමාත්‍යාංශය විසින් නිම කරන ලදී.

**සටහන:** කෙසේ වුවද, පවතින වසංගත තත්ත්වය සහ විභාග කල්දැමීම හේතුවෙන් බාධා කිහිපයක් ඇති වී ඇති අතර, එමනිසා මෙම ක්‍රියාවලීන් අවසන් කිරීම ප්‍රමාද වී ඇත.

- පවතින මූල්‍ය බාධා, අමාත්‍යාංශයේ/දූත මණ්ඩලයේ විෂය පථය පුළුල් කිරීම සහ අමාත්‍යාංශයේ/දූත මණ්ඩලයේ පවත්නා කාර්ය මණ්ඩල ව්‍යුහය නැවත ඇගයීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, විදේශ ලේකම්වරයාගේ මඟපෙන්වීම යටතේ අනෙකුත් අභ්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව තාර්කික කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සංවාදය මෙම අංශය විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

- i).ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ සේවක සංඛ්‍යාව තාර්කිකකරණය විශ්ලේෂණය කිරීම සඳහා පිහිටුවන ලද කමිටු කිහිපයකට සහභාගී වීම, ii ). අමාත්‍යාංශයට අනුයුක්ත ඇතැම් නිලධාරීන්ට

තරඟකාරී තේරීම් ක්‍රියාවලියක් හරහා විදේශ දූත මණ්ඩලවල සේවය කිරීමට ඇති අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම, iii). අනෙකුත් සමස්ත ලංකා සේවාවන්ට අනුකූලව ශ්‍රී.ලං.වි.සේ. නිලධාරීන් සඳහා නව උසස්වීමේ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා ස්ථාපිත කමිටු කිහිපයක් සඳහා සහභාගී විය.

- ශ්‍රී ලංකා විදේශ සේවය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විදේශ සේවයේ විශේෂ ශ්‍රේණිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා දෙපාර්තමේන්තුව සමඟ පුළුල් ලෙස සම්බන්ධ විය. සුදුසුකම් ලත් ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු වූ විශේෂ ශ්‍රේණියේ තනතුරු 16ක් පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට නිලධාරීන් වෙත අදාළ නිවේදනය නිකුත් කර ඇත.

- බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සහ විශේෂ ශ්‍රේණියේ තනතුරු සංස්ථාගත කිරීමේ නව ප්‍රතිපාදන ඇතුළත් කිරීම සඳහා 2016 ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ද මෙම අංශය තේරීම් කාරක සභාව සමඟ සම්බන්ධීකරණය විය.

- ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි, විදේශ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා කැපවූ ඒකකයක් පිහිටුවීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වන අනුමැතිය 2021 ජනවාරි මාසයේදී ලැබුණු අතර එම අනුමැතියට අනුව, යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය ප්‍රමුඛ පෙළේ පුද්ගලික සමාගම්වල සේවය කරන මේ පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ වෘත්තිකයන්ගෙන් නාමයෝජනා කැඳවා, මෙම ඒකකය පිහිටුවීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. උනන්දුවක් දක්වන වෘත්තිකයන්ගෙන් ලැබුණු අයදුම්පත් සහ ඒකක ප්‍රධානියා සඳහා වන නාමයෝජනා ඉදිරි කටයුතු සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කොට ඇත.

- අමාත්‍යාංශයේ උපාය මාර්ගික සන්නිවේදන ඒකකයක් පිහිටුවීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයකට මෙම අංශය සහභාගී වූ අතර, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපායමාර්ගික සන්නිවේදන උපායමාර්ගයක් සැකසීම සඳහා කලින් කෙටුම්පත් කරන ලද යෝජනාව අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇත.

- මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් ඔවුන්ගේ පශ්චාත් උපාධි සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කරන ලද නියෝජනයන් සම්බන්ධීකරණය කරන අතර, ශ්‍රී ලංකාවේ 2016 විදේශ සේවා ව්‍යවස්ථාවේ C උපග්‍රන්ථය තුළ දක්වා ඇති පරිදි ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම් අධ්‍යයනය කිරීම සහ නිර්දේශ කිරීම සඳහා පිහිටුවා ඇති ස්ථාවර කමිටුව නියෝජනය කර ඇත. ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම් නව ඇතුළත් කිරීම් සම්බන්ධයෙන් ද මෙම අංශය තේරීම් කාරක සභාව සමඟ සම්බන්ධ විය.

- මෙම අංශය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විදේශ සේවයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන නිලධාරීන් සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහන් කිහිපයක් සඳහා පහසුකම් සලසා ඇත. තවද, කළමනාකරණය, නායකත්ව කුසලතා සහ වෘත්තීය ප්‍රගමන අරමුණු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 50 දෙනෙකු සඳහා 3 වැනි කාර්යක්ෂමතා කඩඉම් ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන පැවැත්වීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සමඟ සහයෝගයෙන් යුතුව ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය විසින් කටයුතු කරන ලදී.

- අලුතින් නම් කරන ලද දූත මණ්ඩල ප්‍රධානීන්, දූත කාර්යාල ප්‍රධානීන් සහ මාරුවීම් මත පිටත්ව යාමට නියමිත රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා පෙබරවාරි සහ අගෝස්තු/ සැප්තැම්බර් මාසවල දී ආයතනික සහ බාහිර සම්පත් පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් යුතුව හුරුපුරුදු කරවීමේ වැඩසටහන් දෙකක් සංවිධානය කර අතථ්‍ය අයුරින් පවත්වන ලදී.

- මෙම අංශය අමාත්‍යාංශයේ අදාළ අංශ සමඟ සාකච්ඡා කර ජාතික ආරක්ෂාව, ත්‍රස්තවාදය පිටුදැකීම සහ ඊට අදාළ මාතෘකා කිහිපයක් සම්බන්ධයෙන් ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (INSS) විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ සඳහා නිරීක්ෂණ / යෝජනා ලබාගෙන ආරක්ෂක අමාත්‍යාංශයට යැවීමට නියමිත සංයුක්ත ප්‍රතිචාරයක් සකස් කළේ ය.

- විදේශ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව, මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ සේවා අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හරහා පැය 200 ක විශේෂ දෙමළ භාෂා පුහුණු පාඨමාලාවක් සංවිධානය කළේ ය.

- විදේශයන් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා පත් කරන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ කලත්‍රයන්ගේ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් යෝජිත අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා නිරීක්ෂණ ලබා ගැනීම සඳහා මෙම අංශය අදාළ පාර්ශ්ව සමඟ සම්බන්ධ වූ අතර එම කටයුත්ත මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

- විදේශයන්හි හඳුනාගත් විදේශ දූත මණ්ඩල 16 ක ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා “තානාපති නිලය” සහිත තනතුරක් ඇති කිරීමට විදේශ අමාත්‍යාංශය විසින් කරන ලද යෝජනාවට අදාළ කරුණු අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවට අදාළ කටයුතු මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම කමිටුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අතර අතිරේක ලේකම්/ජනාධිපති ලේකම් කාර්යාලය එහි ප්‍රධානියා විය. කමිටුවේ අවසන් වාර්තාව විදේශ ලේකම්වරයා වෙත භාරදී ඇත.

- ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් අතර සාකච්ඡාව පදනම් වූ වැඩ සංස්කෘතියක් දිරිගැන්වීමේ අරමුණින්, ජාත්‍යන්තර සබඳතා සහ රාජ්‍යතාන්ත්‍රික කාලීන ගැටලු පිළිබඳ සාකච්ඡා මාලාවක් මෙම අංශය විසින් සංවිධානය කරන ලදී.

- 2021 දූත මණ්ඩල නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම

- මෙම කාලසීමාව තුළ විදේශ ලේකම්වරයාගේ ඍජු විෂය පථයට අයත් වන මෙම අංශය විසින් විවිධ ප්‍රකාශන සඳහා වාර්තා සහ අමාත්‍යාංශයේ ප්‍රගතිය සහ ප්‍රධාන ජයග්‍රහණ පිළිබඳ කාලීන වාර්තා කිහිපයක් අවශ්‍ය විට දී ඉදිරිපත් කරන ලදී.

## මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය


මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය, විදේශවල දී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රක්ෂේපණය කිරීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා රජය සහ බාහිර ක්‍රියාකාරීන් අතර අතුරු මුහුණත ලෙස කටයුතු කරයි. මෙම අංශය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතාවලට අදාළව අමාත්‍යාංශයේ සහ පොදුවේ රට තුළ සිදුවන සිදුවීම්/ තත්ත්වයන් ආවරණය කරයි. මීට අමතරව, අංශය විසින් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල සිදුවීම්/ ප්‍රවණතා පිළිබඳ තොරතුරු බෙදා හරිනු ලැබේ.

**මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය**

මෙම අංශය විසින් දේශීය/ විදේශීය මාධ්‍ය සහ වෙබ් ප්‍රවෘත්ති වල අඩංගු වන මෙම අමාත්‍යාංශයට/ ශ්‍රී ලංකාවට අදාළ වැදගත් ප්‍රවෘත්ති පිළිබඳව අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් සහ සියලුම දූත මණ්ඩල/ දූත කාර්යාල දිනපතා අධීක්ෂණය සහ යාවත්කාලීන කිරීම සිදු කරයි. අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට අහිතකර ප්‍රවෘත්තිවල දෛනික යාවත්කාලීන කිරීම් විදේශ ලේකම්වරයාගේ අවධානයට යොමු කොට, අවශ්‍ය යැයි සලකන විට දී ප්‍රතික්ෂේප කිරීම් නිකුත් කරනු ලැබේ. තවද, සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් මාධ්‍ය නිවේදන, ප්‍රකාශ, දූත මණ්ඩල පුවත් සහ දැන්වීම් දේශීය මුද්‍රිත සහ ඩිජිටල් මාධ්‍ය වෙත මෙන්ම කොළඹ කේන්ද්‍ර කොට ගත් විදේශ වාර්තාකරුවන් වෙත බෙදා හරින ලද අතර, ඒවා මුද්‍රිත මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය තුළ පළ කිරීම සඳහා මෙන්ම රූපවාහිනියේ සහ ගුවන් විදුලියේ නිරන්තරයෙන් විකාශනය කිරීම සඳහා ද සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන ලදී.

මීට අමතරව, මෙම අංශය මහජන සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකාවල දෛනිකව නිරත වන අතර, ඉලක්කගත ග්‍රාහක පිරිස් වෙත තොරතුරු ඵලදායී ලෙස සම්ප්‍රේෂණය කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ මහජනතාව සම්බන්ධ කර ගැනීමට සියලුම දූත මණ්ඩල/දූත කාර්යාල බොහෝ අවස්ථාවන්හි දී දිරිමත් කරනු ලැබේ. එමෙන්ම, අමාත්‍යාංශයේ ට්විටර් පණිවිඩ/පෝස්ටු ආදිය අදාළ පරිදි නැවත යොමු කිරීමට/නැවත පළ කිරීම සඳහා ද දූත මණ්ඩල/දූත කාර්යාල දිරිමත් කරනු ලැබේ.

**සමාජ මාධ්‍යයේ භාවිතය හා අංශයේ නියැලීම**




ගෝලීය වසංගතය හේතුවෙන් මෙම කාල සීමාව තුළ දී අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද කාර්යයන් සීමා කරන ලදී. 2021 ජූලි 27 වැනි දින අමාත්‍යාංශයේ දී ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ 50 වැනි සංවත්සරය සැමරීම සඳහා ශ්‍රී ලංකාවේ දී සහ සිංගප්පූරුවේ දී මුද්දර එළිදැක්වීම සහ සිංගප්පූරුව පදනම් කරගත් ගෝලීය ලාභ නොලබන ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවසන් කිරීමේ සන්ධානය (Alliance) වෙතින් පරිත්‍යාග කරන ලද 'බීච්ටෙක් හයිඩ්‍රෝ ස්වීපි' වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍රෝපකරණ, විදේශ ලේකම්වරයා විසින් 2021 අගෝස්තු 02 වැනි දින මීගමුව සරුක්කුව වෙරළ තීරයේ දී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීම පිළිබඳව ඩිජිටල්/මුද්‍රිත මාධ්‍ය මාධ්‍යවේදීන් විසින් ආවරණය කිරීම සඳහා මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය කටයුතු කළේය. මෙවලම් සහ අංශයේ සබඳතා

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ දී විදේශ මාධ්‍ය කාර්ය මණ්ඩලයේ බොහෝ සංචාර නොතිබුණ ද, විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකාව තුළ විදේශ මාධ්‍ය ආවරණය/ රූගත කිරීම් සඳහා ද අංශය පහසුකම් සපයයි. කෙසේ වෙතත්, වසංගතය මධ්‍යයේ, Humble Bee Pictures UK හි ත්‍රි පුද්ගල කාර්ය මණ්ඩලයක් 2021 මැයි 01 සිට ජූනි 01 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. තවද, ස්වීඩන් මාධ්‍ය කණ්ඩායමක්, පෝලන්තයේ TVN මාධ්‍ය කණ්ඩායමක් සහ එක්සත් රාජධානියේ BBC මාධ්‍ය කණ්ඩායමක් රූගත කිරීම් සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමේ හැකියාව පිළිබඳව විමසා ඇත

විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගතය වැනි හදිසි අවස්ථාවල දී, වෙළෙඳ, ආයෝජන ප්‍රවර්ධන, සංචාරක ප්‍රවර්ධනයට අදාළ වැදගත් තොරතුරු පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශන සහ ප්‍රාදේශීය අමාත්‍යාංශ/ ආයතනවල දෛනික යාවත්කාලීන කිරීම් පිළිබඳ තොරතුරු මෙම අංශය විසින් ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල වෙත සක්‍රීයව ලබා දී ඇත.

## ජාත්‍යන්තර ආරක්ෂාව සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අංශය

**එල්ටීටීඊ සංවිධානය හා සම්බන්ධ කරුණු:**

එල්ටීටීඊ සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීම, මෙම කාලය තුළ දී යුරෝපා සංගමයේ සමාලෝචන කිහිපයකට ලක් විය. 2021 ජනවාරි සහ 2021 ජූලි මාසවල දී එය දීර්ඝ කිරීමට සහාය වීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සම්පාදනය කිරීම පිණිස ජාතික බුද්ධි ප්‍රධානී (CNI) කාර්යාලය, ත්‍රස්ත මර්දන විමර්ශන අංශය (CTID), හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය (DMI), රාජ්‍ය බුද්ධි සේවය (SIS), ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුව සහ අදාළ දූත මණ්ඩල සමඟ මෙම අංශය සම්බන්ධීකරණය කොට, යුරෝපීය බාහිර ක්‍රියාකාරී සේවාවන් හි (EEAS) සම්බාධක ප්‍රතිපත්ති අංශය (SPD) සමඟ බෙදා හදා ගන්නා ලදී. එක්සත් රාජධානියේ, දෙමළ ඊළාම් සංක්‍රාන්ති රජය (TGTE) විසින් දියත් කරන ලද අභියෝගයේ දී තහනම් සංවිධාන අභියාචනා කොමිසම (POAC) විසින් සිය විවෘත විනිශ්චය එක්සත් රාජධානියේ ස්වදේශ ලේකම්වරයාට පක්ෂව ඉදිරිපත් කරන ලද අතර, ඔහු 2021 සැප්තැම්බර් මාසයේදී TGTE හි අයදුම්පත ප්‍රතික්ෂේප කොට එල්ටීටීඊය එක්සත් රාජධානියේ ත්‍රස්ත සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීම එසේම පවත්වා ගැනීමට තීරණය කළේය. මෙම අංශය, අභ්‍යන්තර ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව මෙම ප්‍රතිඵලයට සහාය වීම සඳහා අදාළ තොරතුරු ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන ලදී. ඉතාලියේදී, 2021 සැප්තැම්බර් මාසයේ දී ‘ශ්‍රී ලංකාවේ ජන සංහාරය’ හඳුනාගැනීමේ ප්‍රොටෝකෝලයක් සම්මත කිරීම සඳහා ප්‍රතිචාරයක් ලෙස, මෙම අංශය ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරමින් ඉතාලි බලධාරීන් සමඟ සහ කොළඹ පිහිටි ඉතාලි දූත මණ්ඩලය හරහා ද මෙම කාරණය සම්බන්ධීකරණය කරයි. කටයුතු කළ යුතු රටා සහ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා, විශේෂිත දිනවල සහ සිදුවීම්වල දී විදේශයන්හි එල්ටීටීඊයට සම්බන්ධ සමාජ මාධ්‍ය සහ දේශපාලන ක්‍රියාකාරකම් ද මෙම අංශය විසින් නිරීක්ෂණය කරන ලදී. තවද, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය තුළ එල්ටීටීඊය අඛණ්ඩව තහනම් කිරීම සම්බන්ධයෙන් අදාළ දූත මණ්ඩලවලට යෙදවුම් ලබා දී සම්බන්ධීකරණය කර ඇත.

**ශ්‍රී ලංකා ආරක්ෂක ආයතනවල විදේශ ජාලය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම:**

ත්‍රස්තවාදයට සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව සටන් කිරීමට අදාළ මෙහෙයුම් ජාලය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකාවේ බුද්ධි අංශ සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ ඔවුන්ගේ විදේශ සගයන් අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, මෙම අංශය නව සබඳතා ආරම්භ කළ අතර, පවතින සබඳතා වර්ධනය කර ගත්තේය.

**ද්විපාර්ශ්වික:**

– **බංග්ලාදේශය සහ පිලිපීනය** සමඟ ත්‍රස්තවාදය සම්බන්ධ සහයෝගීතාව පිළිබඳ ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් මෙම අංශය ප්‍රගතියක් ලබා ඇත.

– 2021 ජූලි මාසයේදී **ඉන්දුනීසියාව** සමඟ පැවති ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 4 වැනි අතථ්‍ය රැස්වීමේ දී මෙම අංශය සම්බන්ධීකරණය කළ අතර, කේන්ද්‍රස්ථානය ලෙස ද කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵල ලේඛනය සම්බන්දයෙන් එකඟ වී ඇති අතර, භාර ගන්නා ලද කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ ආරම්භ කොට ඇත.

– මෙම අංශය විසින් 2021 ජනවාරි මාසයේ දී මිනිස් ජාවාරම් පිළිබඳ ශ්‍රී ලංකා - **ඕස්ට්‍රේලියා** ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම, 2021 ජනවාරි මාසයේ දී **යුරෝපා සංගම්-** ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාව සහ 2021 ජූලි මාසයේදී ශ්‍රී ලංකා - **ජර්මන්** ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සඳහා දායකත්වය ලබා දී සහභාගී විය. 2021 ඔක්තෝබර් මාසයේදී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා - **රුසියා** ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සහ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සමගාමීව තුර්කි විදේශ

අමාත්‍යවරයා සමඟ අමාත්‍යවරයාගේ රැස්වීම සඳහා තුර්කියේදී ද අංශය විසින් දායකත්වය ලබා දෙන ලදී.

**බහුපාර්ශ්වික:**

– ජාතික බුද්ධි ප්‍රධානියා, රාජ්‍ය බුද්ධි සේවය සහ ත්‍රස්ත මර්දන විමර්ශන අංශය සහ Europol අතර පළමු රැස්වීම 2021 පෙබරවාරි මාසයේ දී පවත්වන ලද අතර, Europol සමඟ විධිමත් ක්‍රියාකාරී වැඩපිළිවෙළක් ආරම්භ කිරීම. සාකච්ඡා කිරීමට නියමිත නෛතික ගිවිසුමේ කෙටුම්පත Europol වෙතින් ලැබී ඇති අතර, එය දේශීය ආයතන විසින් සකස් කෙරෙමින් පවතී.

– බුද්ධි අංශ සහ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) IS පිළිබඳ ගෝලීය සාකච්ඡාව සමඟ කටයුතු කරන බව සහතික කිරීම සඳහා, 2021 මැයි මාසයේදී IS පිළිබඳ ගෝලීය සන්ධානයේ IS සංවිධානයට එරෙහිව අරමුදල් සැපයීමේ කණ්ඩායමේ (CIFG) ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමට නිරීක්ෂකයෙකු ලෙස ශ්‍රී ලංකාව පළමු වරට සහභාගී වීම.

– 2021 මැයි මාසයේ දී, ත්‍රස්තවාදී අන්තර්ගතයන් සහ මාර්ගගත රැඩිකල්කරණයට එරෙහිව සටන් කිරීම සඳහා, 'ක්‍රයිස්ට්චර්ච් කෝල් ටු ඇක්ෂන්' හි 2 වැනි සමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී, එය කණ්ඩායමට සම්බන්ධ වීමට 2019 සැප්තැම්බර් මාසයේ දී කැමැත්ත පළකිරීමෙන් පසුව, ශ්‍රී ලංකාව විධිමත් ලෙස කණ්ඩායම්කරණය සමඟ සම්බන්ධ වූ පළමු අවස්ථාව විය. නවසීලන්ත අග්‍රාමාත්‍යවරයා සහ ප්‍රංශ ජනාධිපතිවරයා විසින් මෙම රැස්වීමේ සම සභාපතිත්වය දැරූ අතර, සියලුම ප්‍රධාන සමාජ මාධ්‍ය සමාගම්වල නියෝජිතයින් ද ඊට ඇතුළත් විය.

– ආරක්ෂක අමාත්‍යාංශය, රාජ්‍ය බුද්ධි සේවය, හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සහ වෙනත් අයගේ ශ්‍රී ලංකා දූත පිරිස ප්‍රථම වරට ත්‍රස්ත මර්දන සතියට සහ 2021 ජූනි මස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ නියෝජිතායතන ප්‍රධානීන්ගේ රැස්වීමට සහභාගී වීම.

**දේශීය ආරක්ෂක සහ නීති ආයතනවල ධාරිතා සංවර්ධනය:**

**බහුපාර්ශ්වික:** පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාරයෙන් පසු ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මූලාශ්‍රවලින් ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආධාර ලබා දීමෙන් පසු, මෙම අංශය දේශීය ආයතනවල ධාරිතාව ගොඩනැගීමේ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික උත්සාහයන් සම්බන්ධීකරණය කර ඇත. විශේෂයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දී ත්‍රස්තවාදය සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන ශක්තිමත් කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ ප්‍රාදේශීය ආයතන අතර ධාරිතා ගොඩනැගීම සඳහා ව්‍යාපෘති 21 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධීකරණය කර ඇති **යුරෝපා සංගම් ව්‍යාපෘතිය** වන "ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සහාය" සම්බන්ධයෙන් **එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය** සමඟ සම්බන්ධීකරණය කිරීමයි. ත්‍රස්තවාදයට සම්බන්ධ නඩු (නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය, විත්තියේ නීතිඥයින්), ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ විමර්ශන සහ සාක්ෂි රැස් කිරීම (පොලිසිය, FIU, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ආදිය) මෙන්ම ප්‍රහාර වැළැක්වීමේ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් ද මෙයට ඇතුළත් වේ. පොලිසිය, ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලය) සහ බන්ධනාගාර.මෙම අංශය විසින් දේශීය ආයතනවල උපකරණ අවශ්‍යතා හඳුනාගැනීම සම්බන්ධීකරණය කර ඇති අතර, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය මගින් උපකරණ මිලදී ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

**ද්විපාර්ශ්වික:** දේශසීමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ ඇති හැකි සහයෝගීතාවය, ධාරිතා වර්ධනය වර්ධනය කිරීමේදී මෙම අංශය **දේශසීමා අවදානම් තක්සේරු මධ්‍යස්ථානය සහ එක්සත් ජනපද බලධාරීන්** අතර සම්බන්ධීකරණය කොට ඇත.

**ප්‍රචණ්ඩ අන්තවාදය වැලැක්වීමේ/එරෙහිව කටයුතු කිරීමේ ප්‍රයත්නවලට සහාය වීම:**

විදේශගතව සිටින ශ්‍රී ලංකාවට අවශ්‍ය ත්‍රස්තවාදී සැකකරුවන් කිහිප දෙනෙකු පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම අංශය සම්බන්ධීකරණය කරන ලද අතර, රාජ්‍ය බුද්ධි සේවය සහ අදාළ විදේශීය ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා සහාය විය. නීතිපති දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත, ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා සිදුවීම පිළිබඳ අධිකරණ ක්‍රියාදාමයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම අංශය කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරමින් පැවති අතර, මේ වන විට පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණවල විමසෙන නඩුවලදී සාක්ෂි සැපයීම සඳහා ඔවුනට හැකියාව ලබා දීම පිණිස එක්සත් ජනපද විමර්ශකයින් සමඟ සම්බන්ධීකරණය කරමින් පවතී. තවද, නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන අය සම්බන්ධ ආරක්ෂාව පිළිබඳ විධිවිධාන ඇතුළත් කිරීම සඳහා ඉලෙක්ට්‍රෝනික නැවත පිළිගැනීමේ සිද්ධි කළමනාකරණ පද්ධතියේ විධිවිධාන යළි සමාලෝචනය කිරීම පිළිබඳව මෙම අංශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රාජ්‍ය බුද්ධි සේවය සහ කොන්සියුලර් අංශය සහ නීති අංශය සමඟ සාකච්ඡා ආරම්භ කළේය. එසේම මෙම ප්‍රමුඛතා ක්ෂේත්‍රය යටතේ, රැඩිකල්කරණයට එරෙහිව සටන් කිරීමේදී බිම් මට්ටමේ සංවිධානවලට සහාය දැක්වීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශය ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලය, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය සහ ගෝලීය ප්‍රජා සහභාගීත්වය සහ ඔරොත්තු දීමේ අරමුදල (GCERF) අතර සම්බන්ධීකරණය කොට ඇත. උප ප්‍රදානයන් සඳහා වන පළමු කැඳවීම ප්‍රදාන ලාභියා විසින් දීර්ඝ කරන ලද අතර, ප්‍රදාන ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ආයතන විසින් හඳුනාගත් දිස්ත්‍රික්කවල ප්‍රජා පදනම් වූ සංවිධාන කෙටි ලැයිස්තුගත කොට අවසන් කර ඇත. මීට අමතරව, නවසීලන්තයේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයත් සමඟ, රැඩිකල්කරණයට ලක් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් අනාගත සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම අංශය කොළඹ නවසීලන්ත දූත මණ්ඩලය සහ නවසීලන්ත රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ආරක්ෂක අමාත්‍යාංශය සහ රාජ්‍ය බුද්ධි සේවය සමඟ සම්බන්ධීකරණය කළේය. ගෝලීය ප්‍රජා සහභාගීත්වය සහ ඔරොත්තු දීමේ අරමුදලේ (GCERF) ශ්‍රී ලංකා නිලධාරීන්ගේ සංචාරය සම්බන්ධීකරණය කරන ලදී.

**ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ නීතිමය රාමුව සංවර්ධනය කිරීම සම්බන්ධ ප්‍රයත්න සඳහා උපකාර කිරීම:**

ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් මත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම්වලට මෙන්ම දේශීය නීතිවලට අනුකූලව ගෙන ඒම සඳහා එය නැවත සලකා බැලීම සඳහා ස්ථාපිත කරන ලද නිලධාරීන්ගේ කමිටුවේ නියෝජ්‍ය නීති අංශය සමඟ එක්ව, මෙම අංශය විදේශ අමාත්‍යාංශය නියෝජනය කළේය. එහි අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලයීය අනුකමිටුවට ඉදිරිපත් කිරීමට මේ වනවිට කටයුතු සූදානම් වෙමින් පවතී.

**ජාතික ආරක්ෂාවට ඇති තර්ජන පිළිබඳව කටයුතු කිරීම පිළිබඳ වෙනත් අංශවලට සහය වීම:**

"ජාත්‍යන්තර දින" ආශ්‍රිත සන්නිවේදන ක්‍රමෝපාය ඉලක්ක කරගත් උපාය මාර්ගයක් ක්‍රියාවට නැංවීම හරහා, විවිධ අවස්ථා වලදී ඉහළ නංවන ලද ශ්‍රී ලංකාව පිළිබඳ සෘණාත්මක පණිවිඩවලට එරෙහිව සටන් කිරීමට ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා අංශය කටයුතු කරයි. "ජාත්‍යන්තර දින" ආශ්‍රිත සන්නිවේදන උපායමාර්ගයේ ඉලක්කගත උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම හරහා විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා අක්තගන්වා ඇති සහ අනෙකුත් දූත මණ්ඩලවලට ශ්‍රී ලංකාවේ ධනාත්මක අංශ පිළිබඳව හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානයට ප්‍රතිවිරුද්ධ පණිවුඩ යැවීම සම්බන්ධයෙන් අදාළ ක්‍රියාකාරකම් එදිනට සිදු කරන ලෙස උපදෙස් දීම: පෙබරවාරි මාසයේ 'ළමා සොල්දාදුවන් භාවිතයට එරෙහි ජාත්‍යන්තර දිනය', මැයි මාසයේ 'සහජීවනයෙන් එකට ජීවත්වීමේ ජාත්‍යන්තර දිනය' සහ අගෝස්තු මාසයේ 'ත්‍රස්තවාදී ප්‍රහාරවලට ගොදුරු වූවන්ගේ ජාත්‍යන්තර දිනය' යන දිනවල දී මෙම අභ්‍යාසය සිදු කරන ලදී. අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල සිටින ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා සමාජ මාධ්‍ය වෙබ් අඩවි ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ත්‍රස්තවාදී අන්තර්ගතයන් පිළිබඳව කටයුතු කිරීම සඳහා ෆේස්බුක්

සහ ඉන්ස්ටග්‍රෑම් හි නියෝජිතයින් මඟින් පුහුණුවක් සංවිධානය කිරීම සහ පැවැත්වීම සඳහා ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය සමඟ එක්ව කටයුතු කරන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: දේශභූමික අංශ

### අප්‍රිකා අංශය

**ද්විපාර්ශ්වික සබඳතා**

**ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා සහ ඊජිප්තුවේ සහ කෙන්යාවේ ජනාධිපතිවරු අතර පැවති දුරකථන සංවාද**

ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා සහ ඊජිප්තු අරාබි ජනරජයේ අතිගරු ජනාධිපති අබ්දෙල් ෆටා අල්-සිසි මැතිතුමා අතර 2021 මාර්තු 16 වැනි දින පැවති දුරකථන සංවාදය.

ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා සහ කෙන්යාවේ අතිගරු ජනාධිපති උහුරු මුයිගායි කෙන්යාටා මැතිතුමා අතර 2021 සැප්තැම්බර් 02 වැනි දින පැවති දුරකථන සංවාදය.

ගරු විදේශ අමාත්‍යවරයා සහ විදේශ ලේකම්වරයා අප්‍රිකානු රටවල තානාපතිවරු සමඟ පැවැත්වූ නිල හමු සඳහා පහසුකම් සැලසීම.

**ද්විපාර්ශ්වික උපදේශන**

ඉතියෝපියාවේ සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශ අතර ද්විපාර්ශ්වික උපදේශනවල පළමු සැසිවාරය 2021 ජූනි 09 වැනි දින අතථ්‍ය හමුවක් ලෙස පවත්වන ලද අතර, එම උපදේශන තුළින් දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

ඊජිප්තුව, ඇල්ජීරියාව, මොරොක්කෝව, මොරිටේනියා සීෂෙල්ස් සහ නයිජීරියාව සමඟ ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීම සඳහා මූලික පියවර ගෙන ඇත.

අයිවරි කෝස්ට් රාජ්‍ය සමඟ ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ කෙටුම්පත් ගිවිසුම් යෝජනා වී ඇත.

ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය සහ ඇල්ජීරියාවේ විදේශ අමාත්‍යාංශය අතර ද්විපාර්ශ්වික උපදේශනවල පළමු සැසිය 2021 ඔක්තෝබර් 12 වැනි දින අතථ්‍ය අයුරින් පැවැත්විණි.

**සිදු වෙමින් පවතින කටයුතු:** 2022 පෙබරවාරි මස පැවැත්වෙන දකුණු අප්‍රිකාව සහ ශ්‍රී ලංකාව අතර හවුල්කාරිත්ව සංසදයේ 8 වැනි සැසිවාරය පිළිබඳ කටයුතු.

2022 පෙබරවාරි මස ඊජිප්තුව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික උපදේශනය.

**මැඩගස්කරය තුළ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයක් විවෘත කිරීම**

අප්‍රිකානු කලාපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික පැවැත්ම වැඩිදියුණු කිරීමේ අරමුණින්, මැඩගස්කරය තුළ ශ්‍රී ලංකාවේ කොන්සල් ජනරාල් කාර්යාලයක් පිහිටුවීම සඳහා මූලික පියවර ගෙන ඇත. මේ සඳහා ශ්‍රී ලංකාව මැඩගස්කරයේ බලධාරීන්ගේ එකඟතාවය බලාපොරොත්තුවෙන් සිටියි.

**අප්‍රිකානු මහාද්වීපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පුළුල් කිරීම**

ශ්‍රී ලංකාව විසින් 2021 මාර්තු 19 වැනි දින ගැබොන් ජනරජය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවන ලදී.

නිව්යෝර්ක් හි පිහිටි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය නුදුරේදීම කැමරූන් රාජ්‍යය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට අපේක්ෂා කරයි.

කොමරෝස් රාජ්‍යය සමඟ විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා පැවැත්වීම සඳහා විධිවිධාන සපුරාලීමට මෙම අංශය විසින් කටයුතු කරනු ලැබේ.

**බහුපාර්ශ්වික සබඳතා**

**ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) යෝජනාව**

ශ්‍රී ලංකාවට සහාය පළ කරමින් එරිත්‍රියාව සහ සෝමාලියාව ජිනීවාහි ශ්‍රී ලංකාව පිළිබඳ UNHRC යෝජනාවට විරුද්ධව ඡන්දය දුන් අතර බර්කිනා ෆාසෝ, කැමරූන්, මොරිටේනියාව, ලිබියාව, මලාවි, නැමීබියාව, සෙනගාලය, සුඩානය සහ ටෝගෝ යන රටවල් UNHRC යෝජනාවට එරෙහිව ඡන්දය දීමෙන් වැළකී සිටියහ.

ශ්‍රී ලංකාව දරන ස්ථාවරයට සහාය පළ කිරීම සඳහා අප්‍රිකානු රටවල සහාය පැතීමේ ප්‍රයත්නවලට මෙම අංශය සම්බන්ධ විය. වර්තමානය වන විට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) සාමාජිකත්වය නොදරන රටවල් කිහිපයක් ද, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සහාය පළ කර ඇත.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

අප්‍රිකානු රටවල් සමඟ පවත්නා ආර්ථික සහයෝගීතාවය සම්බන්ධයෙන් වන නිම නොකළ අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් සමාලෝචනය කර පසු විපරම් කිරීම.

**ආරක්ෂාව හා ආරක්ෂක සහයෝගීතාව**

අප්‍රිකානු රටවල් සමඟ ආරක්ෂක සහයෝගීතාවය සම්බන්ධයෙන් වන නිම නොකළ අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් සමාලෝචනය කර පසු විපරම් කිරීම.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඞ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

මෙම අංශය විසින් ජනාධිපති ලේකම් කාර්යාලය, සීෂෙල්ස්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ අනෙකුත් අදාළ රේඛීය ආයතනවල සහාය ඇතිව කොවිඞ්-19 වසංගත ව්‍යාප්තිය හමුවේ සීෂෙල්ස්, මැඩගස්කරය, ඉතියෝපියාව සහ කෙන්යාව යන රටවල අතරමං වූ ශ්‍රී ලාංකිකයන් සිය රට පැමිණවීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. සිය රට පැමිණවීමේ කටයුතු සඳහා විශේෂ ගුවන් ගමන් සංවිධානය කෙරිණි.

## ඇමෙරිකා අංශය

ඇමරිකා අංශය ලතින් ඇමරිකාව සහ කැරිබියන් කලාපය, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව ආවරණය වන පරිදි රටවල් 33ක් ආවරණය කරයි. ඒ අනුව, බ්‍රසීලියා (බ්‍රසීලය), හවානා (කියුබාව), වොෂින්ටන් ඩීසී (එක්සත් ජනපදය), ඔටාවා (කැනඩාව) හි මහ කොමසාරිස් කාර්යාලය මෙන්ම ලොස් ඇන්ජලීස් සහ ටොරොන්ටෝහි කොන්සල් ජනරාල් කාර්යාල සහ නිව් යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලයට අදාළ ද්විපාර්ශ්වික කටයුතු එම අංශයේ විෂය පථයට අයත් වේ. 2021 වර්ෂය තුළදී මෙම අංශයේ ප්‍රධාන සේවා ක්ෂේත්‍රවලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

**ද්විපාර්ශ්වික සබඳතා**

**ද්විපාර්ශ්වික අන්තර්ක්‍රියා**

ගරු විදේශ අමාත්‍යවරයා සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ උපදේශක ඩෙරෙක් චොලට් මහතා, විදේශ ලේකම් සහ දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජනපදයේ උපලේකම් වික්ටෝරියා නුලැන්ඩ් මහත්මිය, මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ බංග්ලාදේශය, භූතානය, මාලදිවයින, නේපාලය සහ ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් කෙලී කීඩර්ලින් මහත්මිය අතර පැවති අතථ්‍ය හමු සම්බන්ධීකරණය කිරීම සහ ඊට පහසුකම් සැලසීම ඇමෙරිකා අංශය විසින් සිදු කෙරිණි. ඉහත සඳහන් කළ ශ්‍රී ලංකා දූත මණ්ඩල මැදිහත්කරුවන් සමඟ ඔවුන්ගේ සංවාදය අඛණ්ඩව සිදු කළ අතර, තමන් වෙත අක්ත ගන්වන ලද රටවල තත්ත්වයන් අනුව ඔවුන්ගේ නිරතවීම් වැඩිදියුණු කොට ඇත. මෙම අන්තර්ක්‍රියාවල ප්‍රධාන අරමුණ වූයේ මෙම රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සහ පුළුල් පරාසයක ක්ෂේත්‍ර හරහා සහයෝගීතාව වැඩිදියුණු කිරීම යි. බ්‍රසීලය, කොලොම්බියාව සහ උරුගුවේ සමඟ දේශපාලන උපදේශන කල් ඇතිව පැවැත්වීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. හවුල්කාරිත්ව සංවාදයේ සිව්වන සැසිවාරය කොළඹ දී පැවැත්වීම පිළිබඳව සැලසුම් කිරීම සඳහා එක්සත් ජනපද පාර්ශ්වය සමඟ තාක්ෂණික මට්ටමේ සාකච්ඡා මෙම අංශය විසින් අරඹන ලදී.

මෙම දූත මණ්ඩල, මෙම රටවල පළාත් / ප්‍රාන්ත සමඟ සිදු කරන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින්, එම රටවලට පත් කර ඇති ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරුන් සමඟ සමීපව කටයුතු කොට ඇත. එමඟින් ඔවුන්ගේ ව්‍යාප්ති වැඩසටහන්වල විෂය පථය පුළුල් වේ. බ්‍රසීලය, චිලී, කොලොම්බියාව, සුරිනම්, පේරු, ආර්ජන්ටිනාව, බොලිවියාව, ජැමෙයිකාව, හයිටි සහ එල් සැල්වදෝරයේ රියෝ ද ජැනයිරෝ සහ සාඕ පවුලෝ සඳහා යෝග්‍ය නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම හෝ ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම.

ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජනපද කොංග්‍රස් කණ්ඩායම 2021 ජූලි මාසයේ දී එක්සත් ජනපද කොංග්‍රසයේ 117 වැනි සැසිවාරය සඳහා නැවත ලියාපදිංචි කරන ලදී. මෙම කණ්ඩායමේ සම සභාපතිවරුන් වන්නේ කොන්ග්‍රස් සභික රොබට් ඇඩර්හෝල්ට් (රිපබ්ලිකන්/ඇලබාමා) සහ කොංග්‍රස් සභික හැන්ක් ජොන්සන් (ඩිමොක්‍රටික්/ජෝර්ජියා) යන මහත්වරුන් ය.

පේරු, චිලී සහ ගයනා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සමගාමී අක්තපත්‍ර පිළිගැන්වීම විධිමත් කිරීමට කටයුතු කරන ලදී.

**පුද්ගල ජාවාරම පිළිබඳ වාර්තාව**

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ පුද්ගල ජාවාරම් පිළිබඳ 2021 වාර්තාව, ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (**SNAP**) සඳහා වන ශ්‍රී ලංකා රජයේ සැල කිරීම අවසන් කිරීම සඳහා මෙන්ම, මානව ජාවාරම නිරීක්ෂණය කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම (2021-2025) සහ පසු විපරම් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම අංශය ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බළකා රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගි විය. ශ්‍රී ලංකා රජයේ අවසාන සැල කිරීම 2021 මාර්තු මාසයේ දී එක්සත් ජනපද තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. එක්සත් ජනපදයේ පුද්ගල ජාවාරම් පිළිබඳ නවතම 2021 වාර්තාව අනුව, ශ්‍රී ලංකාවට නිදහස් කිරීමක් ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාව අඛණ්ඩව තුන්වන වසර සඳහා ද ස්ථර-2 නිරීක්ෂණ ලැයිස්තුවේ රඳවා තබා ඇත.

**ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තැබීම**

වෙළඳ කටයුතු ඉහළ නැංවීම, ජාතික වියදම් සහ ආදායම් ඉහළ නැංවීම (**PARTNER**) පිළිබඳ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ලිපිය (සහය ගිවිසුම) සඳහා වන **USAID** හවුල්කාරිත්වය සහ අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ දරුවන් සුරකින්න යන ආයතනය අතර වෙළඳපොළ සන්ධාන (**PALAM/A**) ව්‍යාපෘතිය හරහා ස්වයං පාලනය, සාක්ෂරතාවය සහ අවධානය ප්‍රවර්ධනය කිරීම සඳහා සිව්පාර්ශ්වික අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමට පහසුකම් සැලසීම සහ එය කඩිනම් කිරීම යන කටයුතු මෙම අංශය විසින් සිදු කෙරිණි. ඇමරිකානු ඩොලර් මිලියන 26 ක මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ

පාසල් පෝෂණය කිරීමේ වැඩසටහනට සහාය විය. ජාතික විද්‍යා පදනම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සඳහා අදාළ බ්‍රසීලියානු ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

**සෘණාත්මක / සත්‍ය නොවන වාර්තාවලට එරෙහිව කටයුතු කිරීම**

"2009 මැයි 18 වැනි දින නිමාවට පත් වූ ශ්‍රී ලංකාවේ යුද්ධය අවසන් වී වසර 12ක් සපිරීම නිමිත්තෙන්, අහිමි වූ ජීවිතවලට ගෞරව කිරීම සහ කල්පවත්නා සාමකාමී දේශපාලන විසඳුමක් සහතික කිරීමට ශ්‍රී ලංකාව තුළ යුක්තිය, වගවීම, සංහිඳියාව, ප්‍රතිනිර්මාණය, හානිපූරණය සහ ප්‍රතිසංස්කරණ සඳහා සහාය ප්‍රකාශ කිරීම සහ ශ්‍රී ලංකාවාසී සියලුම ජනතාවට සමෘද්ධිමත් අනාගතයක් තහවුරු කිරීම" සම්බන්ධයෙන් 2021 මැයි 18 වැනි දින එක්සත් ජනපදයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දී කොන්ග්‍රස් සභික දෙබොරා රොස් (ඩිමොක්‍රටික්- උතුරු කැරොලිනා) මහත්මිය හඳුන්වා දුන් එක්සත් ජනපද පාර්ලිමේන්තුවේ 413 දරන යෝජනා සම්මුතිය පිහිටුවීම සහ සම්මත කිරීම වැළැක්වීම සඳහා මෙම අංශය විසින් බහුවිධ ප්‍රවේශයකට පහසුකම් සපයන ලදී. මෙම යෝජනාව සඳහා ශ්‍රී ලංකා රජය සිය ප්‍රතිචාරය වොෂින්ටන් ඩී.සී. හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා එක්සත් ජනපදයේ පාර්ලිමේන්තුවේ විදේශ කටයුතු කමිටුවේ සභාපතිවරයාට සහ ශ්‍රේණිගත කිරීමේ සාමාජිකයාට මෙන්ම රාජ්‍ය දෙපාර්තමේන්තුවට සහ කොළඹ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලයට ඉදිරිපත් කර ඇත.

කැනඩාව තුළ ශ්‍රී ලංකාවට අදාළ වන වැදගත් කරුණු පිළිබඳව සහ විශේෂයෙන් දෙමළ ජන සංහාර අධ්‍යාපන සතිය, දෙමළ ජන සංහාර ස්මාරක ඉදිකිරීම යනාදිය පිළිබඳ 104 වැනි ඔන්ටාරියෝ පළාත් පනත් කෙටුම්පතට අදාළව ඔටාවා හි මහ කොමසාරිස් කාර්යාලය සහ ටොරොන්ටෝ හි කොන්සල් ජනරාල් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් එම කරුණු සමීපව අධීක්ෂණය කිරීම හා ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම මෙම අංශය විසින් සිදු කෙරිණි.

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී සිදුවන ධනාත්මක ප්‍රවණතා සහ විශේෂාකාරයෙන් ප්‍රතිසන්ධානය සහ වගවීම සම්බන්ධයෙන් සිදුවන ප්‍රවණතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ දේශපාලඥයන් සහ නිලධාරීන් ඔටාවා හි මහ කොමසාරිස් කාර්යාලය සහ ටොරොන්ටෝ හි කොන්සල් ජනරාල් කාර්යාලය විසින් නිරන්තරයෙන් දැනුවත් කරන ලදී.

ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා වොෂින්ටනයේ තානාපති කාර්යාලය රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් සහ අනෙකුත් අදාළ මැදිහත්කරුවන්ගේ සහභාගීත්වයෙන් වට මේස සාකච්ඡාවක් කැඳවී ය.

**බහුපාර්ශ්වික සබඳතා**

ක්‍යුබෙක් හි මොන්ට්‍රියල් නගරය සිය මූලස්ථානය කරගත් ජාත්‍යන්තර සිවිල් ගුවන් සංවිධානය (ICAO) සම්බන්ධ කටයුතු සඳහා ඔටාවා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

මෙම අමාත්‍යාංශයේ එක්සත් ජාතීන්ගේ අංශය, එක්සත් ජාතීන්ගේ ආයතන සඳහා පැවැත්වෙන මැතිවරණයේදී ශ්‍රී ලංකාවේ අපේක්ෂකයින්ට සහය ලබා ගැනීම සහ ජිනීවාහි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී සහය ලබාගැනීම සඳහා කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ ස්ථාවරය සඳහා සහාය ලබා ගැනීම සම්බන්ධයෙන්. දූත මණ්ඩල මේ සම්බන්ධයෙන් අදාළ රජයේ දෙපාර්තමේන්තු / තම රටවලට අක්ත ගන්වන ලද නිලධාරීන් සමඟ සම්බන්ධ වී ඇත.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල සහිතව ආර්ථිකය සම්බන්ධ කරුණු ප්‍රවර්ධනය කිරීම සඳහා, තානාපති කාර්යාල / මහ කොමසාරිස් කාර්යාල සහ කොන්සල් කාර්යාල මෙන්ම මෙම අංශය මගින් බොහෝ වැඩ කටයුතු සිදු කෙරී ඇත. දැනුවත් කිරීම් සිදු කිරීම, ශ්‍රී ලාංකික නිෂ්පාදන අදාළ වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සහ

එම රටවල සහ ශ්‍රී ලංකාව අතර අදාළ ආයතන අතර ව්‍යාපාරික සම්බන්ධතා ඇති කිරීම සඳහා රැස්වීම්, වෙබිනාර් සාකච්ඡා, ජාලකරණ සිදුවීම් සංවිධානය කිරීම / පහසුකම් සැලසීම මෙයට ඇතුළත් විය. ශ්‍රී ලංකාව තුළ හා පිටත, ව්‍යාපාරික සහ රාජ්‍ය දූත පිරිස්වල නිල සංචාරයන් සිදු කිරීම අරඹන ලදී.

වාණිජ මණ්ඩල අතර සම්බන්ධතා ස්ථාපිත කරන ලද අතර සුදුසු අවස්ථාවලදී, ශ්‍රී ලංකා ව්‍යාපාරික මණ්ඩල/සභා නැවත ප්‍රබෝධමත් කර හෝ ඒ ඒ රටවල ස්ථාපිත කරන ලදී. තාක්ෂණික සහයෝගීතාවය සහ ධාරිතා ගොඩනැගීමේ අවස්ථා සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගීතාව පවත්වා ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය තුළ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා අතථ්‍ය හමුවක් සංවිධානය කෙරිණි.

යෝග්‍ය රෝපණ මාධ්‍ය තුළ වර්ධනය වන  තෝරාගත් පලතුරු සහ පැල වර්ග අපනයනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා දූත මණ්ඩලය එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කර ඇත. මෙම අංශය මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය **(CATC)** සහ කැනඩාවේ ෆ්‍රේසර් වැලි විශ්වවිද්‍යාලය අතර අථත්‍ය හමුවක් පැවැත්වීම සඳහා පහසුකම් සැලසුවේ ය. ටොරොන්ටෝ හි සළුසල ශාඛාව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික නිර්මාණ ඇකඩමිය විසින් පත් කරන ලද නියෝජිතයා සමඟ ද ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සාකච්ඡා පැවැත්වී ය. ශ්‍රී ලංකාවේ කුළුබඩු අපනයනකරුවන් කියුබානු වෙළඳුන් සමඟ සම්බන්ධ කිරීමට කියුබාවේ විදේශ වෙළඳ හා ආයෝජන අමාත්‍යාංශය එකඟ විය. බ්‍රසීලයේ තානාපති කාර්යාලය පිඟන් භාණ්ඩ සහ පෝසිලේන් භාණ්ඩ, තේ, කොහු නිෂ්පාදන, රෙදිපිළිවලට යොදන වර්ණ, බ්‍රසීලයේ සහ අනෙකුත් පිළිගත් රටවල **PVC** පයිප්ප ආනයනය කිරීමට අපේක්ෂා කරන නවකයින් හඳුනාගෙන ව්‍යාපාරික සාකච්ඡා ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා සමාගම් සමඟ අන්තර් ව්‍යාපාර රැස්වීම් සංවිධානය කළේ ය. [දූත මණ්ඩල සහ මෙම අංශය විසින් සිදු කරනු ලබන සියලුම ආර්ථික ආශ්‍රිත ක්‍රියාකාරකම් ලැයිස්තුගත කිරීම ප්‍රායෝගික නොවන බැවින් මෙය සම්පූර්ණ කරුණු ඉදිරිපත් කිරීමක් නොවන බව කරුණාවෙන් සලකන්න.]

**ආරක්ෂක සහයෝගීතාව**

එක්සත් ජනපදයේ නාවික හමුදාව විසින් 2021 සැප්තැම්බර් මාසයේ දී රෝඩ් අයිලන්ඩ්, නිව් පෝර්ට් හි එක්සත් ජනපද නාවික යුධ විද්‍යාලය තුළ සංවිධානය කෙරුණු 24 වැනි ජාත්‍යන්තර මුහුදු බලශක්ති සම්මන්ත්‍රණයට **(ISS)** සහභාගී වීම සඳහා නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතාට ආරාධනා කෙරුණු අතර ඒ මහතාගේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචාරය, මෙම අංශය විසින් සම්බන්ධීකරණය කෙරිණි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වැනි සංවත්සරය වෙනුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ පැසිෆික් ගුවන් හමුදාවේ හමුදාපති ජනරාල් කෙනත් විල්ස්බැක් මහතාගේ සංචාරය සඳහා ද මෙම අංශය පහසුකම් සලසා ඇත.

ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සහ එක්සත් ජනපද මිත්‍ර පාර්ශ්වය අතර ඒකාබද්ධ පුහුණු අභ්‍යාස සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම. ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් සඳහා එක්සත් ජනපදයේ පුහුණු අවස්ථා ලබාගැනීම.

එල්ටීටීඊ සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් ඔටාවා හි මහ කොමසාරිස් කාර්යාලය පබ්ලික් සේෆ්ටි කැනඩා ආයතනය සමඟ අඛණ්ඩව පසු විපරම් කරමින් සිටි අතර එය දැනට ද ක්‍රියාත්මක වේ.

ආරක්ෂක සහයෝගිතාව සහ මානව ජාවාරම් සහ අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ යන ක්ෂේත්‍ර පිළිබඳ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පිළිබඳව බ්‍රසීලය සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා පහසුකම් සපයන ලදී.

බ්‍රසීලයෙන් ආචාර වෙඩිමුර සඳහා යොදාගන්නා තුවක්කු මිලදී ගැනීම සඳහා පහසුකම් සැලසීම.

**මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

ඔටාවා හි මහ කොමසාරිස් කාර්යාලය සාමයෙන් එකට ජීවත්වීමේ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් අතථ්‍ය වැඩසටහනක් සංවිධානය කළ අතර, විහාරස්ථාන සහ ශ්‍රී ලංකා සංගම් විසින් පවත්වනු ලබන අතථ්‍ය/පුද්ගලික වැඩසටහන් සඳහා සහභාගී විය.

වොෂින්ටන් ඩීසී හි තානාපති කාර්යාලය OSL ජාලය, ශ්‍රී ලංකාවේ මිතුරන්, එක්සත් ජනපද ෆෙඩරල් සහ පළාත් පාලන නිලධාරීන්, රාජ්‍යතාන්ත්‍රිකයින් සහ ප්‍රාදේශීය ප්‍රජාවේ අනෙකුත් සහභාගිවන්නන් සමඟ සහයෝගයෙන් සංස්කෘතික උත්සව සංවිධානය කළේ ය.

කියුබාවේ සිටින ශ්‍රී ලාංකික ප්‍රජා සාමාජිකයින් සහ සිසුන් සඳහා ප්‍රජා උත්සව කිහිපයක් සංවිධානය කරන ලද අතර, මෙලෙස ඔවුන් ශ්‍රී ලංකාවට සහයෝගය දැක්වීම සඳහා එක්රැස් කරන ලදී. එවැනිම අතථ්‍ය වැඩසටහන් කිහිපයක් බ්‍රසීලයේ පැවැත්විණි.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

මෙම අංශය, 2021 වන විට කොවැක්ස් පහසුකම හරහා මොඩර්නා සහ ෆයිසර්-බයෝඑන්ටෙක් කොවිඩ්-19 එන්නත් මාත්‍රා මිලියන 3.4ක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කිරීමට වොෂින්ටන් ඩී.සී. හි දූත මණ්ඩලය සමඟ එක්ව පහසුකම් සලසා ඇත. ඊට අමතරව, ඇ.ඩො.මි. 17.9ක වටිනාකමින් යුත් වෛද්‍ය සැපයුම්/ සේවා මෙන්ම පශ්චාද් වසංගත තත්ත්වය යටතේ ආර්ථිකය යළි ගොඩනැගීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකුවලට මූල්‍ය ආධාර වශයෙන් ඇ.ඩො.මි. 265ක් එක්සත් ජනපදය විසින් ලබා දී ඇත.

කොවිඩ්-19 සඳහා ක්ෂණික ආධාර සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය දිගු කාලීනව ශක්තිමත් කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය හරහා කැනඩාව ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 1.3ක් පරිත්‍යාග කළ අතර, UNICEF හි කොවිඩ්-19 මෙවලම් වේගවත් කරවීමේ සැපයුම් මූල්‍ය පහසුකම් ප්‍රවේශය සඳහා කැනඩාවේ දායකත්වය හරහා ශ්‍රී ලංකාව සඳහා හදිසි ඔක්සිජන් ප්‍රතිකාර සැපයුම් ලබා ගැනීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0ක් ද ලබා දුන්නේය. එඩ්මන්ටන් හි ශ්‍රී ලංකා කැනඩා මිත්‍රත්ව සංගමය විසින් 'ඉටුකම – කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල' සඳහා කැනේඩියානු ඩොලර් 6,350.00ක් පරිත්‍යාග කරන ලදී.

විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ජාලයේ ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීම සහ එක්සත් ජනපදය තුළ ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය ලබා ගන්නා අරමුණින් යුතුව, එක්සත් ජනපදය පුරා වෙසෙන ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලාංකික ඇමරිකානුවන් සහ 'ශ්‍රී ලංකාවේ මිතුරන්' සමඟ සම්බන්ධ වීම සඳහා වොෂිංටන් ඩී.සී. හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ජාලය දියත් කරන ලදී.

ටොරොන්ටෝ හි කොන්සල් ජනරාල් කාර්යාලය, නියෝජිතයන් හරහා කැනඩාවේ අනාගත රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයන්ට සිය රැකියා අවස්ථාවල සත්‍යවාදී බව තහවුරු කර ගැනීමට සහය විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ද කොන්සල් කාර්යාලය සිය සහය ලබා දුන්නේ ය.

කොවිඩ්-19 ගෝලීය වසංගතය හේතුවෙන් පනවන ලද ජාත්‍යන්තර සංචාරක සීමා මධ්‍යයේ ඇමෙරිකානු කලාපය තුළ සිටි ශ්‍රී ලාංකිකයන් සියරට පැමිණවීම සඳහා සහ ඩොමිනිකන් ජනරජයේ සහ හයිටියේ සිටින ශ්‍රී ලාංකිකයන්ට එන්නත් ලබාදීම සඳහා අදාළ දූතමණ්ඩල සමග එක්ව පහසුකම් සැලසීම.

**අනෙකුත් කටයුතු:**

මෙම අංශය විසින් කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ අදාළ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එක්සත් ජනපද නිලධාරීන් සඳහා නොමිලේ වීසා 298 ක් නිකුත් කරන ලදී.

ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලය 2021 දෙසැම්බර් 30 වැනි දින සාර්ථකව නව පරිශ්‍රයක් කරා ගෙන යන ලදී.

## නැගෙනහිර ආසියා අංශය

### ද්විපාර්ශ්වික සබඳතා

ඉහළ පෙළේ අන්තර්ක්‍රියා හරහා විවිධ අංශ ඔස්සේ නිරන්තරයෙන් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම:

ජපාන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සංවාදයේ 2 වැනි සැසිවාරය සහ ශ්‍රී ලංකා - නවසීලන්ත නිල උපදේශනවල සමාරම්භක සැසිය පිළිවෙළින් 2021 පෙබරවාරි මස 10 සහ 2021 අප්‍රේල් මස 08 යන දිනවල දී පැවැත්විණි.

අතිගරු ජනාධිපතිවරයා 2021 අප්‍රේල් මස 20 වැනි දින පැවති බොආඕ ෆෝරම් ෆෝ ඒෂියා (Boao Forum for Asia) වාර්ෂික සමුළුව සහ 2021 මැයි මස 20 වැනි දින ජපානයේ නික්කෙයි සංස්ථාව විසින් සංවිධානය කරන ලද "ආසියාවේ අනාගතය" සමුළුව අතථ්‍ය අයුරින් ඇමතී ය. ගරු අග්‍රාමාත්‍යවරයා 2021 සැප්තැම්බර් මස 03 වැනි දින තයියුන් බලශක්ති, දේශගුණික සහ පරිසර සංසදය අතථ්‍ය අයුරින් ඇමතූ අතර, විදේශ අමාත්‍යවරයා කොවිඩ්-19 සහයෝගීතාව සහ කොවිඩ්-19 එන්නත් සහයෝගීතාව පිළිබඳ අතථ්‍ය හමු දෙකකට සහභාගී විය. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා 2021 ජූලි මාසයේ දී ටෝකියෝවේ සංචාරයක නිරත විය.

2021 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා සහ චීන ජනාධිපතිවරුන් අතර දුරකථන සංවාදයක් පැවැත්විණි. ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයා චීනය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ කොරියානු ජනරජය යන රටවල විදේශ අමාත්‍යවරු සමඟ පිළිවෙළින් 2021 පෙබරවාරි මස 24, 2021 ජුනි මස 09, 202 අගෝස්තු මස 03, 2021 මාර්තු මස 22 යන දිනයන්හිදී වෙන් වෙන් වශයෙන් සාකච්ඡා පැවැත්වී ය.

ගරු කථානායකවරයා 2021 අගෝස්තු මස 31 වැනි දින චීන පාර්ලිමේන්තුවේ කථානායකවරයා සමඟ අතථ්‍ය හමුවක් පැවැත්වී ය.

නවසීලන්තය විසින් ශ්‍රී ලංකාව තුළ සිය නව රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය 2021 අගෝස්තු මස 11 වැනි දින පිහිටුවන ලදී.

ගරු පා. ම. කේරන් ඇන්ඩෲස් මැතිතුමා සහ ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍යවරයා 2021 දෙසැම්බර් 18-21 යන දිනවල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වූ අතර, අතර පුද්ගලයින් ආපසු පැමිණීම සහ නැවත භාර ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී.

හොංකොං විශේෂ පරිපාලන කලාපය සහ මැකෝ විශේෂ පරිපාලන කලාපය සඳහා නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීම් සඳහා අනුමැතිය ලබා දී ඇත.

2022 ජනවාරි 8-9 යන දිනවල සිදු කිරීමට නියමිත චීනයේ රාජ්‍ය උපදේශක සහ ගරු විදේශ අමාත්‍ය වොන්ග් යි මැතිතුමාගේ සංචාරය සඳහා වන මූලික සූදානම් වීමේ කටයුතු සිදු කරන ලදී.

දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා 70 වසරක් ගතවීම නිමිත්තෙන් 2022 වසරට යෙදෙන සංවත්සරය සැමරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

ගරු විදේශ අමාත්‍යවරයා 2022 ජනවාරි 5-7 යන දිනවල කොරියානු ජනරජයේ සිදු කිරීමට නියමිත නිල සංචාරයේ කටයුතු සූදානම් කරන ලදී.

### බහුපාර්ශ්වික සබඳතා

සංචාරක සහයෝගීතාව පිළිබඳ අතථ්‍ය අයුරින් සිදු කළ ව්‍යාපාර අතර අන්තර් ක්‍රියාකාරී සැසියක් 2021 ඔක්තෝබර් මස 17 වැනි දින **CICA** සාමාජික රටවල් 27ක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාව විසින් පවත්වන ලදී. **CICA** හි විශේෂ ක්‍රියාකාරී කණ්ඩායම් සහ ජ්‍යොෂ්ඨ නිල කමිටු රැස්වීම් මාලාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කෙරිණි. 2021 **CICA** ක්‍රියාකාරී සැලැස්ම යටතේ පවත්වනු ලබන වෙබිනාර් සාකච්ඡා/

පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම සඳහා රේඛීය ආයතන සමඟ කටයුතු කිරීම. 2021 දෙසැම්බර් 9 සහ 11 යන දිනවල පැවති **CICA** හි **SWG** සහ **SOC** රැස්වීම් සඳහා අතථ්‍ය අයුරින් සහභාගී විය.

පුද්ගල ජාවාරම් සහ පුද්ගල ජාවාරමට එරෙහිව සටන් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන බාලි ක්‍රියාවලියට සහභාගී වීමෙන්, ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීම. ඕස්ට්‍රේලියාව සමඟ ප්‍රතිලාභ ලැබීම සහ නැවත ඒකාබද්ධ වීම පිළිබඳ 4 වැනි බාලි ක්‍රියාවලියේ ක්‍රියාකාරී-මට්ටමේ

තාක්ෂණික විශේෂඥයන්ගේ කණ්ඩායම සඳහා 2021 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව සම සභාපතිත්වය ලබා දුන්නේ ය.

i) බහුපාර්ශ්වික සංසදවල කටයුතු කිරීමේදී සහ මූල්‍ය ආධාර ලබා ගැනීමේදී **UN** නියෝජිතායතන/ **CIDCA** සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම.

ii) එක්සත් ජාතීන්ගේ තරුණ නියෝජිත පිරිසෙහි සහභාගීත්වයෙන් බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙ හිදී පැවැත්වූ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර තරුණ නිපුණතා දින සැමරුම.

4 වැනි එක්සත් ජාතීන්ගේ සාම සාධක අමාත්‍ය රැස්වීම පැවැත්වීම සහ ආසියා පැසිෆික් කලාපයේ අමාත්‍යවරුන්ගේ සහ පරිසර අධිකාරීන්ගේ සංසදයේ සිව්වැනි සැසිය සඳහා ශ්‍රී ලංකාවේ ගරු පරිසර අමාත්‍යවරයා අතථ්‍ය අයුරින් සහභාගී වීම.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

ශ්‍රී ලංකාවේ සහ චීනයේ **JETC** සමුළුවේ 7 වැනි සැසිවාරය 2021 සැත්තැම්බර් මස 24 දින පැවැත්විණි.

කොවිඩ්-19 ආශ්‍රිත ආර්ථික අභියෝගවල ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා චීනය, ජපානය සහ කොරියානු ජනරජය සමඟ මූල්‍ය සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

කොළඹ වරාය නගරය, හම්බන්තොට කර්මාන්ත කලාපය, එරාවූර් රෙදි උද්‍යානය, සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් නිදහස් වෙළඳ කලාප වැනි ප්‍රමුඛ ව්‍යාපෘති සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

අදාළ රේඛීය ආයතන සමඟ විදේශ ගමනාන්තවලින් ලැබෙන ආයෝජන යෝජනාවලි සම්බන්ධීකරණය කිරීම: මගී වාහන එකලස් කිරීමේ කම්හල පිහිටුවීම, ආරක්ෂිත වීදුරු නිෂ්පාදන ව්‍යාපෘතිය, කොවිඩ්-19 එන්නත් නැවත පිරවීමේ කම්හල, නේවාසික දේපළ සංවර්ධනය, සූර්ය හා සුළං බලශක්ති වගා ව්‍යාපෘතිය, සිමෙන්ති කම්හල, පාසල් සඳහා ඩිජිටල් පන්ති කාමර හඳුන්වා දීම.

සයිනොෆාම් කොවිඩ් - 19 එන්නත නැවත පිරවීම සඳහා පිරවුම් හලක් ස්ථාපිත කිරීම පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලය සමඟ සාකච්ඡා පැවැත්වෙන අතර, ශ්‍රී ලංකාව තුළ තාක්ෂණ හා කෘෂිකර්ම විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ යෝජනාව පිළිබඳව ද සාකච්ඡා කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා දූත මණ්ඩල/ අක්ත ගන්වන ලද රටවල දූත කාර්යාල මඟින් අන්තර් ව්‍යාපාර අන්තර්ක්‍රියා/ ප්‍රදර්ශන/ අථත්‍ය වේදිකා හරහා ශ්‍රී ලාංකික නිෂ්පාදන/ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

අ). **කොරියානු ජනරජය:** පොල් ආශ්‍රිත නිෂ්පාදන, බෝට්ටු සහ නැව් තැනීම, මැණික් හා ස්වර්ණාභරණ වැනි අපනයන ප්‍රවර්ධන සඳහා වෙබිනාර් සාකච්ඡා තුනක් සංවිධානය කිරීම සහ ඉම්පෝර්ට් ගුඩ්ස් ෆෙයා 2021 සහ සෝල් ෆුඩ් ඇන්ඩ් හොටෙල් ෂෝ 2021 යන වෙළඳ ප්‍රදර්ශන දෙක සඳහා සහභාගී වීම, කොරියානු ජනරජයේ අනාගත ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ අපනයන හඳුන්වා දීම සඳහා අන්තර් ව්‍යාපාර රැස්වීම් 70ක් පමණ සංවිධානය කිරීම, කොරියාව තුළ "ශ්‍රී ලංකා මැණික් වෙළඳ මධ්‍යස්ථානයක්" පිහිටුවීම සඳහා වූ මුලපිරීම, ශ්‍රී ලංකා සමාගම් 10කට සිය ව්‍යාපාර පැතිකඩ කොරියානු ජනරජයේ **XPrive** ව්‍යාපාර සංවර්ධන වේදිකාව තුළ ප්‍රකාශයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීම, 2021 ශ්‍රී ලංකා ආයෝජන සංසදයේ දී "කොරියානු දේශයේ සැසිය" සඳහා සම-සංවිධායකත්වය ලබා දීම, ආයෝජන ආකර්ෂණය

සඳහා **D-Camp Korea** සහ ඇඟලුම් සහ රෙදිපිළි පිළිබඳ වෙබිනාර් සාකච්ඡා 02ක් පැවැත්වීම සහ 2021 සැප්තැම්බර් මාසයේ දී කොරියාවේ ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වීම.

ආ). **ජපානය:** ශ්‍රී ලාංකික නිෂ්පාදන මිලදී ගන්නා අනාගත ගැනුම්කරුවන් සමඟ තනි තනි වශයෙන් ව්‍යාපාරික රැස්වීම් 43ක් පැවැත්වීම, ශ්‍රී ලංකාවේ අපනයන සහ සංස්කෘතිකමය සාරවත් බව, පරිසර සචාරි, අධ්‍යාපනික සංචාරක ව්‍යාපාරය යනාදිය ප්‍රවර්ධනය කෙරෙන සජීවී සම්මන්ත්‍රණ 30ක් පැවැත්වීම, සංචාරක හා අපනයන ප්‍රවර්ධන වැඩසටහන් 16ක් සඳහා පුද්ගලිකව සහභාගී වීම, ජපානය තුළ අධ්‍යාපනය සහ රැකියා පිළිබඳව දැනුවත් කිරීම සඳහා මාසිකව සජීවී වැඩසටහන් 08ක් පැවැත්වීම, ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි ඉගෙනීමට ජපන් ජාතිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහනක් දියත් කිරීම, ශ්‍රී ලංකාව තුළ ජපන් අධ්‍යාපනය දියුණු කිරීමට පහසුකම් සැලසීම. ජපාන ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශනය, INCHEM Tokyo 2021 ප්‍රදර්ශනය, ජපාන තේ සංගමය සමඟ එක්ව තේ රස බැලීමේ සැසිය සහ මිනාටෝ සහ ෂිබුයා නගරවල සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම. ජපානයේ මරුබේනි සංස්ථාවේ පුනර්ජනනීය බලශක්ති ආයෝජන නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණීම. ජපානයේ වෙසෙන ශ්‍රී ලාංකික වෘත්තිකයන් හරහා ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ සමාගම් සහ ජපන් සමාගම් සම්බන්ධ කරමින් ජපානය පදනම් කරගත් ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සඳහා ව්‍යවසායකත්ව වැඩමුළුවක් සංවිධානය කිරීම.

ඇ). **චීනය:** වෙළඳාම, ආයෝජන, සංචාරක සහ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම/ ඒවාට සහභාගී වීම, වසරකට ලංකා තේ කිලෝග්‍රෑම් මිලියන 4ක් චීනයට ආනයනය කිරීම සඳහා චීන සමාගමක් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට පහසුකම් සැලසීම, 4 වැනි CIIE සමුළුව සහ ෆුජියාන් - ශ්‍රී ලංකා ආර්ථික සහ වෙළඳ සහයෝගීතා සමුළුව සඳහා සහභාගී වීමේ කටයුතු නිම කිරීම, වෙළඳ සහ ආර්ථික කටයුතු සඳහා චීන ශ්‍රී ලංකා සංගමය පිහිටුවීම, චීනය විසින් දකුණු සහයෝගීතාවය වෙත ලබා දෙන අරමුදල් වෙත ප්‍රවේශ වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය, බීජිං හි බහුපාර්ශ්වික සංවිධානය, CIDCA සහ ශ්‍රී ලංකාවේ රේඛීය ආයතන සමඟ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකාව තුළ මහා පරිමාණ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය සතු ව්‍යවසායකයන්, පෞද්ගලික සමාගම් (25ට වැඩි ප්‍රමාණයක්) සහ පළාත් බලධාරීන් සමඟ සම්බන්ධ වී අඛණ්ඩව කටයුතු කිරීම, ග්වන්ඩොන්ග් වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ආයෝජන පිළිබඳ වෙබිනාර් සාකච්ඡාවක් පැවැත්වීම.

ඈ). **ඕස්ට්‍රේලියාව:** 2021 මැයි මස 21 වැනි දින ඕස්ට්‍රේලියානු තේ මාස්ටර් ආයතනය සමඟ එක්ව ජාත්‍යන්තර තේ දිනය සැමරීම, SLASSCOM සමඟ එක්ව තොරතුරු තාක්ෂණ සහ BPM අංශ වෙළඳපොළ වෙත යොමු කිරීම පිළිබඳ වැඩසටහනක් සංවිධානය කිරීම, "අවුරුදු පොළ" සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2021අප්‍රේල් මස 18 වැනි දින සංවිධානය කිරීම, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන, ආයෝජන අවස්ථා, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපනය ආදිය ප්‍රවර්ධනය කෙරෙන වෙබිනාර් සාකච්ඡා 9ක් සංවිධානය කිරීම සහ ඊට සහභාගී වීම, "ශ්‍රී ලංකාවේ භූ දේශපාලනය සහ වෙළඳාම" නමින් වෙබිනාර් සාකච්ඡාවක් පැවැත්වීම, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩසටහන යටතේ ක්වීන්ස්ලන්තයේ සහ බ්‍රිස්බේන් හි වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම, ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය පිහිටුවීම, 2021 ජූනි මාසයේ දී ශ්‍රී ලංකා ආයෝජන සංසදය සඳහා ඕස්ට්‍රේලියාවේ සිට පැමිණි පුද්ගලයන් 42 දෙනෙකුගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම.

**ආරක්ෂක සහයෝගීතාව**

2021 අප්‍රේල් 28 වැනි දින නිරත වූ චීන ආරක්ෂක අමාත්‍යවරයාගේ සංචාරය, 2021 ජූලි 06 වැනි දින අතිගරු ජනාධිපතිතුමා සහ ජපාන ආරක්ෂක අමාත්‍යවරයා අතර පැවති ආරක්ෂක අමාත්‍යාංශ දුරකථන සම්මන්ත්‍රණය, පෙබරවාරි, මාර්තු සහ මැයි මාසවල දී ඕස්ට්‍රේලියානු හමුදා/ගුවන් හමුදාපතිවරුන් සමඟ පැවති අථත්‍ය අන්තර්ක්‍රියා.

පුද්ගල ජාවාරම් සහ අනෙකුත් ජාත්‍යන්තර අපරාධ පිළිබඳ 07 වැනි ඕස්ට්‍රේලියානු - ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම අතථ්‍ය හමුවක් ලෙස 2021 ජනවාරි 21 වැනි දින පැවැත්විණි.

චීන මහජන විමුක්ති හමුදාව වෙතින් සයිනොෆාම් එන්නත් මාත්‍රා 300,000ක් ශ්‍රී ලංකා යුද හමුදාවට පරිත්‍යාග කිරීම සඳහා පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාව වෙත යුධ නෞකා දියත් කිරීමේ සුහද චාරිකා සඳහා පහසුකම් සැලසීම සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ආයතනවල අදාළ ධාරිතා වර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) අතර නව අවබෝධතා ගිවිසුම සඳහා 2021 නොවැම්බර් 05 වැනි දින අත්සන් තැබීම.

**මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් හරහා පුද්ගලයන් අතර සම්බන්ධතා, මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු ප්‍රවර්ධනය කිරීම, අක්ත ගන්වන ලද රටවල ආයතන/ සමාගම්/ සංගම් විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා සහභාගී වීම.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා චීනය, ජපානය, කොරියානු ජනරජය සහ ඕස්ට්‍රේලියාවෙන් ලද කොවිඩ්-19 ආශ්‍රිත එන්නත්, වෛද්‍ය උපකරණ, පී.පී.ඊ. කට්ටල යනාදිය කාලානුරූපීව බෙදා හැරීම/ මූල්‍ය ආධාර සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම: "ඉටුකම" අරමුදල වෙනුවෙන් ලද රු. 900,000ක පරිත්‍යාගය සම්බන්ධීකරණය කිරීම; කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවට සහාය වීම සඳහා ඕස්ට්‍රේලියාව විසින් ශ්‍රී ලංකාව වෙත ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 11.7ක් ලබා දෙන ලදී. සයිනොෆාම් එන්නත් මාත්‍රා මිලියනයක් ලබා ගැනීම, චීනය පරිත්‍යාග කළ සයිනොෆාම් එන්නත් මාත්‍රා මිලියන 3, පෞද්ගලික ආරක්ෂණ උපකරණ කට්ටල, ඔක්සිජන් සාන්ද්‍රක පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කොරියානු ජනරජයෙන් ලද ඇ.ඩො. 500,000ක වටිනාකමින් යුත් වෛද්‍ය උපකරණ, දැඩි ප්‍රතිකාර ඒකක ඇඳන් 32 සහ ඔක්සිජන් සිලින්ඩර 50 පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කොරියානු ජනරජයේ IIDA විසින් තිළිණ කරන ලද ඇ.ඩො. 365,000ක වටිනාකමින් යුත් පිළිකා යන්ත්‍රය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය, ටෝකියෝවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් රැස් කරන ලද රු.මිලියන 43ක මුදල සම්බන්ධීකරණය කිරීම සහ ජපානයෙන් ඇස්ට්‍රාසෙනෙකා එන්නත් මාත්‍රා මිලියන 1.45ක් ලබා ගැනීම.

අලුතින් බඳවාගත් ශ්‍රී ලාංකික සේවකයින් කොරියානු ජනරජය වෙත ප්‍රවේශවීම සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම, රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර ශ්‍රමිකයන් යැවීම සහ එවීම පිළිබඳ අවබෝධතා ගිවිසුම අලුත් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාවෙන් කොරියානු ජනරජය වෙත යවනු ලබන සංක්‍රමණික සේවකයින්ගේ කෝටාව වැඩි කිරීම සඳහා කොරියානු ජනරජය සමඟ සම්බන්ධ වීම.

ජපානය වෙත ශ්‍රී ලාංකික සේවකයින් බඳවා ගැනීම සඳහා ජපානයේ එහිම් ප්‍රාන්තය සහ ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ/ නියෝජිතායතන 03ක් සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම සඳහා පහසුකම් සැලසීම.

ශ්‍රී ලාංකිකයන්, නීතිවිරෝධී සංක්‍රමණිකයන්, පිටුවහල් කළ අයවලුන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා දූත මණ්ඩල/ දූත කාර්යාල මඟින් කොන්සියුලර් සහාය ලබා දීම, වීසා බලපත්‍ර දීර්ඝ කිරීමට පහසුකම් සැලසීම සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් මුහුණ දුන් විවිධ දුක්ගැනවිලි විසඳීම, සිදුව ඇති මරණ සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීම, ශ්‍රමය සහ සුබසාධනය සම්බන්ධ බොහෝ ගැටළු විසඳීම. කොරියානු ජනරජය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ජපානය, චීනය සහ අක්ත ගන්වන ලද අනෙකුත් රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන්ගේ කම්කරු සුබසාධනය සම්බන්ධ බොහෝ ගැටළු විසඳීම, දැනට සිරගෙවල්වල සහ රැඳවුම් මධ්‍යස්ථානවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳව සොයා බැලීම.

**යුරෝපය හා මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩලයීය අංශය**

**ද්විපාර්ශ්වික සබඳතා**

**ඒකාබද්ධ කොමිෂන් සභා/ දේශපාලන උපදේශන සහ ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීම (ද්විපාර්ශ්වික):**

ශ්‍රී ලංකාව සහ රුසියාව අතර වෙළෙඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය කොමිෂන් සභා රැස්වීම 2021 ජූනි 15 වැනි දින පැවැත්විණි.

ජර්මනිය සමඟ ප්‍රථම විදේශ කාර්යාල උපදේශනය 2021 ජූලි 14 වැනි දින අතථ්‍ය අයුරින් පැවැත්විණි.

ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ දෙවැනි ශ්‍රී ලංකා-තුර්කි ඒකාබද්ධ කමිටුව 2021 ජුනි 11 වැනි දින පැවැත්විණි.

රුසියාව සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන 2021 ඔක්තෝබර් 08 වැනි දින මොස්කව්හි දී පැවැත්වූ අතර, 03 වැනි විදේශ කාර්යාල උපදේශනය 2021 නොවැම්බර් 08 වැනි දින ස්විට්සර්ලන්තය සමඟ පැවැත්වී ය.

ගරු විදේශ අමාත්‍යවරයා 2021 ඔක්තෝබර් 27 වැනි දින මයිකල් නේස්බි සාමිවරයා විසින් පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයක් අතරතුර, සාමි මන්ත්‍රී මණ්ඩලයේ දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල දෙකෙහි මන්ත්‍රීවරුන් සහ අනෙකුත් ප්‍රභූවරුන් ඇමතී ය.

**සිදු කෙරෙමින් පවතින කටයුතු**

2022 පෙබරවාරි මාසයේ දී රුසියාව සමඟ පැවැත්වීමට නියමිත වෙළඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ 03 වැනි IGC සමුළුවට පහසුකම් සැලසීමේ ක්‍රියාවලියේ දී, 2022 පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකාව සහ රුසියාව අතර ඒකාබද්ධ කොමිසමේ පළමු රැස්වීම පැවැත්වීම සහ 2022 පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකාව සහ රුසියාව අතර කෘෂිකර්මය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම පැවැත්වීම. 2022 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය අතර පළමු විදේශ කාර්යාල උපදේශන කටයුතු පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමට කටයුතු කරයි.

2022 වර්ෂයට යෙදෙන, ශ්‍රී ලංකාව සහ නෙදර්ලන්තය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා 70 වසරක් සපිරීමේ සංවත්සරය සහ 2022 වර්ෂයට යෙදෙන, රුසියාව හා ශ්‍රී ලංකාව අතර පවත්නා 65 වසරක රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ සැමරුම් පැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කරයි.

**රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවීම, ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල විවෘත කිරීම, නිර්වේතනික කොන්සල්වරු පත් කිරීම:**

රුමේනියාව සහ ස්පාඤ්ඤය තුළ ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල විවෘත කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර සිසිලියේ කොන්සල් කාර්යාලය විවෘත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ලිච්ටන්ස්ටයින් රාජ්‍ය සමඟ නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා 2021 මාර්තු 05 වැනි දින ආරම්භ කරන ලදී. ජර්මනියේ හැම්බර්ග් සහ ෂ්ලෙස්විග්- හොල්ස්ටයින් රැඩෝල්ෆ්සල්, බැවේරියාව යන කොන්සියුලර් අධිකරණ බල ප්‍රදේශ සඳහා නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීමට පහසුකම් සැලසීම.

**ඉහළ පෙළේ අභ්‍යන්තර සහ බාහිර සංචාර සහ ඇමතුම් සඳහා පහසුකම් සැලසීම:**

බාහිර සංචාර සඳහා පහසුකම් සැපයීම/ පහත දක්වා ඇති රැස්වීම් සඳහා දායකත්වය ලබා දීම:

- 2021 සැප්තැම්බර් 12-14 යන දිනවල පැවති ගෝලීය අන්තර් ආගමික සංසදයට සහභාගී වීම සඳහා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා නිරත වූ සංචාරය සඳහා පහසුකම් සැලසීම සහ සිය ප්‍රධාන දේශනය සඳහා දායකත්වය ලබා දීම.

- අග්‍රාමාත්‍යවරයා 2021 සැප්තැම්බර් 12 වැනි දින ඉතාලියේ බොලොඤ්ඤා හි පැවති G20 අන්තර් ආගමික සංසදයේ දී ස්ලෝවේනියාවේ අතිගරු ජනාධිපති බොරුට් පහෝර් මැතිතුමා හමු විය.

- අග්‍රාමාත්‍යවරයා සහ ගරු විදේශ අමාත්‍යවරයා සංචාරය අතරතුර දී ඉතාලියේ හිටපු අග්‍රාමාත්‍ය මෙන්ම ඉතාලියේ යුරෝපීය කොමිසමේ හිටපු සභාපති වන රොමානෝ ප්‍රෝඩි මහතා හමු විය.

- ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා, 2021 සැප්තැම්බර් මාසයේ දී ඉතාලියේ බොලොඤ්ඤා හි අගරදගුරු අතිඋතුම් මැටියෝ මරියා සුප්පි හිමිපාණන්, තුර්කි විදේශ අමාත්‍ය මෙව්ලුට් කවුස්ගොලු මැතිතුමා, මෝල්ටාවේ ගරු මුදල් අමාත්‍ය බාර්ටොලෝ එවරිස්ට් මැතිතුමා සහ ඉතාලියේ ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍ය මරිනා සෙරෙනි මැතිනිය හමු විය.

- ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා, 2021 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ 76 වැනි සැසි වාරය අතරතුර දී තුර්කි විදේශ අමාත්‍යවරයා හමු විය.

- ගරු මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා සහ ගරු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමා 2021 ජුනි 2-5 යන දිනවල රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් නුවර පැවති 24 වැනි ජාත්‍යන්තර ආර්ථික සංසදයට සහභාගී විය.

- ගරු කලාපීය සහයෝගීතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා, 2021 සැප්තැම්බර් 05 සිට 08 යන දිනවල රුසියාවේ මොස්කව් හි පැවති "OTDYKH ලෙෂර් ෆෙයා" ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.

- ගරු ප්‍රවාහන අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය සහ ගරු විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර මැතිතුමා, රුසියානු සමූහාණ්ඩුවේ ෆෙඩරල් සභාවේ ඩූමා ප්‍රාන්තයේ නියෝජිතයින් තෝරා පත් කර ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා සැප්තැම්බර් 16 සිට 23 යන දිනවල රුසියාවේ සංචාරයක නිරත විය.

- ගරු කලාපීය සහයෝගීතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා සහ ගරු සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා, 2021 ඔක්තෝබර් 05 සිට 08 යන දිනවල ප්‍රංශයේ පැරිස් නුවර පැවති ජාත්‍යන්තර ප්‍රංශ සංචාරක වෙළඳ ප්‍රදර්ශනයට (IFTM TOP RESA 2021) සහභාගී විය.

- වෙළඳාම, සංචාරක ව්‍යාපාරය සහ ආයෝජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා 2021 සැප්තැම්බර් 9-10 යන දිනවල ගරු කලාපීය සහයෝගීතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා යුක්රේනයේ සිදු කළ සංචාරය.

- ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා 2021 ඔක්තෝබර් 25 සිට 28 වැනි දින දක්වා එක්සත් රාජධානියේ සිදු කළ සංචාරය. ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මෙහිදී එක්සත් රාජධානියේ අතිගරු විදේශ ලේකම් එලිසබෙත් ට්‍රස් මැතිනිය, සභාවේ අතිගරු කතානායක ලින්ඩ්සේ හොයිල් මැතිතුමා, මයිකල් නේස්බි සාමිවරයා සහ ශ්‍රී ලංකාව සඳහා බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාගේ වෙළඳ නියෝජිත, ඇබර්සොක් හි ඩේවිස් සාමිවරයා හමුවිය.

- 2021 නොවැම්බර් 1-2 යන දෙදින තුළ ග්ලාස්ගෝ සහ එක්සත් රාජධානියේ පැවති UNFCCC කෝප්-26 ලෝක නායක සමුළුවට සහභාගී වීම සඳහා අතිගරු ජනාධිපතිවරයා එක්සත් රාජධානියේ සංචාරයක නිරත විය. මීට සමගාමීව, ජනාධිපතිවරයා බහරේන් රාජධානියේ ඔටුන්න හිමි කුමරු සහ අතිගරු අග්‍රාමාත්‍යවරයා වන සල්මාන් බින් හමාඩ් අල් කලීෆා මැතිතුමා, නේපාලයේ අතිගරු අග්‍රාමාත්‍ය ෂර් බහදූර් ඩෙයුබා මැතිතුමා, යුක්රේනයේ අතිගරු ජනාධිපති වොලොඩිමීර් සෙලෙන්ස්කි මැතිතුමා, සර්බියාවේ අතිගරු ජනාධිපති ඇලෙක්සැන්ඩර් වුචික් මැතිතුමා, පොදුරාජ්‍ය මණ්ඩලයේ අතිගරු මහලේකම් පැට්‍රීෂියා ස්කොට්ලන්ඩ් කිව්සී මැතිනිය සහ WTO හි අධ්‍යක්ෂ ජනරාල් න්ගෝසි ඔකොන්ජෝ ඉවීලා මැතිනිය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වී ය.

- රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ගරු ලේකම් නිකොලායි පට්‍රෂේව් මැතිතුමා 2021 නොවැම්බර් 22-24 යන දිනවල සිදු කළ සංචාරය. මෙම සංචාරය අතරතුර දී එතුමා ජනාධිපතිවරයා හමුවූ අතර, පැමිණි නියෝජිත පිරිස සහ ආරක්ෂක අමාත්‍යාංශය අතර ආරක්ෂක උපදේශන පවත්වන ලදී.

පහත පිරිස් අතර පැවැත්වූ දුරකථන ඇමතුම් සහ වීඩියෝ ඇමතුම් සඳහා පහසුකම් සපයන ලදී:

- ගරු විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ රුසියාවේ ගරු විදේශ අමාත්‍ය සර්ජි ලැව්රොව් මැතිතුමා අතර 2021 ජුනි 07 වැනි දින පැවති සංවාදය.

- 2021 ජූලි 15-16 යන දිනවල උස්බෙකිස්තානයේ පැවැත්වූ 'මධ්‍යම සහ දකුණු ආසියාව: කලාපීය සම්බන්ධතාව, අභියෝග සහ අවස්ථා' නමැති ජාත්‍යන්තර සමුළුව සඳහා අතථ්‍ය අයුරින් සහභාගී වීමට ගරු විදේශ අමාත්‍යවරයාට පහසුකම් සැලසීම.

- ගරු විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ එක්සත් රාජධානියේ දකුණු ආසියාව සහ පොදුරාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය තාරික් අහමඩ් සාමිවරයා අතර 2021 ජනවාරි සහ 2021 ජුනි 17 වැනි දින පවත්වන ලද වීඩියෝ ඇමතුම.

- එක්සත් රාජධානියේ ගරු ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය රනිල් ජයවර්ධන මැතිතුමා සහ කලාපීය සහයෝගීතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා අතර 2021 ජුනි 29 වැනි දින පැවැත්වූ සංවාදය.

- ගරු විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ ලක්සම්බර්ග් හි විදේශ අමාත්‍ය ජීන් ඇසල්බෝර්න් මැතිතුමා අතර 2021 ජූලි 09 වැනි දින පැවැත්වූ වීඩියෝ සංවාදය.

- ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා සහ දකුණු ආසියාව සහ එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය තාරික් අහමඩ් සාමිවරයා අතර 2021 සැප්තැම්බර් 09 වැනි දින පැවැත්වූ සංවාදය.

**වැදගත් ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්/ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සහ පසු විපරම් කිරීම:**

- එක්සත් රාජධානිය සමඟ ක්ෂුද්‍ර ප්ලාස්ටික් පර්යේෂණ පිළිබඳ අවබෝධතා ගිවිසුම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඊට අත්සන් තැබීමේ කටයුතු සූදානම් කිරීම.

- ශ්‍රී ලංකාව සහ රුසියාව අතර රේගු කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය සහය පිළිබඳ කෙටුම්පත් ගිවිසුම සඳහා වන සාකච්ඡා අවසන් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.

- දඬුවම් නියම වූ පුද්ගලයින් විස්ථාපනය කිරීම පිළිබඳ ගිවිසුම සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමට අදාළව චෙක් ජනරජය සමඟ සාකච්ඡා අවසන් කොට අත්සන් කිරීමට සූදානම් කිරීම සහ අනෙකුත් එක් එක් ප්‍රාන්තවල නිල දූත මණ්ඩලවල සිටින නියෝජිතයින්ගේ පවුලේ සාමාජිකයින් සඳහා වැටුප් සහිත රැකියාවක නිරත වීමට අවසර දීම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් කෙටුම්පත් කිරීම. මේ සඳහා කැබිනට් අනුමැතිය අපේක්ෂා කෙරේ.

- සෞඛ්‍ය ආරක්ෂණ සහයෝගීතාව පිළිබඳව එක්සත් රාජධානිය සමඟ එකඟ වූ අවබෝධතා ගිවිසුම පිළිබඳ සාකච්ඡා අවසන් කොට ඇත. ඊට කැබිනට් අනුමැතිය හිමිය ඇති අතර අත්සන් තැබීම සඳහා සූදානම් කොට ඇත.

- රුසියාව සමඟ පවත්නා තරුණ සංවර්ධනය පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ රුසියාව සමඟ පවත්නා භෞතික සංස්කෘතිය සහ ක්‍රීඩා පිළිබඳ අවබෝධතා ගිවිසුමේ සාකච්ඡා අවසන් අදියරේ පවතී.

- ජර්මනිය සමඟ පවත්නා ද්විත්ත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම පිළිබඳ සාකච්ඡා සිදු කෙරෙමින් පවතී

- එක්සත් රාජධානිය සමඟ පවත්නා ක්ෂුද්‍ර ප්ලාස්ටික් පර්යේෂණ පිළිබඳ අවබෝධතා ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඊට අත්සන් තැබීමට සූදානම් කොට ඇත.

- ගාල්ලේ මහමෝදර මාතෘ රෝහල (හෙල්මත් කෝල් රෝහල) ඉදිකිරීම සඳහා ජර්මානු රජයෙන් යුරෝ මිලියන 25 ක (රුපියල් බිලියන 357) ණය මුදල ලබාගැනීම සඳහා පහසුකම් සැලසී ය.

- සිදු කෙරෙමින් පවතින සාකච්ඡා: සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික බලශක්තිය භාවිතා කිරීමේ සහයෝගීතාව පිළිබඳව රුසියාව සමඟ පවතින අවබෝධතා ගිවිසුම. රියදුරු බලපත්‍ර අලුත් කිරීම සහ සිරකරුවන් මාරු කිරීම සම්බන්ධයෙන් ඉතාලිය සමඟ පවතින ගිවිසුම, ජර්මනිය සමඟ භෞතික වශයෙන් හෝ බුද්ධි හුවමාරුව සහ ද්‍රව්‍ය පිළිබඳ වර්ගීකරණය කරන ලද තොරතුරු අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා කිරීම පිළිබඳව ගිවිසුම සහ ජර්මනියේ මානව ඉතිහාස විද්‍යාව සඳහා වූ මැක්ස් ප්ලැන්ක් ආයතනය සහ මානව ශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යාව පිළිබඳ අධ්‍යයනාංශය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා සහ උපාධි අධ්‍යයන පීඨය අතර පවතින අවබෝධතා ගිවිසුම.

  හංගේරියානු විදේශ අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අධ්‍යාපන සහයෝගීතාව (ස්ටයිපෙන්ඩියම් හංගේරියානු ශිෂ්‍යත්ව), ගුවන් සේවා ගිවිසුම්, හංගේරියාව සමඟ ද්විත්ත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම පිළිබඳ අවබෝධතා ගිවිසුම අවසන් කිරීමට කටයුතු කිරීම.

**බහුපාර්ශ්වික සබඳතා**

**පොදුරාජ්‍ය මණ්ඩලය**

- 2021 මැයි 20-21 යන දිනවල පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ වාර්ෂික රැස්වීම සඳහා පහසුකම් සැලසීම.

- 2021 සැප්තැම්බර් 16 වැනි දින පැවති CFAMM හමුව සඳහා සහභාගී විය.

- 2022 ජූනි මස රුවන්ඩාවේ දී පැවැත්වීමට නියමිත මීළඟ පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය නියෝජනය කිරීම සඳහා අවැසි පහසුකම් සැපයීමේ කටයුතු සිදු වෙමින් පවතී.

**යුරෝපා සංගමය**

- යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 23 වැනි සැසිවාරය 2021 ජනවාරි 25 වැනි දින කැඳවීම. සංවර්ධන සහයෝගීතා රැස්වීමේ දී යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම සඳහා පහසුකම් සැලසීම. යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් (GSP+) වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ අධීක්ෂණ ක්‍රියාවලිය - පසු විපරම් ප්‍රශ්න + 2020-2021 ලකුණු සටහන පිළිබඳ ශ්‍රී ලංකාවේ සැල කිරීම 2021 ජූනි මස 25 දින යොමු කරන ලදී. යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ඒකාබද්ධ යළි පිවිසුම් කමිටු රැස්වීම 2021 ජූලි මාසයේ දී පැවැත්විණි.

- යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් වැඩපිළිවෙළෙ හි ජාත්‍යන්තර සම්මුතීන් 27 සඳහා ශ්‍රී ලංකාවේ අනුකූල වීම සමාලෝචනය කිරීම සඳහා යුරෝපා සංගමයේ නියාමන කණ්ඩායම 2021 සැප්තැම්බර් 24 සිට ඔක්තෝබර් 05 වැනි දින තෙක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත පිරිස අතිගරු ජනාධිපතිවරයා, ගරු කථානායකවරයා, විදේශ අමාත්‍යවරයා, අධිකරණ හා මුදල් අමාත්‍යවරුන්, මානව හිමිකම්, පරිසරය, කම්කරු සහ යහපාලනය යන පොකුරුවලට අදාළ රාජ්‍ය නිලධාරීන් හමු විය. මෙම නියෝජිත පිරිස විරුද්ධ දේශපාලන පක්ෂ, සිවිල් සමාජය, වෘත්තීය සමිති, සේවා යෝජකයින්, ව්‍යාපාරික ප්‍රජාව, එක්සත් ජාතීන්ගේ සහ ජාත්‍යන්තර නියෝජිතායතන ද හමුවිය. මෙම සංචාරයට සමගාමීව, රාජ්‍ය පාලනය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපා

සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම 2021 සැප්තැම්බර් 29 වැනි දින කොළඹ දී හමුවක් පැවැත්වූ අතර එහිදී ඔවුහු ගැටලු සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව විමසා බැලූහ.

- 2021 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ 76 වැනි මහා මණ්ඩල සැසි වාරය අතරවාරයේ දී අතිගරු ජනාධිපතිවරයා ලැට්වියාවේ අතිගරු ජනාධිපති එගිල්ස් ලෙව්ට්ස් මැතිතුමා හමු විය.

- ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා එක්සත් ජාතීන්ගේ 76 වැනි මහා මණ්ඩල සැසි වාරය අතරතුර දී 2021 සැප්තැම්බර් 24 වැනි දින එක්සත් රාජධානියේ දකුණු ආසියා සහ පොදුරාජ්‍ය මණ්ඩලීය අමාත්‍ය තාරික් අහමඩ් සාමිවරයා හමුවිය.

- ගරු අග්‍රාමාත්‍යවරයා 2021 සැප්තැම්බර් 12 වැනි දින ඉතාලියේ බොලොඤ්ඤා හි පැවති G20 අන්තර් ආගමික සංසදයේ දී යුරෝපීය පාර්ලිමේන්තුවේ ගරු සභාපති ඩේවිඩ් සසෝලි මැතිතුමා හමු විය.

- 2022 ජනවාරි 26 දින පැවැත්වීමට නියමිත වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම, 2022 දෙසැම්බර් 02 වැනි දින පැවැත්වීමට නියමිත සංවර්ධන සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම සහ 2022 ජනවාරි 31 වැනි දින යුරෝපා සංගම් ශ්‍රී ලංකා ආයෝජක සංවාදය පැවැත්වීම සඳහා කටයුතු සිදු වෙමින් පවතී. 2022 පෙබරවාරි 08 වැනි දින බ්‍රසල්ස් හි පැවැත්වීමට නියමිත යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීම පිළිබඳ කටයුතු සූදානම් කෙරෙමින් පවතී.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

- කොහුවල හන්දියේ සහ ගැටඹේ ගුවන් පාලම ඉදිකිරීම සඳහා හංගේරියාව සමඟ ණය ආධාර ගිවිසුමකට අත්සන් කිරීම සම්බන්ධීකරණය කිරීම. ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන්නේ හංගේරියාවේ පොළී රහිත ණය පහසුකමක් මඟිනි.
- ලක්සම්බර්ග් කොටස් හුවමාරුවෙන් සහ EIB වෙතින් ශ්‍රී ලංකාවේ හරිත ව්‍යාපෘති සඳහා හරිත හා තිරසාර ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

- බ්‍රසල්ස් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ ලක්සම්බර්ග් වාණිජ මණ්ඩලය සමඟ සහයෝගීතාවයෙන් වෙබිනාර් සාකච්ඡාවක් සංවිධානය කරන ලදී.

- බ්‍රිතාන්‍ය වාණිජ මණ්ඩලය වෙත පවරන ලද එක්සත් රාජධානි-ශ්‍රී ලංකා ව්‍යාපාරික මණ්ඩලය ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් නැවත දියත් කරන ලදී.

- පැරීසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් CCI සමඟ සහයෝගයෙන් ප්‍රංශයේ MEDEF සහ METF සමඟ වෙබිනාර් සංකච්ඡාවක් සංවිධානය කරන ලදී.

**ආරක්ෂක සහයෝගීතාව**

- යුරෝපා සංගමය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස පිළිගැනෙන තහනම, 2021 ජූලි 19 වැනි දින සිට 2022 ජනවාරි මස දක්වා මාස හයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට යුරෝපා සංගමය කටයුතු කළේ ය.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය/ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

**සංක්‍රමණික කම්කරු සුබසාධනය/ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්**

ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර අත්සන් තබන ලද ශ්‍රී ලාංකිකයන් සඳහා ආරක්ෂිත සහ නිත්‍ය ශ්‍රම සංක්‍රමණය (IV අදියර) පිළිබඳ ගිවිසුම (2021 සැප්තැම්බර් 07 වැනි දින අත්සන් තබන ලද) පිළිබඳ කටයුතු නිම කිරීම සහ ඊට අත්සන් තැබීම සඳහා පහසුකම් සැලසීම.

**කොවිඩ්-19 ආශ්‍රිත සහාය**

- කොවිඩ්-19 අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා සිදු කෙරෙන රජයේ ප්‍රයත්නවලට සහාය වීම සඳහා යුරෝපා සංගමය විසින් යුරෝ මිලියන 02 ක ප්‍රතිපාදන ප්‍රදානය කරනු ලැබීම (ලෝක සෞඛ්‍ය සංවිධානය හරහා).

- විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සියරට පැමිණවීම සඳහා පහසුකම් සැලසීම, තුර්කියෙන් වෙන්ටිලේටර සහ ආරක්ෂක උපකරණ ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම, රුසියාවෙන් ස්පුට්නික් V එන්නත් තොග කිහිපයක් ලබා ගැනීම සහ ඇස්ට්‍රාසෙනෙකා එන්නත් මාත්‍රා 600,000ක් ලබා ගැනීමට යුරෝපා සංගමයට සහ එක්සත් රාජධානියට ඉල්ලීම් යොමු කිරීම.

- කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලයට ලබා දීම සඳහා ඇස්ට්‍රාසෙනෙකා එන්නත ආනයනය කිරීමට සහ ඒ පිළිබඳ පරිපාලන කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීම.

- නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ලබා දීම සඳහා ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එන්නත ආනයනය කිරීමට සහ ඒ පිළිබඳ පරිපාලන කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීම.

## මැද පෙරදිග අංශය

**ද්විපාර්ශ්වික සබඳතා**

**සංචාර**

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2021 දෙසැම්බර් 4 - 7 දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී ඉන්දීය සාගර සමුළුවට (IOC) සහභාගී වූ අතර, එහිදී අබුඩාබි හි ඔටුන්න හිමි කුමරු සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නියෝජ්‍ය උත්තරීතර සේනාංකාධිපති ෂෙයික් මොහොමඩ් බින් සයීඩ් බින් සුල්තාන් අල් නහියන් මැතිතුමා හමුවිය.

ගරු යෞවන හා ක්‍රීඩා කටයුතු, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ සහ ඩිජිටල් තාක්ෂණ සහ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු නියෝජිත පිරිස දෝහා හි සංචාරයක නිරත වූ අතර 2021 දෙසැම්බර් 19 වැනි දින කටාර් රාජ්‍යයේ ගරු කම්කරු අමාත්‍ය ආචාර්ය අලි බින් සයීඩ් බින් ස්මයික් අල් මාරි මැතිතුමා හමුවිය.

ගරු කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා සහ ගරු විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ප්‍රියංකර ජයරත්න මැතිතුමා 2021 ඔක්තෝබර් 11 සිට 15 යන දිනවල කටාර් රාජ්‍යයේ සංචාරයක නිරත විය.

ගරු කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා 2021 දෙසැම්බර් 29 වැනි දින ඕමානයේ පැවති හොකී තරඟාවලියේ ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවය සඳහා ශ්‍රී ලංකාවේ යෞවන හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා නියෝජනය කරමින් ගරු ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ විශේෂ නියෝජිතයකු වශයෙන්, මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා 2021 අප්‍රේල් 07 සිට 10 යන දිනවල ඕමාන් සුල්තාන් රාජ්‍යයේ සංචාරයක නිරත විය. එතුමා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ඕමානයේ සුල්තාන් හයිතම් බින් තාරික් මැතිතුමා වෙත යොමු කළ විශේෂ පණිවිඩයක් රැගෙන මෙම සංචාරයේ නිරත විය.

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෞදි අරාබි රාජධානියේ රියාද් නුවර (KSA) සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ (UAE) අබුඩාබි යන නගරවල සිටින තම මිත්‍ර පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අනෙකුත් ආයෝජකයන් සමඟ පැවති රැස්වීම්වලට සහභාගී වීම සඳහා සහ 2021 දෙසැම්බර් 11 සිට 18 යන දිනවල සංචාරයක නිරත විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් ලැබුණු ආරාධනය මත, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නොවැම්බර් 5 වැනි දින ඩුබායි හි සංචාරයක නිරත වූ අතර, 2021 නොවැම්බර් 03 සිට 09 යන දිනවල ඕමාන් සුල්තාන් රාජ්‍යයේ ආයෝජකයින් සමඟ පැවති රැස්වීම්වලට සහභාගි වූහ.

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිස 2021 ඔක්තෝබර් 20 සිට 22 යන දිනවල කටාර් රාජ්‍යයේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත පිරිස කටාර් මහ බැංකුවේ ගරු අධිපති ෂෙයික් අබ්දුල්ලා බින් සෞද් අල්-තානි මැතිතුමා හමුවී ශ්‍රී ලංකා මහ බැංකුව සහ කටාර් රාජ්‍යයේ මහ බැංකුව අතර පවත්නා සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කළේ ය.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඉහළ පෙළේ අමාත්‍ය සංචාර කිහිපයක් සංවිධානය කරන ලදී. එනම්, 2021 මාර්තු 07-11 දිනවල යෞවන හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා සහ ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ඩී. වී. චානක මැතිතුමා නිරත වූ සංචාරය; 2021 සැප්තැම්බර් 20-24 දිනවල බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මැතිතුමාගේ සංචාරය; 2021 පෙබරවාරි 21- 25 යන දිනවල යුධ, නාවික සහ ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානීතුමාගේ සංචාරය; 2021 දෙසැම්බර් 12-16 යන දිනවල මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය සරත් වීරසේකර මැතිතුමාගේ සංචාරය.

ඉරාන ජනාධිපතිවරයාගේ දිවුරුම් දීමේ උත්සවය සඳහා, 2021 සැප්තැම්බර් 24-27 යන දිනවල ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මර්ජාන් ෆලීල් මැතිතුමා සහ ගරු බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමා සිදු කළ නිල සංචාර සඳහා පහසුකම් සලසන ලදී.

බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතා 2021 සැප්තැම්බර් 24 සිට 27 දක්වා කාලය තුළ ඉරාන ඛණිජ තෙල් අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්වීම සඳහා මෙන්ම, GASTECH සමුළුවට සහභාගී වීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරයක නිරත විය.

ඕමාන් සුල්තාන් රාජ්‍යයේ විදේශ අමාත්‍යාංශයේ සහයෝගයෙන්, 2021 පෙබරවාරි 17 වැනි දින ශ්‍රී ලංකාව සහ ඕමාන් සුල්තාන් රාජ්‍යය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 40 වැනි සංවත්සරය සමරන ලදී.

**අතථ්‍ය සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම:**

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා 2021 මාර්තු 21 වැනි දින ඉස්ලාමීය රටවල් සඳහා වූ සංවිධානයේ මහ ලේකම් ආචාර්ය යූසෙෆ් අල්-ඔතයිමීන් මහතා සමඟ අතථ්‍ය හමුවක් පැවැත්වී ය.

ශ්‍රී ලංකාවේ හිටපු විදේශ අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා 2021 අගෝස්තු 11 වැනි දින අබ්දෙල් බින් අහ්මඩ් අල්-ජුබෙයිර් මැතිතුමා සමඟ අතථ්‍ය හමුවක් පැවැත්වී ය.

ඉන්දියානු සාගර සමුළුවට සමගාමීව, දෙසැම්බර් 05 වැනි දින ගරු විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු හා ජාත්‍යන්තර සහයෝගීතා අමාත්‍ය සහ අමාත්‍ය මණ්ඩල සාමාජික ගරු ෂෙයික් අබ්දුල්ලා බින් සයෙඩ් නහ්යන් මැතිතුමා සමඟ හමුවක් පැවැත්වීම.

2021 ජූලි 8 වැනි දින මැද පෙරදිග අංශයේ දී ලේකම්වරයා සහ අදාළ තානාපතිවරුන් හා දූත කාර්යාල ප්‍රධානීන් අතර සාකච්ඡාවක් පැවැත්වීම.

මෙම අංශය නේවාසික දූත මණ්ඩල ප්‍රධානීන්, ගරු විදේශ අමාත්‍යවරයා සහ විදේශ ලේකම්වරයා අතර සාකච්ඡා කිහිපයක් පැවැත්වීම සඳහා පහසුකම් සැලසී ය.

**අතථ්‍ය රැස්වීම් - දේශපාලන උපදේශන සහ ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීම්:**

ශ්‍රී ලංකාව සහ බහරේනය අතර (අථත්‍ය) දේශපාලන උපදේශනවල 01 වැනි වටය 2021 ඔක්තෝබර් 21 වැනි දින පැවැත්විණි.

දේශපාලන උපදේශන පිළිබඳ 3 වැනි වටය 2022 පෙබරවාරි 1 වැනි දින පැවැත්වීමට නියමිත ය.

**ශ්‍රී ලංකා- එක්සත් අරාබි එමීර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව**

ශ්‍රී ලංකා-එක්සත් අරාබි එමීර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව 2020 EXPO (ඔක්තෝබර් 2021 - මාර්තු 2022) අතරතුර ඉහළ මට්ටමේ සංචාරයකට සමගාමීව 2021 අග භාගයේදී හෝ 2022 පළමු කාර්තුවේදී පැවැත්වීමට නියමිතය.

**ද්විපාර්ශ්වික ගිවිසුම්වල පසු විපරම් /සිදු කෙරෙමින් පවතින කටයුතු;**

ශ්‍රී ලංකා රජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර කොන්සියුලර් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම සඳහා 2018 දී අත්සන් තැබූ අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ බලධාරීන් සමඟ ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීම සඳහා මෙම අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින අතර එය දෙපාර්ශ්වයෙන්ම අපේක්ෂා කෙරේ.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා කිරීම පිළිබඳ ගිවිසුම් කෙටුම්පතක් ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් හුවමාරු කරගන්නා ලදී.

පළමු සාකච්ඡා වටය 2021 සැප්තැම්බර් 1 සිට 2 යන දෙදින තුළ පැවැත්විණි.

- 'ලේකම්වරයා සමඟ සංවාදයේ යෙදීම' නමැති සැසිවාරයෙන් පසුව, අපේක්ෂිත ගිවිසුම්වල වත්මන් තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා, දූත මණ්ඩලවල උපදේශනය සහිතව ගිවිසුම් පසු විපරම් කිරීම සඳහා මෙම අංශය කටයුතු කර ඇත.
- කටාර් රාජ්‍යයේ ශ්‍රී ලාංකික මිනිස්බල රැකියා නියාමනය පිළිබඳ ගිවිසුම යටතේ, 2021 ජූනි 16 වැනි දින කටාර්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටු රැස්වීම අතථ්‍ය අයුරින් පවත්වන ලදී.

**අවසන් කරන ලද ගිවිසුම්**

**ඕමානය:** ශ්‍රී ලංකාව සහ ඕමානය අතර රාජ්‍යතාන්ත්‍රික, විශේෂ, සේවා සහ නිල විදේශ ගමන් බලපත්‍ර දරන්නන්ගේ වීසා බලපත්‍ර අවශ්‍යතා පිළිබඳ ගිවිසුම 2021 පෙබරවාරි 17 වැනි දින අවසන් කෙරිණි.

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) සහ ඕමාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (OCCI) අතර 2021 ජූලි 07 වැනි දින අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම.

ඕමාන ෂුමූක් ආයෝජන සමාගම අතර නොබැඳි ගිවිසුමක් සඳහා 2021 ජූලි 26 වැනි දින අත්සන් කරන ලදී.

**ඉරානය:** තෙල් මිල සඳහා වූ හිඟ ගෙවීමක් නිරාකරණය කිරීම හරහා ඉරානය වෙත සිදු කෙරෙන ලංකා තේ විකුණුම වැඩි කිරීම සඳහා යෝජිත යෝජනා ක්‍රමය පිළිබඳ ගිවිසුමට, 2021 දෙසැම්බර් 21 වැනි දින, ඉරානයේ කර්මාන්ත, පතල් හා වෙළඳ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වැවිලි අමාත්‍යාංශය අතර අත්සන් තබන ලදී.

**බහරේනය:** බහරේනය සහ ශ්‍රී ලංකාව අතර, රාජ්‍යතාන්ත්‍රික, විශේෂ සහ නිල ගමන් බලපත්‍ර දරන්නන් සඳහා වීසා අවශ්‍යතා නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම සඳහා 2021 සැප්තැම්බර් 23 වැනි දින අත්සන් තබන ලදී.

**ඊශ්‍රායලය:** ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර පවත්නා ගුවන් ප්‍රවාහන ගිවිසුමේ සංශෝධන පිළිබඳ විධිවිධානවලට අත්සන් කිරීම පිළිබඳ සාකච්ඡා අවසන් කරන ලදී. 2020 පෙබරවාරි 24 වැනි දින අත්සන් කරන ලද, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා ඊශ්‍රායලයේ නිශ්චිත ශ්‍රම වෙළඳපොළ අංශවල (සාත්තු සේවා අංශය) තාවකාලික රැකියා ලබා දීමේ ගිවිසුම.

**2021 වර්ෂයේ පැවති එක්සත් ජාතීන්ගේ 76 වැනි සැසි වාරයට සමගාමීව පැවති ද්විපාර්ශ්වික රැස්වීම් සඳහා පහසුකම් සැලසීම.**

- අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන අතිගරු ෂෙයික් ටමීම් බින් හමාඩ් අල්- තානි මැතිතුමා අතර පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාව
- කුවේටයේ අග්‍රාමාත්‍ය අතිගරු ෂෙයික් සබාහ් අල් ඛලේඩ් අල් හමාඩ් අල්- සබාහ් මැතිතුමා සහ කටාර් රාජ්‍යයේ එමීර්වරයා වන අතිගරු ෂෙයික් ටමීම් බින් හමාඩ් අල්- තානි මැතිතුමා සමඟ පැවති සාකච්ඡාව
- ඉස්ලාමීය රටවල් සඳහා වූ සංවිධානයේ මහ ලේකම් ආචාර්ය යූසෙෆ් අල්-ඔතයිමීන් මහතා ද්විපාර්ශ්වික සබඳතා පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්වී ය.
- ලෙබනන ජනරජයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරිය හා ආරක්ෂක අමාත්‍යවරිය වන ගරු සෙයිනා අකාර් මැතිනිය සමඟ පැවති ද්විපාර්ශ්වික හමුව

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

බහරේනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ආයෝජන මණ්ඩලය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ (BPO) ව්‍යාපෘතියක් සාර්ථක ලෙස සම්බන්ධීකරණය කළේ ය.

2021 මාර්තු 23-27 දිනවල දෝහා හි පැවති "8 වැනි කටාර් ජාත්‍යන්තර කෘෂිකාර්මික ප්‍රදර්ශනය Agrite Q – 2021" සඳහා දෝහා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහභාගී වූ අතර එහිදී ශ්‍රී ලාංකික කෘෂිකාර්මික නිෂ්පාදන සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කෙරිණි.

සිලෝන් බිස්කට්ස් ලිමිටඩ් සහ ට්‍රැඩ්ලන්කා ලිමිටඩ් වෙතින් නව ශ්‍රී ලාංකික ආහාර නිෂ්පාදන 78 ක් 2021 අප්‍රේල් මාසයේ දී SPAR Oman ආයතනය වෙත අපනයනය කරන ලදී.

බහරේනය තුළ "ශ්‍රී ලංකා ෆෙස්ට්" නමින් පැවති මහා වෙළෙඳ, සංචාරක සහ තේ ප්‍රවර්ධන වැඩසටහනේ කටයුතු සමාප්ත කෙරිණි. (2021 සැප්තැම්බර් 29 සිට ඔක්තෝබර් 03 දක්වා)

"Destination Sri Lanka" නමැති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සහයෝගය ඇතිව 2021 ඔක්තෝබර් 26 වැනි දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී සාර්ථකව පැවැත්විණි.

කුර්දිස්තානයේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල් කාර්යාලය කුෂ්මා සමාගමේ සහයෝගය ඇතිව, ඔක්තෝබර් 26 - 29 දිනවල 2021 අර්බිල් ඒෂියන් එක්ස්පෝ ප්‍රදර්ශනය අර්බිල් හිදී සංවිධානය කළේ ය. ලංකා තේ මණ්ඩලයේ සහයෝගය ඇතිව තේ සමාගම් 08ක් ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමට එකඟ කර ගැනීමට තානාපති කාර්යාලය කටයුතු කළේ ය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), ඊශ්‍රායල - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ ඊශ්‍රායල- ආසියා වාණිජ මණ්ඩලය සමඟ එක්ව දූත ටෙල් අවිව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ "ව්‍යාපාර සහ ආයෝජන අවස්ථා" පිළිබඳ වෙබිනාර් සාකච්ඡාව 2021 පෙබරවාරි 16 වැනි දින සාර්ථකව පවත්වන ලදී.

ඊශ්‍රායලයේ ප්‍රමුඛ පෙළේ පෞද්ගලික ගුවන් සමාගමක් වන ආර්කියා ඊශ්‍රායල් ගුවන් සමාගම ප්‍රමුඛ පෙළේ ඊශ්‍රායල සංචාරක ක්‍රියාකරුවෙකු ලෙස ද ක්‍රියා කරන අතර, එම සමාගම නියමු ව්‍යාපෘතියක් ලෙස කොවිඩ්-19 වසංගතය හමුවේ/පශ්චාද් කොවිඩ්-19 තත්ත්වය හමුවේ "ජෛව බුබුළු කැප්සියුල" සංකල්පය යටතේ ඊශ්‍රායල සංචාරක කණ්ඩායම් ශ්‍රී ලංකාවට එවීමට සිය කැමැත්ත පළ කළේ ය.

වෙළඳපොළ පිළිබඳ දැනුවත් කිරීම සඳහා "සාම්ප්‍රදායික වෙළඳපොළවලින් ඔබ්බට වර්ධනය වන්න" යන තේමාව යටතේ ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය (NCE), ඊශ්‍රායල වාණිජ මණ්ඩලය (FICC) සහ ඊශ්‍රායල - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සමඟ සහයෝගීතාවයෙන් 2021 අප්‍රේල් 28 වැනි දින දූත මණ්ඩලය වෙබිනාර් සාකච්ඡාවක් සංවිධානය කළේ ය. ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ ඇරඹුම පිළිබඳ වෙබිනාර් සාකච්ඡාව සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් 20 කට වඩා වැඩි පිරිසක් සහභාගී වූහ.

අබුඩාබි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඩුබායි හි කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 'එක්ස්පෝ 2021' ප්‍රදර්ශනයේ සංවිධායකයන් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සංවිධායකයන් සමඟ සාර්ථක සාකච්ඡා සම්බන්ධීකරණය කරන ලදී. අවශ්‍යතා ගණනාවක් සපුරා ගැනීම සහ එක්ස්පෝ ප්‍රදර්ශනයේ කුටි කිහිපයක සංචාරයේ නිරත වීම.

'ගල්ෆ් ෆුඩ් ෆෙස්ටිවල්' ප්‍රදර්ශනයේ දී ලංකා තේ සහ අනෙකුත් ශ්‍රී ලාංකික සන්නාම ප්‍රවර්ධනය කිරීම සඳහා අබුඩාබි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික සමාගම්වලට පහසුකම් සලසන ලදී.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් 200කට අධික සංඛ්‍යාවක් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණ සමාගම් එක්ව, ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සමඟ සම්බන්ධ වී ශ්‍රී ලාංකික සමාගම්වලට වෙළඳපොළ ප්‍රවේශය විවෘත කිරීම සඳහා 'ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ වෘත්තීය සංගමය' පිහිටුවන ලදී.

2021 පෙබරවාරි මාසයේ දී, STTPB හි සභාපතිවරයා සමඟ වෙබිනාර් සාකච්ඡාවක් සංවිධානය කර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරක ක්‍රියාකරුවන් 100 කට අධික සංඛ්‍යාවක් ඊට සම්බන්ධ කර ගත් අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරකයින් සඳහා වන නව ජෛව බුබුළ වැඩපිළිවෙළේ හි විධිවිධාන පිළිබඳව දැනුවත් කරන ලදී.

2021 ඔක්තෝබර් 09 වැනි දින දමස්කස් හි අල් බුසුරි සූක් හිදී පැවති සිරියාවේ රාජ්‍යතාන්ත්‍රික සමාජයේ ජාත්‍යන්තර බසාර් ප්‍රදර්ශනයේ දී ලංකා තේ ප්‍රවර්ධනය කෙරිණි.

සෞදි අරාබි රාජධානිය වෙත මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා මත්ස්‍ය අපනයන 17ක් ලියාපදිංචි කෙරුණු අතර හරිත තේ සහ කරාබු නැටි සඳහා පනවා තිබූ තාවකාලික සීමා ඉවත් කරන ලදී.

2021 සැප්තැම්බර් 8-14 දිනවල ලුලු හයිපර්මාර්කට් ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා ආහාර සතිය ආරම්භ කෙරිණි.

**වෙනත්:**

**ආගමන විගමන පාලකවරයා සහ කුවේට් තානාපතිවරයා හමුවීම.**

- 2021 ජූලි 20 වැනි දින කුවේට් හි ශ්‍රී ලංකා තානාපතිවරයාගේ සහ මැදපෙරදිග අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහභාගීත්වයෙන්, කුවේට් හි විදේශ ගමන් බලපත්‍ර සහ අනෙකුත් අදාළ ආගමන කටයුතු සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පැවති "ලේකම්වරයා සමඟ සාකච්ඡා කිරීම" නමැති වැඩසටහනට පසුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයා සමඟ අතථ්‍ය රැස්වීමක් පැවැත්වීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී.
- 2021 ජනවාරි 21 වැනි දින, විපතට පත් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් 187 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ 2021 පෙබරවාරි මාසයේ දී අවශ්‍යතා සහිත විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සඳහා ආහාර කට්ටල 800ක් සහ ඖෂධ ලබා දීම.
- 2023-2027 කාලසීමාව සඳහා නිව්යෝර්ක් හි පැවැත්වෙන ජාත්‍යන්තර නීති කොමිසමේ ඡන්දයෙන් තෝරාපත් කෙරෙන තනතුර සඳහා වන ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට ජෝර්දාන් රජය සිය සහය පළ කර ඇත.
- ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2021 ජනවාරි 1 වැනි දින සිට සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුළ ශ්‍රී ලාංකිකයන් සඳහා නව රැකියා 706 ක් ලබාගෙන ඇත. එම ශ්‍රී ලාංකිකයන් 706 දෙනා මෙම වසරේ ජනවාරි මාසයේ සිට ජෝර්දානයේ සේවය කරති.

- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය වෙත ඔක්සිජන් සිලින්ඩර 460 ක්, ඔක්සි මීටර 22 ක් සහ ඔක්සිජන් රෙගියුලේටර 10 ක් ගුවන් මඟින් එවීමට කටාර් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සලසා දී ඇති අතර, සෞඛ්‍ය අංශයේ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා කටාර් රියාල් 5000/- ක මුදලක් "ඉටුකම - කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" වෙත තැන්පත් කරන ලදී.
- බේරූට් හි කොන්සල් ජනරාල් කාර්යාලය විසින් 2021 සැප්තැම්බර් 04 වැනි දින සිරියාවේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල් කාර්යාලයේ දී ජංගම කොන්සියුලර් සේවාවක් පවත්වන ලදී.
- නෙවිල් ප්‍රනාන්දු රෝහලට සහ වතුපිටිවල රෝහලට 'ඔප්ටිමල්' ෆින්ගර්ටිප් පල්ස් ඔක්සි මීටර 06 ක් පරිත්‍යාග කිරීම සඳහා බේරූට් හි කොන්සල් ජනරාල් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

**දකුණු ආසියා සහ සාර්ක් අංශය**

**ද්විපාර්ශ්වික සබඳතා**

**ඉහළ පෙළේ අභ්‍යන්තර/ බාහිර සංචාර සඳහා පහසුකම් සැලසීම**

මෙම අංශය 2021 ජනවාරි මස සිදු වූ ඉන්දියාවේ ගරු විදේශ අමාත්‍ය එස්. ජෙයිශංකර් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය, 2021 ඔක්තෝබර් මස 04 වැනි දින සිදු වූ ඉන්දීය විදේශ ලේකම්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය සහ 2021 ඔක්තෝබර් 12 සිට 16 යන දිනවල ඉන්දීය යුද හමුදා මාණ්ඩලික ප්‍රධානියාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සැලසී ය.

2015 වසරේ සිට ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාද වූ වෘත්තීය කොන්සල් ජනරාල් කාර්යාලය කොල්කටා හි පිහිටුවීම සඳහා අවශ්‍ය අනුමැතිය මෙම අංශය ලබාගෙන ඇති අතර එම කාර්යාලය 2022 ජනවාරි මාසයේ දී විවෘත කිරීමට නියමිත ය.

2021 පෙබරවාරි මාසයේ 23-24 දිනවල දී සිදු වූ පාකිස්ථාන අග්‍රාමාත්‍යවරයාගේ සංචාරය දෙරට අතර පවත්නා අඛණ්ඩ සුහද ද්විපාර්ශ්වික සබඳතා සනිටුහන් කළ අතර, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාවට පාකිස්ථානයේ සහාය ලබා දීම පිළිබඳ නව කැපවීමක් තහවුරු කළේ ය. මෙම අංශය සහ පාකිස්ථානයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම සංචාරය සම්බන්ධීකරණය කරන ලදී.

ගරු බංග්ලාදේශ අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනයෙන් 2021 මාර්තු 19-20 යන දිනවල සිදු වූ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාගේ බංග්ලාදේශ සංචාරය, ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ මුදල් හුවමාරු කිරීමේ දීමනාව යනාදිය මඟින් ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කෙරිණි. මෙම අංශය සහ බංගලාදේශයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම සංචාරය සම්බන්ධීකරණය කරන ලදී.

ඉන්දියාවේ නව ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මැතිතුමා 2021 සැප්තැම්බර් 22 වැනි දින ඉන්දීය ජනාධිපතිවරයා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වී ය.

එම්.වී. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ව්‍යසනයට අදාළව ඉන්දියාවේ සහාය ලබා ගැනීම සඳහා නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරිණි.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගුවන් ගමන් බුබුළ නිර්මාණය කිරීම සඳහා නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

අන්දමන් දූපත්වල අධිකරණ භාරයේ සිටි ශ්‍රී ලාංකික ධීවරයින් 12 දෙනෙකු නිදහස් කර නැවත ශ්‍රී ලංකාවට එවීම සඳහා පහසුකම් සැලසීම සඳහා නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඉන්දීය රජය සමඟ සාකච්ඡා පැවැත්වී ය.

2021 ඔක්තෝබර් 20 වැනි දින කුෂිනගර් ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත මංගල ගුවන් ගමනට පහසුකම් සැලසීම සඳහා මෙම අංශය සහ නවදිල්ලියේ මහ කොමසාරිස් කාර්යාලය, ඉන්දීය රජය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය.

ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් ස්වේච්ඡාවෙන් ආපසු සියරට පැමිණවීම සඳහා චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය UNHCR සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කළේ ය.

නොවැම්බර් 17 වන දින ඩකා හි පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ (IORA) රැස්වීමට සමගාමීව විදේශ අමාත්‍යවරයා බංග්ලාදේශ අග්‍රාමාත්‍යවරිය, විදේශ අමාත්‍යවරයා සහ නාවික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා හමුවී ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වී ය. මෙම අංශය සියලුම ද්විපාර්ශ්වික හමු සඳහා පහසුකම් සලසා ඇති අතර, බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව අතර පවතින වෙරළබඩ නාවික කටයුතු පිළිබඳ ගිවිසුම, ලංකා නැව් සංස්ථාව (CSC) සහ බංග්ලාදේශ නැව් සංස්ථාව විසින් මෙහෙයවනු ලබන කොළඹ සහ චැටෝග්‍රම් අතර පෝෂක සේවාවේ අතරමං වූ නැව්වල මෙහෙයුම් ක්‍රියාවලි (SOP) සහ වරණීය වෙළඳ ගිවිසුම (PTA) යනාදී ගිවිසුම් අවසන් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ මේ වන විට පසු විපරම් කරමින් සිටියි.

2021 වසරේ දෙසැම්බර් මාසයේ දී ප්‍රති-ත්‍රස්තවාදය ආදී අංශ පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට මෙරටට පැමිණි බංග්ලාදේශ හමුදා නිලධාරීන්ගේ සංචාරය සඳහා මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී.

2021 දෙසැම්බර් 01-02 යන දෙදින ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉන්දියාව වෙත සිදු කළ සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මුදල් අමාත්‍යවරයා සහ ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් සංවිධානය කළ අතර, මෙම සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස; ඉන්දියාවෙන් මූල්‍ය ආධාර රැසක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.

ඉන්දියාවේ කුෂිනගර් ජාත්‍යන්තර ගුවන්තොටුපළ විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීම සඳහා ගරු ක්‍රීඩා අමාත්‍යවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකාවෙන් පැමිණි බෞද්ධ භික්ෂූන් වහන්සේලා 100 දෙනෙකු සහ ඉහළ පෙළේ සම්භාවනීය අමුත්තන්ගෙන් සමන්විත මංගල ගුවන් ගමන සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

පාකිස්ථානයේ දී ශ්‍රී ලාංකිකයෙකු ඝාතනය වූ වහාම අතිගරු ජනාධිපතිවරයා, පාකිස්ථාන අග්‍රාමාත්‍යවරයා සහ දෙරටේ හි විදේශ අමාත්‍යවරුන් දෙදෙනා අතර දුරකතන සාකච්ඡා පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු මෙම අංශය විසින් සංවිධානය කරන ලදී.

ඉස්ලාමාබාද්හි COMSATS විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ KDU විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා මෙම දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

නොවැම්බර් 02 වන දින ග්ලාස්ගෝ හි පැවති කෝප්-26 සමුළුවට සමගාමීව, අතිගරු ජනාධිපතිතුමා සහ නේපාලයේ ගරු අග්‍රාමාත්‍යවරයා සමඟ හමුවක් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී.

**සාකච්ඡා කොට කටයුතු අවසන් කරන ලද ගිවිසුම්**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ඉන්දියානු මූල්‍ය ප්‍රදානය ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුම, (2) යාපනයේ සංස්කෘතික මධ්‍යස්ථානය(JCC) ගොඩනැගීම සඳහා වූ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම (3) සුෂ්මා ස්වරාජ් විදේශ සේවා ආයතනය සහ ශ්‍රී ලංකාවේ BIDTI ආයතනය අතර අවබෝධතා ගිවිසුම, (4) ආරක්ෂක සහයෝගිතා සහ අධ්‍යාපන අංශයේ අවබෝධතා ගිවිසුම් කිහිපයක් යනාදී වශයෙන් දිගු කාලයක් මුළුල්ලේ අවසන් කිරීමට නියමිතව තිබූ ගිවිසුම් කිහිපයක ලේඛන මෙම කාල පරිච්ඡේදය තුළ මෙම අමාත්‍යාංශය විසින් අවසන් කරන ලදී.

2022 ජනවාරි 27 දිනට නියමිත අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා මොරැන්ග් කර්මාන්ත මණ්ඩලය (CIM) සහ ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය (CNCI) අතර අන්තර්ක්‍රියා පැවැත්වීම සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සපයන ලදී.

## ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු

### ඉන්දියාව

ඉන්දියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සාර්ථක ව්‍යාපාරික ජාලකරණ සැසි, අන්තර් ව්‍යාපාර රැස්වීම් සහ උපදේශන, ආයෝජන ප්‍රවර්ධනය සහ සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ වෙබිනාර් සාකච්ඡා, අවස්ථානුරූපී ව්‍යාපාරික විමසීම්, ඉන්දීය වෙළඳපොළට නව නිෂ්පාදන හඳුන්වාදීම, ඒකාබද්ධ ව්‍යාපාර සහයෝගීතා සහ ආයෝජන යෝජනාවලි ප්‍රවර්ධනය, ශක්‍යතා සහිත ආයෝජකයින් හඳුනා ගැනීම, වෙළඳාම සහ ආයෝජන සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටලු විසඳීම ආදී කටයුතු සිදු කරන ලදී.

ඉන්දීය ධීවරයින් සම්බන්ධයෙන් උග්‍ර වෙමින් පවතින ධීවර ගැටලුව සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ සහභාගීත්වයෙන් සියලුම පාර්ශවකරුවන් සඳහා හමුවක් කැඳවන ලදී.

### පාකිස්ථානය

පාකිස්ථාන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 12 වැනි සැසිවාරය පෙබරවාරි 3 වැනි දින අතථ්‍ය අයුරින් පැවැත්විණි.

2021 පෙබරවාරි 18 වැනි දින පැවති වාණිජ ලේකම් මට්ටමේ සංවාදවල හත්වැනි සැසිය සඳහා ඉස්ලාමාබාද් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

ආරක්ෂක සහයෝගීතාව සඳහා පාකිස්ථානය ඩොලර් මිලියන 50ක ආරක්ෂක ණය පහසුකමක් ලබා දුන්නේ ය. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා පාකිස්ථාන රුපියල් මිලියන 52ක් ලබා දෙන ලදී. 2021 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී පාකිස්ථාන අග්‍රාමාත්‍යවරයාගේ මෙරට සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස පාකිස්ථානය වෛද්‍ය ක්ෂේත්‍රයේ ශිෂ්‍යත්ව 100ක් ශ්‍රී ලංකාව වෙත පිරිනැමී ය.

කොළඹ පැවති ජාත්‍යන්තර ජයග්‍රහණ සම්මාන (IAA) ප්‍රදානෝත්සවය සඳහා රාවල්පිණ්ඩි වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ (RCCI) 120 දෙනෙකුගෙන් යුත් දූත පිරිසකට මෙම දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ ගරු අග්‍රාමාත්‍යවරයා ය.

### බංග්ලාදේශය

2021 මාර්තු 19-20 යන දිනවල සිදු වූ අග්‍රාමාත්‍යවරයාගේ බංගලාදේශ සංචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් බංගලාදේශය විසින් 2021 මැයි මාසයේ දී ශ්‍රී ලංකාව සමඟ ඩොලර් මිලියන 200ක මුදල් හුවමාරු ගිවිසුමක් අනුමත කරන ලදී. ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර ඇති වරණීය වෙළඳ ගිවිසුම පිළිබඳ පළමු හමුව 2021 ජූනි 30 වැනි දින ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුවේ දී පැවැත්විණි.

මෙම දූත මණ්ඩලය ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සමඟ සහයෝගීතාවයෙන්, සංචාරක ව්‍යාපාරයට අදාළ බංග්ලාදේශ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා 2021 නොවැම්බර් 7 වැනි දින වෙබිනාර් සාකච්ඡාවක් සංවිධානය කළේ ය.

### නේපාලය

මෙම අංශය කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් 2021 අගෝස්තු 31 වැනි දින සිට ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා කත්මණ්ඩු සිට කොළඹ දක්වා සෘජු ගුවන් ගමන් හතරක් ආරම්භ කිරීම සම්බන්ධ කටයුතු සම්පාදනය කළේ ය.

කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මැණික් සහ ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ 2021 මාර්තු 12 වැනි දින පැවති වෙබිනාර් සාකච්ඡාව සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී.

කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව 2021 මැයි 04 වැනි දින සංවිධානය කරන ලද ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ වෙබිනාර් සාකච්ඡාව මඟින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හවුල්කරුවන් සහ සමාගම් එකම වේදිකාවකට ගෙන එන ලදී.

ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ ඉදිකිරීම් සමාගම් විස්සක් අතර අන්තර් ක්‍රියාකාරී අන්තර් ව්‍යාපාර සැසියක් අතථ්‍ය අයුරින් සංවිධානය කරන ලදී.

**මාලදිවයින**

2021 දෙසැම්බර් 20 වැනි දින ලංකා වාණිජ මණ්ඩලය සහ මාලදිවයිනේ ජාතික වාණිජ හා කර්මාන්ත මණ්ඩලය අතර නව අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට පහසුකම් සලසන ලදී.

මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, මාලදිවයින තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ නැව්ගත කිරීමේ සහ සැපයුම් ආශ්‍රිත නියෝජිතායතනවල ව්‍යාපාරයන්හි විදේශ කොටස්වල වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාලදිවයිනේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා සමඟ රැස්වීමක් පැවැත්වී ය.

**ආරක්ෂක සහයෝගීතාව**

ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් මෙම අංශය, 2021 අගෝස්තු 4 වැනි දින ශ්‍රී ලංකාවේ ආරක්ෂක කාර්ය මණ්ඩලයේ ප්‍රධානියාගේ සභාපතීත්වයෙන් ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර අතථ්‍ය අයුරින් පැවති නියෝජ්‍ය මට්ටමේ ජාතික ආරක්ෂක උපදේශක හමුව සඳහා සහභාගී විය.

නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, බැංගලෝරයේ පැවති "Aero India 2021" ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා දූත පිරිසට පහසුකම් සැපයූ අතර, ආරක්ෂක සේවා සහ මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන චාරිකාවේ ජාත්‍යන්තර සහයෝගීතා සංචාරය සඳහා ද පහසුකම් සැපයුවේ ය.

ඉන්දියානු සහ ශ්‍රී ලංකා නෞකා මගින් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට නිසි වෛද්‍ය ප්‍රමිතියෙන් යුත් ඔක්සිජන් ප්‍රවාහනය කිරීමට ද නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පහසුකම් සලසා ඇත.

ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද පුහුණු පාඨමාලා සඳහා බංගලාදේශය, නේපාලය, පාකිස්ථානය සහ ඉන්දියාව යන රටවල හමුදා නිලධාරීන් සඳහා මෙම අංශය විසින් පහසුකම් සලසන ලදී.

මෙම අංශය බංගලාදේශයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වැනි සංවත්සරයට සහභාගී වීම සඳහා බංගලාදේශ ගුවන් හමුදා ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් මාසිඋසාමන් සර්නියාභාත් මහතාට 2021 මාර්තු 03 වැනි දින හය දින නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණීමට පහසුකම් සැපයුවේ ය.

2021 සැප්තැම්බර් 06 වැනි දින පැවති 14 වැනි ඉන්දු-පැසිෆික් බුද්ධි ප්‍රධානීන්ගේ සමුළුවේ සමාරම්භක අවස්ථාවට මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය.

2020 මාර්තු 18-25 යන දිනවල සිදු වූ ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීවරයාගේ සහ ශ්‍රී ලංකා යුධ හමුදාපතිවරයාගේ සංචාරය සඳහා ඉස්ලාමාබාද් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

2021 නොවැම්බර් 20 සිට 24 යන දිනවල පැවති ත්‍රෛපාර්ශ්වික අභ්‍යාසය වන "Dosti XV" සඳහා සහභාගී වීමට පැමිණි ශ්‍රී ලංකාවේ වෙරළාරක්ෂක නෞකාවක් වන "සුරක්ෂා" නෞකාවේ කටයුතු සම්බන්ධීකරණය කළේ ය.

**බහුපාර්ශ්වික සහයෝගිතාව**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරයේ දී ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාවට එරෙහිව සහ ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් සහාය ලබා දෙන ලෙස ඉල්ලා නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ගත් ක්‍රියාමාර්ග.

ජිනීවා හි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරයේ දී පාකිස්ථානය ශ්‍රී ලංකාවට සහය පළ කර තිබේ.

තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කොළඹ ප්‍රකාශයේ හවුල්කරුවෙකු වන පාකිස්ථානය ශ්‍රී ලංකාවේ මූලපිරීම් සඳහා සිය සහයෝගය ලබා දෙයි

කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාවට සහාය ලබා දෙන ලෙස නේපාලයෙන් ඉල්ලා සිටියේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස නේපාලය 2021 පෙබරවාරි මස 46 වැනි සැසිවාරයේ දී ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතියට සහාය දක්වන බව දන්වමින් ප්‍රකාශයක් සිදු කළේ ය.

ජාත්‍යන්තර නීති කොමිසමේ 2023-2027 කාලසීමාව සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මාලදිවයින් රජයෙන් සහාය ඉල්ලා සිටියේ ය.

**මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

විවිධ ගැටළු සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ නිල කටයුතු පිළිබඳ තොරතුරු කඩිනමින් බෙදා හැරීමට මෙන්ම රට පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ස්ථාපිත කිරීම සඳහා සියලුම දකුණු ආසියානු දූත මණ්ඩල සමාජ මාධ්‍ය (ෆේස්බුක් සහ ට්විටර්) ක්‍රියාකාරී ලෙස භාවිත කර ඇත.

**සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

කොවිඩ්-19 එන්නත්, වෛද්‍ය ප්‍රමිතියේ ඔක්සිජන් ටොන් 400කට වැඩි ප්‍රමාණයක්, **Remdesivir** එන්නත් මාත්‍රා 30,500ක්, හදිසි වෛද්‍ය සැපයුම්, සීමා සහිත ඖෂධ යනාදිය ඉන්දියාවෙන් ලබා ගැනීමටත්, සංචරණ සීමා මධ්‍යයේ වුවද හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඉන්දියාවට යාමට අවශ්‍ය පහසුකම් සැලසීමත් නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිදු කෙරිණි. ඉන්දියාව තුළ පැවති ජාත්‍යන්තර මගීන්ගේ පැමිණීමේ සීමාවන් තුළ පවා, හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවකට ඉන්දියාවේ ප්‍රතිකාර ගැනීම සඳහා සංචාරය කිරීමට පහසුකම් අමාත්‍යාංශය සහ දූත මණ්ඩලවල විසින් සපයන ලදී. 2021 මාර්තු මාසයේ දී ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වන නිතිපතා ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමෙන් පසු ඉන්දියාවේ සිට ශ්‍රී ලාංකික සරණාගතයින් ස්වේච්ඡාවෙන් ආපසු ගෙන්වා ගැනීමට පහසුකම් සලසා ඇත.

ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සංචරණ සීමා මධ්‍යයේ ශ්‍රී ලාංකිකයින් 129 දෙනෙකු ඉන්දියාවේ සිට මෙරටට ගෙන්වා ගන්නා ලදී.

මාලදිවයින් මුහුදු සීමාවේ නීතිවිරෝධී ලෙස මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ධීවර යාත්‍රා 08ක් සහ ධීවරයින් 41 දෙනෙකු මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් යළි එරටට යවා ඇත.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය සිසුන්ට එන්නත් ලබා දීමේ කටයුතු දිරිමත් කිරීම සඳහා කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අදාළ බලධාරීන් සමඟ මැදිහත් වී කටයුතු කළේ ය.

ඇෆ්ගනිස්ථානයේ නීත්‍යානුකූල රජය බිඳවැටීමෙන් පසු ඇෆ්ගනිස්ථානයේ සිටින ශ්‍රී ලාංකිකයන් ඉවත් කිරීමේ කටයුතු මෙම අංශය විසින් සම්පාදනය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලාංකිකයින් 69 දෙනෙකු ඇෆ්ගනිස්ථානයේ සිට නිරුපද්‍රිතව මෙරටට පැමිණිය හ.

### සාර්ක්

සාර්ක් කොවිඩ්-19 හදිසි අරමුදලට ශ්‍රී ලංකාව ඇ. ඩො. මි. 5ක මුදලක් පොරොන්දු විය. සාමාජික රටවල හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා සාර්ක් කොවිඩ්-19 හදිසි අරමුදල මේ වන විට ක්‍රියාත්මක වේ.

කොවිඩ් රෝගීන් සඳහා හුදකලා වාට්ටුවක් පිහිටුවීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදල (**SDF**) විසින් මහනුවර ජාතික රෝහලට ඩොලර් මිලියනයක් ලබා දෙන ලදී.

සාර්ක් ලේකම් කාර්යාලයේ සුවිශේෂී කේන්ද්‍රස්ථානයක් වන සාර්ක් අංශය විසින් පහත හමුවීම්/ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කෙරිණි.

- සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ 15 වැනි රැස්වීම
- වාස්තු විද්‍යාවේ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ වැඩමුළුව
- දේශගුණික විපර්යාස සහ ආපදාවල බලපෑමෙන් සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ පර්යේෂණ සඳහා අරමුදල් පිරිනැමීම
- **SARSO** හි පාලක මණ්ඩලයේ 10 වැනි රැස්වීම
- ජෛව තාක්ෂණය සඳහා ජාතික කේන්ද්‍රස්ථානයක් හඳුනා ගැනීම
- සාර්ක් ක්ෂය රෝග සහ **HIV/AIDS** මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ 31 වැනි රැස්වීම

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (**NARA**) අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා **SAARC** කෘෂිකාර්මික මධ්‍යස්ථානය මගින් ශ්‍රී ලාංකීය වෘත්තිකයන්ට පිරිනැමෙන "සාර්ක් දර්ශන විශාරද උපාධි ශිෂ්‍යත්වය-2021" සඳහා සාර්ක් අංශය පහසුකම් සලසා ඇත. සාර්ක් කලාපීය/විශේෂිත ආයතන විසින් සංවිධානය කරන ලද රැස්වීම් / වෙබිනාර් සාකච්ඡා සඳහා රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. සාර්ක් ලේකම් කාර්යාලයට ශ්‍රී ලංකාවෙන් සම්බන්ධීකරණ නිලධාරියකු තෝරා ගැනීම සඳහා විභාගයක්/සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වන ලදී.

## අග්නිදිග ආසියා අංශය

### ද්විපාර්ශ්වික සබඳතා

අක්ත ගන්වන ලද රටවල් සමඟ වැඩිදියුණු කළ දේශපාලන උපදේශන පැවැත්වීම තුළින් ද්විපාර්ශ්වික සහයෝගීතාව පුනර්ජීවනය කිරීම:

- මැලේසියාව සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල පළමු වටය, වියට්නාමය සමඟ දේශපාලන උපදේශනවල 4 වැනි වටය, තායිලන්තය සමඟ දේශපාලන උපදේශනවල 5 වැනි වටය, සහ ලාඕ ප්‍රජාතාන්ත්‍රික ජනරජය සමඟ පළමු වටයේ දේශපාලන උපදේශන පැවැත්වීම සඳහා සූදානම් වීම.

පිලිපීනය සමඟ කෘෂිකර්මය, ආරක්ෂාව, සංචාරක ව්‍යාපාරය, ගුවන් සේවා, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතයට එරෙහිව සටන් කිරීම/ ඉන්දුනීසියාව සමඟ මැතිවරණ සහයෝගීතාව, නිර්මාණාත්මක ආර්ථිකය සහ ක්‍රීඩාව/ තායිලන්තය සමඟ අධ්‍යාපනය, රේගු කටයුතු සම්බන්ධයෙන් අන්‍යොන්‍ය සහාය, කෘෂිකාර්මික සහයෝගීතාව, ආරක්ෂාව පිළිබඳ අන්‍යොන්‍ය සහාය සහ වර්ගීකෘත තොරතුරු හුවමාරු කර ගැනීම/ තායිලන්තය සමඟ SEP සහ සංස්කෘතිය/ කාම්බෝජය සහ ලාඕ ප්‍රජාතාන්ත්‍රික ජනරජය සමඟ සංස්කෘතික සහයෝගීතාව, අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, වෙළඳාම, ක්‍රීඩා සහ වාණිජ කටයුතු ආදිය පිළිබඳ ද්විපාර්ශ්වික නෛතික ලේඛන මූලාරම්භ කිරීම, කටයුතු අවසන් කිරීම සහ අලුත් කිරීම සඳහා පියවර ගන්නා ලදී.

2021 මාර්තු මස පිලිපීනයේ අතිගරු ජනාධිපතිවරයා සහ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා අතර පැවති දුරකථන සංවාදය/ ශ්‍රී ලංකාවේ සහ පිලිපීනයේ විදේශ අමාත්‍යවරුන් දෙදෙනා අතර 2021 ජනවාරි මස පැවති දුරකථන සංවාදය යනාදී ඉහළ පෙළේ අන්තර්ක්‍රියා හරහා ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම.

සිංගප්පූරුව සමඟ පවත්නා රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල 50 වැනි සංවත්සරය සැමරීම සඳහා 2021 ජූලි මාසයේ දී මුද්දරයක් නිකුත් කිරීම.

සිංගප්පූරුවේ පිහිටි සංගමයක් විසින් පරිත්‍යාග කරන ලද ඇ.ඩො. 180,000ක වටිනාකමින් යුත් වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍ර 8ක් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ලබා දීම සඳහා පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාව සහ මියන්මාරය අතර පැවති ද්විපාර්ශ්වික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 3 වැනි සැසිවාරය අතරතුර, ශ්‍රී ලංකාව යොමු කළ ඉල්ලීමකට අනුව, මියන්මාර රජය විසින් ශ්‍රී.ලං.රු. 10,000,000 ක දළ වටිනාකමකින් යුත් කිරිගරුඬ චෛත්‍යයක් පරිත්‍යාග කිරීම.

ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර සිදු කෙරෙන ගමන් සඳහා, එන්නත්කරණයට ලක් කළ සංචාරකයන් සඳහා මාවතක් ස්ථාපිත කිරීම.

එම්වී එක්ස්ප්‍රස් පර්ල් නෞකාව පිළිබඳ සිදුවීම සහ ශ්‍රී ලංකාව සඳහා වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍ර පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් සිංගප්පූරුවේ සමුද්‍රීය හා වරාය අධිකාරියේ සහ විදේශ අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ පසු විපරම් කිරීම.

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර කෘෂිකාර්මික සහයෝගීතාව, රේගු කටයුතු පිළිබඳ කරුණු හා සබැඳි සහයෝගීතාව, අන්‍යෝන්‍ය ආරක්ෂාව සහ වර්ගීකෘත තොරතුරු හුවමාරු කර ගැනීම යනාදී අවබෝධතා ගිවිසුම් සහ අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම පිළිබඳ කටයුතු අවසන් කොට අත්සන් කිරීම සඳහා සූදානම් කොට ඇත.

**ක්‍රියාත්මක වෙමින් පවතින කටයුතු**

දෙරට අතර පැවැත්වීමට නියමිත ඒකාබද්ධ කොමිසමේ මීළඟ සැසිවාරය 2022 වර්ෂයේ මැද භාගයේ දී පැවැත්වීම සහ එය අවසන් කිරීම කඩිනම් කිරීම සඳහා ද්විපාර්ශ්වික උපකරණ ඇගයීම පිළිබඳ පසු විපරම් රැස්වීම් පැවැත්වීම සඳහා මැලේසියාවේ විදේශ අමාත්‍යාංශය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම.

2022 වර්ෂයේ පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර පැවැත්වීමට නියමිත 3 වැනි වටයේ දේශපාලන උපදේශන පැවැත්වීම, වාර්ෂික ලක්ෂ්මන් කදිරගාමර් අනුස්මරණ දේශනය සහ ආරක්ෂක සහයෝගීතාව හා ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ සංවාදය ආරම්භ කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් පිලිපීනයේ විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ ලේකම්වරයාගේ නායකත්වයෙන් යුත් දූත පිරිස හා ශ්‍රී ලංකා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා අතර සිදු කළ හැකි ඉහළ පෙළේ සංචාර පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන පැවැත්වීම සහ පසු විපරම් කිරීම මෙන්ම, 2022 වර්ෂයේ මුල් භාගයේ දී ශ්‍රී ලංකා වියට්නාම් ඒකාබද්ධ කොමිසමේ 4 වැනි සැසිවාරය පිළිබඳ දින වකවානු නියම කිරීම.

**බහුපාර්ශ්වික සබඳතා**

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN), ARF, කොළඹ සැලැස්ම රාජ්‍ය විද්‍යාලය(CPSC), ආසියා සහ පැසිෆික් කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP) සහ කලාපීය කාබන් චක්‍ර ඇගයීම් සහ ක්‍රියාවලි ආයතනය (ReCCAP) සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වීම සහ රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා හවුල්කාරිත්වයන් ගොඩනැගීම.

ශ්‍රී ලංකාව, 2021 ජූනි මාසයේ පැවති ආසියාන් කලාපීය සංසදයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හමුවට (ARF SOM) සහ 28 වැනි ආසියාන් කලාපීය සංසදයට (විදේශ අමාත්‍ය මට්ටමින්) 2021 අගෝස්තු මාසයේ දී අතථ්‍ය අයුරින් සහභාගි විය. ගෝලීය නිරායුධකරණ න්‍යාය පත්‍රය පිළිබඳ ආසියාන් කලාපීය සංසදයේ අන්තර්-වාරික සැසි සඳහා 2024 වර්ෂය තෙක් ශ්‍රී ලංකාව, තායිලන්තය සහ එක්සත් ජනපදය සම සභාපතිත්වය දරන බව තීරණය කෙරිණි. සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික බලශක්තිය භාවිත කිරීමේ අංශය ශ්‍රී ලංකාව විසින් මෙහෙයවනු ඇත.

ආසියාන් කලාපීය සංසදය (ARF): අනාගත සමෘද්ධිය සඳහා තරුණ කටයුතු වෙනුවෙන් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ කැපවීම ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකාව මෙම වසරේ දී බෲනායි දරුස්සලාම්, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය, නවසීලන්තය සහ කැනඩාව සමඟ එක්ව යෞවන කටයුතු, සාමය සහ ආරක්ෂක න්‍යාය පත්‍රය ප්‍රවර්ධනය කිරීමේ ඒකාබද්ධ ප්‍රකාශයක් සඳහා සම අනුග්‍රහය දැක්විය. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ආපදාවට ලක්වන අග්නිදිග ආසියානු කලාපය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ඉදිරි අන්තර් වාරික සැසියේ දී ආසියාන් කලාපීය සංසදයට සත්කාරකත්වය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කෙරෙමින් පවතී.

2021අප්‍රේල් මස 27 වැනි දින පැවති 77 වැනි UNESCAP සමාරම්භක සැසිය සඳහා ගරු අග්‍රාමාත්‍යවරයා යොමු කළ පණිවිඩය සහ ශ්‍රී ලංකා පාර්ශ්වය වෙනුවෙන් විදේශ ලේකම්වරයා අතථ්‍ය අයුරින් සිදු කළ ප්‍රකාශය.

2019 මාර්තු මාසයේ දී, ශ්‍රී ලංකාව විසින් ආසියාන් වෙත ආංශික සංවාද හවුල්කාරිත්වය සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් විසින් මැදිහත්කරුවන් දැනුවත් කෙරුණු අතර, ආංශික සංවාද හවුල්කරුවෙකු වීම සඳහා වූ ශ්‍රී ලංකාවේ ඉල්ලුම්පත්‍රය සඳහා සහාය ඉල්ලා සිටින ලදී.

ප්‍රවාහනය පිළිබඳ 4 වැනි අමාත්‍ය සමුළුවේ උප සභාපති ලෙස බැංකොක් හි ශ්‍රී ලංකා තානාපතිවරයා තේරී පත් වූ අතර එතුමා එහි අමාත්‍ය අංශයේ සභාපතිත්වය දැරී ය.

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන කවුන්සිලයේ සහයෝගීතාවයෙන්, 2021 නොවැම්බර් මාසයේ දී තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වැනි දකුණු ආසියානු සංසදය ශ්‍රී ලංකාව විසින් කොළඹ දී පවත්වන ලදී.

**ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

අක්ත ගන්වන ලද රටවල අනාගත ගැනුම්කරුවන්/ ආයෝජකයින් සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පාර්ශ්ව අතර අන්තර් ව්‍යාපාර අන්තර්ක්‍රියා පැවැත්වීම සඳහා ඊට අදාළ ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා පහසුකම් සැලසීම, කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ රට තුළ හඳුනාගත් අනෙකුත් ස්ථාන වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අක්ත ගන්වන ලද රටවල රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීම සහ පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව ප්‍රදර්ශන/ අථත්‍ය සම්මන්ත්‍රණ සහ වෙනත් වේදිකා හරහා ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම:

**ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකාවේ කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යවරයා, සංචාරක අමාත්‍යවරයා සහ ඉන්දුනීසියාවේ මිත්‍ර පාර්ශ්ව අතර නිර්මාණාත්මක ආර්ථිකය, විද්‍යුත් වාහන සම්බන්ධ ආයෝජන අවස්ථා, හම්බන්තොට කලාපය තුළ ඖෂධ නිෂ්පාදනය සහ රෙදිපිළි කර්මාන්තයේ සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ඉන්දුනීසියාවේ ජාතික වාණිජ මණ්ඩලය සමඟ එක්ව 2021 දෙසැම්බර් මාසයේ දී සංචාරක ව්‍යාපාරය පිළිබඳ වෙබිනාර් සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. මේ සඳහා සංචාරක නියෝජිතයන් 19 දෙනෙකු සහභාගී වූහ. විද්‍යුත් වාහන අංශයේ ආයෝජන ගවේෂණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ ඉන්දුනීසියානු විදුලි වාහන කර්මාන්ත සංගමයේ සහයෝගීත්වයෙන් හමුවක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ මැණික් ප්‍රමුඛ ඉන්දුනීසියානු ස්වර්ණාභරණ සමාගම් තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා, තානාපති කාර්යාලය විසින් ආයෝජන සංවර්ධන මණ්ඩලය සමඟ රැස්වීමක් සංවිධානය කරන ලදී.

**මැලේසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** පාම් ඔයිල් කර්මාන්තයේ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය සහ අදාළ මැලේසියානු රාජ්‍ය ආයතන අතර පැවති සාකච්ඡා සඳහා පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර ආයතනය වෙත යෝජනා දෙකක් ඉදිරිපත් කිරීම, 'ආගමික සංචාරක ව්‍යාපාරය' ප්‍රවර්ධනය කිරීම සඳහා බෞද්ධ විහාරස්ථාන/ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකාව වෙත ආයෝජන ගෙන්වා ගැනීමේ හැකියාව සෙවීම සඳහා මැලේසියානු සමාගම් ගණනාවක් සමඟ මාර්ගගත අයුරින් සාකච්ඡා මාලාවක් පැවැත්වීම.

**පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** කෘෂිකාර්මික කර්මාන්තයේ කීර්තිමත් පිලිපීන සමූහ ව්‍යාපාරයක් (Aboitiz Group) සඳහා විශේෂ කොට සත්ත්ව ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ පවතින ආයෝජන අවස්ථා හඳුන්වා දීම/ පොල් සැකසුම් අංශයේ හවුල් ව්‍යාපාර අවස්ථා ගවේෂණය කිරීම සඳහා පිලිපීනයේ කීර්තිමත් පොල් අපනයන සමාගමක් වෙත සිලොන් බිස්කට්ස් සමාගම හඳුන්වා දීම.

ශ්‍රී ලංකාවේ බතික් නිර්මාණ පිලිපීනය වෙත අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බුද්ධි බැටික්ස් ආයතනය සහ කෆ්ටාන් වන් ආයතනය අතර බතික් විලාසිතා නිර්මාණ පිළිබඳ නිර්මාණාත්මක උසස් සංස්කෘතික සහයෝගීතාවක් ප්‍රවර්ධනය කිරීම. ආහාර නිෂ්පාදනය, ධීවර කර්මාන්තය, සිල්ලර බෙදා හැරීම යන අංශවලට අදාළව, ශක්‍යතා සහිත ඒකාබද්ධ හවුල්කාරීත්වයන් සඳහා පිලිපීනයේ ව්‍යාපාරික සමූහ (CDO, Frabelle, Century Pacific,ආදී ව්‍යාපාර සමූහ) සමඟ රැස්වීම් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික මිත්‍ර පාර්ශ්ව සමඟ සබඳතා පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම. රියල් වානේ සංස්ථාවේ CFO ධවාඕ හි ශ්‍රී ලංකා කොන්සල්වරයා ලෙස පත් කිරීම සහ ඉටුකම - කොවිඩ් 19 අරමුදල සඳහා ඇමරිකානු ඩොලර් 20,000 ක් පරිත්‍යාග කිරීම. NKAR ට්‍රැවල්ස් සඳහා සුවිශේෂී ප්‍රවර්ධන වෙබිනාර් සාකච්ඡාවක් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම හා NAITAS හි සාමාජිකයින් 25 දෙනෙකුගේ චාරිකා සඳහා පහසුකම් සැලසීම.

**සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සිලයේ ප්‍රධාන අනුකම්ටු ක්‍රියාකාරකම් වන අධ්‍යාපනය, ෆින්ටෙක්, බෝට්ටු පැදීම, මැණික් සහ දේපළ වෙළඳාම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම. 2021 වර්ෂයේ පළමු භාගය සඳහා සිංගප්පූරුවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 18.077කි.

2021 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට අතථ්‍ය අයුරින් පැවති ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනය සඳහා සිංගප්පූරුවේ බෝට්ටු සහ නැව් තැනීමේ සමාගම් 08 ක්, උපාංග නිෂ්පාදකයින් සහ වරලත් ක්‍රියාකරුවන් පිරිසක් සහභාගී කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා වෙළඳ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් පහසුකම් සලසන ලදී. 2021 ඔක්තෝබර් මස පැවති "Food and Hotel Asia (FHA) Match: Fine food" ප්‍රදර්ශනය සඳහා ස්වභාවික, කාබනික සහ ශාක පදනම් වූ ආහාර ප්‍රදර්ශනය කරන ප්‍රමුඛ පෙළේ ආහාර නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්ගෙන් සමන්විත ශ්‍රී ලාංකික සමාගම්වල සහභාගීත්වය ද සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සහ සිංගප්පූරුවේ බෙදාහරින්නන් සමඟ සම්බන්ධීකරණයෙන් විවිධ කෘෂි නිෂ්පාදන වර්ග හඳුන්වා දීම. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සිට සිංගප්පූරුව වෙත ප්‍රථම වරට රතු පැපොල් නැව්ගත කෙරිණි.

**වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ආසන්න වශයෙන් වියට්නාමයේ බාහිර සංචාරක නියෝජිතයින් 50 දෙනෙකු සමඟ තනි තනි වශයෙන් මාර්ගගත හමු පැවැත්වීම/ CCC හි සහයෝගයෙන් ක්‍රියාකාරකම් කිහිපයක් හරහා ආයෝජන ප්‍රවර්ධනය සිදු කිරීම/ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය හඳුන්වාදීම.

ස්මාර්ට් සිටි (Smart City) සමුළුව සහ ඩීඑක්ස් ඩේ වියට්නාම් 2021 (DX Day Viet Nam 2021) වැඩසටහන සමඟ සම්බන්ධ වූ අතර, 2022 මාර්තු සහ දෙසැම්බර් යන මාස සඳහා වියට්නාමය තුළ වෙළඳ ප්‍රදර්ශන 2ක් පැවැත්වීමට නිර්දේශ කෙරිණි. ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර සහ මාංශ නිෂ්පාදන වියට්නාමය වෙත අපනයනය කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වියට්නාමයේ සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවැත්වීම. ශ්‍රී ලංකාව වෙත වරලත් ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම

සඳහා වියට්නාමයේ FLC සමූහයේ බැම්බූ ගුවන් සමාගම (Bamboo Airways) සමඟ සාකච්ඡා කරමින් පවතී. වෙළෙඳාම, ආයෝජන, උපදේශන සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සහ වියට්නාම ව්‍යාපාරික ආයතන අතර අන්තර් ව්‍යාපාර රැස්වීම් සහ ව්‍යාපාරික ජාලකරණ සැසි 14ක් සංවිධානය කරන ලදී.

**තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** තායිලන්තයේ ටොයෝටා ඩයිහට්සු ඉන්ජිනියරින් ඇන්ඩ් මැනුෆැක්චරින් පුද්ගලික සමාගම සමඟ සහයෝගයෙන් සහ තායිලන්තයේ SCG පුද්ගලික සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ඇති ග්‍රැෆයිට් භාවිතයෙන් සිදු කෙරෙන බැටරි සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය පසු විපරම් කිරීමට SLINTEC සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කිරීම/රාජ්‍යාන්තර පදනම මත තායිලන්තයෙන් හාල්මැස්සන් ආනයනය කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සහ හාල්මැස්සන් සහ කරවල ආනයනය කිරීම සඳහා තායිලන්තය සමඟ භාණ්ඩ හුවමාරු වෙළඳාමක් සිදු කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම.

3 වැනි ශ්‍රී ලංකා - තායිලන්ත වෙළඳ සාකච්ඡා කමිටුව (SLTTNC) සඳහා දින නියම කිරීමේ කටයුතු අවසන් කිරීම, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළෙඳාම සම්බන්ධ කරුණු පිළිබඳ උප කමිටුවේ 4 වැනි රැස්වීම පැවැත්වීම. තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය විසින් 2 වැනි වරට සංවිධානය කරන ලද නත්තල් පුණ්‍ය සල්පිල සඳහා 'ඩිල්මා තේ' සමඟ ඒකාබද්ධ වී සහභාගී වීම, කාම්බෝජය සහ ලාඕ මහජන ප්‍රජාතාන්ත්‍රික ජනරජය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙළඳ ලකුණ අලුත් කිරීම. තායි සංචාරක නියෝජිත සංගමය (TTAA) විසින් මාර්ගගත අයුරින් සංවිධානය කරන ලද දැනුවත් කිරීම සඳහා සහභාගී වීම, 2021 ඔක්තෝබර් මස අතථ්‍ය අයුරින් පවත්වන ලද බෝට්ටු ප්‍රදර්ශනය සඳහා නිසි ප්‍රචාරණයක් ලබා දීම. තායිලන්තයේ ශ්‍රී ලන්කන් ගුවන් සේවය සමඟ සහයෝගයෙන්, තායිලන්තයේ ප්‍රමුඛ බලපෑම්කරුවෙකුගේ ශ්‍රී ලංකා සංචාරය ආරම්භ කරන ලදී.

**මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** රට තුළ පවතින දේශපාලන අස්ථාවරත්වය තුළ ශ්‍රී ලාංකික ආයෝජකයින්ට සහ ව්‍යාපාරික ප්‍රජාවට සහාය වීම/ ශ්‍රී ලංකාව සහ මියන්මාරය අතර ඍජු ගුවන් සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා බලධාරීන් සහ මියන්මාර ජාතික ගුවන් සේවය, මියන්මාර් එයාර්වේස් ඉන්ටර්නැෂනල් ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම/ සුවිශේෂී ආගමික සංචාරක ගමනාන්තයන් වන කොළඹ - යැංගෝන් - බුද්ධගයාව සහ කොළඹ - යැන්ගොන් - කත්මණ්ඩු යන ගමනාන්ත අතර ගුවන් සම්බන්ධතාවය ඇරඹීම පිළිබඳ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ රට තුළ හඳුනාගත් අනෙකුත් ස්ථාන වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අක්ත ගන්වන ලද රටවල රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීම.

3 වැනි ශ්‍රී ලංකා - තායිලන්ත සාකච්ඡා කමිටුව/ ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළෙඳාම සම්බන්ධ කරුණු පිළිබඳ අනු කමිටුවේ 4 වැනි හමුව සහ ඒකාබද්ධ කෘෂිකර්මාන්ත ක්‍රියාකාරී කණ්ඩායමේ හමුව පැවැත්වීම සඳහා මූලිකත්වය ගන්නා ලදී. (JAWG)

ප්‍රදර්ශන/ අථත්‍ය සම්මන්ත්‍රණ සහ වෙනත් වේදිකා හරහා ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම: ජාත්‍යන්තර තේ දිනයේ දී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම/ ඉන්දුනීසියාව- ජකර්තා හි ආර්ට් ප්ලස් සඟරාව සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව, ඉහළ පෙළේ පාරිභෝගිකයින් ඉලක්ක කර ගනිමින් ලංකා තේ පිළිබඳ සුවිශේෂී ඩිජිටල් විශේෂාංගයක් ආරම්භ කිරීම/ සිංගප්පූරුව- ලංකා කුරුඳු, ලංකා තේ සහ පිටි කළ පොල් ඊ-වාණිජ වෙළඳපොළට හඳුන්වාදීමේ වැඩසටහනක් "ගොවිපොළ සිට වෙළඳපොළ දක්වා" යන නමින් මෙහෙයවීම/ තායිලන්තය- 2021 ජූලි මස පැවති "Thai to the World Tourism Dialogue" වෙබිනාර් හමුවට සහභාගී වීම සඳහා SLAITO, SLTPB, TSLCC යන ආයතනවලට පහසුකම් සැලසීම/ 2021 මාර්තු මාසයේ දී 'ඩිල්මා තේ' සමඟ එක්ව 54 වැනි රාජ්‍යතාන්ත්‍රික රතු කුරුස වෙළඳපොළ වැඩසටහන සඳහා සහභාගී වීම/ වියට්නාමය - 2021 ජාත්‍යන්තර නවෝත්පාදන ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.

**ආරක්ෂක සහයෝගීතාව**

ආරක්ෂක ආයතන අතර සහයෝගීතාව ඇති කිරීම/ අක්ත ගන්වන ලද රටවල් විසින් පිරිනමනු ලබන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා හමුදා නිලධාරීන්ගේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම.

ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම පිළිබඳ 4 වැනි ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම 2021 ජූලි මස 14 වැනි දින පැවැත්විණි.

2021 ජූලි මස 01 වැනි දින කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ ඉන්දුනීසියාවේ ආරක්ෂක විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් සඳහා අත්සන් තැබීම.

ආරක්ෂක සහයෝගීතාව, බුද්ධි හුවමාරු සහයෝගීතාව, ජාත්‍යන්තර අපරාධ ක්ෂේත්‍රයේ සහයෝගීතාව, රැඩිකල්කරණය සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අක්ත ගන්වන ලද රටවල ආරක්ෂක බලධාරීන් සමඟ අවබෝධතා ගිවිසුම් අවසන් කිරීමට පියවර ගනු ලැබේ.

පොලිස් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර සහයෝගීතාව සම්බන්ධයෙන් පවත්නා අවබෝධතා ගිවිසුම 2022-2027 කාල සීමාව සඳහා අලුත් කිරීම.

**මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**

වෙළඳාම, ආයෝජන, සංචාරක ව්‍යාපාරය, විදේශ රැකියා, විවිධ වැඩසටහන් හරහා පුද්ගල සබඳතා පැවැත්වීම වැනි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති ඵලදායි ලෙස ප්‍රවර්ධනය කිරීම/ විදේශවල පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල/ දූත කාර්යාල විසින් සංවිධානය කරන ලද ක්‍රියාකාරකම්, අක්ත ගන්වන ලද රටවල ආයතන, සමාගම්, සංගම් විසින් සංවිධානය කරන ලද මීට සමාන වැඩසටහන්වලට සහභාගී විය.

විදේශ අමාත්‍යවරයා සහ කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යවරයා සිංගප්පූරුවේ ආගමික නායකයන් සහ ශ්‍රී ලාංකික සංගම් අතර අතථ්‍ය අයුරින් පවත්වන ලද අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සැලසීම/ EDB හි සහයෝගය සහිතව, අනාගත වියට්නාම භික්ෂූන්, භික්ෂුණීන් සහ ගිහියන් අතර ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම. වියට්නාමයේ VASS/ IISAS ආයතන විසින් ශ්‍රී ලංකාව පිළිබඳ නිකුත් කළ විශේෂ සඟරා කලාපය තුළ ශ්‍රී ලංකාවේ කීර්තිමත් විද්වතුන් විසින් ලියන ලද පර්යේෂණ පත්‍රිකා හයක් ප්‍රකාශයට පත් කිරීම.

**අධ්‍යාපනය**

සහෝදර සමාජ ගිවිසුමක් හරහා ශ්‍රී ලංකාවේ සිසුන්ට තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ශිෂ්‍යත්ව 500ක් ප්‍රදානය කිරීම සඳහා, ඔවුන්ගේ ශ්‍රී ලාංකික මිත්‍ර පාර්ශ්ව සමඟ සම්බන්ධ වීම පිණිස පිලිපීනයේ මැකාටි මිතුරු කවයේ රොටරි සමාජය සහ කලම්බු රීකනෙක්ෂන්ස් රොටරි සමාජය සම්බන්ධ කිරීම.

**සංක්‍රමණික ශ්‍රමික සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**

කොවිඩ්-19 සහයෝගිතාව: මූල්‍ය ආධාර ලබා ගැනීමේ දී කාලීන මැදිහත්වීම/ සම්බන්ධීකරණය/ අක්ත ගන්වන ලද රටවල් විසින් කොවිඩ්-19 ආශ්‍රිත එන්නත්, වෛද්‍ය උපකරණ යනාදිය ලබා දීම: සිංගප්පූරුවේ ටෙමාසෙක් පදනම මගින් SLAS සංගමය වෙත ලිවිංගාඩ් මුව ආවරණ 300,000ක් පරිත්‍යාග කිරීම/ ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය විසින් මහජන අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාරයක් හරහා රැස් කරන ලද අරමුදල් භාවිතා කිරීමෙන් ලබා ගත් සිංගප්පූරු ඩොලර් 21,717.00ක වටිනාකමින් යුත් වෛද්‍ය සැපයුම් ශ්‍රී ලංකාව වෙත එවීම සඳහා පහසුකම් සැලසීම/ සිංගප්පූරුවේ හිතවතකු විසින් පරිත්‍යාග කරන ලද ඇ.ඩො. 10,000 ක දළ වටිනාකමින් යුත් පී.පී.ඊ. කට්ටල ලබා දීම සඳහා පහසුකම් සැලසීම/ සිංගප්පූරුවේ මහා කරුණා බෞද්ධ සංගමය විසින් පරිත්‍යාග කරන ලද ඔක්සිජන් සාන්ද්‍රක 250ක් ලබා දීම සඳහා පහසුකම් සැලසීම/ තායි විදේශ අමාත්‍යංශය සහ තායිලන්තයේ බෞද්ධ සංවිධාන විසින් ඔක්සිජන් සාන්ද්‍රක 30ක්, ඔක්සිජන්

ටැංකි 108ක්, රෙගියුලේටර 62ක්, කැනියුලා සහ ඔක්සිමීටර් 160ක් පරිත්‍යාග කිරීම/ වියට්නාම රජය විසින් ඇමරිකානු ඩොලර් 30,000ක වටිනාකමින් යුත් වේගවත් ප්‍රතිදේහ පරීක්ෂණ පී.සී.ආර්. කට්ටල තොගයක් පරිත්‍යාග කිරීම.

නියමිත කාලයට වඩා වැඩි කාලයක් මැලේසියාවේ රැඳී සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ට ආරක්ෂිතව ආපසු පැමිණීම සඳහා පොදු සමා කාලයක් ලබා දීම/ ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින් දැනුවත් කිරීම සඳහා සිංගප්පූරුවේ FAST සහ CDE ආයතන සමඟ එක්ව වැඩමුළු පවත්වන ලද අතර ඔවුන්ට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා කෙටි කාලීන පුහුණු පාඨමාලා ද පවත්වන ලදී.

අග්නිදිග ආසියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල හරහා අක්ත ගන්වන ලද රටවල වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සුබසාධනය සඳහා පහසුකම් සැලසීම සහ කොන්සියුලර් සේවා සැපයීම: සියරට පැමිණවීමේ කටයුතු සිදු කිරීම, වීසා දීර්ඝ කිරීම සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන විවිධ දුක්ගැනවිලි විසඳීම, පුද්ගල මරණ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කම්කරුවන් හා සුබසාධන කටයුතු සම්බන්ධ බොහෝ ගැටළු විසඳීම.

මියන්මාරයේ සිටි ශ්‍රී ලංකාවේ ධීවරයින් 12 දෙනෙකු නිදහස් කිරීම සහ ධීවර යාත්‍රා 2 ක් නිදහස් කිරීම. මියන්මාර නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන සිටින තවත් ධීවරයින් 7 දෙනෙකු නිදහස් කිරීමේ කටයුතුවලට සහය වීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

ශ්‍රී ලාංකිකයින් සඳහා නව රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා සමාගම් 10 ක් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

2021 වසර තුළ මැලේසියාවේ දී නියමිත අධිකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික රැඳවියන්/වැරදිකරුවන් 113 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීමට/ පිටුවහල් කිරීම සඳහා පහසුකම් සලසන ලදී.

සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලංකාවේ සංක්‍රමණික සේවකයින් සඳහා සුදුසු සේවා කොන්දේසි නිර්මාණය කිරීම සඳහා, දූත මණ්ඩලය සේවකයින් සහ නියෝජිතයන් සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. සංක්‍රමණික සේවකයින් සඳහා ශ්‍රී ලංකා බෞද්ධ විහාරස්ථාන තුළ සති අන්තයේ දී නිතිපතා ජංගම සේවා පැවැත්වීම, විශේෂයෙන්ම ගෘහාශ්‍රිත/නුපුහුණු සේවකයාගේ සිට අර්ධ පුහුණු හෝ පුහුණු ශ්‍රමිකයන් දක්වා එම සේවකයන්ගේ තත්ත්වය උසස් කිරීම සඳහා, සංක්‍රමණික ශ්‍රමිකයන් දැනුවත් කිරීම හා ශ්‍රමිකයින්ගේ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා කොන්සියුලර් සේවා සහ වැඩමුළු සංවිධානය කිරීම.

2022 වසරේ පළමු කාර්තුවේ දී ලියාපදිංචි හෙද නිලධාරීන් 2000 ක් සැපයීම සඳහා ඇනවුමක් ලබාගැනීම පිණිස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බඳවාගැනීම් පිළිබඳ වගකීම දරන සිංගප්පූරු රජයේ අනුබද්ධිත ආයතනයක් වන Ministry of Health Holding Company Pvt Ltd. ආයතනයේ බලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය: මෙහෙයුම් අංශ

### මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය

මෙම අංශයේ ප්‍රධාන වගකීම වන්නේ විදේශවල පිහිටි ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාල 67ක (වසර අවසානය වන විට 63 ක් දක්වා වෙනස් කරන ලදී) පරිපාලනය සහ සුමට ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීම තහවුරු කිරීමයි. ඒ අනුව, මෙම අංශය විසින් රජයේ ප්‍රතිපත්තිවලට සහ අදාළ පරිපාලන රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය සම්පත් සහ මගපෙන්වීම් සපයනු ලැබේ. දූත මණ්ඩල/ දූත කාර්යාලවල මානව සම්පත් කළමනාකරණ ගැටළුවලට අදාළ සියලු කටයුතු ද මෙම අංශය විසින් මෙහෙයවනු ලැබේ. *(මේ වනවිට ඇෆ්ගනිස්ථානයේ කාබුල් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එරට පවතින දේශපාලන ප්‍රවණතා හේතුවෙන් තාවකාලිකව වසා දමා ඇත. තානාපති*

*කාර්යාල 36ක්, මහකොමසාරිස් කාර්යාල 13ක්, එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩල 02ක්, නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයක්, කොන්සල් ජනරාල් කාර්යාල 13ක් සහ නියෝජිත කාර්යාලයකින් සමන්විත ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල 66 මීට අයත් වේ).*

2021 ජනවාරි 01 වැනි දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දී පහත සඳහන් විශේෂිත කාර්යයන්/ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරිණි.

ශ්‍රී ලංකාවේ වැදගත් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා මෙන්ම ආර්ථික, වෙළඳ, සංවර්ධන සහ අනෙකුත් ජාතික අවශ්‍යතාවලට හානියක් නොවන පරිදි විදේශ විනිමය සංචිත ඉතිරි කර ගැනීම සඳහා,

අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2021 දෙසැම්බර් 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, විදේශයන්හි පිහිටි පහත සඳහන් රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/කාර්යාල තාවකාලිකව වසා දැමීම පිළිබඳ කටයුතු, මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

I. නයිජීරියා ෆෙඩරල් ජනරජයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය
II. ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය
III. සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය

දූත මණ්ඩල/ දූත කාර්යාල ප්‍රධානීන් 35 දෙනෙකු පත් කිරීමට අදාළ කටයුතු සම්පාදනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම. සෝල්, අඩිස් අබාබා, රෝමය, කැන්බරා සහ මාලදිවයින සඳහා දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම සඳහා නාමයෝජනා දහයක් (10) ක්‍රියාත්මක වෙමින් පවතී.

දූත මණ්ඩල ප්‍රධානීන්/ දූත කාර්යාල ප්‍රධානීන් 40 දෙනෙකුගේ නිල චාරිකා අවසන් කිරීමට අදාළ විධි නියමයන් සඳහා පහසුකම් සැලසීම.

වාණිජ දෙපාර්තමේන්තුවේ විසි දෙදෙනෙකු (22), ආරක්ෂක අංශයේ දස දෙනෙකු (10), කම්කරු දෙපාර්තමේන්තුවේ පස් දෙනෙකු (05), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ විසි එක් දෙනෙකු (21), ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ එක් අයෙකු (01) සහ තවත් එක් අයෙකු (01) වශයෙන් රාජ්‍යතාන්ත්‍රික ගණයේ නිලධාරීන් හැත්තෑ හත් (77) දෙනෙකුගේ පත්වීම්වලට අදාළ කටයුතු සම්පාදනය කොට, ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

සිය රාජකාරි චාරිකාව නිම කිරීමෙන් අනතුරුව නැවත පැමිණීමේ ස්ථාන මාරු ලබාගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් දහතුන් දෙනෙකුට (13) පහසුකම් සලසන ලදී. එනම්, වාණිජ දෙපාර්තමේන්තුවේ හතර දෙනෙකු (04), ආරක්ෂක සේවයේ හතර දෙනෙකු (04), කම්කරු දෙපාර්තමේන්තුවේ එක් අයෙකු (01) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තිදෙනෙකු (03) වශයෙනි.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කළමනාකාර නිලධාරී සේවයේ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම පිණිස සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීමේ විවෘත තරඟ විභාගය අවසන් කර නිලධාරීන් 114 දෙනෙකු තෝරා ගන්නා ලදී. *(මේ වන විට නිලධාරීන් 111 දෙනෙකු දූත මණ්ඩලවල රාජකාරි භාරගෙන ඇති අතර, අනෙකුත් නිලධාරීන් 03 දෙනා රාජකාරි භාර ගැනීම සඳහා සිය ගමන් විධිවිධාන අවසන් කිරීමේ කටයුතුවල නිරතව සිටී.)*

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පුද්ගලික සහකාර සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සඳහා වූ තරඟ විභාගය අවසන් කර සුදුසු අපේක්ෂකයන් හතළිස් හතර දෙනෙකු (44) තෝරා ගන්නා ලදී. ඔවුන් අතරින් පුද්ගලික සහකාරවරුන් හතළිස් එක් දෙනෙකු (41) දූත මණ්ඩලවල රාජකාරි භාරගෙන ඇත.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවලට අනුයුක්ත කරන ලද ස්ථානීය වශයෙන් බඳවාගත් කාර්ය මණ්ඩලයේ 100කට ආසන්න සංඛ්‍යාවකගේ හිමිකම්වලට අදාළ පත්වීම්, සේවා කාලය දිගු කිරීම්, සේවා කාලය අවසන් කිරීම් සහ ගෙවීම් සම්බන්ධ කරුණු මෙහෙයවන ලදී.

දූත මණ්ඩල/ දූත කාර්යාල ප්‍රධානීන්ගේ, ස්වකීය රට තුළ/අක්ත ගන්වන ලද රටවල නිරත වූ නිල සංචාර තිස්තුනක් (33) සඳහා පහසුකම් සලසන ලදී.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් පවත්වනු ලබන කොන්සියුලර් ජංගම සේවා නවය (09) සඳහා පහසුකම් සපයන ලදී.

මෙම කාලසීමා තුළ දී තොරතුරු තාක්ෂණ නිලධාරීන් හතර දෙනෙකු (04), යතුරුලියන්නන් (සිංහල හතර දෙනෙකු (04) සන්ධාන සහකාර/නිලධාරී දෙදෙනෙකු (03) ගේ මාරුකිරීම් ක්‍රියාවලි ක්‍රියාත්මක කරන ලදී.

දේශීය වශයෙන් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් සේවක කාණ්ඩයේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශයේ සේවය කරන රියදුරු/කාර්යාල කාර්ය සහයකයන් 10 දෙනෙකු සහ රියදුරන් 14 දෙනෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කරන ලදී.

බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී සහ ඩකා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ ලේකම් (වාණිජ) යන තනතුරු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් (DMS) ලබා ගන්නා ලදී. මිලාන් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සියරට පේරුව පදනම යටතේ කළමනාකරණ සේවා නිලධාරී තනතුරක් නිර්මාණය කිරීම සහ රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට මිලාන් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය වෙත වෙළඳ අංශය මාරු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා වෙතින් අනුමැතිය අපේක්ෂා කෙරේ.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ ලේකම් තනතුරු විස්සක් (20) පිරවීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ ස්ථාන මාරු මණ්ඩලයේ 2021/2022 ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසන ලදී. තවද, 2021 මාරුවීම් මණ්ඩලයේ නිර්දේශ මත පදනම්ව ස්ථාන මාරු කරන ලද විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ  නිලධාරීන් අට (08) දෙනෙකුගේ රාජකාරි භාරගැනීම සඳහා මානව සම්පත් අංශය සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය පහසුකම් සලසා ඇත.

පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, නීතිපති සහ විගණකාධිපති, ජනාධිපති කොමිෂන් සභා මගින් කරන ලද විමසීම් සඳහා කාර්ය මණ්ඩල, වියදම් ක්‍රියා පටිපාටි ආදි විෂයයන් පිළිබඳ වාර්තා සකස් කිරීම මෙම අංශය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) පිළිබඳ විමසීම් සඳහා යෙදවුම් ඉදිරිපත් කිරීම සහ රාජ්‍යතාන්ත්‍රික සහ රාජ්‍යතාන්ත්‍රික නොවන නිලධාරීන්ට එරෙහි පැමිණිලිවලට අදාළ කරුණු ද මෙම අංශය මගින් මෙහෙයවන ලදී.

දූත මණ්ඩල කාර්ය මණ්ඩල සාමාජිකයන් 440 දෙනෙකුට වැඩි පිරිසකගේ වැටුප් පරිවර්තනවලට අදාළ ක්‍රියාවලිය නිම කෙරිණි.

රුමේනියාව සහ ස්පාඤ්ඤය තුළ පිහිටුවීමට යෝජිත ශ්‍රී ලංකා තානාපති කාර්යාල දෙක (02) සඳහා සේවක තනතුරු ස්ථාපිත කිරීමට මෙන්ම මැඩගස්කරයේ කොන්සල් ජනරාල් කාර්යාලයක් (01) ස්ථාපිත කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ඇත. ඉතාලියේ සිසිලි නගරය තුළ පිහිටි කොන්සල් ජනරාල් කාර්යාලයේ තනතුරු නිර්මාණය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ එක්ව ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් 26 දෙනෙකුගේ උසස්වීම් පිළිබඳ කටයුතු සකස් කෙරිණි. තවත් එක් (1) විදේශ සේවා උසස්වීමක් පිළිබඳ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හය දෙනෙකුගේ (06) විශ්‍රාම ගැන්වීම් ක්‍රියාවලි සිදු වෙමින් පැවති අතර, ඉන් 08ක් සම්පූර්ණ කර ඇත.

විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල සියරට පේරුවේ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන අධ්‍යාපන දීමනා විධිමත් කිරීම. 2021 අප්‍රේල් 20 දිනැති නව දූත මණ්ඩල උපදෙස් මාලා අංක 223 නිකුත් කරන ලදී. ඒ අනුව, උපරිම වශයෙන් අවුරුදු 5-20 වයස් සීමාවේ පසුවන දරුවන් දෙදෙනෙකු (02) සඳහා පමණක් අධ්‍යාපන දීමනාවෙන් 75%ක් ගෙවනු ලැබේ.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල තුළ ස්ථානගත කර ඇති සියරට සේරුවේ නිලධාරීන් ආපසු පැමිණීමේ අවශ්‍යතාවය විධිමත් කිරීම සඳහා 2021 ජනවාරි 25 දිනැති නව දූත මණ්ඩල උපදෙස් මාලා අංක 222 නිකුත් කරන ලදී.

රැකියා ස්ථානය වෙනස් කිරීම සඳහා ගමන් දීමනා වියදම් ඉල්ලීමේ හිමිකම්වලට අදාළව 2021 මැයි 05 දිනැති නව නව දූත මණ්ඩල උපදෙස් මාලා අංක 224 නිකුත් කෙරිණි.

## නීති අංශය

**මෙම අංශයේ සුවිශේෂී සිදුවීම් සහ ජයග්‍රහණ**

විදේශ අමාත්‍යාංශයේ නීති අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ, අමාත්‍යංශ ලේකම්වරයා හරහා අමාත්‍යවරයාට, විදේශ අමාත්‍යාංශයේ අනෙකුත් අංශ වෙත, විදේශවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවලට මෙන්ම වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ජාත්‍යන්තර නීතිය හා සම්බන්ධ කරුණු පිළිබඳව නීති උපදෙස් ලබා දීම යි. ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් තැන්පතුව ද නීති අංශය භාරයේ පවතී. තවද, සියලුම ප්‍රතිපත්ති තීරණවල නීතිමය අංශ සහ විශේෂයෙන්, භූමි ප්‍රදේශ පිළිබඳ හිමිකම් සහ සීමාවන්, ත්‍රස්තවාදය හා සම්බන්ධ ගැටලු, ගිවිසුම් සබඳතා පිළිගැනීම, රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද, එක්සත් ජාතීන්ගේ සම්බාධක තන්ත්‍රය සහ ඒකපාර්ශ්වික සම්බාධක යනාදිය වැනි, ජාත්‍යන්තර ගැටලු සම්බන්ධයෙන් උපදෙස් සපයයි. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක: PS/SP/SB/ චක්‍රලේඛය/06/2019 ප්‍රකාරව, 2021 ඔක්තෝබර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාල රාමුව තුළ නීති අංශය විසින් අවබෝධතා ගිවිසුම් 250කට වැඩි ප්‍රමාණයක් සඳහා නීතිමය නිරීක්ෂණ/ නීතිමය නිෂ්කාශන ලබා දී ඇත. ඉහත කරුණු වලට අමතරව, නීති අංශය පහත සඳහන් සැලකිය යුතු ප්‍රධාන කාර්ය සාධනයන් අත්කර ගෙන ඇත.

**සාගර නීතිය-** අන්තර් අමාත්‍යාංශ අවශ්‍යතා සෙවීම සඳහා වන ජාතික කමිටුව පිහිටුවීම සහ ජාතික අධිකරණ බල සීමාවෙන් ඔබ්බෙහි වූ ප්‍රදේශවල සාගර ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය (BBNJ) පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පැවැත්වීමට නියමිත 4 වැනි අන්තර් රාජ්‍ය සමුළුවේ දී (ICG) ප්‍රකාශයට පත් කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ ස්ථාවරය සකස් කිරීම නීති අංශය විසින් ආරම්භ කරන ලදී.

**ශ්‍රී ලංකාවේ මහද්වීපික තටකය පිළිබඳ කරුණු දැක්වීම-** මහද්වීපික තටකය පිළිබඳ ශ්‍රී ලංකාවේ කරුණු දැක්වීම සඳහා මහද්වීපික තටකයේ සීමාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම (UNCLCS) විසින් පත් කරන ලද උප කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා දූත පිරිස අතර දැනටමත් සාකච්ඡා වට 09ක් පවත්වා ඇති අතර උප කොමිෂන් සභාවේ සියලුම අමතර අවශ්‍යතා සපයා ඇත. තවද, දෙසැම්බර් 15-18 යන දිනවල නිව්යෝර්ක් හි දී පැවැත්වීමට නියමිත 54 වැනි සැසියේදී උප-කොමිසම සමඟ රැස්වීමක් පැවැත්වීමට නියමිත අතර එහිදී මහද්වීපික තටකයේ පිටත සීමාවන් අවසන් කිරීමට යටත්ව, ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකය පිහිටුවීමට අවශ්‍ය නිර්ණායක හතර ශ්‍රී ලංකාව සපුරා ඇති බව සඳහන් කෙරෙන ශ්‍රී ලංකාවේ ප්‍රකාශය තාවකාලිකව පිළිගෙන ඇත.

**මුක්තිය සහ වරප්‍රසාද -** GCF සමඟ සත්කාරක රාජ්‍ය ගිවිසුම අවසන් කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ රැස්වීම් දෙකක් පවත්වන ලදී.

**ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCITRAL)-** ආයෝජක රාජ්‍ය ආරවුල් නිරවුල් කිරීම (ISDS) පිළිබඳ UNCITRAL හි තුන්වැනි ක්‍රියාකාරී කණ්ඩායමේ 40 වැනි සැසිවාරය සහ නැවත ආරම්භ කරන ලද 40 වැනි සැසිවාරය විදේශ අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් විසින් ශ්‍රී ලංකාවේ ස්ථාවරය ප්‍රකාශයට පත් කරමින් 2021 පෙබරවාරි මස සහ 2021 මැයි මස අතථ්‍ය අයුරින් පැවැත්විණි. ක්‍රියාකාරී කණ්ඩායමේ සැසි වරින් වර පවත්වනු ලබන අතර, නීති අංශය නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මෙම රැස්වීම් සඳහා සහභාගී වී ශ්‍රී ලංකාවේ ඉදිරි දැක්ම පිළිබඳ කරුණු සපයා දුන්නේ ය.

**ආයෝජන -** නීතිපති දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය සහ විදේශ අමාත්‍යාංශයේ නීති අංශය සහ ආර්ථික කටයුතු අංශවල නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවට නව ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් ආකෘතියක් සංවර්ධනය කිරීමට හැකි විය. මෙම ආකෘතිය ශ්‍රී ලංකාව සමඟ ආයෝජන ගිවිසුම්වලට එළැඹීමේ හැකියාව සහිත රටවලට මෙන්ම, ශ්‍රී ලංකාව සමඟ සාකච්ඡා පැවැත්වීමට නියමිත රටවලට ද යවා ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ ආයෝජන ප්‍රවර්ධනය සහ අන්‍යෝන්‍ය ආරක්ෂාව පිළිබඳ

ද්විපාර්ශ්වික ගිවිසුම පිළිබඳ සාකච්ඡා වට දෙකක් පිළිවෙළින් 2021 ඔක්තෝබර් 18-19 සහ 2021 නොවැම්බර් 24-26 යන දිනවල ඩුබායි හි දී පැවැත්විණි.

**උපායමාර්ගික වෙළඳ පාලන නීති ක්‍රියාත්මක කිරීම-** අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව ඇති උපායමාර්ගික වෙළඳ පාලන ක්‍රමය පිළිබඳ නීති කමිටුව සඳහා නීති අංශයේ දායකත්වය ලැබී ඇති අතර, එහි දේශීය ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ කටයුතු මේ වන විට අවසන් අදියරේ සිදු කෙරෙමින් පවතී.

**සංක්‍රමණය -** 2021-2025 යන වර්ෂ සඳහා, මිනිස් ජාවාරම් ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර, ජාවාරම් කාර්ය සාධක බලකාය විසින් එහි කටයුතු නිම කෙරුණු අතර මෙහි දී නීති අංශය නියෝජනය කෙරිණි. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික මිනිස් ජාවාරම් වාර්තාවේ දෙවැනි ශ්‍රේණියේ නිරීක්ෂණ ලැයිස්තුව තුළ ශ්‍රී ලංකාව ඇතුළත් කොට ඇත.

**නැවත භාර ගැනීම-** 7 වැනි වාර්ෂික ඒකාබද්ධ නැවත භාර ගැනීමේ කමිටු රැස්වීම 2021 ජූලි 20 වැනි දින අතථ්‍ය අයුරින් පැවැත්වූ අතර, ක්‍රියාවට නැංවීමේ සන්ධාන සමඟින් ඉදිරි ගමන පිළිබඳව සම්මුතියකට එළඹිණි. නැවත භාර ගැනීමේ ගිවිසුම් කෙටුම්පත සහ එහි ක්‍රියාවට නැංවීමේ සන්ධාන පිළිබඳ කටයුතු නිම කිරීම සඳහා, 2021 මාර්තු මස රුසියාව සමඟ විශේෂඥ උපදේශනවල 5 වැනි වටය අතථ්‍ය අයුරින් පවත්වන ලදී. 2021 දෙසැම්බර් 20 වැනි දින ඕස්ට්‍රේලියාව සමඟ, නැවත භාර ගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුමට එළැඹිණි.

**අන්‍යෝන්‍ය නෛතික සහාය, උද්ධර්පණය සහ වරදකරුවන් මාරු කරන ලෙස ඉල්ලා සිටීම -** අන්‍යෝන්‍ය නෛතික සහාය සඳහා වන ඉල්ලීම් 22ක්, උදර්පණය පිළිබඳ ඉල්ලීම් 4ක් සහ වරදකරුවන් මාරු කිරීම පිළිබඳ ඉල්ලීමක් සඳහා ජනවාරි 1 සිට සැප්තැම්බර් 30 දක්වා වූ කාලය තුළ දී පහසුකම් සලසන ලදී.

**ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ කරුණු-** ජිනීවා සම්මුතියේ 70 වැනි සංවත්සරයේ සැමරුම් උත්සවයේ දී ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටුවට ඉදිරිපත් කරන ලද ජිනීවා සම්මුතිවල සිංහල සහ දෙමළ පරිවර්තනය සම්බන්ධයෙන් නිල සත්‍යාපනය ලබා ගැනීම තුළින් එම සම්මුතිය පොදු අවකාශයකින් ලබා ගත හැකි වන පරිදි සකස් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කළේ ය. පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය සහ පොකුරු යුද අවි ගිවිසුම (OSLO) සඳහා වන දේශීය නීති සම්පාදනය අවසන් කෙරෙමින් පවතී. 2021 අප්‍රේල් 26 සිට 29 දිනවල මාර්ගගත අයුරින් පැවති 5 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය ජාත්‍යන්තර මානුෂීය නීති කමිටු රැස්වීමේ දී නීති අංශය සිය කාර්ය තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීම් ලබා දුන්නේ ය. 2021 ඔක්තෝබර් 26-28 දිනවල පැවති, ආසියා-පැසිෆික් ජාතික ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටු සමුළුව සඳහා වූ අතථ්‍ය විශේෂඥ හුවමාරුව සහ ජාතික ප්‍රමුඛතා සහ ආයුධ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති කමිටුවේ කාර්යභාරය පිළිබඳ පැවති විශ්වීය ජාතික ජාත්‍යන්තර මානුෂීය නීති රැස්වීම ඇතුළුව, ජාත්‍යන්තර රතුකුරුස සංවිධාන කමිටුව විසින් පවත්වන ලද ජාත්‍යන්තර මානුෂීය නීති සංසද කිහිපයකට ද නීති අංශය සහභාගී විය.

**නීති අංශයේ නිලධාරීන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ඇතැම් කමිටු සහ අනෙකුත් කමිටු සාමාජිකයන් වශයෙන් පත් කෙරිණි-** ජාතික සාගර කටයුතු කමිටුවට නීතිමය යෙදවුම් සපයන ලදී. එක්සත් ජනපදයට ඉදිරිපත් කරන ලද වාර්ෂික මිනිස් ජාවාරම් වාර්තාව සකස් කිරීම සහ අවසන් කිරීම සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සපයන ලදී. උපායමාර්ගික වෙළඳ පාලනය (STC) පිළිබඳ නීති කමිටුවට සහ උපායමාර්ගික වෙළඳ පාලනය පිළිබඳ නීති කෙටුම්පත් අවසන් කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රතිපත්ති සහ නීතිමය යෙදවුම් සපයන ලදී. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ මෙන්ම ත්‍රස්තවාදය සඳහා මුදල් සපයන පුද්ගලයන් සහ ආයතන ලැයිස්තු ගත කිරීම පිළිබඳ UNSCR 1373 කමිටුවට ජාත්‍යන්තර දැක්මක්

සහිත නීති ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් සපයන ලදී. රාජ්‍ය නොවන සංවිධාන පනත් සංශෝධන කමිටුවට සහ නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා ප්‍රතිපත්තිමය සහ නීතිමය මාර්ගෝපදේශ සපයන ලදී. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (APG) සහ මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සම්බන්ධ සියලුම අමාත්‍යාංශ කටයුතු සිදු කිරීම සහ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ මූල්‍ය බුද්ධි අංශය වෙත සහාය ලබා දීම සහ විදේශ ලේකම්වරයා නියෝජනය කිරීම. ආසියා පැසිෆික් කණ්ඩායමේ අන්‍යෝන්‍ය ඇගයීම සඳහා අවශ්‍ය වන මූල්‍ය බුද්ධි අංශය විසින් පවත්වනු ලබන ජාතික අවදානම් තක්සේරුවේ කමිටු දෙකක සාමාජිකයෙකු ලෙස නීති අංශය අමාත්‍යාංශය නියෝජනය කරයි. නවතම ප්‍රවණතා සහ අදාළ ජාත්‍යන්තර සාම්ප්‍රදායන්වල ප්‍රමිතීන් පිළිබිඹු කිරීම සඳහා, 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර ලබා දීමේ පනත සහ 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ සංශෝධන සඳහා ජාතික කමිටුවට යෙදවුම් සපයන ලදී. නීති අංශය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා වන සමාලෝචිත කමිටුව නියෝජනය කරනු ලැබූ අතර, පැවරී ඇති ප්‍රධාන කාර්යයන් කිහිපයක් අවසන් කිරීමට හැකිවන පරිදි කමිටුව වෙත යෙදවුම් සපයන ලදී.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ නීතිය සහ න්‍යෂ්ටික/ පරමාණුක බලශක්ති නීති සංසද සහ රැස්වීම්වලට දායක වීම සහ ඊට සහභාගී වීම.

**UNESCAP - ආයෝජන පිළිබඳ නිදහස් වෙළඳ ගිවිසුම-** ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිෂන් සභාවේ (UNESCAP) ආයෝජන පිළිබඳ නිදහස් වෙළඳ ගිවිසුම සඳහා නීති අංශය සභාපතිත්වය ලබා දුන් අතර, කලින් කලට යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී.

**බිම්ස්ටෙක් (BIMSTEC) සහ IORA -** නීති අංශය මේ සඳහා සිය නියෝජනය ලබා දී ඇති අතර, නෛතික නිරීක්ෂණ ද සපයා ඇත.

**ජී.එස්.පී+ ක්‍රියාවලිය, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම සහ ශ්‍රී ලංකාවට එරෙහි යෝජනා -** අවශ්‍යතාව පරිදි නීති අංශය විසින් නීතිමය සහාය සපයනු ලැබේ.

**අධිකරණ නඩු-** විදේශ අමාත්‍යාංශය වගඋත්තරකරුවෙක් ලෙස නම් කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු සහ අභියාචනාධිකරණ රිට් අයදුම්පත් සම්බන්ධයෙන් නීති අංශය විසින් නිරීක්ෂණ සකස් කර ලබා දී ඇත.

**පූර්ණ බලතල සහිත මෙවලම් නිකුත් කිරීම -** ගරු අමාත්‍යවරයාගේ අත්සන ලබා ගැනීම සඳහා නීති අංශය විසින් පූර්ණ බලතල සහිත මෙවලම් නවයක් සකස් කොට ඇත.

**අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ -** නීති අංශය විසින් ගරු විදේශ අමාත්‍යවරයාගේ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ 90ක් සකස් කෙරිණි.

**විදේශ සිතාසි-** මෙම අංශය 2021 දෙසැම්බර් 31 වැනි දින දක්වා විදේශ සිතාසි 220ක් සඳහා පහසුකම් සලසා ඇත.

**තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් සහ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්-** 2021 දෙසැම්බර් 31 වැනි දින විට ඉල්ලීම් 17 ක් සඳහා පහසුකම් සලසා ඇත.

**සාකච්ඡා කොට අවසන් කරන ලද ගිවිසුම්**

- චෙක් ජනරජය සමඟ සිරකරුවන් මාරු කිරීමේ ගිවිසුමකට 2021 ඔක්තෝබර් 14 වැනි දින අත්සන් තැබූ අතර 2021 නොවැම්බර් 26 වැනි දින තුර්කිය සමඟ රේගු සහයෝගීතා ගිවිසුමකට අත්සන් තබන ලදී. ඉරානය සමඟ පැවති අවබෝධතා ගිවිසුම අවසන් කර 2021 දෙසැම්බර් 21 වැනි දින තේ/තෙල් භාණ්ඩ හුවමාරු වැඩපිළිවෙළ සඳහා එළඹෙන ලදී.
- භූගෝලීය දර්ශක සහ ජාත්‍යන්තර තත්ත්ව සහතික සංවර්ධනය තුළින් වටිනාකම් නිර්මාණයට සහාය වීම සඳහා Agence Finacasise De Development (AFD) (නියෝජිතායතනය), Centre de Cooperation International Recherche Agronomique pour le Development (CIRAD)

(තාක්ෂණික හවුල්කරු) සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය (SLTB) (ප්‍රතිලාභියා) අතර පවත්නා ත්‍රෛපාර්ශ්වීය ෆෙක්ස්ට් හවුල් ගිවිසුම නිරවුල් කරන ලදී.

- ද්විත්ත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් බදුවලට අදාළව රාජ්‍ය මූල්‍ය පැහැර හැරීම වැළැක්වීම සඳහා චෙක් ජනරජය, සයිප්‍රසය, හංගේරියාව, ඩෙන්මාර්කය, මෝල්ටාව, තුර්කිය, ඉන්දියාව (සන්ධාන), යුක්රේනය සහ සෞදි අරාබි රාජධානිය සමඟ ද්විත්ත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ ගිවිසුම් අවසන් කිරීමට ක්‍රියාකාරීව සහභාගී විය.

- පිලිපීනය, මියන්මාරය, ඇෆ්ගනිස්ථානය, භූතානය, කාම්බෝජය, කැනඩාව, ගයනාව සමඟ පවතින ගුවන් සේවා ගිවිසුම් අවසන් වෙමින් පවතී. ඊශ්‍රායලය සමඟ පවත්නා ගුවන් සේවා සන්ධානය අවසන් කොට ඇති අතර එය අත්සන් කිරීම සඳහා සූදානම් කොට ඇත.

2021 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ නීති අංශය විසින් ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් ආසන්න වශයෙන් 600ක් පමණ නිෂ්කාශනය කර ඇති අතර විවිධ ක්ෂේත්‍ර සඳහා උපදෙස් 150ක් පමණ ලබා දී ඇත.

නීති අංශය විසින් "උසස් අධ්‍යාපන හා පර්යේෂණ" ක්ෂේත්‍රයේ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් 77ක් පිළිබඳ නිරීක්ෂණ ලබා දී ඇත.

ගිවිසුම් තැන්පතු ලේඛනවලට අනුව, එම නිෂ්කාශනය කරන ලද ගිවිසුම් අතරින් නීති අංශයේ ආරක්ෂක සහයෝගිතාව, ආයෝජන මණ්ඩලයේ සහයෝගිතාව, වීසා බලපත්‍ර නිදහස් කිරීම්, රාජ්‍යතාන්ත්‍රික සබඳතා, දේශපාලන උපදේශන/ ඒකාබද්ධ ප්‍රකාශයන්, සංස්කෘතික සහයෝගිතාව, වෘත්තීය සහ අනෙකුත් පුහුණු, කෘෂිකාර්මික සහයෝගිතාව, සංචාරක ව්‍යාපාරය, අධ්‍යාපනය සහ විනෝදාස්වාදය යන ක්ෂේත්‍රවලින් ගිවිසුම් 22ක් පමණක් යාවත්කාලීන කොට ඇත. කෙසේ වෙතත්, රේඛීය ආයතන මඟින් අත්සන් කරන ලද ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් කිහිපයක් තවමත් ලැබී නැත.

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම-** ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සංශෝධන අවසන් කිරීම සඳහා නීති අංශයේ නියෝජිතයා මූලික විය.

**නීතිමය උපදේශ ලබාදීම -** විදේශ ලේකම්වරයාට, විදේශ අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශවල ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත නීතිමය උපදේශ 30කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත.

## විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය

2021 වර්ෂය තුළදී, දැනට පවත්නා රාජ්‍ය දේපළ අලුත්වැඩියා කිරීම/ ඉදිකිරීම, චෙනත් චංචල හා නිශ්චල වත්කම් නඩත්තු කිරීම හා දේපළ අත්පත් කර ගැනීම සම්බන්ධ බොහෝ ක්‍රියාකාරකම් සිදු කිරීම කෙරෙහි මෙම අංශය අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත්, පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හා අයවැය බාධක හේතුවෙන් ඇතැම් ක්‍රියාකාරකම් කල් දැමීමට සිදු විය. දූත මණ්ඩල/ දූත කාර්යාල ප්‍රධානීන් ද ඇතුළුව සියරට සේවයේ කාර්ය මණ්ඩලයේ 400 දෙනෙකුගේ පමණ (පැමිණෙන හා පිටතට යන) ගමන් හා සැපයුම් සේවා කටයුතු සඳහා මෙම අංශය පහසුකම් සැලසී ය.

මෙම සන්දර්භයට අනුව, 2021 වසරේ දී විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය විසින් ලබා ඇති සැලකියයුතු අන්දමේ ප්‍රගතිය පහත පරිදි හඳුනාගෙන ඇත;

**විදේශ වත්කම් අත්පත් කර ගැනීම හා නඩත්තු කිරීම**

**චංචල දේපළ:**

**වාහන**

ලීසිං සහ මූල්‍ය කල්බදු ක්‍රම මගින් තෝරාගත් දූත මණ්ඩල/ දූත කාර්යාල සඳහා වාහන 10ක් සම්පූර්ණයෙන්ම මිලදී ගැනීමට මහා භාණ්ඩාගාරය සිය අනුමැතිය ලබා දී ඇත. කෙසේ වුවද, ඉහත සඳහන් කළ වාහන මිලදී ගැනීමෙන් වළකින ලෙසත්, මේ වන විටත් මිලදී ගැනීමේ ඇණවුම් ලබා දී නොමැති නම්, පවතින මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින් එම මිලදී ගැනීම් 2022 වසර දක්වා කල් දමන ලෙසත් උපදෙස් දෙන ලදී.

**වෙනත් ප්‍රාග්ධන වත්කම්:**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් කරන ලද ඉල්ලීම්වලට අනුව කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ශ්‍රී.ලං.රු.මි. 40.93 ක පිරිවැයක් යටතේ 2021 ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා මිලදී ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය අනුමැතිය ලබා දී තිබේ. මෙම අනුමැතිය ලැබී ඇත්තේ විදේශ රටවල පිහිටි දූත මණ්ඩලවල ක්‍රියාකාරීත්වය සඳහා අවම අවශ්‍යතා ලබා දීම සඳහා ය.

ඒ අතරම, එම කාලය තුළදී ශ්‍රී ලංකා රජය සතු දේපළ ශ්‍රී. ලං. රු. මිලියන 3.65 ක වියදමින් නඩත්තු කිරීම සඳහා අමාත්‍යාංශය අනුමැතිය ලබා දී ඇත.

**ආරක්ෂක තැපැල් ඒකකය**

පවතින වසංගත තත්ත්වය යටතේ සාමාන්‍ය ගුවන් ගමන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, රාජ්‍යතාන්ත්‍රික මලු කඩිනමින් බෙදා හැරීම සහතික කිරීම සඳහා තෝරාගත් දූත මණ්ඩලවලට ඩී.එච්.එල්. වැනි කුරියර් සමාගම් සමඟ රාජ්‍යතාන්ත්‍රික මලු බාධාවකින් තොරව ලබාදීම සහතික කිරීමට මෙම ඒකකය විකල්ප විධිවිධාන ආරම්භ කර ඇත.

තවද, විවිධ අගනගරවලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන වෛද්‍ය උපකරණ/ සුරක්ෂිතා අංග උපාංග අදාළ දූත මණ්ඩල සහ ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කර යැවීම සඳහා මෙම අංශය පහසුකම් සලසා ඇත.

**තොරතුරු තාක්ෂණ ඒකකය**

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල සහ ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල පිහිටි වෙනත් සංවිධාන සහ ආයතනවලින් දෛනික පදනමින් ෆැක්ස් පණිවිඩ හා විද්‍යුත් තැපැල් පණිවිඩ 600-700 ත් අතර සංඛ්‍යාවක් මෙම තොරතුරු හා තාක්ෂණ ඒකකය වෙත ලැබේ. සතියේ දින හතේම සහ පැය 24 පුරාම ක්‍රියාත්මක වන මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය සේවා මුර ක්‍රමය යටතේ සේවයේ යොදවා ඇත.

**චාරිකා අංශය**

සංචාර ඒකකය විසින් 2021 වර්ෂය තුළ දී නිල සංචාර 23ක් පිළිබඳව කටයුතු කොට ඇති අතර, රාජ්‍ය නිලධාරීන්ට නිල සහ පෞද්ගලික සංචාර සඳහා තුන්වැනි පාර්ශ්ව සටහන් (TPN) 349ක් නිකුත් කර ඇත.

## සන්ධාන අංශය

2021 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව, 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා සන්ධාන අංශය විසින් පහත සඳහන් කටයුතු සාර්ථකව නිම කරන ලදී. ඇමුණුම තුළ ලැයිස්තුගත කර ඇති ඉහළ පෙළේ සංචාර සම්බන්ධීකරණය කිරීම සහ ඒවාට පහසුකම් සැපයීම ද මෙම අංශය විසින් සිදු කරන ලදී.

විදේශයන් හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරීමේ ආයතනික ක්‍රියා පටිපාටි සංශෝධනය කරන ලදී. ඒ අනුව, නව ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරු 10 දෙනෙකු සහ නව විදේශීය නිර්වේතනික කොන්සල්වරු 05 දෙනෙකු පත් කෙරිණි. තවද, සේවා කාලය දිගු කිරීම් 19 ක් ක්‍රියාත්මක කෙරිණි.

තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් හය (06) දෙනෙකු,කොන්සල් ජනරාල්වරුන් දහඅට (18) දෙනෙකු, නියෝජ්‍ය මහ කොමසාරිස්වරයෙකු (01) ඇතුළු දූත මණ්ඩල ප්‍රධානීන් හැත්තෑපහක් (25) පත් කරන ලදී.

තානාපතිවරුන් විසි හතර දෙනෙකුට (24) අක්තපත්‍ර ප්‍රදානය කරන ලදී.

| | |
|---|---|
| ඉතා වැදගත් පුද්ගලයින් සඳහා වෙන් කිරීම් | - 480 |
| රාජ්‍යතාන්ත්‍රිකයින් සහ නිර්වේතනික කොන්සල්වරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම් | - 702 |
| රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා ගුවන් තොටුපළ බලපත්‍ර නිකුත් කිරීම | - 176 |
| රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශනය | |
| ගුවන් යානා | - 110 |
| නැව් | - 47 |
| වීසා නිකුත් කිරීම | |
| තානාපති කාර්යාල | |
| ඇතුල්වීමේ වීසා | -1218 |
| පදිංචි වීසා | - 745 |
| ආයතන | |
| ඇතුල්වීමේ වීසා | - 483 |
| පදිංචි වීසා | - 289 |
| රේගු නිෂ්කාශන සහතික අනුමත කිරීම් | - 1318 |
| නව රාජ්‍යතාන්ත්‍රික වාහන ලියාපදිංචි කිරීම් | - 105 |
| තීරු බදු රහිත වාහන බැහැර කිරීම් | - 225 |
| රියදුරු බලපත්‍ර අනුමත කිරීම් නිකුත් කිරීම් | - 130 |

## සාමාන්‍ය පරිපාලන අංශය

අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන අංශය, පරිපාලන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සියලුම මෙහෙයුම් සහ නඩත්තු කටයුතු, මානව සම්පත් සැලසුම් කිරීම සහ සමස්ත ලංකා සේවා, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, ප්‍රාථමික සේවා සහ ශ්‍රී ලංකා විදේශ සේවය හැර අනෙකුත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සේවා පිළිබඳ පුළුල් ක්ෂේත්‍රයක වගකීම දරයි.

එසේම විදේශ ලේකම්වරයාගේ මඟපෙන්වීම මත අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම, පාර්ලිමේන්තු කාරක සභා සහ උපදේශක කාරක සභා සඳහා පිළිතුරු සකස් කිරීම පරිපාලන අංශය මඟින් සිදු කෙරේ.

සාමාන්‍ය පරිපාලන අංශය (GAD) විසින් 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දී සාමාන්‍ය රාජකාරිවලට අමතරව සිදු කරන ලද විශේෂ කාර්යයන් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ;

**මානව සම්පත් කළමනාකරණය**

2022 වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය හරහා අමාත්‍යාංශයේ සේවය කිරීම සඳහා දක්ෂ කළමනාකරණ සේවා නිලධාරීන් තෝරා ගැනීම සඳහා මාර්ගගත සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. අපේක්ෂකයින් 98 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කර ඇති අතර කෙටි ලැයිස්තුගත නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට දන්වා යවා ඇත.

අමාත්‍යාංශයේ මානව සම්පත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන්, සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම සහ සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකා සහ විදේශීය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්, ඩිප්ලෝමාධාරීන් සහ වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා සීමාවාසික පුහුණුව ලබා දෙන ලදී. සිසුන් 50 දෙනෙකු පුහුණු කරන ලදී.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා උසස් MS Excel පුහුණුව.
- විදේශ දූත මණ්ඩලවලට සේවය කිරීම සඳහා පත් කරන ලද කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා කොන්සියුලර් සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
- මාණ්ඩලික නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පැය 200ක දෙමළ භාෂා පාඨමාලාව.
- සේවාවේ අවශ්‍යතාවයක් ලෙස මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 03 දෙනෙකුගේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා පහසුකම් සලසා ඇත.
- අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා ධාරිතා වර්ධන පුහුණුව.
- කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන සමීක්ෂණ ක්‍රියා පටිපාටිය අමාත්‍යාංශයේදී පැවැත්විණි.
- සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා විනය පටිපාටිය.
- කාර්යාල රැකියා සහායකයින් සහ රියදුරන් සඳහා මූලික ඉංග්‍රීසි භාෂා පාඨමාලාව මාර්ගගතව පවත්වන ලදී.

**විශේෂ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු**

**කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීමේ සහාය සේවා** - ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ලැබුණු පෞද්ගලික ආරක්ෂක උපකරණ සහ අනෙකුත් සෞඛ්‍ය උපකරණ බෙදා හැරීම ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරන ලදී. කාර්ය මණ්ඩල ප්‍රජාවගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම සහතික කරමින්, සියලුම සේවකයින්ට ආරක්ෂක උපකරණ ලබා දෙන ලදී.

**තොරතුරු තාක්ෂණ සංවර්ධන**

තොරතුරු තාක්ෂණ අංශය උසස් මට්ටමේ ද්වි පාර්ශ්වික, බහු පාර්ශ්වීය අතථ්‍ය/දෙමුහුන් රැස්වීම් සඳහා තාක්ෂණික සහාය අඛණ්ඩව ලබා දී ඇති අතර, 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අමාත්‍යාංශයේ දී පවත්වන ලද අතථ්‍ය රැස්වීම් 350 කට වැඩි සංඛ්‍යාවක් සඳහා සාර්ථකව තාක්ෂණික සහාය ලබා දී ඇත.

අතථ්‍ය සම්මන්ත්‍රණ සහ දුරස්ථ වැඩ පිළිවෙත් හේතුවෙන් වැඩි වූ ජාල තදබදයට අනුගත වීමට සහ නව සයිබර් ආරක්ෂණ තර්ජනවලට සහාය වීමට ජාල සහ ආරක්‍ෂක උපකරණ වැඩිදියුණු කරන ලදී.

අමාත්‍යාංශයේ කඩදාසි පරිභෝජනය හා කාබන් පියසටහන් පහත හෙළීම සඳහා ඉ-සයිෆර් (e-Cypher) වේදිකාව හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් හඳුන්වාදීම.

**පාර්ලිමේන්තු කටයුතු**

අමාත්‍ය මණ්ඩලයීය පත්‍රිකා 26ක් ඉදිරිපත් කිරීම, අමාත්‍ය මණ්ඩලයීය සංදේශ රාශියකට අදාළව ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට අමතරව, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය සමඟ කාර්යක්ෂමව සම්බන්ධීකරණය කරන ලදී.

අමාත්‍ය උපදේශක කාරක සභාවට සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පිළිතුරු/වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය කිරීම.

**ප්‍රසම්පාදන හා නඩත්තු**

අදාළ රෙගුලාසි වලට අනුකූලව සියලුම ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සහ නඩත්තු කටයුතු සිදු කරන ලද අතර, අමාත්‍යාංශය, නිල නිවාස සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 92 ක් වටිනා ප්‍රසම්පාදන හා නඩත්තු කටයුතු සිදු කරන ලදී. තවත් 2021 වසර සඳහා විදේශයන්හි සියලුම ශ්‍රී ලංකා දූත මණ්ඩලවල අවශ්‍යතා සඳහා රු. මිලියන 9 ක ප්‍රසම්පාදන සිදු කරන ලදී.

ජනරජ ගොඩනැගිල්ලේ පුරාවිද්‍යාත්මක වටිනාකම සහ අලංකාරය ආරක්ෂා කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, රජයේ කර්මාන්ත ශාලාවේ සහ බස්නාහිර පළාත් බලධාරීන්ගේ (කාර්මික සංවර්ධන අධිකාරිය-WP) සහාය ඇතිව ජනරජ ගොඩනැගිල්ලේ නිසි හා විධිමත් නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

**සැපයුම් සේවා**

මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල තුනක් පිහිටුවීම සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම.

විදේශ අමාත්‍යාංශය එක් නිවාස ගොඩනැගිල්ලකට ගෙනයාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2021 සැප්තැම්බර් මස 06 වැනි දින ලබාගෙන ඇති අතර එම, අමාත්‍ය මණ්ඩලයීය අනුමැතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

දිවයින පුරා පනවා ඇති නිරෝධායන ඇඳිරි නීතිය පවතින කාලසීමාවන්හි දී පවා සේවයට පැමිණි සියලුම සේවකයින් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම පිණිස සංසන්දනාත්මක රියදුරන් සංඛ්‍යාවක් සමඟ වාහන 82 කින් යුත් රථ සමූහයක් කාර්යක්ෂම ලෙස භාවිත කරන ලදී.

රාජ්‍ය මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින්, නව වාහන මිලදී ගැනීම පිළිබඳ අමතර බරක් යෙදවීමකින් තොරව ධාවන කාල නඩත්තුව සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සහිතව දැනට පවතින වාහන සමූහය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.

## අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ, මෙම අමාත්‍යාංශයේ, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල සහ මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන අනෙකුත් ආයතනවල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය අධීක්ෂණය හා ඇගයීම සහ සමස්ථ කාර්යසාධනය සහ අනුකූලවීම් සඳහා මග පෙන්වමින් ආයතනයේ මෙහෙවරට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් ලබාදීමයි.

- මෙම අමාත්‍යාංශය, අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන ආයතන සහ විදේශ දූත මණ්ඩල / දූත කාර්යාල සඳහා මෙම අංශය විසින් විගණන විමසුම් 28ක් ඉදිරිපත් කර තිබේ.
- 2019 මාර්තු මස 06 දින පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු 11ක් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර තිබේ.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල තීරණ සඳහා පසු විපරම් කටයුතු සිදු කරන ලදී.
- ජාතික විගණන කාර්යාලය මගින් යොමුකරන ලද විගණන විමසුම් 13කට පිළිතුරු සැකසීම සම්බන්ධීකරණය කරන ලදී.
- රෝමයේ පිහිටි විදේශ දූත මණ්ඩලයට අදාලව මහාධිකරණයේ විභාග වන නඩු 02ක් සඳහා අමාත්‍යාංශය නියෝජනය කිරීම හා තොරතුරු ලබාදීම.

# 2021 වර්ෂයේ සුවිශේෂී අවස්ථා




*2021 නොවැම්බර් 01 වැනි දින එක්සත් රාජධානියේ ස්කොට්ලන්තයේ පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේ “COP 26 ලෝක නායක සමුළුව” හමුවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සිදු කළ දේශනය.*



*විදේශ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා, එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම්වරිය සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කරයි.*




*ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍යවරිය විදේශ අමාත්‍ය ජී.එල්.පීරිස් මැතිතුමා සමඟ පුළුල් පරාසයක සාකච්ඡා පවත්වයි*



*විදේශ අමාත්‍ය මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ අමාත්‍යවරයා සමඟ බලශක්ති ආරක්ෂාව, රැකියා අවස්ථා ඉහළ නැංවීම පිළිබඳව සාකච්ඡා කරයි.*



එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු විදේශ අමාත්‍යවරයා හමුවෙයි

අභාවප්‍රාප්ත ප්‍රියන්ත කුමාර මහතාගේගේ පවුලේ මූල්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ පාකිස්තාන තානාපතිවරයා සමඟ සාකච්ඡා කරයි.





බිම්ස්ටෙක් හි මහලේකම් ටෙන්සින් ලෙක්ෆෙල් මැතිතුමාගේ සංචාරය අතරතුරදී විදේශ අමාත්‍ය ජී.එල්. පීරිස් මැතිතුමා බිම්ස්ටෙක් සංවිධානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා කැපවීම සහතික කරයි.

“ගෝලීය වසංගතය පැවතියද ශ්‍රී ලංකාව සිය තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ගෝලීය ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කොට ඇත” : විදේශ ලේකම් තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වන දකුණු ආසියානු සංසදයේ දී කියයි.







බිම්ස්ටෙක් සංවිධානයේ ලේකම් ජනරාල් ටෙන්සින් ලෙක්ෆෙල් මහතා ඩකා හි දී විදේශ අමාත්‍ය ජී.එල්.පීරිස් මැතිතුමා හමුවෙමින්.



බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකාව සඳහා වූ විශේෂ වෙළඳ නියෝජිත ඇබර්සොක් හි මර්වින් ඩේවිස් සාමිවරයා ශ්‍රී ලංකා- එක්සත් රාජධානි වෙළඳ මණ්ඩලය ලන්ඩනයේ මහ කොමසාරිස් කාර්යාලය තුළ ඒකාබද්ධව ඇරඹූ අවස්ථාවේ දී විදේශ අමාත්‍ය ජී.එල්.පීරිස් මැතිතුමා සිදු කළ දේශනය.



ශ්‍රී ලංකාව CICA හි 6 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වේ



මොස්කව් හි පැවති ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල දී ශ්‍රී ලංකාව සහ රුසියාව සියශක්තිමත් හවුල්කාරිත්වය යළි තහවුරු කරයි

කොවිඩ්-19 වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම



# 03 වැනි පරිච්ඡේදය

## 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

එසිජ්-එෆ්

| අයවැය 2021 | | සටහන | තථ්‍ය 2021 | නැවත ගලපන ලද 2020 | |
|---|---|---|---|---|---|
| (රු.) | | | (රු.) | (රු.) | |
| - | ආදායම් ලැබීම් | | - | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසිජ්-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසිජ්-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසිජ්-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසිජ්-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 9,369,712,663 | 9,385,178,602 | ඒසිජ්-3 |
| - | තැන්පතු | | 2,076,010,925 | 1,452,471,015 | ඒසිජ්-4 |
| 35,000,000 | අත්තිකාරම් ගිණුම් | | 51,762,773 | 43,380,027 | ඒසිජ්-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **35,000,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **11,497,486,361** | **10,881,029,644** | |
| **35,000,000** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **11,497,486,361** | **10,881,029,644** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **100,000,476** | **943,415** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **11,397,485,885** | **10,880,086,229** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 7,319,339,500 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 6,803,407,447 | 6,639,945,810 | ඒසිජ්-2(ii) |
| 4,210,440,500 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 3,907,979,711 | 3,289,376,733 | ඒසිජ්-2(ii) |
| 616,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 470,003,154 | 437,731,433 | ඒසිජ්-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසිජ්-2(ii) |
| 40,500,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 6,368,744 | 5,238,253 | ඒසිජ්-2(ii) |
| **12,186,580,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **11,187,759,056** | **10,372,292,229** | |
| | **මූලධන වියදම්** | | | | |
| 350,220,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු | 10 | 120,744,787 | 132,234,122 | ඒසිජ්-2(ii) |
| 106,180,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 63,415,740 | 70,399,078 | ඒසිජ්-2(ii) |
| 2,400,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසිජ්-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසිජ්-2(ii) |
| 4,000,000 | හැකියා වර්ධනය | 14 | 2,062,858 | 1,109,935 | ඒසිජ්-2(ii) |
| 40,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,737,946 | - | ඒසිජ්-2(ii) |
| **502,800,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **187,961,331** | **203,743,135** | |
| | තැන්පතු ගෙවීම් | | 2,050,025,630 | 1,595,777,211 | ඒසිජ්-4 |
| 40,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 39,143,701 | 46,903,083 | ඒසිජ්-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | 66,006 | |
| **40,000,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **2,089,169,331** | **1,642,746,300** | |
| **12,729,380,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **13,464,889,718** | **12,218,781,664** | |
| **(12,729,380,000)** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(2,067,403,833)** | **(1,338,695,435)** | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (3,076,705,760) | **(2,217,937,991)** | ඒසිජ්-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 1,009,301,927 | **879,242,556** | ඒසිජ්-3 |
| | | | (2,067,403,833) | **(1,338,695,435)** | |

## 3.2. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

### 2021 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 12,740,581,583 | 12,716,440,231 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 111,099,792 | 123,736,361 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 1,009,301,927 | 879,242,556 |
| **මුළු වත්කම්** | | **13,860,983,302** | **13,719,419,148** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (263,943,109) | (230,908,697) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 12,740,581,583 | 12,716,440,231 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 375,042,901 | 354,645,059 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 1,009,301,927 | 879,242,556 |
| **මුළු වගකීම්** | | **13,860,983,302** | **13,719,419,148** |

පිටු අංක..**06**..සිට ..**78**.. දක්වා ඒසීඒ **1** සිට ඒසීඒ **7** දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..**79**..සිට ..**133**.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2022
අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ
ලේකම්
විදේශ අමාත්‍යාංශය
කොළඹ 01.

..........................
ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර : අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ
දිනය : 2022.02.25
ලේකම්
විදේශ අමාත්‍යාංශය
කොළඹ 01.

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/~~ප්‍රධාන ගණකාධිකාරී/~~
~~අධ්‍යක්ෂ (මුදල්)/~~ කොමසාරිස් (මුදල්)
ඒ. සී. අබේරත්න
ප්‍රධාන ගණකාධිකාරී
විදේශ අමාත්‍යාංශය
කොළඹ 01.
නම :
දිනය : 2022.02.25

02

## 3.3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ඒසිඒ-සි

| | සටහන | 2021 (රු.) | නැවත ගලපන ලද 2020 (රු.) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 3,221,067,854 | 2,389,880,478 |
| අග්‍රිම ලැබීම් | | 9,278,182,565 | 9,293,333,341 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 56,789,023 | 63,627,057 |
| තැන්පතු ලැබීම් | | 2,076,010,925 | 1,452,471,015 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **14,632,050,367** | **13,199,311,891** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 11,183,873,316 | 10,370,961,874 |
| සහනාධාර සහ මාරුකිරීම් | | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 149,014,309 | 220,670,748 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 100,000,476 | 943,415 |
| අත්තිකාරම් ගෙවීම් | | 44,334,666 | 49,671,064 |
| තැන්පතු ගෙවීම් | | 2,050,025,630 | 1,595,777,211 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **13,527,248,397** | **12,238,024,312** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **1,104,801,970** | **961,287,579** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමෙ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | 24,648,585 |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **-** | **24,648,585** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 187,030,142 | 198,538,869 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **187,030,142** | **198,538,869** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(187,030,142)** | **(173,890,284)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **917,771,828** | **787,397,295** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | | **917,771,828** | **787,397,295** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **91,530,099** | **91,845,261** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **1,009,301,927** | **879,242,556** |

03

### 3.4. මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

**වාර්තා කිරීමේ පදනම**

**1) වාර්තා කිරීමේ කාලය**

මෙම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීමේ කාලය 2021 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වේ.

**2) මිනුම් පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ඇතැම් වත්කම් නැවත තක්සේරු කිරීම මගින් වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය මත වන අතර, වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම්, වෙනස් කරන ලද මුදල් පදනමක් මත ගිණුම්ගත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත්තේ ආසන්නතම රුපියලට වටයමිනි.

**3) ආදායම් හඳුනා ගැනීම**

විනිමය සහ විනිමය නොවන ආදායම් අදාළ ආදායම් කාලසීමාව නොසලකා ගිණුම්කරණ කාලය තුළ මුදල් ලැබීම් මත හඳුනා ගැනේ.

**4) දේපළ, කම්හල් සහ උපකරණ හඳුනා ගැනීම සහ මැනීම (PP&E)**

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇති විට දේපළ, කම්හල සහ උපකරණ පිළිබඳ අයිතමයක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි ය.

PP&E පිරිවැයකින් මනිනු ලබන අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන විට නැවත ඇගයීමේ ආකෘතිය යොදනු ලැබේ.

**5) දේපළ, කම්හල් සහ උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ කම්හලේ සහ උපකරණවල අනුරූප ගිණුම යි.

**6) මුදල් හා සමාන මුදල්**

මුදල් සහ මුදල් සමානකම්වලට 2021 දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ දේශීය මුදල් නෝට්ටු සහ කාසි ඇතුළත් වේ.

**7) මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිවල වෙනස්කම් සහ සංසන්දනාත්මක සංඛ්‍යා ගැළපීම**

2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද වෙනස්කම්වලට අනුකූලව 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යාවලට අදාළ ගැලපීම් සිදු කර ඇත.

## 3.5. ආදායම් එකතු කිරීම පිළිබඳ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතය පිළිබඳ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව 2021 | | එකතු වූ ආදායම (2021.12.31 දිනට) | |
|---|---|---|---|---|---|
| | | මූලික | අවසන් | ප්‍රමාණය (රුපියල්.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලිය | 2,900 | 2,900 | 2,881 | 99% |
| 2002-02-99 | අනෙකුත් පොළී | 5,000 | 5,000 | 5,581 | 112% |
| 2003-02-07 | විදේශ ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ත්ව පුරවැසිභාවය සඳහා වන ගාස්තු | 1,950,000 | 2,250,000 | 2,309,679 | 103% |
| 2003-02-13 | විභාග සහ අනෙකුත් ගාස්තු | 35 | 15 | 15 | 100% |
| 2003-02-14 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 20,000 | 25,500 | 25,027 | 98% |
| 2003-02-99 | කොන්සියුලර් ගාස්තු | 500,000 | 500,000 | 674,576 | 135% |
| 2003-99-00 | වෙනත් ලැබීම් | 150,000 | 100,000 | 163,848 | 164% |
| 2004-01-00 | සමාජ ආරක්ෂණ දායකත්වය -(මධ්‍යම රජය) | 30,000 | 38,000 | 35,353 | 93% |
| 2004-02-00 | සමාජ ආරක්ෂණ දායකත්වය -(පළාත් සභා) | 450 | 700 | 681 | 97% |
| 2006-02-01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන) | 4,000 | 6,000 | 3,289 | 55% |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්) | 200 | 200 | 138 | 69% |
| සමස්තය | | **2,662,585** | **2,928,315** | **3,221,068** | |

**3.6.** ප්‍රතිපාදන භාවිතයේ කාර්ය සාධනය

**රු. ,000**

| වෙන් කිරීම් වර්ගය | 2021 වෙන් කිරීම | | සැබෑ වියදම් (2021.12.31 දිනට) | වෙන්කිරීම් භාවිතය අවසාන ප්‍රතිපාදනයේ %ක් ලෙස (2021.12.31 දිනට) |
|---|---|---|---|---|
| | මූලික | අවසන් | | |
| පුනරාවර්තන | 12,208,580 | 12,186,580 | 11,187,759 | 92% |
| ප්‍රාග්ධනය | 480,800 | 502,800 | 187,961 | 37% |
| සමස්තය | **12,689,380** | **12,689,380** | **11,375,720** | |

**3.7. 208** වැනි මූල්‍ය වාර්තාව ප්‍රකාරව අමාත්‍යාංශයේ වියදම් සඳහා වූ ප්‍රතිපාදන ප්‍රදානය කිරීම

**රු. ,000**

| අනුක්‍රමික අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | වෙන් කිරීමේ අරමුණ | වෙන් කිරීම | | | සැබෑ වියදම | ප්‍රතිපාදන උපයෝජනය අවසාන ප්‍රතිපාදනයේ% ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | | මූලික | අවසන් වෙන් කිරීම | අවසන් වෙන් කිරීම | | |
| 001 | ජනාධිපති කාර්යාලය | VVIP සංචාර | | 23,885,138.00 | 23,885,000.00 | 24,757,000.00 | 104% |
| 002 | අග්‍රාමාත්‍ය කාර්යාල | 2021 මාර්තු 19-20 දිනවල පැවති රාජ්‍ය සංචාරය | | 35,684,102.55 | 35,684,000.00 | 35,402,000.00 | 99% |
| 005 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | VVIP සංචාර | | 2,579,205.00 | 2,579,000.00 | 2,579,000.00 | 100% |
| 101 | බුද්ධශාසන අමාත්‍යාංශය | ආගමික කටයුතු සඳහා වන වියදම් | | 3,719,493.57 | 3,719,000.00 | 3,709,000.00 | 100% |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | ආරක්ෂක සහයකගේ වියදම් | | 2,275,533.18 | 2,276,000.00 | ,341,000.00 | 59% |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | කියුබානු උපාධි අපේක්ෂකයින් සඳහා වන දීමනාව සහ සම්බන්ධීකරණ නිලධාරියාගේ වැටුප් ගෙවීම, යුනෙස්කෝවේ දායකත්වය | | 39,976,563.41 | 39,977,000.00 | 8,977,000.00 | 22% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 160 | පරිසර අමාත්‍යාංශය | VVIP සංචාර | | 1,709,760.00 | 1,710,000.00 | 1,753,000.00 | 103% |
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | මුහුදු මාර්ගයෙන් අතිරික්ත ගමන් මලු ගෙන්වීම, නීතිමය ගාස්තු සහ නිල වාහනයක් අලුත්වැඩියා කිරීම | | 34,880,062.73 | 34,880,000.00 | 27,996,000.00 | 80% |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | ඉන්ධන ප්‍රසම්පාදනය | | 11,814,250.00 | 11,814,000.00 | 11,748,000.00 | 99% |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | වාර්ෂික මූල්‍ය දායකත්වය – ඉන්ටර්පෝල් මහලේකම් කාර්යාලය | | 7,718,235.00 | 7,718,000.00 | 7,680,000.00 | 100% |
| 290 | ධීවර දෙපාර්තමේන්තුව සහ ARD | ධීවරයන් සියරට පැමිණවීම | | 7,331,275.77 | 7,331,000.00 | 7,227,000.00 | 99% |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | | 6,681,586.00 | 6,682,000.00 | 5,911,000.00 | 88% |
| 419 | කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය සංචාර හා අනෙකුත් වියදම් | | 8,652,000.00 | 8,652,000.00 | 8,652,000.00 | 100% |
| 423 | ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය | පරීක්ෂණ කට්ටල තොග සඳහා පිරිවැය | | 1,323,000.00 | 1,323,000.00 | 1,282,000.00 | 97% |

**3.8.** **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම පිළිබඳ කාර්ය සාධනය**

**රු.,000**

| **වත්කම් කේතය** | **කේතය පිළිබඳ විස්තරය** | **සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවලට අනුව 2021.12.31 දිනට ශේෂය** | **මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවලට අනුව 2021.12.31 දිනට ශේෂය** | **ගිණුම්කරණයට යොමු කළ යුතු** | **වාර්තාකරණයේ ප්‍රගතිය % ලෙස** |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහය | | 10,059,336,000 | - | 100% |
| 9152 | යන්ත්‍ර සහ උපකරණ | | 1,586,989,000 | - | 100% |
| 9153 | ඉඩම් | | 1,010,362,000 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 27,909,000 | - | 100% |
| 9155 | ජීවවිද්‍යාත්මක වත්කම් | | - | - | 100% |
| 9160 | සිදු කෙරෙමින් පවතින කටයුතු | | 55,985,000 | - | 100% |
| 9180 | බදු වත්කම් | | - | - | 100% |

### 3.9. 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

(රු. 000')

| කාණ්ඩය | 2021 ඇස්තමේන්තුගත | 2021 සැබෑ | හිඟය/අතිරික්තය | *විචල්‍යා වීමට ඉවහල් වූ ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම (අදාළ නම්) | **2,928,315** | **3,221,068** | | වසර අවසානය වන විට Covid-19 වසංගත තත්ත්වය අඩු වීම හේතුවෙන් අපේක්ෂිත ආදායම් වැඩිවීම |
| **සමස්ත වියදම** | **12,689,380** | **11,375,720** | | |
| පුනරාවර්තන | 12,186,580 | 11,187,759 | | 01. පවතින තත්ත්වය හේතුවෙන්<br>02. භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති උපදෙස් අනුව වියදම් පාලනය කිරීම |
| ප්‍රාග්ධනය | 502,800 | 187,961 | | 01. පවතින තත්ත්වය හේතුවෙන්<br>02. කැන්බරා සහ ස්ටොක්හෝම් දූත මණ්ඩලවල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ අපේක්ෂිත වියදම් නොලද හෙයින් ප්‍රතිසංස්කරණය සඳහා වන මූලික කටයුතු 2022 දී ආරම්භ කෙරේ.<br>03. භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති උපදෙස් අනුව වියදම් පාලනය කිරීම<br>04. ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ අනිවාර්ය ඉතිරිකිරීමේ හැකියාව පිළිබඳව මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීම |

*ආදායම් සහ වියදම්වල සැලකිය යුතු විචලනයන් සඳහා ඉවහල් වන ප්‍රධාන හේතු කෙටියෙන් මෙහි දැක්විය යුතු ය.

### 3.10 2021 ජාතික අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| අයවැය යෝජනා (අං) | යෝජනාව (කෙටියෙන්) | වෙන් කළ අරමුදල් | අපේක්ෂිත ප්‍රතිලාභය (අදාළ නම්) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | භෞතික % | මූල්‍ය % |
| **23** | විදේශීය ආර්ථික සබඳතා | **රුපියල් මිලියන 750.0 කි සටහන- 01 *** | **සටහන- 01 *** | නොමැත | නොමැත |

**සටහන- 01 *(කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි)**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/A/FM/01/FS/2021 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 අප්‍රේල් 2. දින

ලේකම්

විදේශ අමාත්‍යාංශය

**විදේශ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පත මේ සමග එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟ විය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේයැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින තුනක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුයි.

03. ඉහත සඳහන් දින තුනක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණුවලට ඔබ එකඟවූ ලෙස සලකා එම වාර්තාව පදනම් කරගෙන අවසන් වාර්තාව නිකුත් කිරීමට කටයුතු යොදන බව කරුණාවෙන් සළකන්න.

w. g. n. menike
ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

(රහසයයි) (කෙටුම්පත)

PAF/A/FM/01/FS/2021

ලේකම්

විදේශ අමාත්‍යාංශය

**විදේශ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මතය පසුව ඉදිරිපත් කරනු ලැබේ.

### 1.2 මතය සඳහා පදනම

පසුව ඉදිරිපත් කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව

(අ) පහත විෂයයන්ගේ වෙනස්කම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බවට

| විෂයය | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම රු. | පසුගිය වර්ෂයේ විගණන නිරීක්ෂණ අනුව දැක්විය යුතු වටිනාකම රු. | වෙනස රු. |
|---|---|---|---|
| (i)පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 10,370,961,874 | 10,061,370,232 | 309,591,642 |
| (ii)අත්තිකාරම් ගෙවීම් | 49,671,064 | 49,605,057 | 66,007 |
| (iii)භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම | 198,538,869 | 70,399,077 | 128,139,792 |

(iv) ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර හා මාරු කිරීම් රු. 437,731,433ක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එවැනි අගයක් දක්වා නොතිබුණු අතර, ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂයක් නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාළව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂය රු.943,415ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් වටිනාකම රු. 8,115,205 ක් වුවත් එම වටිනාකම රු. 8,106,458 ක් ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගලපා තිබුණි.

(ආ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් වටිනාකම රු. 304,973 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම වටිනාකම රු. 313,723 ක් ලෙස ගලපා තිබුණි.

### 1.6.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව රු. 2,094,037,896 ක් වූ තැන්පතු ලැබීම් වටිනාකම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 2,076,010,925 ක් ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ලැබීම් රු. 18,026,971 ක් අඩුවෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ගැලපීම් කර තිබුණි.

(ආ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු. 51,762,773 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව එම වටිනාකම රු. 51,771,520 ක් වූයෙන් අත්තිකාරම් ලැබීම් රු. 8,747 ක් අඩුවෙන් ගලපා තිබුණි. තවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව, අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 39,134,951 ක් වුවද, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ එම වටිනාකම රු. 39,143,701 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු.8,750 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ දැක්විය යුතු තැන්පතු ගෙවීම් රු. 2,073,640,054 ක් වුවද, එය රු. 2,050,025,630 ක් ලෙස සටහන් කිරීමෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 23,614,424 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි.

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව (SA -10) වාහන අත්පත් කර ගැනීම් රු. 21,206,909 ක් හා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම් රු. 42,208,832 ක් විය. එසේ වුවද, සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA -82) රු. 21,206,909 ක් වූ වාහන අත්පත් කර ගැනීම් සඳහන් කර නොතිබුණු අතර ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණවල වටිනාකම රු. 12,757,712 ක් පමණක් ඇතුළත් කිරීම හේතුවෙන් එම වටිනාකම රු. 29,451,120 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

#### 1.6.4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු. 10,837,484,562 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 11,183,873,316 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 346,388,754 ක් වැඩියෙන් ගැලපීම් කර තිබුණි.

(ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සහනාධාර හා මාරු කිරීම් රු. 470,003,154 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකමක් නොමැති ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 470,003,154 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි.

#### 1.6.4.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ රු. 187,030,142 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 63,415,742 ක් වූයෙන් රු. 123,614,400 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ විදේශ දූත මණ්ඩල 54 ක පුනරාවර්තන හා මූලධන වියදම | පුනරාවර්තන - 6,315,346,016<br>මූලධන - 91,171,076 | විදේශ දූත මණ්ඩල 13 කට අදාල පුනරාවර්තන හා මූලධන ගෙවීම් වවුචර් ගොනු කිහිපයක වටිකාකම් හැර අනෙකුත් ගෙවීම් වවුචර් ගොනු |
| (ආ) නොනිම් ගොඩනැගිලි | 55,984,547 | අයිතිය හා පැවැත්ම තහවුරු කිරීමේ ලේඛන |
| (ඇ) තැන්පතු | 1,452,471,015 | ඉකුත් වර්ෂයේ ශේෂයන් සමග සැසඳුම් ප්‍රකාශ |
| (ඈ) අත්තිකාරම් ලැබීම් | 43,380,027 | |
| (ඉ) කාර්යාල ගොඩනැගිලි | 9,730,692,636 | එක් එක් වත්කමක් වෙන්ව හඳුනාගත හැකි ස්ථාවර වත්කම් ලේඛණය |
| (ඊ) මගී වාහන | 1,055,280,776 | |
| (උ) මිශ්‍ර නාගරික දේපල | 1,010,362,062 | |
| (ඌ) නිල නිවාස | 317,741,508 | |
| (එ) වාහන අපහරණය | 39,119,254 | |
| (ඒ) වත්කම් අත්පත් කර ගැනීම් | 63,415,740 | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 28 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුළු වටිනාකම රු. 561,669,027 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් "බී" ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයට අනුව නිලධාරීන් 24 දෙනෙකුගෙන් වැඩිපුර අය කරගන්නා ලද රු. 215,322 ක ශේෂයක් පැවති අතර එම ශේෂය වාර්තාවේ දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) සේවය හැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,098,606 ක ශේෂයක් අයවිය යුතුව පවතින අතර එම ණය ශේෂය තුළ වර්ෂ 2-3 ත් අතර ශේෂය රු. 435,660 ක්ද වර්ෂ 4-5 ත් අතර ශේෂය රු. 127,275 ක් සහ වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු. 535,671 ක් ලෙසද පැවතුණි.

(ඇ) වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන සේවය අවසන් කළ නිලධාරීන් 5 දෙනෙකුට අදාළව රු. 299,955 ක ණය ශේෂයක් පැවති අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු. 130,551 ක්ද මුදලක් අයවිය යුතුව පැවති අතර එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සටහන් අංක iii යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය (SA - 92) සමඟ සැසඳී තිබිය යුතු වුවද බැඳීම් හා බැරකම් ප්‍රකාශ සටහන් අංක iii යටතේ රු. 115,320,800 ක් දක්වා තිබූ අතර SA – 92 අනුව එම ශේෂය රු. 250,194,868 ක් විය.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හෝ විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i). xix පරිච්ඡේදයේ 5.2.5 වගන්තිය | රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් අවිවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 7 ½ ක මාසික නිවාස කුලියක් අය කළ යුතු වුවත් නිලධාරීන් 7 දෙනෙකුගෙන් ඊට අනුකූල නොවන ලෙස සියයට 12 ½ ක මාසික නිවාස කුලියක් අය කර තිබුණි. |
| (ii) xix පරිච්ඡේදයේ 8.1, 8.2 වගන්තීන් | රජයේ නිවාසවල විදුලි උපකරණ පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද, නිවාසයේ නඩත්තුව පිළිබඳ වගකීම පැවරී ඇති බලධරයන් අනෙකුත් උපකරණ හා සවිකිරීම් යනාදිය පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද තබා ගත යුතු වුවත් විදේශ අමාත්‍යාංශයේ රජයේ නිවාස වලට අදාළව එවැනි ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i). මුදල් රෙගුලාසි 104 | වර්ෂ 01ක සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක් ගත වී තිබුණු රු. 3,990,669 ක් වූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් හා 2010 වර්ෂයේදී සිදුව තිබූ රු. 1,991,695 ක් වූ වාහන සොරකම් කිරීම් |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii). | මුදල් රෙගුලාසි 104 (i) | පාඩුවක් හෝ අලාභයක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ පැවැත්විය යුතු වුවත් වර්ෂ 01ක සිට වර්ෂ 05ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 05 කට අදාළව රු. 403,777 ක භාණ්ඩ නැතිවීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii). | මුදල් රෙගුලාසි 106 | ඌනතාවයක්, අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා මුදල් නැතිවූ විටක ඒ නැති වූ මුදල වහාම පූරණය කල යුතු වුවත් වර්ෂ 09ක සිට වර්ෂ 15ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 5 කට අදාලව මුදල් නැතිවීම් රු. 17,201,664 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iv). | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිමයන් එය දෙන කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් විදේශ දූත මණ්ඩල 12 කට අදාළව දෙන ලද නොපියවූ අත්තිකාරම් එකතුව රු. 1,804,674 ක් වර්ෂ 7 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. |
| (v). | මුදල් රෙගුලාසි 565 (2) | ලැබුණ හෝ ගෙවූ තැන්පතු සියල්ලක්ම පොදු තැන්පතු ගිණුම් යටතේ දිනපතා ඇතුළත් කළ යුතු වුවද විදේශ දූත මණ්ඩලවලට අදාළ පොදු තැන්පතු ගිණුම්වල ආරම්භක ශේෂයන්ගෙන් වර්ෂය තුළ කරන ලද ගෙවීම් විගණිත දිනය වන 2022 අප්‍රේල් මස 05 දින වන විටත් සටහන් කර නොතිබුණි. |
| (vi). | මුදල් රෙගුලාසි 565 (3) | තැන්පතු ලෙජරයේ අවසාන පිටු කිහිපය තුලන ගිණුමක් සඳහා අනිවාර්යයෙන්ම වෙන්කර, ඉකුත් |

| | |
|---|---|
| | මාසයේ ඉදිරියට ගෙනා ශේෂයද මාසයට අදාළ සියලුම දෛනික ලැබීම් හා ගෙවීම්වල එකතුවද සටහන් කර තුලන ගිණුම ශේෂ කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ තැන්පතු ගිණුම් සඳහා එසේ තුලන ගිණුම් සකස් කර නොතිබුණි. |
| (vii). මුදල් රෙගුලාසි 565(5) | එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (viii). මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් රු. 32,601,682 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ඔක්තෝම්බර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තු චක්‍රලේඛයෙහි 4.3 (ඉ) (i) හා (ii) | චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද එපරිදි අයකර නොගත් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හඳුනා නොගත් රු. 1,499,176 ක ණය ශේෂයක් පැවතුණි. |
| (ඇ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විශ්‍රාම ගනු ලබන හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් කඩිනමින් පියවිය යුතු වුවත් මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 465,050 ක ණය ශේෂයක් පැවති අතර ඉන් රු. 273,560 ක ණය ශේෂයක් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවතුණි. |
| (ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් |

ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි.

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුම

(i). 2013 අග්‍රිම ගිණුම් ශේෂය ඉකුත් වර්ෂයේදී රු. 91,530,099 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු. 89,919,237 ක් වී තිබුණු අතර, වර්ෂය තුළ රු. 1,610,863 ක් එනම් 1.7% ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණක් නිරවුල් කර තිබුණි.

(ii).

- 2013 වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට අදාළ නොපියවූ අත්තිකාරම් වලින් රු. 89,919,237 ක් වූ අග්‍රිම ශේෂයේ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 248ක් සඳහා ගෙවූ අත්තිකාරම් රු. 60,051,898 කින් සමන්විත වී තිබුණි. එම නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 248 න් රු. 478,980 ඇප තැන්පතුව හැර රු. 59,572,918 ක් වූ ඉතිරි නිවාස ඇප තැන්පතු 247 ක්ම මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වී තිබුණි.

- භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වටිනාකමින් රු. 12,440,021 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු. 43,292,731 ක් වර්ෂ 10 ක් වර්ෂ 20 ක් අතරද, රු. 3,840,166 ක් වූ ඉතිරිය වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 250 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(iii). අග්‍රිම ගිණුම් ශේෂය වූ රු. 89,919,237 තුළ ඇතුළත් රු. 29,867,341 ක් වටිනා තත් කාර්යය අතුරු අග්‍රිම 127 ක් පැවති අතර ඉන් රු. 699,358 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබූ අතර රු. 12,840,889 ක් වර්ෂ 10-20 ත් අතරද ඉතිරි රු. 16,327,094 ක් වර්ෂ 07 ඉක්මවා තිබුණි. මු.රෙ. 371 ප්‍රකාරව තත් කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මෙම අත්තිකාරම්වලින් 72 ක් කුමන කරුණක් සඳහා ලබා දී ඇතිද යන්න තහවරු කර ගැනීමට නොහැකි වුණි.

(ආ). 7002-0-0-035/21 දරන අග්‍රිම ගිණුම

(i). සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 919,382,691 ක් වූ අග්‍රිම ගිණුම් ශේෂය තුළ දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් රු. 365,235,118 ක් වූ අතර එම වටිනාකමින් රු. 344,210,756 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වී තිබුණි.

(ii). විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වලින් රු. 19,536,652 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 46 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු. 3,020,376 ක් වර්ෂ 10 ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු. 16,516,276 ක් වර්ෂ 04-10 ත් අතර කාල පරාසයක් ගත වී තිබූ තැන්පතු විය.

(iii). දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් තුළ රු. 21,024,362 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර ඒ තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. 3,931,910 ක් ද 2019 වර්ෂයට අදාළ රු. 2,433,646 ක් හා 2020 වර්ෂයට අදාළ රු. 4,272,499 ක් ද විය. එම තත්කාර්යය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් මු.රෙ. 371 හි සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පත් කළ නමුත් බැර නොකළ චෙක්පත්

පහත සඳහන් දූත මණ්ඩල බැංකුව වෙත සිදුකරන ලද තැන්පත් කිරීම් විගණන දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි. ඒ සඳහා වර්ෂ 03-11 දක්වා කාලයක් ගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| දූත මණ්ඩලය | ගිණුම් අංකය | මුදල් ඒකකය | චෙක්පත් ගණන | වටිනාකම | විස්තරය(අදාළ වර්ෂය) |
|---|---|---|---|---|---|
| කැන්බරා | 012984004427941 | ඕ . ඩො | 3 | 402 | 2010 හා 2011 |
| බර්ලින් | 100700000237745500 | යූරෝ | 1 | 110 | 2017 |

(ආ) මුදල් වංචා / සොරකම් කිරීම්

පහත සඳහන් දූත මණ්ඩලවල විගණනයට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ තුළ මුදල් වංචා සහ සොරකම් ලෙස දක්වා තිබූ පහත සිදුවීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

| දූත මණ්ඩලය | ගිණුම් අංකය | මුදල් ඒකකය | වටිනාකම | විස්තරය |
|---|---|---|---|---|
| ලොස් ඇන්ජලිස් | 7260025932 | ඇ. ඩො | 1,583 | 2011 වර්ෂයේ සොරකම් කිරීම් ලෙස සඳහන්ව තිබුණි. |
| මොස්කව් | 40807840800000000255 | ඇ. ඩො | 105 50 | 2002 හා 2003 වර්ෂවල තැන්පත් නොකරන ලද මුදල් ලෙස දක්වා තිබුණි |

## 2.7 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධි විධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come)ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් වන අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණද වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මඟින් සපයන සේවාවන් සඳහා අය කරන ගාස්තු සංශෝධනය කර ගැසට් පත්‍රයක් පළ කිරීමට සැලසුම් කර තිබුණද එය ඉටු කර නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. 70,638,545 ක මුදලක් ගෙවා තිබුණද ඉන් නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වැඩසටහන් අංක 02 යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයන්හි සිද්ධීන් 55 කට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති රු. 29,185,385 ක පාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණය අනුව එම වටිනාකමින් රු.2,254,421 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු.21,626,285 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ දූත මණ්ඩල පවතින ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ තානාපති කාර්යාල සඳහා කාර්යය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 318 | 183 | 135 | |
| තෘතියික මට්ටම | 08 | 01 | 07 | |
| ද්විතීයික මට්ටම | 369 | 398 | | 29 |
| ප්‍රාථමික මට්ටම | 125 | 117 | 08 | |
| | 820 | 699 | 150 | 29 |

ද්විතියික මට්ටමට අයත් අනුමත සේවක සංඛ්‍යාව 369 තුළ ඇතුළත් සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පිළිවෙලින් 74ක් හා 169 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 86 ක් හා 207 ක් වූයෙන් අතිරික්තය 12 ක් හා 38 ක් විය.

(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ xiii වැනි පරිච්ඡේදයේ 154 වගන්තිය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන බවත් එහි 157 වගන්තිය අනුව රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත සේවයේ යෙදවිය හැක්කේ කොන්ත්‍රාත් පදනම මත පමණක් වන බවත් එවැනි පත්කිරීමක් එක් අවස්ථාවකදී එක් අවුරුද්දක කාල පරිච්ඡේදයකට සීමා කළ යුතු වුවද ටොරෙන්ටෝ විදේශ දූත මණ්ඩලයේ සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුර සඳහා 2019 අගෝස්තු 28 දින විශ්‍රාම ලත් නිලධාරිනියක 2019 සැප්තැම්බර් 01 දින සිට වසර 03 ක කාලයක් බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පත් කර තිබුණි.

විගණකාධිපති

*මෙම කෙටුම්පතෙහි අවසන් විගණකාධිපති වාර්තාව (සිංහල පිටපත) සමස්ථ වාර්තාව අවසානයෙහි අමුණා ඇත.

## 04 වැනි පරිච්ඡේදය

### කාර්ය සාධන දර්ශක

**අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

**ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු තුළින් විදේශයන් තුළ ශ්‍රී ලංකාවේ ජාතික උනන්දුව ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා, 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල සාරාංශය.**

විශේෂයෙන් සිය නියෝජන භූමිකාව, සන්ධාන කාර්යයන් සහ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතාවල විවිධ මට්ටම් සහ රාජ්‍යතාන්ත්‍රික කටයුතු සම්බන්ධ සංවේදී ස්වභාවයේ කරුණු අනුව අමාත්‍යාංශය සහ දූත මණ්ඩල විසින් ඉටු කරනු ලබන කාර්යයන් බොහෝ දුරට අස්පෘශ්‍ය ස්වභාවයක් ගනී.

ක්‍රියාකාරී සැලැස්මට අනුව, අමාත්‍යාංශයේ දිගුවක් වන අංශ සහ දූත මණ්ඩල මගින් ශ්‍රී ලංකාව නැඟී එන ආර්ථිකයක් ලෙස ඵලදායී ලෙස ස්ථානගත කිරීමටත්, කලාපීය සහ ගෝලීය ආර්ථික ක්‍රියාකරුවන් සමඟ ආර්ථික, ආයෝජන, රැකියා, සංචාරක සහ වෙළඳ සබඳතා වර්ධනය කිරීමටත් ඉන්දියන් සාගරය තුළ ශ්‍රී ලංකාවේ අද්විතීය භූ-උපායමාර්ගික පිහිටීම ප්‍රයෝජනයට ගනිමින් උපායමාර්ගික කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ ව්‍යාප්තිය ස්ථාපිත කෙරෙන ක්‍රියාකාරී සැලසුම් ආරම්භ කිරීමටත් අපේක්ෂා කරන ලදී. පහත සඳහන් ප්‍රමුඛතා ක්ෂේත්‍ර මත පදනම්ව අයවැය ප්‍රතිපාදන ඉල්ලීම්වලට අනුකූලව 2021 වසර සඳහා කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට ද දූත මණ්ඩල/කාර්යාල බලාපොරොත්තු විය:

- ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික) - විදේශ රැකියා, සංචාරක, අපනයන සහ ස්ථිර සෘජු ආයෝජන සම්බන්ධයෙන් අදාළ රේඛීය ආයතනවලින් ලැබුණු ඉලක්ක මත පදනම්ව, ආර්ථික කටයුතු අංශය විසින් වෙන් වෙන් වශයෙන් ආර්ථික ඉලක්ක සකස් කරන ලදී.
- දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)
- ආරක්ෂක සහයෝගීතාව
- මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු
- කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන්
- සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මිනිසුන් අතර සබඳතා
- විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු
- මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය
- වෙනත්

| ප්‍රමුඛ අවධානයක් යොමු කෙරෙන අංශ/ප්‍රධාන කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානයන් | | |
|---|---|---|---|
| | **100%-70%** | **70%-40%** | **40%** ට අඩු |
| බහුපාර්ශ්වික වේදිකාවල ශ්‍රී ලංකාවේ නියෝජනය වැඩිදියුණු කිරීම | | | |
| කලාපීය සංවිධාන සමඟ සම්බන්ධ වීම | | | |
| ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික සංචාර ඉහළ නැංවීම | | | |
| ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන/ඒකාබද්ධ කමිටු/ රැස්වීම්/ සාකච්ඡා ගණනාවක් පැවැත්වීම | | | |
| විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන් සමඟ පවත්නා සබඳතා සමඟ ඉහළ නැංවීම | | | |
| කොවිඩ්-19 සහායකයින් පිළිබඳ ස්පෘශ්‍යා ක්‍රියාකාරකම් | | | |
| කොවිඩ්-19 හමුවේ නැවත සියරට පැමිණවීම් සංඛ්‍යාව | | | |
| විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන්ට සහය වීම | | | |
| සෞඛ්‍ය රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ සහයෝගීතාව ඉහළ නැංවීම | | | |
| අමාත්‍යාංශයේ උපායමාර්ගික සන්නිවේදන ප්‍රවේශය යටතේ මූලපිරීම් සංඛ්‍යාව | | | |
| ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව | | | |
| ජනමාධ්‍ය සමඟ පැවැත්වූ නිරතවීම්(විදේශයන් තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ඵලදායීත්වය) | | | |
| වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | * | |
| සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | * | |
| අපනයන ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | * | |
| ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | * | |
| 'නව සාමාන්‍ය' තත්ත්වය හමුවේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු යටතේ සිදු කළ මූලපිරීම් සංඛ්‍යාව | | | |
| ආරක්ෂක සහයෝගීතාව වැඩිදියුණු කිරීම සහ ආරක්ෂාව සම්බන්ධ කටයුතු වැඩිදියුණු කිරීම | | | |
| සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | * | |
| ශ්‍රී ලාංකිකයන් සඳහා ලබා දුන් ශිෂ්‍යත්ව අවස්ථා /විදේශ අධ්‍යාපන බලධාරීන් සමඟ සිදු කළ නිරතවීම් සම්බන්ධවීම් | | | |
| විද්‍යා හා තාක්ෂණ සහයෝගිතාව වැඩිදියුණු කිරීම | | | |
| කොන්සියුලර් සේවා සහ කම්කරු සුභසාධනය යටතේ සිදු කළ මූලපිරීම් සංඛ්‍යාව | | | |
| මානව සම්පත් ඉහළ නැංවීම්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය | | | |

* පෙර සැලසුම් කළ බොහෝ භෞතික වැඩසටහන්, වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. ඇතැම් වැඩසටහන් අතථ්‍ය අයුරින් පවත්වන ලදී.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) ප්‍රතිශත සාක්ෂාත් කරගැනීම

## හරස් කැපුම් ක්ෂේත්‍ර සහිත අංශ

| එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| <u>දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු</u><br><u>මානව හිමිකම්</u><br>- පෙබරවාරි, ජූනි සහ සැප්තැම්බර් මාසවල මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී සිදු කළ සැලකිය යුතු මැදිහත්වීම් සහ දායකත්වයන් සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉදිරිපත් කළ රැස්වීම්/සිදුවීම් සංඛ්‍යාව<br>- මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේදී සහාය දක්වන/ සම අනුග්‍රහය දක්වන යෝජනා සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ ආවර්තක වාර්තා ඉදිරිපත් කිරීම් (CEDAW, CMW, ICESCR, ICCPR, ICED, CAT)<br>- විශේෂ වාර්තාකරුවන්ගේ මෙරට සංචාර<br>- ශ්‍රී ලංකාව පිළිබඳ UPR නිර්දේශ මත සිදු කරන ලද පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව (MFA මෙම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරනු ඇත); | | 80% | |
| **මානුෂීය කටයුතු**<br>- **UNHCR -** පවත්වන ලද අන්තර්ක්‍රියා සංඛ්‍යාව සහ ප්‍රතිඵල<br>- **ICRC -** පවත්වන ලද අන්තර්ක්‍රියා සංඛ්‍යාව සහ ප්‍රතිඵල | | | 70% |
| **එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවේ 76 වැනි සැසි වාරය**<br>- 2021 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල සමුළුවේ 76 වැනි සැසිවාරයේ ඉහළ පෙළේ කොටස සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිවරයා / විදේශ අමාත්‍යවරයා සහ නියෝජිත පිරිස සාර්ථකව සහභාගී වීම.<br>- 76 වැනි සැසියේදී ඉදිරිපත් කරන ලද මැදිහත්වීම් / ප්‍රකාශ සංඛ්‍යාව<br>- 76 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව විසින් සහාය දක්වන ලද මූල පිරීම් / යෝජනා සංඛ්‍යාව. | | 85% | |
| **සමාන අදහස් ඇති අනෙකුත් කණ්ඩායම්වල දී ශ්‍රී ලංකාව**<br>**NAM -** සම්බන්ධීකරණ රැස්වීම් සංඛ්‍යාව<br>- මැදිහත්වීම් සකස් කිරීම<br>- ශ්‍රී ලංකාව විසින් අනුග්‍රහය දැක්වූ මූලපිරීම් සංඛ්‍යාව<br>**G 77 -** සම්බන්ධීකරණ රැස්වීම් සංඛ්‍යාව<br>- මැදිහත්වීම් සකස් කිරීම<br>- ශ්‍රී ලංකාව විසින් අනුග්‍රහය දක්වන මූලපිරීම් සංඛ්‍යාව | | 80% | |
| **අපේක්ෂකත්ව**<br>- එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික සහයෝගීතාව ගැඹුරු කිරීමට දායක වන ශ්‍රී ලංකාව විසින් සහාය දක්වන වෙනත් රටවල අපේක්ෂකත්ව සංඛ්‍යාව,<br>- අපේක්ෂක දත්ත සමුදාය යාවත්කාලීන කෙරිණි<br>- ශ්‍රී ලංකා අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති මූලපිරීම් සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සඳහා සුරක්ෂිත කර ඇති අන්‍යෝන්‍ය විධිවිධාන සංඛ්‍යාව | 90% | | |
| **සාමය ආරක්ෂා කිරීම**<br>- භට පිරිස් කාලානුරූපව යෙදවීම සහ සැපයුම් බෙදා හැරීම<br>- PK යෙදවීම් සම්බන්ධ ද්විපාර්ශ්වික කාරණා සම්බන්ධයෙන් DPKO සමඟ සිදු කළ සංඛ්‍යාව<br>- බහුපාර්ශ්වික PK සංවාදවල නිරතවීම් සංඛ්‍යාව | | 75% | |

| | | | |
|---|---|---|---|
| **ජාත්‍යන්තර සංසදවලදී ශ්‍රී ලංකාවේ නියෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම**<br>- 2021 වර්ෂය තුළ සකස් කර නිකුත් කරන ලද අක්තපත්‍ර සංඛ්‍යාව | 100% | | |
| **ආරක්ෂක සහයෝගීතාව**<br>**නිරායුධකරණය සහ ප්‍රගුණනය නොකිරීම**<br>- ශ්‍රී ලංකාව නියෝජනය කළ රැස්වීම් සංඛ්‍යාව<br>- සිදු කරන ලද මැදිහත්වීම් සංඛ්‍යාව.<br>- ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මූලපිරීම් සංඛ්‍යාව<br>- අනෙකුත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් සහාය දක්වන ලද මූලපිරීම් සංඛ්‍යාව (සම අනුග්‍රාහකත්වය, ඡන්දය ප්‍රකාශ කිරීම)<br>- ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සංඛ්‍යාව<br>- අදාළ බිම්බෝම්බ තහනම් කිරීමේ කමිටුව සහ ජාතික බිම් බෝම්බ ක්‍රියාකාරී මධ්‍යස්ථානය සමඟ පවත්වන ලද උපදේශන සංඛ්‍යාව<br>- එක් එක් නීති සම්පාදන පියවර මත සිදු කරන ලද පසු විපරම් සංඛ්‍යාව<br>- සකසන ලද සහ ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය<br>- නිරායුධකරණ සම්මුතීන්ට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br>- ශ්‍රී ලාංකිකයන් සඳහා ලබා දී ඇති අනුග්‍රාහකත්ව සංඛ්‍යාව | 90% | | |
| **සෞඛ්‍ය රාජ්‍යතාන්ත්‍රික කටයුතු (බහුපාර්ශ්වික)**<br>- PRUN/ජිනීවා හරහා ශ්‍රී ලංකාව නියෝජනය කළ රැස්වීම් සංඛ්‍යාව,<br>- සිදු කරන ලද මැදිහත්වීම් සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත සම්බන්ධීකරණය කර උපදෙස් යවා ඇති තනතුරු / ප්‍රතිපත්ති සංඛ්‍යාව<br>- ඉදිරිපත් කළ ප්‍රකාශ සංඛ්‍යාව.<br>- සම අනුග්‍රහය දක්වන/සහාය දක්වන යෝජනා / ඒකාබද්ධ මූලපිරීම් සංඛ්‍යාව. | | 80% | |
| **<u>ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (බහුපාර්ශ්වික සංසද)</u>**<br>**තිරසාර සංවර්ධන ඉලක්ක කිරීම**<br>- සම්බන්ධීකරණය කරන ලද රැස්වීම් සංඛ්‍යාව<br>- ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් සංඛ්‍යාව<br>**FAO සහ WFP**<br>- සම්බන්ධීකරණය කරන ලද මූලපිරීම් සංඛ්‍යාව<br>- සම්බන්ධීකරණය කරන ලද රැස්වීම් සංඛ්‍යාව | | 85% | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු- යුනෙස්කෝ**<br>-වැඩසටහන්, මූලපිරීම් සහ වාර්තා සංඛ්‍යාව<br>- සම්බන්ධීකරණය කළ ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව<br>- සම්බන්ධීකරණය කරන ලද නාමයෝජනා සංඛ්‍යාව | | 80% | |

| ආර්ථික කටයුතු අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික)**<br>- ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- රැස්වීම් පවත්වන ලදී<br>- සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී<br>- ශ්‍රී ලංකා තානාපතිවරුන්ගේ සාකච්ඡා<br>- අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා | | 85% | |

| සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය තුළ සාගර කටයුතු සම්බන්ධයෙන් නිශ්චිත අවධානයක් ලබා දීම**<br>- දේශීය හා ජාත්‍යන්තර නියෝජිතායතන සහ චින්තන මණ්ඩල සමඟ පැවැත්වීමට නියමිත සාකච්ඡා/ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>- වෙබිනාර් සාකච්ඡාවට පෙර අතථ්‍ය අයුරින් පැවැත්වීමට නියමිත සූදානම් වීමේ සාකච්ඡා සංඛ්‍යාව.<br>- IORA, අරමුදල් සපයන ආයතන සහ රාජ්‍ය රේඛීය ආයතන සමඟ මෙම අංශය මඟින් පහසුකම් සැලසිය යුතු සාකච්ඡා සංඛ්‍යාව.<br>- මෙම අංශය විසින් පවත්වනු ලබන පාර්ශවකරුවන්ගේ රැස්වීම් සංඛ්‍යාව.<br>- MSR මාර්ගෝපදේශ සහ රෙගුලාසි අනුගමනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා නීති අංශය සමඟ ගත යුතු පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව.<br>- මෙම අංශය මඟින් පහසුකම් සපයන ජාතික සබ්මැරීන් කේබල් ප්‍රත්‍යස්ථතා සැලැස්මක් සංවර්ධනය කිරීම සඳහා නේවාසික වැඩමුළු දෙකක් පවත්වන ලදී.<br>- ක්‍රියාවලිය ආරම්භ කිරීම සහ ප්‍රක්ෂේපණය කිරීම සඳහා මෙම අංශය විසින් ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව<br>- මෙම අංශය මගින් පහසුකම් සැලසීමට නියමිත අතුරු කමිටුව සඳහා යෝජිත අදාළ ආයතන සමඟ පැවති රැස්වීම්/සාකච්ඡා සංඛ්‍යාව | 91% | | |
| **ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ පරිසරය සහ දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් නිශ්චිත අවධානයක් ලබා දීම**<br>- ජාත්‍යන්තර සහ දේශීය පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන් පවත්වනු ලබන රැස්වීම්, ක්‍රියාකාරකම්, වැඩසටහන් සංඛ්‍යාව සඳහා මෙම අංශය මඟින් පහසුකම් සලසනු ලැබේ.<br>- ශ්‍රී ලංකාව සත්කාරකත්වය දරන 1 වැනි සහ 2 වැනි MELAG රැස්වීම්වල පසු විපරම් ක්‍රියා සංඛ්‍යාව.<br>- විෂය ක්ෂේත්‍රයට අදාළ වත්මන් ගැටළු, කඩොලාන ආරක්ෂා කිරීම පිළිබඳ හොඳම භාවිතයන්, ධාරිතා වර්ධනය සහ විද්‍යාත්මක තොරතුරු බෙදාහදා ගැනීමට පාර්ශවකරුවන්ට මෙම අංශය මඟින් පහසුකම් සපයන ලද අවස්ථා සංඛ්‍යාව.පුද්ගල සාකච්ඡාවලට පෙර සූදානම් වීමේ ක්‍රියාකාරකම් ගණනාවක් අතථ්‍ය අයුරින් පැවැත්වීම.<br>- ශ්‍රී ලංකාවේ රේඛීය ආයතන සමඟ පැවැත්වෙන සූදානම් වීමේ රැස්වීම් ගණනාව සඳහා මෙම අංශය මඟින් පහසුකම් සපයනු ලැබේ.<br>- මෙම අංශය මඟින් පහසුකම් සපයන සාකච්ඡා සහ රැස්වීම් සංඛ්‍යාව.<br>- CLiP වැඩසටහනේ අරමුදල් සම්පත් වෙත සම්බන්ධ කිරීම සඳහා සාකච්ඡා ගණනාවක් හරහා දේශීය පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම<br>- ISA විසින් පවත්වනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හරහා ISA මූලස්ථානය සමඟ සන්නිවේදනය කිරීමේ කේන්ද්‍රස්ථානයට පහසුකම් සැලසීම.<br>- ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා ලබාගත් අවස්ථා/සම්බන්ධතා සංඛ්‍යාව<br>- දේශගුණික අරමුදල් සඳහා ශ්‍රී ලංකාව සඳහා ලබා ගත් අවස්ථා සංඛ්‍යාව. | 95% | | |

| ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධන අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **ප්‍රතිපත්ති අරමුණු, ප්‍රමුඛතා, ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධක දර්ශක**<br>- අංශ/දූත මණ්ඩල සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කාලෝචිත ලෙස සකස් කිරීම | 100% | | |
| **කාර්ය සාධනය ඇගයීම සහ අධීක්ෂණය**<br>- අංශ/දූත මණ්ඩල සමඟ සිදු කළ සන්නිවේදන සංඛ්‍යාව<br>- නියමිත වේලාවට වාර්තා සම්පූර්ණ කිරීම සහ ඉදිරිපත් කිරීම | 100% | | |
| **මානව සම්පත් සංවර්ධනය**<br>- විවෘත තරඟ විභාග පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය පිළිබඳව සාකච්ඡා කිරීමට/සංවිධානය කිරීමට/අවසන් කිරීමට පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වී සිදු කළ නිරතවීම් සංඛ්‍යාව.<br>- LFS සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍රය නිකුත් කිරීම | | 75% | |
| **ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සහ ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටළු පිළිබඳ සාකච්ඡාව**<br>- පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන සමඟ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව.<br>- මෙම කාරණය සම්බන්ධයෙන් පත් කරන ලද අභ්‍යන්තර කමිටුව සමඟ කැඳවා ඇති රැස්වීම් සංඛ්‍යාව | | | 60% |
| **ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සහ දීප ව්‍යාප්ත සේවාවන්ට සමගාමීව, නව ප්‍රවර්ධන යෝජනා ක්‍රමයට අදාළ ගැටළු පිළිබඳ සාකච්ඡාව**<br>- මෙම කාරණය සම්බන්ධයෙන් පත් කරන ලද අභ්‍යන්තර කමිටුව සමඟ කැඳවා ඇති රැස්වීම් සංඛ්‍යාව | | | 50% |
| **පුහුණුවීම් සහ සංවර්ධනය**<br>- ශ්‍රී ලංකාවට පිරිනමන ලද පුහුණුවීම් සංඛ්‍යාව;<br>- විදේශ පුහුණුවීම් සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සංඛ්‍යාව;<br>- විදේශ පුහුණුවීම් සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන නිලධාරීන් සංඛ්‍යාව.<br>- ශ්‍රී ලංකාවට පිරිනමන ලද පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සංඛ්‍යාව.<br>- 01 වැනි සහ 02 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම සඳහා වන ගැසට් නිවේදනය පිළිබඳව සාකච්ඡා කිරීමට/සංවිධානය කිරීමට/අවසන් කිරීමට පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වූ නිරතවීම් සංඛ්‍යාව;<br>- පසු විපරම් සංඛ්‍යාව; විභාගය පැවැත්වීම<br>- පුහුණුවීම් සඳහා සහභාගී වූ තානාපතිවරුන්/නම් කළ මහ කොමසාරිස්වරුන් සංඛ්‍යාව.<br>- සංවිධානය කරන ලද දේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව.<br>- පුහුණුව ලැබූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සංඛ්‍යාව.<br>- සහභාගී වූ දූත මණ්ඩල ප්‍රධානීන්/දූත කාර්යාල ප්‍රධානීන් සංඛ්‍යාව | | 80% | |
| **ප්‍රතිපත්ති පර්යේෂණ**<br>- සකසන ලද පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව<br>- සංවිධානය කරන ලද වෙබිනාර් සාකච්ඡා/දුඹුරු මළු/සාකච්ඡා සංඛ්‍යාව | | 80% | |
| **වඩා හොඳ ඵලදායිතාවයක් ලබාගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න වැඩ කරන පරිසරයක් නිර්මාණය කිරීම**<br>- පහසුකම් හිමි වූ නිලධාරීන් සංඛ්‍යාව. | | | 40% |

| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **දේශීය මාධ්‍ය, විදේශීය මාධ්‍ය සහ වෙබ් ප්‍රවෘත්ති නිරීක්ෂණය කිරීම**<br>- අමාත්‍යාංශයේ සහ සියලුම දූත මණ්ඩලවල සියලුම නිලධාරීන් සඳහා දෛනික පුවත් ජනනය කිරීම/සම්පාදනය/ප්‍රචාරය කිරීම<br>- මෙයට සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවල ප්‍රවෘත්ති නිරීක්ෂණය කිරීම ඇතුළත් වේ. දෛනික පදනමින් පැන නගින ඕනෑම වැදගත් ප්‍රවෘත්තියක් පැය 24 පුරා නිරීක්ෂණය කිරීම ද මීට ඇතුළත් වේ.<br>- විදේශ ලේකම්වරයා, ගරු කලාපීය හා ජාත්‍යන්තර සහයෝගිතා රාජ්‍ය අමාත්‍යවරයා සහ ගරු විදේශ අමාත්‍යවරයා වෙත සඳහා දෛනික පුවත් වාර්තාව ලබා දීම.<br>- මෙම වාර්තාව සති අන්තවල සහ රජයේ නිවාඩු දිනවලද සකස් කර ඇත. (24/7 සහ දින 365 පුවත් අධීක්ෂණය)<br>- අමාත්‍යාංශය / දූත මණ්ඩල විසින් නිකුත් කරන ලද ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | 90% | | |
| **මාධ්‍ය නිවේදන, ප්‍රකාශ, දූත මණ්ඩල පුවත් හා නිවේදන දේශීය මුද්‍රිත සහ මාර්ගගත මාධ්‍ය සහ විදේශ මාධ්‍ය වාර්තාකරුවන්ට බෙදා හැරීම**<br>- විවිධ වේදිකාවල ප්‍රකාශනය සඳහා මාධ්‍ය වෙත බෙදා හරින ලද මාධ්‍ය නිවේදන සංඛ්‍යාව | 95% | | |
| **ශ්‍රී ලංකාව තුළ විදේශ මාධ්‍ය ආවරණය සඳහා පහසුකම් සැලසීම (මාධ්‍යවේදීන්ගේ සහ චිත්‍රපට කාර්ය මණ්ඩලයේ සංචාරවලට සහාය වීම)**<br>- පැමිණි විදේශ මාධ්‍යවේදීන් සංඛ්‍යාව සහ නිකුත් කළ මාධ්‍ය ප්‍රතීතන ලිපි සංඛ්‍යාව<br>- රේගු නිෂ්කාශනය පහසු කිරීම සඳහා නිකුත් කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව<br>- පැමිණි මාධ්‍යවේදීන් විසින් නිෂ්පාදනය කරන ලද වාර්තා චිත්‍රපට සහ චිත්‍රපට සංඛ්‍යාව<br>- මාධ්‍ය නිලධාරීන්ගේ ආවරණය සඳහා පහසුකම් සැලසීමේදී අදාළ රේඛීය ආයතනවලින් ලැබුණු අනුමත කිරීම් සංඛ්‍යාව | | 85% | |
| **ශ්‍රී ලංකාව වෙත සිදු කෙරෙන විදේශීය ඉතා වැදගත් පුද්ගලයින්/ අතිශයින් වැදගත් පුද්ගලයින්ගේ සංචාර සඳහා ආවරණය සැපයීම**<br>**- ආවරණය කළ ඉතා වැදගත් පුද්ගලයින්/ අතිශයින් වැදගත් පුද්ගලයින්ගේ සංචාර සංඛ්‍යාව.** | | 85% | |
| **අමාත්‍යාංශයේ මාධ්‍ය සබඳතා වැඩිදියුණු කිරීම**<br>- අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනවල ප්‍රකාශන සංඛ්‍යාව (මුද්‍රණය/ඉලෙක්ට්‍රොනික සහ සමාජ මාධ්‍ය)<br>- අමාත්‍යාංශයේ ප්‍රකාශක දෛනික මාධ්‍ය ප්‍රශ්නවලට ලබා දුන් කාලෝචිත හා නිවැරදි ප්‍රතිචාරය | 95% | | |
| **දේශීය හා විදේශීය මහජන සම්බන්ධතා ශක්තිමත් කිරීම**<br>- වෙබ් අඩවි සම්බන්ධ වීම් සංඛ්‍යාව<br>- සම්මත ආකෘතියෙන් සංවර්ධනය කරන ලද දූත මණ්ඩල වෙබ් අඩවි සංඛ්‍යාව<br>- වැඩි වූ අනුගාමිකයින්/කැමැත්ත පළ කිරීම් සංඛ්‍යාව<br>- අමාත්‍යාංශ මාධ්‍ය නිවේදන සෑම විටම භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත් කෙරේ | 90% | | |
| **අමාත්‍යාංශයේ සියලුම අන්තර්ජාල සම්බන්ධ පද්ධති (වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය ගිණුම්, විද්‍යුත් තැපැල සහ වෙනත් පද්ධති) ආරක්ෂා කිරීම**<br>- නිවැරදි කරන ලද අවදානම් ප්‍රතිශතය. (නිවැරදි කරන ලද දුර්වලතා ÷ හඳුනාගත් දුර්වලතා) × 100% | | 80% | |
| **ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ මාධ්‍ය සහ අමාත්‍යාංශ වෙබ් අඩවිය හරහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව, විදේශීය** | | 80% | |

| | | | |
|---|---|---|---|
| **ජනතාව, විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධ කර ගැනීම.**<br>- විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල මගින් අරඹන ලද ට්විටර් සහ ෆේස්බුක් ගිණුම් සංඛ්‍යාව<br>- දූත මණ්ඩල ප්‍රධානීන් විසින් නිර්මාණය කරන ලද ට්විටර් ගිණුම් සංඛ්‍යාව<br>- සමාජ මාධ්‍ය පළ කිරීම් සමඟ නැවත ට්වීට් යොමු කිරීම්, හුවමාරු කිරීම්, බැලීම් සහ සම්බන්ධවීම් සංඛ්‍යාව<br>- සිදුකරන ලද සමාජ මාධ්‍ය ප්‍රචාරණ සංඛ්‍යාව සහ සමාජ මාධ්‍ය හුවමාරු සංඛ්‍යාව<br>- හුවමාරු කොට ඇති ප්‍රවර්ධන පළ කිරීම් සංඛ්‍යාව<br>- වෙබ් අඩවියේ ඇති තොරතුරු නිවැරදි සහ යාවත්කාලීන බව. | | | |
| **මාධ්‍ය වෙත ප්‍රතිචාර දැක්වීම, මාධ්‍ය සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සහ රාජ්‍යතාන්ත්‍රික සංවාද පැවැත්වීම**<br>- අමාත්‍යාංශය විසින් ප්‍රතිචාර දක්වන ලද මාධ්‍ය විමසුම් සංඛ්‍යාව.<br>- පැවැත් වූ මාධ්‍ය සම්මන්ත්‍රණ සහ රාජ්‍යතාන්ත්‍රික සංවාද සංඛ්‍යාව | | 80% | |

| ජාත්‍යන්තර ආරක්ෂක සහ ත්‍රස්ත මර්දන අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **එල්ටීටීඊ සංවිධානය ආශ්‍රිත ක්‍රියාකාරකම්**<br>- රටවල් 32 ක කොටි සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තුගත කිරීම පවත්වාගෙන යාම<br>- විදේශගත එල්ටීටීඊ සාමාජිකයින් සම්බන්ධ නඩු සම්බන්ධයෙන් පියවර ගැනීම<br>- ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම්වලට අදාළව පවතින නඩු පිළිබඳ වාර්තා කිරීම | 90% | | |
| **ත්‍රස්තවාදයට එරෙහි ප්‍රයත්නයන්ට සහාය වීම**<br>- ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය ප්‍රවර්ධනය කරන ත්‍රස්තවාදී අන්තර්ගතයන් සහ වෙනත් පණිවිඩ පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කිරීම<br>- CT සම්බන්ධ තොරතුරු හුවමාරු කිරීම සම්බන්ධීකරණය කිරීම<br>- CT කාරණාවලදී විදේශ රටවල් සමඟ සම්බන්ධීකරණයට පහසුකම් සැලසීම<br>- පුහුණු, අරමුදල් සහ තාක්ෂණික අවශ්‍යතා සඳහා දේශීය නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහාය වීම | | 85% | |
| **ත්‍රස්තවාදයට එරෙහි නීතිමය රාමුව**<br>- ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයට එරෙහිව ජාත්‍යන්තර දායකත්වය ලබා දීම<br>- ප්‍රති ත්‍රස්තවාදී ප්‍රයත්නවල දී කලාපීය සම්බන්ධීකරණය ඇති කිරීම/සංවර්ධනය කිරීම<br>- ද්විපාර්ශ්වික සම්බන්ධීකරණය පිළිබඳ විධිමත් රාමුවක් සකස් කිරීම. ප්‍රති ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහි වීම (CVE)/ ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම (PVE)<br>- දේශීය උත්සාහයන්ට සහාය වීම | | 80% | |
| **ප්‍රචණ්ඩකාරී අන්තවාදී (CVE) ප්‍රයත්නයන්ට එරෙහිව සහාය වීම**<br>- PVE/CVE සම්බන්ධ ව්‍යාපෘති සඳහා ද්විපාර්ශ්වික හවුල්කරුවන් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය<br>- දේශීය විමසීම් සඳහා සහාය වීම | | 85% | |
| **සංවිධානාත්මක අපරාධ මැඩලීමේ උත්සාහයන්ට සහාය වීම**<br>- නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම<br>- කුඩා අවි සහ සැහැල්ලු අවි සමාජයෙන් තුරන් කිරීමේ වැඩසටහන් දියත් කිරීම | | 85% | |

දේශගුණික අංශ

| අප්‍රිකා කටයුතු අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික)**<br>ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, පසු විපරම් ක්‍රියාමාර්<br>- ශ්‍රී ලංකා තානාපතිවරුන් විසින් කරන ලද සාකච්ඡා සංඛ්‍යාව | | 85% | |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩි දියුණු කිරීම<br>- සමගාමී අක්ත ගැන්වීම් තාර්කික කිරීම සම්බන්ධයෙන් පැවැත්වූ සන්නිවේදන/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>- දූත පිරිස් සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>- අත්සන් කළ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්<br>- පැවැත්වූ ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව<br>- රේඛීය නියෝජිතායතන සමඟ පැවැත්වූ සන්නිවේදන/පසු විපරම් ක්‍රියා සංඛ්‍යාව<br>- ගිවිසුම්/අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රතිපත්ති විශ්ලේෂණ සංඛ්‍යාව | | 85% | |
| **ආරක්ෂක සහයෝගීතාව** (සංචාර, පුහුණු කිරීම්) | | 80% | |

| ඇමරිකා අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>**-**රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩි දියුණු කිරීම (සමගාමී අක්ත ගැන්වීම් තාර්කික කිරීම සම්බන්ධයෙන් පැවැත්වූ සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර් ක්‍රියා සංඛ්‍යාව) | | 80% | |
| **-ශ්‍රී ලංකා තානාපතිවරුන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් විසින් (භෞතික සහ අතථ්‍ය යන දෙකම)** පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව | 90% | | |
| **-** රු විදේශ අමාත්‍යවරයා, විදේශ ලේකම්වරයා, අතිරේක විදේශ ලේකම්වරයා, ඇමරිකා අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් විදේශ නියෝජිතයන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සහ සංචාරය සඳහා පැමිණෙන සම්භාවනීය අමුත්තන් සමඟ පවත්වන ලද සාකච්ඡා | 90% | | |
| -වැදගත් දේශපාලන වර්ධනයන් පිළිබඳව සිදු කළ සන්නිවේදන කටයුතු සහ විශ්ලේෂණ සංඛ්‍යාව | 90% | | |
| -මෙරට වෙත සහ බාහිර වශයෙන් සිදු වන සංචාර සඳහා පහසුකම් සපයන ලද සංඛ්‍යාව | | | 50% |
| අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අවසන් කිරීම සඳහා පවත්වන ලද රැස්වීම්/සාකච්ඡා සහ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව | | 85% | |
| **-** පවත්වන ලද ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව | | | 50% |
| **-**රේඛීය ආයතන සමඟ පවත්වන ලද සන්නිවේදන කටයුතු/ පසු විපරම් | 90% | | |
| **-** අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සම්බන්ධයෙන් සකස් කර ඇති ප්‍රතිපත්ති විශ්ලේෂණ සංඛ්‍යාව | | 85% | |
| - එක්සත් ජනපද දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා රජයේ 2021 සහ 2022 පුද්ගල ජාවාරම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු අවසන් කිරීම | 100% | | |

| | | | |
|---|---|---|---|
| සඳහා පවත්වන ලද සන්නිවේදන කටයුතු, සාකච්ඡා සහ රැස්වීම් සංඛ්‍යාව | | | |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)** | | | |
| - ද්විපාර්ශ්වික වෙළඳාම, ආයෝජන, සංචාරක සහ සංවර්ධන ආධාර වැඩි දියුණු කිරීම | | 75% | |
| -පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | | 75% | |
| -පවත්වන ලද සන්නිවේදන කටයුතු, පසු විපරම් ක්‍රියාකාරකම් | | 75% | |
| -ශ්‍රී ලංකා දූත පිරිස් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අතර පැවති සාකච්ඡා සංඛ්‍යාව | | 75% | |
| -විදේශීය දූත පිරිස් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් අතර පැවති සාකච්ඡා සංඛ්‍යාව | 90% | | |
| -අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා සංඛ්‍යාව | | | 50% |
| **ආරක්ෂක සහයෝගීතාව** | | | |
| -ආරක්ෂක කටයුතු ආශ්‍රිත සංචාර සංඛ්‍යාව (මෙරටට පැමිණෙන සහ බාහිර වශයෙන්) | | 85% | |
| -යුධ උපකරණ පරිත්‍යා කිරීම්(උදා: එක්සත් ජනපදය නෞකාවක් පරිත්‍යාග කිරීම) | 100% | | |
| -පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 100% | | |
| -ඒකාබද්ධ ක්‍රියාකාරකම් සංඛ්‍යාව | 100% | | |
| -එතෙර සිටින ශ්‍රී ලංකා විරෝධී ප්‍රජාවන්ගේ අහිතකර ප්‍රචාරවලට එරෙහිව සිදු කළ සන්නිවේදන කටයුතු, රැස්වීම් සහ සාකච්ඡා සංඛ්‍යාව | | 80% | |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු** | | | |
| -ට්වීටර් පණිවිඩ හා මාධ්‍ය ප්‍රකාශ සංඛ්‍යාව | 90% | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ්-19 ආශ්‍රිත ක්‍රියාකාරකම්** | | | |
| - එන්නත් පරිත්‍යාග කිරීම් සඳහා පහසුකම් සැලසීම | 100% | | |
| - කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා ලබා දුන් අනෙකුත් මූල්‍ය සහය | 100% | | |
| - අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ හා සේවා පරිත්‍යාග කිරීම | 100% | | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා මිනිසුන් අතර සබඳතා** | | | |
| - වැඩසටහන් හා සාකච්ඡා | | | 50% |
| වෙනත් | | | |
| - පහසුකම් සලසන ලද නිදහස් වීසා සංඛ්‍යාව | 100% | | |
| - වීසා සම්බන්ධයෙන් රේඛීය ආයතන, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ නේවාසික දූත මණ්ඩල වෙත සිදු කළ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව | 100% | | |
| - පසු විපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව | 100% | | |

| නැගෙනහිර ආසියා අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)** | | 85% | |
| **දේශපාලනික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහු පාර්ශ්වික)** | 92% | | |
| **ආරක්ෂක සහයෝගීතාව** | 83% | | |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු** | 84% | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්** | 89% | | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා මිනිසුන් අතර සබඳතා** | | | 21% |
| **මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය** | | | 69% |
| **වෙනත් (විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු, අධ්‍යාපනය)** | 95% | | |

සටහන:

- එක් එක් ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රතිදාන ප්‍රතිශතය මෙම අංශයේ විෂය පථය යටතේ ඇති දූත මණ්ඩල/දූත කාර්යාල මඟින් එවන ලද නිමැවුම් ප්‍රතිශතවල සාමාන්‍ය අගයක් ලෙස ගණනය කරන ලදී.
- කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල සාමාන්‍ය ප්‍රතිදාන ප්‍රතිශතය සහ පුද්ගලයන් අතර සබඳතා සැලකිය යුතු ලෙස අඩු අගයක් පෙන්වයි. කොවිඩ්- 19 ව්‍යාප්තිය සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් මෙම අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගෙන ඇත.
- මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, සහ විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය ප්‍රතිදාන ප්‍රතිශතය ද සාපේක්ෂව අඩු අගයක් පෙන්නුම් කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැගි මූල්‍ය සහ මානව සම්පත් සීමා, මෙම පහළ අගයට බලපෑ ප්‍රධාන හේතුව ලෙස හඳුනා ගැනේ.

| **යුරෝපය, මධ්‍යම ආසියාව, යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩල අංශය** | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- පැවැත්වූ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, ක්‍රියාත්මක කළ පසු විපරම් ක්‍රියාමාර්<br>- ශ්‍රී ලංකා තානාපතිවරුන් විසින් කරන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>- අදාළ ගමනාන්තවලින් ලබා ගත් අපනයන, ආයෝජන, සංචාරක පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා සංඛ්‍යාව. | | 75% | |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩි දියුණු කිරීම<br>- සමගාමී අක්ත ගැන්වීම් තාර්කිකකරණය කිරීම සම්බන්ධයෙන් වන සන්නිවේදන<br>කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ දූත පිරිස් සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>-අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්<br>-පවත්වන ලද ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව<br>-රේඛීය ආයතන සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/ පසු විපරම් ක්‍රියාකාරකම්<br>- ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් සකස් කළ පොලිස් විශ්ලේෂණ සංඛ්‍යාව | 90% | | |
| **ආරක්ෂක සහයෝගීතාව** (සංචාර, පුහුණුවීම්) | 90% | | |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු** (ට්විටර් පණිවුඩ, මාධ්‍ය ප්‍රකාශ) | | 85% | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්** (ලාභය සහ ආදායම) | 89% | | 70% |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා මිනිසුන් අතර සබඳතා** (වැඩසටහන්, සාකච්ඡා) | | | 60% |
| **මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය** (රැස්වීම්, පුහුණුවීම්) | | | |

| මැද පෙරදිග අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික) | 90% | | |
| දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික) | 95% | | |
| ආරක්ෂක සහයෝගීතාව | | 75% | |
| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු | | | 70% |
| කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම් | 90% | | |
| සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මිනිසුන් අතර සබඳතා (වැඩසටහන්, සාකච්ඡා) | | | 60% |
| මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය | | | 70% |
| වෙනත් (විද්‍යාව පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික කටයුතු, අධ්‍යාපනය) | | 75% | |

සටහන:

- මෙම අංශය මැදපෙරදිග අංශයේ විෂය පථය යටතේ ඇති දූත මණ්ඩල/දූත කාර්යාල මගින් වාර්තා කරන ලද අගයන් සාමාන්‍යකරණය කිරීමෙන් ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රතිදාන ප්‍රතිශතය ගණනය කළේ ය.
- සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මිනිසුන් අතර සබඳතාවල සාමාන්‍ය ප්‍රතිදාන ප්‍රතිශතය පෙර වසරවලට වඩා සැලකිය යුතු ලෙස අඩු වූ අතර මෙම අඩුවීම කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන නැගි සීමා හේතුවෙන් විය හැකි ය.
- මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය සහ විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය ප්‍රතිදාන ප්‍රතිශතය සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ මූල්‍ය හා මානව සම්පත් ආශ්‍රිතව එල්ල වූ බාධා, මෙම පහළ අගය සඳහා ඉවහල් වූ මූලික හේතුව ලෙස සැලකේ.
- මීට අමතරව විද්‍යා රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ අධ්‍යාපන සහයෝගිතාව වැනි අනෙකුත් ක්ෂේත්‍රවල ප්‍රතිශතය, කොවිඩ්-19 වසංගතය හමුවේ පනවන ලද සංචරණ සීමා හේතුවෙන් සැලකිය යුතු ලෙස අඩු අගයක් පෙන්නුම් කරයි.

| දකුණු ආසියා සහ සාර්ක් අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100%-90% | 89%-75% | 74%-50% |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම<br>- පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව<br>- පැවැත්වූ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, ක්‍රියාත්මක කළ පසු විපරම් ක්‍රියාමාර්<br>- ශ්‍රී ලංකා තානාපතිවරුන් විසින් කරන ලද සාකච්ඡා | | 75% | 55% |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික)**<br>රාජ්‍යතාන්ත්‍රික කටයුතු වැඩි දියුණු කිරීම<br>- සමගාමී අක්ත ගැන්වීම් තාර්කිකකරණය කිරීම සම්බන්ධයෙන් වන සන්නිවේදන කටයුතු/ක්‍රියාකාරකම්/අන්තර්ක්‍රියා සංඛ්‍යාව<br>- ශ්‍රී ලංකාවේ දූත පිරිස් සිදු කළ සාකච්ඡා සංඛ්‍යාව<br>-අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් | 90% | 70%<br>70% | 50% |

| | | | |
|---|---|---|---|
| -පවත්වන ලද ද්විපාර්ශ්වික උපදේශන සංඛ්‍යාව<br>-රේඛීය ආයතන සමඟ සිදු කළ සන්නිවේදන කටයුතු/ පසු විපරම් ක්‍රියාකාරකම්<br>- ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් සකස් කළ පොලිස් විශ්ලේෂණ සංඛ්‍යාව | | | |
| **ආරක්ෂක සහයෝගීතාව** (සංචාර, පුහුණුවීම්) | 90% | | |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු** (ට්විටර් පණිවුඩ, මාධ්‍ය ප්‍රකාශ) | | 75% | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**<br>(ලාභය සහ ආදායම) | | | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ මිනිසුන් අතර සබඳතා**<br>(වැඩසටහන්, සාකච්ඡා) | | | 50% |
| **මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය සහ සංවර්ධනය** (රැස්වීම්, පුහුණුවීම්) | | | |

| අග්නිදිග ආසියා අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහු පාර්ශ්වික)**<br>ද්විපාර්ශ්වික වෙළඳාම හා ආර්ථික සහයෝගීතාව ඉහළ නැංවීම<br>පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව<br>පවත්වන ලද සන්නිවේදන කටයුතු සංඛ්‍යාව, සිදු කළ පසුවිපරම් ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ නියෝජිතයන් විසින් පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>අපනයන, ආයෝජන, අදාළ රටවලින් පැමිණෙන සංචාරකයන්ගේ පැමිණීම් පිළිබඳ කාර්තුමය වාර්තා සංඛ්‍යාව | | 80% | |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහු පාර්ශ්වික)**<br>ද්විපාර්ශ්වික දේශපාලන සබඳතා ඉහළ නැංවීම<br>වැඩිදුර සහයෝගීතාව සඳහා ස්ථිර නෛතික පදනමක් ගොඩනැගීම<br>ශ්‍රී ලංකාවේ නියෝජිතයන් විසින් පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>අත්සන් තැබීම සඳහා නිම කරන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සංඛ්‍යාව<br>පවත්වන ලද උපදේශන සංඛ්‍යාව<br>පවත්වන ලද සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>සිදු කළ පසු විපරම් ක්‍රියාමාර්ග | 90% | | |
| **ආරක්ෂක සහයෝගීතාව**<br>ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව ඉහළ නැංවීම<br>වැඩිදුර සහයෝගීතාව සඳහා ස්ථිර නෛතික පදනමක් ගොඩනැගීම<br>අත්සන් තැබීම සඳහා නිම කරන ලද අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සංඛ්‍යාව<br>මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | 80% | |
| **මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>(මාධ්‍ය නිවේදන, ට්විටර් පණිවුඩ) | 95% | | |
| **සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>(වැඩසටහන්, සාකච්ඡා) | 95% | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ කම්කරු සුබසාධනය, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ කොවිඩ් ආශ්‍රිත ක්‍රියාකාරකම්**<br>(අදායම සහ ලාභය) | 95% | | |
| **මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණය හා සංවර්ධනය**<br>(රැස්වීම්, පුහුණුවීම්) | 90% | | |

## මෙහෙයුම් අංශය

| මානව සම්පත් හා දූත මණ්ඩල කළමනාකරණ අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාලවල මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණයට අදාළ සමස්ත පරිපාලනය | | 85% | |

| නීති අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| **දේශපාලන රාජ්‍යතාන්ත්‍රික කටයුතු (ද්විපාර්ශ්වික/බහු පාර්ශ්වික)**<br>**- ගිවිසුම්, එකඟතා ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් පිළිබඳ සවිස්තරාත්මක නිරීක්ෂණ සැපයීම**<br>**- බහුපාර්ශ්වික ගිවිසුම්, සම්මුතීන් සහ ගිවිසුම්**<br>(විශේෂිත ජාත්‍යන්තර සම්මුති/ගිවිසුම්/ගිවිසුම් වල අනුමත කිරීම්/ප්‍රවේශවීම්/අත්සන් කිරීම් ආදිය ශ්‍රී ලංකාවට වාසිදායකද යන්න පරීක්ෂා කිරීම හා ගිවිසුම/සම්මුතිය ස්ථිර කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යවස්ථාවක් තිබේදැයි පරීක්ෂා කිරීම) | 99% | 75% | |
| **ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>- **වෙළඳාම සහ ආයෝජන**<br>තුර්කිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් පිළිබඳව සාකච්ඡා පැවැත්වීම<br>**ගුවන් සේවා ගිවිසුම්**<br>වෙළෙඳ සහ ආර්ථික සංවර්ධනය සඳහා, රටවල් අතර වෙළෙඳ කටයුතු වේගවත් කිරීම හා මගීන්ට පහසුවෙන් ගමන් කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් කොරියානු ජනරජය (ROK), ලක්සම්බර්ග්, ඕමාන් කැනඩාව සහ ඇෆ්ගනිස්ථානය සමඟ ගුවන් සේවා ගිවිසුමට අත්සන් තැබීම අවසන් කිරීම.<br>**ද්විත්ත්ව බදුකරණය වැළැක්වීම**<br>තුර්කිය, යුක්රේනය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය සහ ඉන්දියාව සමඟ ද්විත්ත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ ගිවිසුම් අවසන් කිරීම.<br>**වීසා නිදහස් කිරීමේ ගිවිසුම්**<br>මාලදිවයින, ඉන්දුනීසියාව, ආර්මේනියාව සහ ලෙබනනය සමඟ වීසා නිදහස් කිරීමේ ගිවිසුම් අවසන් කිරීම | 98% | 75%<br>75%<br>75% | 73% |
| **ආරක්ෂක සහයෝගීතාව**<br>**අන්‍යෝන්‍ය නෛතික සහය**<br>කොරියානු ජනරජය , මාලදිවයින, කුවේට්, සෞදි අරාබිය, ඊජිප්තුව සහ ලෙබනනය සමඟ අන්‍යෝන්‍ය නීතිමය සහය පිළිබඳ ගිවිසුම් අවසන් කිරීම<br>**දඬුවම් නියම වූ පුද්ගලයන් මාරු කිරීම පිළිබඳ ගිවිසුම්**<br>- කොරියානු ජනරජය, ඊජිප්තුව සහ ලෙබනනය සමඟ ගිවිසුම් අවසන් කිරීම | 100% | 75% | 73%<br>65% |

| | | | |
|---|---|---|---|
| - චෙක් ජනරජය සමඟ ගිවිසුමකට එළඹීම<br>**පිටුවහල් කිරීම**<br>කොරියානු ජනරජය, ඊජිප්තුව, ඉතාලිය, ලෙබනනය, මාලදිවයින සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ පිටුවහල් කිරීමේ ගිවිසුම් අවසන් කිරීම | | | |
| **කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රික කටයුතු**<br>**නැවත භාරගැනීම**<br>-"නැවත භාරගැනීම පැහැදිලි කිරීම" යටතේ ප්‍රංශය, ඉතාලිය හා ජෝර්ජියාව යන Benelux රටවල් වෙනුවෙන් නෙදර්ලන්තය සමඟ දැනටමත් අවසන් කර ඇති යුරෝපා සංගම්- ශ්‍රී ලංකා නැවත භාරගැනීමේ සන්ධාන/ගිවිසුම්වලට එළඹීම.<br>- රුසියාව සමඟ ගිවිසුමක් අවසන් කිරීම<br>-යුක්රේනය සමඟ ගිවිසුමක් අවසන් කිරීම<br>-ඕස්ට්‍රේලියාව සමඟ ගිවිසුමක් අවසන් කිරීම<br>**කම්කරු/සංක්‍රමණික සේවක ගිවිසුම්**<br>බහරේනය, ලෙබනනය, පිලිපීනය, සීෂෙල්ස්, ලක්සම්බර්ග්, රුමේනියාව සමඟ කම්කරු/සංක්‍රමණික සේවක ගිවිසුම් අවසන් කිරීම සහ කොරියානු ජනරජය සමඟ අලුත් කිරීමේ ගිවිසුම | 100% | 75%<br>75% | 50%<br>73% |
| **වෙනත්**<br>**සාගර නීතිය**<br>මහාද්වීපික තටකයේ සීමාවන් පිළිබඳ කොමිෂන් සභාව (CLCS) විසින් පත් කරන ලද උප කොමිෂන් සභාව ඉදිරියේ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටක ඉදිරිපත් කිරීම වෙනුවෙන් පෙනී සිටීම.<br>**උසාවි නඩු**<br>-මූලික අයිතිවාසිකම් නඩු හා වෙනත් නඩු කටයුතු මෙහෙයවීම.<br>- විදේශ සිතාසි<br>**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම්**<br>- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම | 90%<br>100%<br>100%<br>98% | | |

| විදේශීය වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය | | | |
|---|---|---|---|
| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය | | |
| | 100% -90% | 89% -75% | 74% - 50% |
| **විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා රජයට අයත් දේපළ අලුත්වැඩියා කිරීම/ඉදිකිරීම**<br>- CPC/MPC රැස්වීම් සංඛ්‍යාව<br>- වෙන් කළ අයවැයෙන් භාවිතා කළ මුදල.<br>- රේඛීය ආයතන සමඟ පැවැත්වූ සන්නිවේදන කටයුතු සංඛ්‍යාව<br>- අවසන් ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා ජනනය කරන ලද වාර්තා සහ තක්සේරු කිරීම් සංඛ්‍යාව සහ සම්පූර්ණ කරන ලද පසු විපරම් ක්‍රියාමාර් | | | 40% |
| **විදේශයන් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල සඳහා වාහන මිලදී ගැනීම සඳහා දැනටමත් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම**<br>- MPC මගින් ලබා දෙන ලද අනුමැති සංඛ්‍යාව<br>- ලබාගත් වාහන සංඛ්‍යාව | | | 20% |

| | | | |
|---|---|---|---|
| **විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාලය සඳහා ප්‍රාග්ධන අයිතම මිලදී ගැනීම**<br>- MPC මගින් ලබා දෙන ලද අනුමැති සංඛ්‍යාව<br>- මිලදී ගත් අයිතම සංඛ්‍යාව | | | 60% |
| **මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය ඵලදායී ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම**<br>- පත්වීම්/මාරු වීම් සංඛ්‍යාව<br>- ක්‍රියාකාරී ගොනු සංඛ්‍යාව | 90% | | |
| **සංචාරක අංශයේ සේවාවන්/කාර්යයන් කඩිනම් කිරීම**<br>- සංචාර සංඛ්‍යාව /TPN | 100% | | |

| **සන්ධාන අංශය** | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100%-90%** | **89%-75%** | **74%-50%** |
| මෙම අංශයේ ලේඛන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම | | | 50% |
| රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාවක් පිහිටුවීම | | | 60% |
| කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දීම | | | 40% |
| සංධාන අංශයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම | | 80% | |
| සමගාමී අක්ත ගැන්වීම් නැවත ස්ථාපිත කිරීම | | | 70% |
| විදේශීය සම්භාවනීය අමුත්තන්ට රාජ්‍ය සහ නිල සංචාර සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම | | | 65% |
| සන්ධාන මාර්ගෝපදේශය යාවත්කාලීන කිරීම | | 75% | |
| අලුතින් අනුමත කරන ලද තනතුරුවලට අනුව නව සන්ධාන නිලධාරීන් බඳවා ගැනීම | | | 50% |

| **සාමාන්‍ය පරිපාලන අංශය** | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා ක්ෂේත්‍රය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100% -90%** | **89%-75%** | **74%-50%** |
| **ආරක්ෂිත සන්නිවේදන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම**<br>- වාර්තා තබා ගැනීම සඳහා භාවිතා කරන අවකාශයෙන් 50% අඩු කිරීම<br>- කඩදාසි භාවිතය අඩු කිරීම | | | 50% |
| **අමාත්‍යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩල අවශ්‍යතාව සම්පූර්ණ කිරීම**<br>- ප්‍රතිව්‍යුහගත සංවිධානයක් පිහිටුවීම<br>- නව සේවක සංඛ්‍යාව සඳහා සංවර්ධනය කරන ලද SOR සංඛ්‍යාව<br>- පුරවා ඇති පුරප්පාඩු සංඛ්‍යාව | * | | |
| **වත්කම් කළමනාකරණ පද්ධතිය (AMS) සංවර්ධනය කිරීම**<br>- සංඛ්‍යාංකනය කළ වත්කම් වාර්තා සංඛ්‍යාව | | 80% | |
| **ක්‍රියාවලි කඩිනම් කිරීම සඳහා මෙහෙයුම් කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ දැනුම යෙදීමේ හැකියාව වැඩි දියුණු කිරීම**<br>- පවත්වන ලද වීඩියෝ පුහුණු සැසි සංඛ්‍යාව<br>- සහභාගී වූවන් සංඛ්‍යාව<br>- පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | 89% | |

| | | | |
|---|---|---|---|
| - සහභාගී වූවන් සංඛ්‍යාව | | | |
| **ප්‍රවාහන කළමනාකරණ පද්ධතිය (TMS) හඳුන්වා දීම**<br>- ඉන්ධන පරිභෝජනය අඩු කිරීම<br>- ලැබී ඇති පැමිණිලි අඩු කිරීම | ** | | |
| **අමාත්‍යාංශය එකම ස්ථානයක් යටතට ගෙන ඒම**<br>- උපදෙස් ලබා ගැනීම සඳහා සම්බන්ධ කොට ගත් අදාළ ආයතන සහ නියෝජිතායතන<br>- පවත්වන ලද සාකච්ඡා<br>- ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කිරීම | | | 20% |

* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් අනුව පියවර ගන්නා ලදී.

** මෙම ප්‍රමුඛතා ක්ෂේත්‍රය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට 2021 වර්ෂයේ දී කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බාධා එල්ල වූ අතර, පසුව එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2022 වර්ෂය දක්වා ගෙන එන ලදී.

| අභ්‍යන්තර විගණන අංශය | | | |
|---|---|---|---|
| **ප්‍රමුඛතා අංශය** | **අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සැබෑ ප්‍රතිදානය** | | |
| | **100% -90%** | **89% -75%** | **74% - 50%** |
| පාර්ලිමේන්තුවට වගකියන රාජ්‍ය ආයතනයක් ලෙස අමාත්‍යාංශයේ කාර්ය සාධනය, එහි දූත මණ්ඩල/දූත කාර්යාල අධීක්ෂණය කිරීම සහ ඇගයීම.<br>- අභ්‍යන්තර පාලන දුර්වලතා හෙළිදරව් කිරීම සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව සහ ඒවා නිවැරදි කිරීම | | 76% | |

## 05 වැනි පරිච්ඡේදය

### තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම පිළිබඳ කාර්ය සාධනය

### 5.1. හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ පිළිබඳ දර්ශක | මෙතෙක් ලැබූ ජයග්‍රහණවල ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75%- 100% |
| | | අදාළ නොවේ | | | |
| | | | | | |

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

- 2020 පෙබරවාරි මාසයේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වැනි සැසිවාරයේ ඉහළ මට්ටමේ කොටසේ දී කළ ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශයේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව සහ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් ලබා දී ඇති වැදගත්කමට අනුකූලව, තිරසාර සංවර්ධනය සහ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය පිළිබඳ තක්සේරුව විදේශ අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ප්‍රධාන ධාරාවට ගැනීම සඳහා වන පියවර යෝජනා කොට ඇත.

- 2020 මාර්තු මාසයේ දී විදේශ සබඳතා අමාත්‍යවරයා විසින් තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය තක්සේරු කිරීමට සහ ඉදිරි මග යෝජනා කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කරන ලදී. තිරසාර සංවර්ධන රාමුව සඳහා කැඳවීමේ බලය සහ බහු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය පෝෂණය කිරීමේ හැකියාව යන දෙකම ඇති ඉහළම මට්ටමේ භාරකාරත්වය අවශ්‍ය බව ක්‍රියාකාරී කණ්ඩායම නිර්දේශ කළේය.

- රූ අග්‍රාමාත්‍යවරයා සහ විදේශ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩලයීය සංදේශයකට අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් 2021 ජනවාරි 4 දිනැති තීරණය අනුව ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් පත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස විදේශ ලේකම්වරයා ද පත් කොට ඇත.

- පළමු මෙහෙයුම් කමිටුවේ දී එකඟ වූ පරිදි, මෙහෙයුම් කමිටුවට සහාය වීම සඳහා අදාළ අමාත්‍යාංශවලින් තාක්ෂණික කමිටුවකට සාමාජිකයන් පත් කිරීමට මුදල් අමාත්‍යාංශයට පැවරුණු අතර, තිරසාර සංවර්ධන ඉලක්කවල ජාතික රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ සම්බන්ධීකරණය කෙරේ.

- තිරසාර සංවර්ධන ඉලක්ක -16 මෙහෙයුම් කමිටුවේ පළමු රැස්වීම 2021 ජුනි 30 වන දින තිරසාර සංවර්ධන කවුන්සිලයේ සහයෝගීතාවයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් කැඳවන ලද අතර, එම රැස්වීමේ දී අපරාධ පාලනය, දූෂණය පාලනය, යුක්තිය සඳහා ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක -16 හි ඉලක්ක සපුරා ගැනීම සඳහා කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් අනු කමිටු (ප්‍රධාන ආයතනවලින් සමන්විත) පිහිටුවීමට තීරණය කරන ලදී. අධිකරණ අමාත්‍යාංශයේ, විදේශ අමාත්‍යාංශයේ සහ තිරසාර සංවර්ධන කවුන්සිලයේ නිලධාරීන් ඇතුළත් අනු කමිටුවක් පිහිටුවන ලෙස ගරු අධිකරණ

අමාත්‍යවරයා උපදෙස් දුන්නේය. 2021 ජූලි 15 වන දින අධිකරණ අමාත්‍යාංශයේ දී පැවති මෙම අනුකමිටුවේ පළමු රැස්වීම සඳහා විදේශ අමාත්‍යාංශය සහභාගී විය.

- තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) මත ශ්‍රී ලංකාව සිය ගෝලීය ශ්‍රේණිගත කිරීම ස්ථාන 7කින් වැඩිදියුණු කර ඇති අතර, 2021 තිරසාර සංවර්ධන වාර්තාවට අනුව 2021 දී රටවල් 165ක් අතරින් 87 වැනි ස්ථානයට පත්ව ඇත.

- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමේ දකුණු සහ නිරිතදිග ආසියානු කාර්යාලය සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන කවුන්සිලය "2030 වර්ෂයේ න්‍යාය පත්‍රය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම ඉදිරියට ගෙන යන අතර කොවිඩ්-19 වසංගතයෙන් මිදී වඩාත් හොඳින් නැවත ගොඩනැගීම" යන තේමාව යටතේ 2021 නොවැම්බර් 15-17 යන දිනවල කොළඹ දී සංවිධානය කළ තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ 5 වැනි දකුණු ආසියානු සංසදය සඳහා විදේශ අමාත්‍යාංශය සිය සහය ලබා දුන්නේ ය.

- 2021 ජූලි මස පැවැත්වීමට නියමිත තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඉහළ පෙළේ දේශපාලන සංසදයට ඉදිරිපත් කෙරෙන, ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ ජාතික ස්වේච්ඡා සමාලෝචනයේ (VNR) දෙවැනි සම්පාදනය සකස් කිරීමේ කටයුතුවලට අදාළව ජාතික මෙහෙයුම් කමිටුව පවත්වන ලද මූලික සාකච්ඡා සඳහා විදේශ අමාත්‍යාංශය දායක විය.

- රජයේ හවුල්කාරිත්වය සහිතව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සිය 2023-2027 කාලසීමාව සඳහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන සහයෝගීතා රාමුව (UNSDCF) සකස් කරමින් සිටී. මෙම රාමුව 2023-2027 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ වැඩසටහන් මෙහෙයවීමේ ප්‍රධාන මාර්ගෝපදේශය බවට පත්වනු ඇත. මෙම රාමුව සංවර්ධනය කිරීම සඳහා, ක්‍රියාකාරී කමිටුවක් සහ ඒකාබද්ධ මෙහෙයුම් කමිටුවක් පිහිටුවා ඇති අතර එයට ප්‍රධාන රේඛීය අමාත්‍යාංශ සහ තිරසාර සංවර්ධන කවුන්සිලය ඇතුළත් වේ. මෙම රාමුව සංවර්ධනය කිරීම හා සබැඳි මූලික සාකච්ඡා සඳහා අමාත්‍යාංශය දායක වූ අතර, ජාතික මට්ටමේ ඉහළ පෙළේ මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහ ඉන් අනතුරුව පැවැති ක්‍රියාකාරී මට්ටමේ රැස්වීම්වලට ද සහභාගි

## 06 වැනි පරිච්ඡේදය

### අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යාව කළමනාකරණය

**අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 104 | 90 | 14 |
| තෘතීයික | 11 | 01 | 10 |
| ද්විතියික | 370 | 398 | - * |
| ප්‍රාථමික | 125 | 117 | 8 |

* පුස්තකාලයාධිපති සේවයේ පුරප්පාඩු 02ක් පැවතිණි.

**විදේශ දූත මණ්ඩල කාර්ය මණ්ඩලය**

| | අනුමත සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු*/ අතිරික්ත |
|---|---|---|---|
| **සියරට පේරුව** | | | |
| **ජ්‍යෙෂ්ඨ/ තෘතීය** | 258 | 221 | **37** |
| ද්විතියික | 263 | 213 | 50 |
| ප්‍රාථමික | 07 | 06 | 01 |
| **දේශීය වශයෙන් බඳවාගත්** | | | |
| ද්විතියික | 255 | 165 | 90 |
| ප්‍රාථමික | 327 | **260** | **67** |

i. ජ්‍යෙෂ්ඨ/ තෘතීය- දූත මණ්ඩල ප්‍රධානී, අමාත්‍ය උපදේශක, උපදේශක, පළමු ලේකම්, දෙවැනි ලේකම්, තුන්වැනි ලේකම්
ii. ද්විතීයික - සංවර්ධන සහකාර, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්
iii. දේශීය වශයෙන් බඳවාගත් ලේකම් - ලිපිකරුවන්, පිළිගැනීමේ නිලධාරීන්, ලඝු ලේඛක, පරිවර්තකයන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු නිලධාරීන්
iv. ප්‍රාථමික - රියදුරන්, කාර්යාල කාර්ය සහායක, සනීපාරක්ෂක කම්කරුවන් ඇතුළු නිලධාරීන්

### 06.2 ** මානව සම්පත් හිඟය හෝ අතිරික්තය අමාත්‍යාංශයේ කාර්ය සාධනයට බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

මෙම අමාත්‍යාංශයේ ක්‍රියාකාරී විෂය පථය ඉහළ නැංවීම සහ එහි අංශ පුළුල් වීමත් සමඟම, අතිරේක ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිලධාරීන් සහ යටත් නිලයන් සඳහා වන අවශ්‍යතාව ඉස්මතු වී ඇත. ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වර්තමාන අවශ්‍යතාවය සහ පුරෝකථනය කරන ලද අනාගත ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී අංශවල කාර්යයන් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

අනුමත කාර්ය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව සහ අනෙකුත් සහයක කාර්ය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර, මේ සඳහා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව තාර්කික කිරීමේ අභ්‍යාසයක් සිදු කරන ලදී. කෙසේවුවද, වසංගතය හා ආර්ථික පසුබෑම හේතුවෙන් දූත මණ්ඩලවල කාර්යභාරයේ වත්මන් සංක්ෂිප්ත බව/ විවිධාංගීකරණය සැලකිල්ලට ගනිමින්, යෝජිත සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් වන ඕනෑම සංශෝධනයක් දැනට පවතින සේවක සංඛ්‍යාවේ තාවකාලික පියවරක් ලෙස සැලකිය යුතු බවට තීරණය කෙරිණි.

අමාත්‍යාංශයේ පවතින මානව සම්පත් හිඟය පියවා ගැනීම සඳහා **2019** වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට පුළුල් ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීමක් අමාත්‍යාංශය විසින් යෝජනා කර තිබූ නමුත් එම ක්‍රියාවලිය ඊට ඇතුළත් නොවුණි. මෙම ක්‍රියාවලිය නැවත වරක් ආරම්භ කිරීමේ අරමුණින්, අවශ්‍යතා මත පදනම් වූ පුළුල් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම සඳහා අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව අධ්‍යයනය කිරීමට කමිටුවක් පත් කොට ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය පැවැත්වීම 2018 වර්ෂයේ සිට ප්‍රමාද වීම හේතුවෙන් අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ රික්තයක් නිර්මාණය වී ඇති අතර, **2020-2021** කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ  නිලධාරීන් කිහිප දෙනෙකු විශ්‍රාම යෑමත් සමඟ මෙම තත්ත්වය තීව්‍ර වී ඇති බව අමාත්‍යාංශය වැඩිදුරටත් සඳහන් කර සිටියි. ලිපිගොනු වාර්තාවලට ප්‍රවේශ වීමට නොහැකි වීම හේතුවෙන් හටගත් පරිපාලනමය ප්‍රමාදයන්, රට අගුලු දැමූ කාලය තුළදී නිවසේ සිට කටයුතු කිරීමට සිදුවීම, ප්‍රමාණවත් තාක්ෂණික සහය / තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නොමැති වීම යනාදී කරුණු,  අමාත්‍යාංශය සහ දූත මණ්ඩල සතු මානව සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම කෙරෙහි විශාල බලපෑමක් එල්ල කොට ඇත. ඒ අතරම, සහයක කාර්ය මණ්ඩල මට්ටමේ සහ කනිෂ්ඨ විධායක මට්ටමේ නිලධාරීන් සම්බන්ධයෙන් පවත්නා මානව සම්පත් හිඟය හේතුවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ මධ්‍යම මට්ටමේ කාර්ය මණ්ඩල නිලධාරීන්ට අධික බරක් දැරීමට සිදුව ඇත. කෙසේවුවද, එහි කාර්ය සාධනයට අයහපත් බලපෑමක් ඇති නොවන පරිදි කාර්ය සාධනය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා, පවතින සේවක සංඛ්‍යාව යොදා ගැනීමට මෙම අමාත්‍යාංශය විසින් පියවර ගන්නා ලදී.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

**ප්‍රතිපත්ති සැලසුම්, පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධන අංශය විසින් කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කළ කාර්ය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහනේ ස්වභාවය | ප්‍රතිලාභය/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය (රු.) | විදේශීය | (විදේශීය/දේශීය) | |
| සාකච්ඡා මාලාව: “සයිබර් ආරක්ෂාව පිළිබඳව දැනුවත් වීම - කළ යුතු සහ නොකළ යුතු දේ” | ශ්‍රී ලංකා විදේශ සේවයේ සියලුම නිලධාරීන් | 2021 ජනවාරි 06 වැනි දින | - | - | මාර්ගගත | සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් වීම පිළිබඳ දැනුම ඉහළ නැංවීම |
| සාකච්ඡා මාලාව: “යුරෝපා සංගමය ජීඑස්පී+ - එය ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ කෙසේද යන්න සහ ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න” | ශ්‍රී ලංකා විදේශ සේවයේ සියලුම නිලධාරීන් | 2021 මැයි 10 වැනි දින | - | - | මාර්ගගත | ජීඑස්පී+ හි වැදගත්කම පිළිබඳ දැනුම ඉහළ නැංවීම |
| දූත මණ්ඩල ප්‍රධානීන් / දූත කාර්යාලවල ප්‍රධානීන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා පැවැත්වූ නම්නීකරණ වැඩසටහන | නම් කළ දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානීන් 04 දෙනෙකු/ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් 22 ක් | පෙබ. 9-16 යන දිනවල (දින 6ක්) | 29,650.00 | - | දේශීය | ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික දේශපාලන කටයුතු, ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු, මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු සහ අනෙකුත් අමාත්‍යාංශ කාර්යයන් පිළිබඳ විස්තර ඇතුළත්ව මෙම වැඩසටහන ආවරණය කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය (UNITAR) සමඟ සහයෝගීතාවයෙන් පැවැත්වූ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය පිළිබඳ විද්‍යුත් වැඩමුළුව | 30 | මාර්තු 22-25 යන දිනවල (දින 4ක්) | - | - | මාර්ගගත | ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ආර්ථික විද්‍යාව සහ විදේශ ප්‍රතිපත්ති අතර අන්තර් සම්බන්ධකම් පිළිබඳ දැනුම ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ බෙදා වෙන් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම. |
| UNITAR හිරෝෂිමා න්‍යෂ්ටික නිරායුධකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සහ ප්‍රගුණනය නොකිරීමේ චක්‍රය පිළිබඳ අත්‍යා පුහුණුව | 1 | මාර්තු 916 යන දිනවල (දින 6ක්) | - | - | මාර්ගගත | ගෝලීය වශයෙන් කටයුතු කරන මධ්‍යම මට්ටමේ වෘත්තිකයන් සතු සාකච්ඡා කිරීමේ සහ සන්නිවේදනයේ කුසලතා වර්ධනය කිරීම |
| පෞද්ගලික සහකාර පුහුණුව | 43 | 2021 මාර්තු 29- අප්‍රේල් 09 යන දිනවල | - | - | මාර්ගගත | කාර්යාල කටයුතු සුමට කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳ මූලික දැනුම වැඩිදියුණු කිරීම |
| රාජ්‍යතාන්ත්‍රික පුහුණුව- තුර්කි පුහුණුව | 34(අමාත්‍යාංශය) 7(දූත මණ්ඩලය) | මාර්තු 8,9,10 යන දිනවල (දින 3 ක්) | - | - | | තුර්කි විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| ශ්‍රී ලංකා විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරීන් සමඟ තොරතුරු සහ අත්දැකීම් බෙදාහදා ගැනීමේ වැඩසටහන | 80 | 2021 මාර්තු 08 වැනි දින (පැය 2ක්) | - | - | මාර්ගගත | ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අතීත අත්දැකීම් පිළිබඳ දැනුම ලබා ගැනීම |
| නීල රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ ඩිජිටල් පුහුණුව: සාගරවල තිරසාර ආර්ථික සංවර්ධනය වැඩි දියුණු | 25 | මැයි 31- ජූනි 11 යන දිනවල (දින 12ක්) | - | - | මාර්ගගත | ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර සාකච්ඡා සහ උපායමාර්ගික සැලසුම් කුසලතා පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරීම | | | | | | ලබා ගැනීම |
| ෆේස්බුක් පිළිබඳ පුහුණුව | 81 | 2021 මැයි 10 වැනි දින | - | - | මාර්ගගත | ෆේස්බුක් වෘත්තීයමය අයුරින් භාවිතයට ගැනීම පිළිබඳ දැනුම ලබා ගැනීම |
| "තීරය සහ මාර්ගය" නමින් ශ්‍රී ලංකාව සඳහා පැවැත්වූ ජාත්‍යන්තර ධාරිතා සහයෝගීතා සම්මන්ත්‍රණය (මාර්ගගත) | | 2021 මැයි 11- 2021 මැයි 31 | - | - | මාර්ගගත | නිලධාරීන්ගේ ධාරිතා ගොඩනැගීම |
| SCP පුහුණු සම්මානය (විද්‍යුත් අයුරින් ඉගෙනීම) : ජාත්‍යන්තර සාගර නීතිය | | 2021 ජූනි 14-18 යන දිනවල | - | - | සිංගප්පූරුව | ජාත්‍යන්තර නීතිය හා සබැඳි කරුණු පිළිබඳ දැනුම ලබා ගැනීම |
| බටහිර ඉන්දීය සාගර කලාපයේ පවත්නා උපායමාර්ගික තරඟය පිළිබඳව පැවති NESA සහ APCSS වැඩමුළුව (WIOR01-21) | | 2021 ජූනි 28-30 යන දිනවල | - | - | මාර්ගගත | බටහිර ඉන්දීය කලාපයේ පවත්නා උපායමාර්ගික තරඟය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| සාගර නීතිය පිළිබඳ යූසු ඇකඩමිය පැවැත්වූ අතථ්‍ය වැඩසටහන | | මැයි 24- ජූනි 20 යන දිනවල | - | - | මාර්ගගත | ජාත්‍යන්තර නීතියට අදාළ කරුණු පිළිබඳ දැනුම ලබා ගැනීම |
| තෙවැනි කාර්යක්ෂමතා කඩඉම - ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ධාරිතා ගොඩනැංවීමේ පුහුණුව | | 2021 ජූලි 02 වැනි දින සිට | | | අතථ්‍ය වේදිකාවක් හරහා (BIDTI-ELS) | සේවා අවශ්‍යතා සම්පූර්ණ කොට I ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම |
| සාමය ඇති කිරීම සහ වැළැක්වීම පිළිබඳ රාජ්‍යතාන්ත්‍රිකභාවය හා | 01 | ජූනි 21- ජූලි 2 දක්වා | - | - | මාර්ගගත | ගැටුම් විශ්ලේෂණය, සාකච්ඡා පැවැත්වීම සහ දැනුම ගැඹුරු කිරීම සඳහා ජාත්‍යන්තර සහ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සබැඳි මිත්‍රත්ව වැඩසටහන 2021 | | | | | | ජාතික සිවිල් සේවකයන් සමඟ මැදිහත් වීම යන ක්ෂේත්‍රවල කුසලතා ශක්තිමත් කිරීම |
| "ආසියා-පැසිෆික් සඳහා ජාත්‍යන්තර නීතිය" පිළිබඳ එක්සත් ජාතීන්ගේ කලාපීය පාඨමාලාව | | නොවැම්බර් 15 - දෙසැම්බර් 10 යන දිනවල | | | බැංකොක්, තායිලන්තය | ජාත්‍යන්තර නීතියට අදාළ කරුණු පිළිබඳ දැනුම ලබා ගැනීම |
| කොවිඩ්-19 ආශ්‍රිත නව සාමාන්‍ය තත්ත්වය යටතේ සෞඛ්‍ය සේවා කළමනාකරණය (විද්‍යුත් අයුරින් ඉගැන්වීම) | | අගෝස්තු 30 සිට සැප්තැම්බර් 03 යන දිනවල | | | මාර්ගගත | සෞඛ්‍ය සේවා කළමනාකරණයට අදාළ කරුණු පිළිබඳ දැනුම ලබා ගැනීම |
| දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානීන් සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා පැවැත්වූ අතථ්‍ය නම්නීකරණ වැඩසටහන | නම් කළ දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානීන් 05 දෙනෙකු සහ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් 20 දෙනෙකු | අගෝස්තු 30 සිට සැප්තැම්බර් 02 යන දිනවල (දින 4ක්) | - | - | දේශීය | එමගින් අමාත්‍යාංශයේ කාර්යයන් සහ රටේ විදේශ ප්‍රතිපත්තියේ සියලුම සමකාලීන අංගයන් පිළිබඳව සහභාගිවන්නන් සතු මූලික දැනුම ආවරණය කෙරිණි. |
| "බෙංගාල බොක්කේ කලාපීය වෙළඳාම සහ සම්බන්ධතා ගොඩනැගීමේ වැඩසටහන" නමින් පුහුණු සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 05 | 2021 ඔක්තෝබර්– 2022 අගෝස්තු දක්වා | - | - | මාර්ගගත | විවිධ යටිතල පහසුකම් සහ වෙළඳ ඒකාග්‍රතාවය අතර පවත්නා සම්බන්ධතා ගවේෂණය කිරීම සඳහා විචාරශීලී චින්තනය දිරිමත් කිරීම මගින් සහභාගිවන්නන්ගේ හැකියාව වර්ධනය කිරීම |
| මොස්කව් හි තරුණ රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ ගෝලීය සංසදය සඳහා වූ | 01 | ඔක්තෝබර් 12-16 යන දිනවල | - | - | රුසියාව | ලොව පුරා සිටින තරුණ රාජ්‍යතාන්ත්‍රිකයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඇරයුම | | | | | | |
| නවදිල්ලියේ සුෂ්මා ස්වරාජ් විදේශ සේවා ආයතනයේ දී වාර්ෂිකව 3 වැනි වරට පැවති නිරායුධකරණය සහ ජාත්‍යන්තර ආරක්ෂක කටයුතු සහයෝගිතා වැඩසටහන | 01 | ජනවාරි 09-29 යන දිනවල | - | - | ඉන්දියාව | මෙම වැඩසටහන සකස් කෙරෙමින් පවතී |
| ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 16 | 2021 දෙසැම්බර් 07 දින සිට (පැය 200ක්) | - | - | දේශීය | දෙවන භාෂා ප්‍රවීණතාව පිළිබඳ සේවා අවශ්‍යතාව සඳහා වන කටයුතු නිලධාරීන් විසින් සාර්ථකව අනුගමනය කරනු ලැබේ. |
| "ජාත්‍යන්තර සරණාගත සුරක්ෂණය" පිළිබඳ UNHCR පුහුණුව | 02 | දෙසැම්බර් 09 වැනි දින (1 දිනක්) | - | - | දේශීය | සරණාගතයින් සහ ආරක්ෂාව අපේක්ෂා කරන්නන් සම්බන්ධ කරුණු පිළිබඳව සාකච්ඡා කළ අතර UNHCR හි කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාවක් හිමි කර ගන්නා ලදී. |

සාමාන්‍ය පරිපාලන අංශය මෙහෙය වූ දේශීය පුහුණු වැඩසටහන්

| වැඩසටහනේ නම | පුහුණු කළ කාර්ය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (විදේශීය/ දේශීය) | ප්‍රතිලාභය/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය (රු.) | විදේශීය | | |
| ධාරිතා ගොඩනැංවීම | | | | | | |
| 2020 සමීක්ෂණ මණ්ඩලය සඳහා පූර්ව- පුහුණුවක් ලබා දීම | නිලධාරීන් 47 දෙනෙකු | 2021.01.05 (1 දිනක්) | 17164.00 | | දේශීය | 2020 සමීක්ෂණ මණ්ඩලය පිළිබඳව දැනුම ලබා ගැනීම සහ සමීක්ෂණ මණ්ඩලය සම්පූර්ණ කිරීම |
| ITMIS පුහුණුව | 2 | 2021.02.22-2021.02.25 (දින 4 ක්) | - | | දේශීය | ITMISS ගිණුම්කරණ පද්ධතියේ නිපුණතා වැඩිදියුණු කිරීම සහ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම |
| දූත මණ්ඩල සඳහා පත් කරන ලද කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පැවැත්වූ කොන්සියුලර් සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 90 | 2021.02.01-2021.02.24 (දින 2ක් ) | - | | දේශීය | කොන්සියුලර් රාජකාරි සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික දැනුම ලබා ගැනීම |
| මහජන රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා ගෝලීය සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 1 | 1 වර්ෂයක් | 37,500.00 | | දේශීය | රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා ගෝලීය සබඳතා පිළිබඳ නිපුණතා වැඩිදියුණු කිරීම |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය/ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 | වර්ෂ 2ක් (සිදු කෙරෙමින් පවතී) | 375,000.00 | | දේශීය | සේවා අවශ්‍යතාව සම්පූර්ණ කොට දැනුම ඉහළ නැංවීම |
| පැය 200ක දෙමළ භාෂා පාඨමාලාව | 16 | දින 25 ක් (අප්‍රේල්/සැප්තැම්බර් ) | - | | දේශීය | සේවා අවශ්‍යතාව සම්පූර්ණ කොට දෙමළ භාෂාවෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුම ඉහළ නැංවීම |
| මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - පශ්චාත් උපාධි | 1 | 1 වර්ෂයක් | 90,000.00 | | දේශීය | සේවා අවශ්‍යතාව සම්පූර්ණ කොට වෘත්තීය ගොඩනැගීම සඳහා අවශ්‍ය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පාඨමාලාව | | | | | | දැනුම ඉහළ නැංවීම |
| සයිබර් ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව | 3 | දින 5 ක්-මාර්තු/අප්‍රේල් | - | | දේශීය | සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුම ඉහළ නැංවීම සහ සේවා ස්ථානයේ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම |
| උසස් Ms Excel තාක්ෂණය | 1 | දින 3 ක් (2021 සැප්තැම්බර් 01 වැනි දින ) | 3500.00 | | දේශීය | සේවා ස්ථානයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා Ms. Excel පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| විනය පටිපාටි | 26 | 2021.10.07 (එක් දිනක්) | 300,000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | 20 | එක් වර්ෂයක්-සිදු කෙරෙමින් පවතී | 300,000.00 | | දේශීය | නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා නව දැනුම ලබා දීම |
| තොරතුරු තාක්ෂණය සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | 20 | එක් වර්ෂයක්-සිදු කෙරෙමින් පවතී | 5000.00 | | දේශීය | නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා නව දැනුම ලබා දීම |
| ප්‍රසම්පාදන පටිපාටි | 24 | 2021.10.31 (එක් දිනක්) | 5000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| ඊ-කේත සහ කාර්යාල ක්‍රියා පටිපාටි(සිංහල මාධ්‍ය) | 29 | 2021.11.19 (එක් දිනක්) | 5000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති- | 28 | 2021.12.10 | 5000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (සිංහල මාධ්‍ය) | | (එක් දිනක්) | | | | සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| ර්-කේත සහ කාර්යාල ක්‍රියා පටිපාටි(දෙමළ මාධ්‍ය) | 34 | 2021.12.21 (එක් දිනක්) | 5000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |
| මූල්‍ය රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි - (දෙමළ මාධ්‍ය) | 24 | 2021.12.30 (එක් දිනක්) | 5000.00 | | දේශීය | පවරා ඇති රාජකාරි ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන වගකීම භාර ගැනීම සඳහා රජයේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |

## 07 වන පරිච්ඡේදය

### අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ** | | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජඅත්තිකාරම ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2 පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)** | | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | විදේශ දූත මණ්ඩලයෙන් තොරතුරු ලැබීමේ ප්‍රමාදය | ලබන වසරේ යාවත්කාලීන කිරීම |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **3 මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු.රෙ. 135))** | | | | |
| 3.1 | ආයතනය තුළමූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4 වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනටඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශයනියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **5 විගණන විමසුම්** | | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබේ | අනුකූල වේ | | |
| **6 අභ්‍යන්තර විගණනය** | | | | |
| 6.1 | මු.රෙ. 134 (2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4)උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3)ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **7 විගණන හා කළමනාකරණ කමිටු** | | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි විය | ඉදිරි වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| **8 වත්කම් කළමනාකරණය** | | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | පැවති වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද විය | 2020 භාණ්ඩ සමීක්ෂණය සම්පූර්ණ කරන ලදී.<br>2021 සඳහා භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර ඇත. |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල නොවේ | පැවති වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද විය | 2020 භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනා ගත් අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත.<br>2021 සඳහා භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර ඇත. |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | පැවති වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද විය | 2020 සඳහා ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත.<br>2021 සඳහා භාණ්ඩ සමීක්ෂණය ආරම්භ කර ඇත. |
| **9 වාහන කළමනාකරණය** | | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අදාළ නොවේ (මේ වන විට අමාත්‍යාංශය සතුව ගර්හිත වාහන නොමැත) | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු කර තිබීම | | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| **10 බැංකු ගිණුම් කළමනාකරණය** | | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11 ප්‍රතිපාදන උපයෝජනය** | | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1)ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| **12 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නො වේ | තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතාව | තොරතුරු සොයා ගැනීමට පියවර ගැනීම |
| **13 පොදු තැන්පත් ගිණුම** | | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව කටයුතු කර තිබීම | | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14 අග්‍රිම ගිණුම** | | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15 ආදායම් ගිණුම** | | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අදාළ නොවේ | | |
| **16 මානව සම්පත් කළමනාකරණය** | | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.9.20 දිනැතMSD චක්‍රලේඛ අංක 04/ 2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17 මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ්අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වනවගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **18 පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | | |
| 18.1 | අංක 05/ 2008 හා 05/ 2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මකකර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19 මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරුකොට තිබීම | අනුකූල නොවේ | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේඇමුණුම 01 හි දැක්වෙන් ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට | | |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20.විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/A/ FM /01/FS/2021 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 23 දින

ලේකම්

විදේශ අමාත්‍යාංශය

**විදේශ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විදේශ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විදේශ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව

(අ) පහත විෂයයන්ගේ වෙනස්කම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බවට

| විෂයය | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම රු. | පසුගිය වර්ෂයේ විගණන නිරීක්ෂණ අනුව දැක්විය යුතු වටිනාකම රු. | වෙනස රු. |
|---|---|---|---|
| (i)පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 10,370,961,874 | 10,061,370,232 | 309,591,642 |
| (ii)අත්තිකාරම් ගෙවීම් | 49,671,064 | 49,605,057 | 66,007 |
| (iii)භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම | 198,538,869 | 70,399,077 | 128,139,792 |

(iv) ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර හා මාරු කිරීම් රු. 437,731,433ක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එවැනි අගයක් දක්වා නොතිබුණු අතර, ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂයක් නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාළව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂය රු.943,415ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් වටිනාකම රු. 8,115,205 ක් වුවත් එම වටිනාකම රු. 8,106,458 ක් ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගලපා තිබුණි.

(ආ) අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් වටිනාකම රු. 304,973 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම වටිනාකම රු. 313,723 ක් ලෙස ගලපා තිබුණි.

### 1.6.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව රු. 2,094,037,896 ක් වූ තැන්පතු ලැබීම් වටිනාකම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 2,076,010,925 ක් ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ලැබීම් රු. 18,026,971 ක් අඩුවෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ගැලපීම් කර තිබුණි.

(ආ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු. 51,762,773 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව එම වටිනාකම රු. 51,771,520 ක් වූයෙන් අත්තිකාරම් ලැබීම් රු. 8,747 ක් අඩුවෙන් ගලපා තිබුණි. තවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව, අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 39,134,951 ක් වුවද, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ එම වටිනාකම රු. 39,143,701 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු.8,750 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ දැක්විය යුතු තැන්පතු ගෙවීම් රු. 2,073,640,054 ක් වුවද, එය රු. 2,050,025,630 ක් ලෙස සටහන් කිරීමෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 23,614,424 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

#### 1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු. 10,837,484,562 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 11,183,873,316 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 346,388,754 ක් වැඩියෙන් ගැලපීම් කර තිබුණි.

(ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සහනාධාර හා මාරු කිරීම් රු. 470,003,154 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකමක් නොමැති ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 470,003,154 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි.

#### 1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ රු. 187,030,142 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 63,415,742 ක් වූයෙන් රු. 123,614,400 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විදේශ දූත මණ්ඩල 54 ක පුනරාවර්තන හා මූලධන වියදම | පුනරාවර්තන 6,315,346,016<br>මූලධන 91,171,076 | - විදේශ දූත මණ්ඩල 13 කට අදාල පුනරාවර්තන හා මූලධන ගෙවීම්<br>- වවුචර් ගොනු කිහිපයක වටිකාකම් හැර අනෙකුත් ගෙවීම් වවුචර් ගොනු |

| | | | |
|---|---|---|---|
| (ආ) | නොනිමි ගොඩනැඟිලි | 55,984,547 | අයිතිය හා පැවැත්ම තහවුරු කිරීමේ ලේඛන |
| (ඇ) | තැන්පතු | 1,452,471,015 | ඉකුත් වර්ෂයේ ශේෂයන් සමඟ සැසඳුම් ප්‍රකාශ |
| (ඇ) | අත්තිකාරම් ලැබීම් | 43,380,027 | |
| (ඉ) | කාර්යාල ගොඩනැඟිලි | 9,730,692,636 | එක් එක් වත්කමක් වෙන්ව හඳුනාගත හැකි ස්ථාවර වත්කම් ලේඛණය |
| (ඊ) | මගී වාහන | 1,055,280,776 | |
| (උ) | මිශ්‍ර නාගරික දේපල | 1,010,362,062 | |
| (ඌ) | නිල නිවාස | 317,741,508 | |
| (එ) | වාහන අපහරණය | 39,119,254 | |
| (ඒ) | වත්කම් අත්පත් කර ගැනීම් | 63,415,740 | |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 වියදම් කළමනාකරණය

-------------------------

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 28 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුළු වටිනාකම රු. 561,669,027 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි.

### 2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් "බී" ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයට අනුව නිලධාරීන් 24 දෙනෙකුගෙන් වැඩිපුර අය කරගන්නා ලද රු. 215,322 ක ශේෂයක් පැවති අතර එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය හැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,098,606 ක ශේෂයක් අයවිය යුතුව පවතින අතර එම ණය ශේෂය තුළ වර්ෂ 2 ත් වර්ෂ 3 ත් අතර ශේෂය රු. 435,660 ක්ද,

වර්ෂ 4 ත් වර්ෂ 5 ත් අතර ශේෂය රු. 127,275 ක් සහ වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු. 535,671 ක් ලෙසද පැවතුණි.

(ඇ) සේවය අවසන් කළ නිලධාරීන් 5 දෙනෙකුට අදාළව රු. 299,955 ක ණය ශේෂයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු. 130,551 ක මුදලක් අයවිය යුතුව පැවති අතර එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**2.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම**

----------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සටහන් අංක iii යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය (SA - 92) සමඟ සැසඳී තිබිය යුතු වුවද බැඳීම් හා බැරකම් ප්‍රකාශ සටහන් අංක iii යටතේ රු. 115,320,800 ක් දක්වා තිබූ අතර SA – 92 අනුව එම ශේෂය රු. 250,194,868 ක් විය.

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හෝ විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| xix පරිච්ඡේදයේ 8.1, 8.2 වගන්තීන් | රජයේ නිවාසවල විදුලි උපකරණ පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද, නිවාසයේ නඩත්තුව පිළිබඳ වගකීම පැවරී ඇති බලධරයන් අනෙකුත් උපකරණ හා |

සවිකිරීම් යනාදිය පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද තබා ගත යුතු වුවත් විදේශ අමාත්‍යාංශයේ රජයේ නිවාස වලට අදාළව එවැනි ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**(ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i). මුදල් රෙගුලාසි 104

වර්ෂ 01ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු රු. 3,990,669 ක් වූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් හා 2010 වර්ෂයේදී සිදුව තිබූ රු. 1,991,695 ක් වූ වාහන සොරකම් කිරීම් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). මුදල් රෙගුලාසි 104 (i)

පාඩුවක් හෝ අලාභයක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ පැවැත්විය යුතු වුවත් වර්ෂ 01ක සිට වර්ෂ 05ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 05 කට අදාළව රු. 403,777 ක භාණ්ඩ නැතිවීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii). මුදල් රෙගුලාසි 106

ඌනතාවයක්, අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා මුදල් නැතිවූ විටක ඒ නැති වූ මුදල වහාම පූරණය කල යුතු වුවත් වර්ෂ 09ක සිට වර්ෂ 15ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 5 කට අදාලව මුදල් නැතිවීම් රු. 17,201,664 ක් පැවති අතර ඉන් රු.16,141,919 ක් සම්බන්ධයෙන් ගත් නෛතික ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණු අතර

| | | |
|---|---|---|
| | | ඉතිරිය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv). | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිමයන් එය දෙන කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් විදේශ දූත මණ්ඩල 12 කට අදාළව දෙන ලද නොපියවූ අත්තිකාරම් එකතුව රු. 1,804,674 ක් වර්ෂ 7 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. |
| (v). | මුදල් රෙගුලාසි 565(5) | එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi). | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් රු. 32,601,682 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ඔක්තෝම්බර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තු චක්‍රලේඛයෙහි 4.3 (ඉ) (i) හා (ii) | චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද එපරිදි අයකර නොගත් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හඳුනා නොගත් රු. 1,499,176 ක ණය ශේෂයක් පැවතුණි. |
| (ඇ) | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විශ්‍රාම ගනු ලබන හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් කඩිනමින් පියවිය යුතු වුවත් මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 465,050 ක ණය ශේෂයක් පැවති අතර ඉන් රු. 273,560 ක ණය ශේෂයක් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවතුණි. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන |

4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි.

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුම

(i). 2013 අග්‍රිම ගිණුම් ශේෂය ඉකුත් වර්ෂයේදී රු. 91,530,099 ක් වූවද සමාලෝචිත වර්ෂයේදී එය රු. 89,919,237 ක් වී තිබුණු අතර, වර්ෂය තුළ රු. 1,610,863 ක් එනම් 1.7% ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණක් නිරවුල් කර තිබුණි.

(ii). 2013 වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට අදාළ රු. 89,919,237 ක් වූ අග්‍රිම ශේෂය නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි.

- විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 248ක් සඳහා ගෙවූ අත්තිකාරම් රු. 60,051,898 කින් සමන්විත වී තිබුණි. එම නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 248 න් රු. 478,980 ඇප තැන්පතුව හැර රු. 59,572,918 ක් වූ ඉතිරි නිවාස ඇප තැන්පතු 247 ක්ම මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වී තිබුණි. එම තැන්පතු වටිනාකමින් රු. 12,440,021 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු. 43,292,731 ක් වර්ෂ 10 ක් වර්ෂ 20 ක් අතරද, රු. 3,840,166 ක් වූ ඉතිරිය වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 250 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

- වටිනාකම රු. 29,867,341 ක් වූ තත් කාර්යය අතුරු අග්‍රිම 127 ක් පැවති අතර ඉන් රු. 699,358 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබූ අතර රු. 12,840,889 ක් වර්ෂ 10-20 ත් අතරද ඉතිරි රු. 16,327,094 ක් වර්ෂ 07 ඉක්මවා තිබුණි. මු.රෙ. 371 ප්‍රකාරව තත් කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මෙම අත්තිකාරම්වලින් 72 ක් කුමන කරුණක් සඳහා ලබා දී ඇතිද යන්න තහවරු කර ගැනීමට නොහැකි වුණි.

(ආ). 7002-0-0-035/21 දරන අග්‍රිම ගිණුම

(i). සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ගිණුම් ශේෂය තුළ රු. 344,210,756 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වී තිබුණි. එම ආරක්ෂිත තැන්පතු වලින් රු. 19,536,652 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 46 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු. 3,020,376 ක් වර්ෂ 10 ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු. 16,516,276 ක් වර්ෂ 04-10 ත් අතර කාල පරාසයක් ගත වී තිබූ තැන්පතු විය.

(ii). දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් තුළ රු. 21,024,362 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර ඒ තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. 3,931,910 ක් ද 2019 වර්ෂයට අදාළ රු. 2,433,646 ක් හා 2020 වර්ෂයට අදාළ රු. 4,272,499 ක් ද විය. එම තත්කාර්යය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් මු.රෙ. 371 හි සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පත් කළ නමුත් බැර නොකළ චෙක්පත්

කැන්බරා දූත මණ්ඩලයෙහි ඕ . ඩො 402 ක් වටිනා චෙක්පත් 03 ක් සහ බර්ලින් දූත මණ්ඩලයෙහි යුරෝ 110 ක් වටිනා චෙක්පතක්ද 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා

කාල පරාසය තුළ තැන්පත් කළ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ආ) මුදල් වංචා / සොරකම් කිරීම්

---

ලොස්ඇන්ජලිස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ. ඩො 1583 ක් සහ මොස්කව් දූත මණ්ඩලයෙහි 2002 වර්ෂයේදී සහ 2003 වර්ෂයන්හීදී තැන්පත් නොකරන ලද මුදල් ලෙස ඇ.ඩො 155 ක් බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පැවතියද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යසාධනය

---

#### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come)ලබා නොගැනීම.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් වන අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණද වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මඟින් සපයන සේවාවන් සඳහා අය කරන ගාස්තු සංශෝධනය කර ගැසට් පත්‍රයක් පළ කිරීමට සැලසුම් කර තිබුණද එය ඉටු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශය විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. 70,638,545 ක මුදලක් ගෙවා තිබුණද ඉන් නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.3 පාඩු හා හානි**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වැඩසටහන් අංක 02 යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයන්හි සිද්ධීන් 55 කට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති රු. 29,185,385 ක පාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණය අනුව එම වටිනාකමින් රු.2,254,421 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු.21,626,285 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

**3.4 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ දූත මණ්ඩල පවතින ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශ තානාපති කාර්යාල සඳහා කාර්යය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 සේවක මණ්ඩල කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද්වීතියික මට්ටමට අයත් අනුමත සේවක සංඛ්‍යාව 369 තුළ ඇතුළත් සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පිළිවෙලින් 74ක් හා 169 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 86 ක් හා 207 ක් වූයෙන් අතිරික්තය 12 ක් හා 38 ක් විය.

(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ xiii වැනි පරිච්ඡේදයේ 154 වගන්තිය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන බවත් එහි 157 වගන්තිය අනුව රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත සේවයේ යෙදවිය හැක්කේ කොන්ත්‍රාත් පදනම මත පමණක් වන බවත් එවැනි පත්කිරීමක් එක් අවස්ථාවකදී එක් අවුරුද්දක කාල පරිච්ඡේදයකට සීමා කළ යුතු වුවද ටොරොන්ටෝ විදේශ දූත මණ්ඩලයේ සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුර සඳහා 2019 අගෝස්තු 28 දින විශ්‍රාම ලත් නිලධාරිනියක 2019 සැප්තැම්බර් 01 දින සිට වසර 03 ක කාලයක් බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පත් කර තිබුණි.

w. g. n. mendes

ඩබ්ලිව්.ජී.එන් .මැණිකේ

නියෝජ්‍ය විගණකාධිපති.

විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව